# NATIONAL LIBRARY RESEARCH SYMPOSIUM 2017

## Knowledge Development Through Innovation of Information Services

## 20th September 2017

# Proceedings



Organized by

National Library & Documentation Services Board

Ministry of Education

# National Library Research Symposium 2017

Knowledge Development Through Innovation of Information Services

# Proceedings

20th September 2017

# National Library Research Symposium 2017

Knowledge Development Through Innovation of Information Services

# Proceedings

20th September 2017

Organized by

National Library and Documentation Services Board

Ministry of Education

© National Library and Documentation Services Board 2017
ISBN 978-955-7544-22-9

Cataloguing - in - Publication Data Approved by the
National Library and Documentation Services Board

National Library Research Symposium (20th September, 2017: Colombo)
Proceedings : knowledge development through innovation of information services. - Colombo : National Library and Documentation Services Board, 2017.
189 p. ; 25 cm.

ISBN 978-955-7544-22-9

i. 020 DDC 23 1. Library science - Congresses

**Compilation Advice**
Dr. W. A. Abeysinghe – Chairman
Mr. W. Sunil – Director General

**Review of articles**
Prof. W. A. Weerasuriya
Dr. Ruwan Gamage
Mr. Gamini De Silva

**Compilation Committee**
G. D. Amarasiri – Director
Chandima Wadasinghe – Deputy Director
Kamalangani Subasinghe – Library and Documentation Officer
Thilini Vithanage - Information Assistant

**Computer Type setting & Page Designing**
Thanuja Rangika – Management Assistant
Asoka Damayanthi – Management Assistant

**Published by**
National Library and Documentation Services Board
No. 14, Independence Avenue,
Colombo 07.
Tele. : 94+113056388 / 94+112698847
Fax : 94+112685201
Email : research@mail.natlib.lk
Website : http://www.natlib.lk

**Printed by :** Nelum Printers, Boralesgamuwa

Authors are responsible for the content of their articles published in this journal

# පටුන


| | | |
|---|---|---|
| | Preface | vii |
| | Introduction | ix |
| 1 | විශේෂ පුස්තකාලයක එකතුව විද්‍යාර්ථීන්ගේ පර්යේෂණ සඳහා යෝග්‍යතාව ඇගයීම : හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ සිදු කරන ලද අධ්‍යයනයක් ඇසුරෙන්<br>කේ. යමුනා ප්‍රියදර්ශනී වීරරත්න | 11-30 |
| 2 | Reading habits among school students : with special reference to school in Dehiovita educational zone<br>D.G.R.L Gunarathna | 31-42 |
| 3 | A glimpse for the collection development through citation analysis of theses for the National Library of Sri Lanka<br>A. K. U. N. Kodithuwakku | 43-58 |
| 4 | ජාතික ඩිජිටල් පුස්තකාලයේ එකතු පිළිබඳ ගවේෂණාත්මක අධ්‍යයනයක්<br>ඉරෝමි විජේසුන්දර | 59-80 |
| 5 | කියවීම ප්‍රවර්ධනය කෙරෙහි විෂය විශේෂ කියවීම් කඳවුරුවල බලපෑම පිළිබඳ අධ්‍යයනයක් (ඌව පළාතේ තෝරාගත් පාසල් කිහිපයක විද්‍යා විෂය කියවීම් කඳවුරු ඇසුරින්)<br>එම්. කේ. එම්. අසිත සඳරුවන් | 81-95 |

6 සිංහලයට පරිවර්තිත ඉන්දීය ප්‍රබන්ධ සාහිත්‍ය පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක අධ්‍යයනයක් (1948-2015) 97-112
උදිත අලහකෝන් / සජීවනී ජයසේකර

7 දේශීය ඥානයෙහි අඛණ්ඩ පැවැත්මට ජන කවියෙහි ශාස්ත්‍රීය දායකත්වය පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක් 113-131
ආර්. ඩී. අනන්ද තිස්ස

8 Criteria to assess the effectiveness and efficiency in an academic library : a review of the literature 133-150
M.P.P. Dilhani / R. Amarasekara

9 පාසල් සිසුන් කියවීමට යොමු කරවීම, හුරු කරවීම සහ රුචිකත්වය වර්ධනය සඳහා ''සිත්ගත් ග්‍රන්ථයන්හි රුවගුණ'' අත්පොත ඇසුරින් ක්‍රියාකාරී පර්යේෂණයක් 151-170
ප්‍රියානි බාලසූරිය

10 ආයුර්වේද වෛද්‍ය ශාස්ත්‍රය අධ්‍යයනයට පරිශීලනය කළ යුතු තොරතුරු මූලාශ්‍ර පිළිබඳ අධ්‍යයනයකි 171-189
පී. එම්. අයෝමි

# Preface

Conducting research in library and information field in Sri Lanka is a main responsibility of the National Library and Documentation Services Board (NLDSB). To fulfill this responsibility, NLDSB implements a number of projects. Conducting research and surveys in library and information field, conducting workshops on research methodology for librarians, making aware the relevant authorities about the research findings are the main activities. National Library Research Symposium is another activity carried out with the objective of inculcating library research in the country. Other objectives of this research symposium is to provide an opportunity for library professionals to present their research papers and also to encourage the library professionals to conduct further research in library and information field. This is also an important landmark of the contribution of NLDSB for the development of research in library and information field in Sri Lanka. I thank the staff of the Library Research Division of NLDSB for organizing this symposium.

Dr. W. A. Abeysinghe
Chairman
National Library and Documentation Services Board

# Introduction

Development of research in any field is very instrumental for the development of the respective fields. The main advantages of research is the generation of new knowledge which is important for education and development. In modern society which is also introduced as a knowledged society, research receives a very significant place. It is clear that research in library and information field in Sri Lanka is limited and development of library research is a timely requirement. A vast development has been achieved in research specially in scientific research. Therefore, it is the responsibility of the relevant institutions to promote library research activities.

As the main government organization in library and information field, National Library and Documentation Services Board (NLDSB) has a special responsibility of promote research in library and information field in Sri Lanka. To fulfill the responsibility, NLDSB implements a member of projects. NLDSB conducts research in selected topics of national importance. In addition, it conducts surveys to understand the present situations of libraries and make available the latest information on the resources and services of the libraries in the country. NLDSB also conducts workshops on research methodology for librarians to make them aware about the research methodology.

National Library Research Symposium is another activity carried out by NLDSB for the promotion of library research. The objective of this symposium is to provide an opportunity for the library professionals to present their research papers and also to encourage them to conduct further research in the library and information field. This symposium is also helpful in NLDSB's effort to creat an research culture in library field in Sri Lanka. I am thankful to all article reviewers and the staff of the Library Research Division of the NLDSB for organizing this symposium.

W. Sunil
Director General
National Library and Documentation Services Board

# විශේෂ පුස්තකාලයක එකතුව විද්‍යාර්ථීන්ගේ පර්යේෂණ සඳහා යෝග්‍යතාව ඇගයීම : හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ සිදු කරන ලද අධ්‍යයනයක් ඇසුරෙන්

කේ. යමුනා ප්‍රියදර්ශනී වීරරත්න
සහකාර පුස්තකාලයාධිපති
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

**සාරාංශය**

පුස්තකාලයක එකතු සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදනය කරනු ලබන්නේ මව් ආයතනයේ අරමුණු සහ ඉලක්ක පදනම් කර ගනිමිනි. විශේෂයෙන්ම පර්යේෂණ තුළින් නව දැනුම සම්පාදනය කරන බැවින් කාලීන තොරතුරු ලබා ගැනීමේ ක්‍රමවේද සකස් කිරීම පුස්තකාලයේ වගකීමකි. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය ආරම්භයේ සිට මේ දක්වා පුස්තකාලය විසින් අනුගමනය කරනු ලබන එකතු සංවර්ධන ප්‍රතිපත්තිවල වෙනස්වීමක් සිදුවී නොමැත. එම කාලපරිච්ඡේදය තුළ තොරතුරු ලෝකයේ සිදු වූ විප්ලවයන් තුළින් බිහි වූ නව තොරතුරු මූලාශ්‍ර පුස්තකාල එකතුවට අන්තර්ගත නොවීම පර්යේෂණ සඳහා බලපා ඇත්තේ කුමන ආකාරයෙන්ද යන්න විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වේ. සෙසු අරමුණු වන්නේ පර්යේෂණ කාර්ය මණ්ඩලයට අවශ්‍ය නව තොරතුරු මූලාශ්‍ර මොනවාද, තොරතුරු විමර්ශනයේදී මුහුණ දෙන ගැටලු සහ බාධක මොනවාද යන්න හඳුනා ගැනීම සහ ඒ සඳහා විසඳුම් යෝජනා කිරීමයි. අධ්‍යයනය සඳහා ආයතනයේ සියලු අංශ නියෝජනය වන පරිදි අහඹු ලෙස තෝරා ගත් පර්යේෂණ නිලධාරීන් 32 ක් නියැදිය ලෙස යොදා ගැනිණි. අධ්‍යයනයට අනුව ප්‍රතිචාරීන්ගෙන් වැඩි පිරිසක් පුස්තකාලයේ ඇති සියලු මුද්‍රිත තොරතුරු මාධ්‍යයන් භාවිත කරන අතර තොරතුරු ලබා ගැනීම සඳහා අන්තර්ජාලය භාවිත කරති. තොරතුරු ගවේෂණය සඳහා පුස්තකාලයෙන් ලැබෙන දායකත්වය පිළිබඳ ප්‍රතිචාරීන්ගෙන් 50% ක් සෑහීමකට පත් වී ඇත. මේ අනුව පවතින තොරතුරු මූලාශ්‍ර කරා කාර්යක්ෂම ප්‍රවේශයක් සලසා දීම සහ පර්යේෂණ සඳහා අවශ්‍ය නව තොරතුරු මූලාශ්‍ර පුස්තකාල එකතුවට අන්තර්ගත කළ හැකි පරිදි එකතු සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදනය කිරීම කාලීන අවශ්‍යතාවකි.

**මූලික පද : එකතු කළමනාකරණය, තොරතුරු මූලාශ්‍ර**

**හැඳින්වීම**

ගොවිජන ක්ෂේත්‍රයේ ගැටලු සඳහා සමාජ ආර්ථික පර්යේෂණ සිදු කිරීම, දැනුම ජනනය කර බෙදාහැරීම තුළින් රජයේ ප්‍රතිපත්ති කාර්යක්ෂම කිරීම හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අරමුණු වේ. Agrarian Research and Training Institute Act, (1972). එම අරමුණු සාක්ෂාත් කරලීම සඳහා සේවයේ නියැළී සිටින පර්යේෂණ නිලධාරීන්ගේ පර්යේෂණ ක්‍රියාවලිය සඳහා අවශ්‍යම ද්විතීයික දත්ත ලබා ගැනීමට සහාය වන්නේ පුස්තකාලයයි. පුස්තකාල එකතු සංවර්ධන ප්‍රතිපත්ති එම පුස්තකාලයේ සහ මව් ආයතනයේ අරමුණු, ඉලක්ක හා පරමාර්ථ සමඟ බැඳී පවතී. එකතු සංවර්ධනය නැතහොත් එකතුව ගොඩනැංවීම යනුවෙන් අදහස් කරනුයේ වර්තමාන හා අනාගත පාඨකයාගේ අවශ්‍යතාවලට අනුකූලව පවත්නා පුස්තකාල එකතු පිළිබඳව විවිධ අංශවලින් අවධානය යොමු කරමින් කිසියම් ප්‍රතිපත්තිමය රාමුවක් තුළ පුස්තකාල ද්‍රව්‍ය තේරීම හා ප්‍රතිග්‍රහණය කිරීම වේ. (Mahapatra, 1999). පර්යේෂණ පුස්තකාලයක මූලික අරමුණ වන්නේ විද්‍යාත්මක තොරතුරු බෙදාහැරීමයි. එයට අවශ්‍ය ශාස්ත්‍රීය තොරතුරු සපයාදීම සහ කෘෂි විඥාපන පද්ධති සකස් කිරීම පුස්තකාලය විසින් ඉටු කළ යුතුය. මෙය පර්යේෂණ වාර්තාවන්හි ගුණාත්මක තත්ත්වය කෙරෙහි ද බලපායි. පර්යේෂණයක අත්‍යවශ්‍ය අංගයක් වන සාහිත්‍ය විමර්ශනයේ දී සිදු වන්නේ පර්යේෂකයාගේ තේමාවට අදාළ සාහිත්‍යය සමඟ විචාරාත්මක සංවාදයකට එළඹීමකි. එහි ප්‍රමාණවත් බව, අඩුපාඩුකම්, හිස්තැන් හඳුනාගන්නා ශාස්ත්‍රීය ව්‍යායාමයකි (උයන්ගොඩ, 2011). 21 සියවසේ දැනුම පාදක සමාජයේ විශේෂ පුස්තකාලයක ප්‍රධාන කාර්යය වන්නේ තොරතුරු යටිතල පහසුකම් සංවර්ධනය සහ අන්තර්ජාල මත පදනම් වූ විද්‍යුත් තොරතුරු සේවා පාඨකයන්ට ලබා දීමයි. ගොවිජන ක්ෂේත්‍රයේ අනාගත සංවර්ධන ක්‍රියාකාරකම් කේන්ද්‍රගත වනුයේ පර්යේෂණ හා ශාස්ත්‍රීය තොරතුරු මත බැවින් පුස්තකාලයේ කාර්යභාරය වන්නේ පවත්නා මුද්‍රිත මාධ්‍ය මෙන්ම නව දැනුම කරා ප්‍රවේශ විය හැකි දත්ත සමුදායන් අත්පත් කර ගැනීමත් භාවිතයට සුදුසු පරිදි සංවිධානය කිරීමත් වේ. සියලු පුස්තකාල ආකෘතීන් සලකා බලන කල පුස්තකාලයක ප්‍රධාන කාර්යය වන්නේ පවත්නා හා ප්‍රවේශ සහිත වූ තොරතුරු මුලාශ්‍රයක හා ඒවා භාවිත කරන්නා අතර මැදිහත්කරුවකු ලෙස ක්‍රියා කිරීමයි. (Nute, A.). වර්තමානයේ විශ්වවිද්‍යාල පුස්තකාල සහ විශේෂ පුස්තකාල බොහොමයක් නව තොරතුරු මූලාශ්‍ර පුස්තකාල එකතුවට අන්තර්ගතකොට ඇත. ආරම්භයේ සිට අද දක්වාම පුස්තකාලය සතුව

ලිඛිත එකතු සංවර්ධන ප්‍රතිපත්තියක් නොමැති වුවද, වර්තමානයේ පුස්තකාලය විසින් අනුගමනය කරනු ලබන එකතු සංවර්ධන ප්‍රතිපත්ති ආයතනයේ පර්යේෂණ නිලධාරීන්ගේ තොරතුරු විමර්ශනය සඳහා බලපා ඇති ආකාරය විමර්ශනය කිරීම මෙම අධ්‍යයනය තුළින් සිදු කෙරේ.

**එකතු සංවර්ධන ප්‍රතිපත්තිය සහ එකතු සංවර්ධනය**

පිරිවැය සාපලා්‍ය සහ භාවිත කරන්නාට අදාළ අයුරින්, පුස්තකාල තොරතුරු සම්පත් සැලසුම් කිරීමේ, ගොඩනැගීමේ සහ නඩත්තු කිරීමේ ක්‍රියාවලිය එකතු සංවර්ධන ප්‍රතිපත්තිය ලෙස හැඳින්විය හැකිය. පොත්පත් හා පොත්පත් නොවන දේ තේරීම හා ප්‍රතිග්‍රහණය ඇතුළු සමස්ත ක්‍රියාවලිය සඳහා එකතු සංවර්ධනය යන පදය භාවිත කරනු ලබයි. එකතු සංවර්ධනයේ දී එම එකතු, ක්‍රමානුකූලව නඩත්තු කිරීම, සම්පත් බෙදාහැරීම, පොත්පත් පිරිසැකසුම් කාර්යය, ආරක්ෂණය හා සංරක්ෂණය, ගබඩා කිරීම, අපහරණය, එකතු භාවිත කිරීමේ ක්‍රම, ප්‍රවර්ධන පුහුණු සම්බන්ධ කටයුතු එකතු කළමනාකරණයට අයත් වේ. (International Encyclopaedia of Information and Library Sciences, p.61)

**අධ්‍යයන ගැටලුව**

පර්යේෂණ තුළින් සිදුකරන නව දැනුම සම්පාදනයට පහසුකම් සැලසීම සඳහා පුස්තකාල එකතුවෙහි පවතින තොරතුරු මූලාශ්‍ර ප්‍රමාණවත් වන්නේද?

**අධ්‍යයනයෙහි පසුබිම**

ආයතනය ආරම්භයේ සිට පර්යේෂණ නිලධාරීන් තොරතුරු විමර්ශනය සඳහා භාවිත කරනු ලැබුවේ මුද්‍රිත මාධ්‍ය ලෙස පවතින පොත්, වාර ප්‍රකාශන හා පර්යේෂණ නිබන්ධනයන්ය. මෙහි පරිහරණයේ පහසුව, කර්තෘගේ නිපුණත්වය, මාධ්‍යයේ සමීපතාව වැනි වාසි මෙන්ම මුද්‍රණයේ දී හා බෙදාහැරීමේ දී සිදු වන ප්‍රමාදය හා මිල අධිකවීම වැනි අවාසි ද දැක ගත හැකි විය. විද්‍යුත් මාධ්‍ය ලෙසින් භාවිත කරනු ලබන සංගෘහිත තැටි මගින් හා මාර්ගගත දත්ත සමුදායන් ලෙස පළ වූ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු මගින් ප්‍රාථමික තොරතුරු හඳුනා ගත හැකි වුව ද එම තොරතුරු අඩංගු සම්පූර්ණ ලේඛන ලබා ගැනීමේ දී නොයෙකුත් ගැටලු මතු වේ. (තලගල, 1997).

ආයතනය ආරම්භයේ සිට අද දක්වා පුස්තකාල එකතුවෙහි සංයුතිය මෙසේ දැක්විය හැකිය.

| තොරතුරු මූලාශ්‍ර | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| පොත් | 23080 | 69% |
| වාර ප්‍රකාශන | 10209 | 30% |
| සිතියම් | 167 | 1% |
| නිබන්ධ | 90 | - |
| සංයුක්ත තැටි | 104 | - |




ප්‍රස්තාර 01: පුස්තකාල එකතුව

දේශීය හා විදේශීය ග්‍රන්ථ සහ වාර ප්‍රකාශන, පර්යේෂණ නිබන්ධන, සංයුක්ත තැටි, සහ සිතියම්වලින් පුස්තකාල එකතුව සමන්විත වේ. පුස්තකාල එකතුවෙහි මුද්‍රිත තොරතුරු මූලාශ්‍ර 99% ක් වැනි ඉහළ අගයක් දැක්වෙන අතර විද්‍යුත් මූලාශ්‍ර ලෙස සැලකිය හැකි සංයුක්ත තැටි සංඛ්‍යාව ඉතා අඩු අගයක් පෙන්නුම් කෙරේ. අන්තර්ජාලය තුළින් නිදහසේ පිවිසිය හැකි (Free access) වෙබ් අඩවි ඇසුරෙන් ලබා ගත හැක්කේ සීමිත තොරතුරු ප්‍රමාණයකි. එසේම පුස්තකාලය විසින් අන්තර් පුස්තකාල සහයෝගිතාව තුළින් අනෙකුත් පර්යේෂණ පුස්තකාල සතු දත්ත පදනම් මගින් තොරතුරු ලබා ගැනීමට පහසුකම් සලසා දී ඇතත් පර්යේෂණ ගැටලුවේ ස්වභාවය අනුව සියලු ආයතන එකම විෂය ක්ෂේත්‍රයට අයත් නොවීම සහ පර්යේෂණ ගැටලුවල ස්වභාවය අනුව තොරතුරු අවශ්‍යතාද වෙනස් වීම නිසා එය සාර්ථක විසඳුමක් වී නොමැත. එබැවින් පවතින පුස්තකාල එකතුව ඇගයීමත් ගොවිජන ක්ෂේත්‍රයේ ගැටලු සඳහා නව පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම්වලට අවශ්‍ය දැනුම ලබා දීමට පුස්තකාල එකතුවට අන්තර්ගත කළ යුතු නව තොරතුරු මූලාශ්‍ර හඳුනා ගැනීමත් කාලීන අවශ්‍යතාවක් මෙන්ම පුස්තකාලයේ වගකීමක් ද වේ. එසේම ආයතනයේ කළමනාකාරිත්වය හා අදාළ ප්‍රතිපත්ති සම්පාදකයන් හට මෙහි ඇති අවශ්‍යතාවය පෙන්වා දීම ද පුස්තකාලයේ වගකීමකි.

**එකතු සංවර්ධන ප්‍රතිපත්ති සංශෝධනයේ අවශ්‍යතාව**

පවතින එකතු සංවර්ධන ප්‍රතිපත්ති කාලීනව සංශෝධනය කිරීමේ උවමනාව මතු

වන්නේ නව තොරතුරු මූලාශ්‍රවල ආගමනය, තොරතුරු තාක්ෂණයේ වර්ධනය සහ පවත්නා මූලාශ්‍රයන් පාඨකයන්ගේ තොරතුරු අවශ්‍යතා හා නොගැළපීම යන හේතූන් නිසාය. පර්යේෂණ තුළින් සිදු කරනු ලබන්නේ ද වර්තමානයේ පැන නැගී ඇති ගැටලු සඳහා විසඳුම් සෙවීම සහ අනාගතයේ දී පැනනැගිය හැකි ගැටලු පිළිබඳ අවධානය යොමු කිරීමය. තොරතුරු යටිතල පහසුකම්වල සංවර්ධනය සහ අන්තර්ජාලය මත පදනම් වූ විද්‍යුත් පුස්තකාල සේවා නිසා පුස්තකාල විසින් ඉටු කරනු ලබන සාම්ප්‍රදායික සේවාවන්හි වෙනස්වීම සිදුවේ. එසේම කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ගෝලීය අභියෝගවලට මුහුණ දීම සඳහා ලොව පුරා නිරන්තරයෙන් සිදු වන නව සොයාගැනීම්, පර්යේෂණ හා ඒ හා සම්බන්ධ සමාජ ආර්ථික තොරතුරු පිළිබඳව පර්යේෂණ නිලධාරීන් දැනුවත් විය යුතුය. පුස්තකාලය සතුව ලිඛිත එකතු සංවර්ධන ප්‍රතිපත්තියක් නොමැති බැවින් තොරතුරු මූලාශ්‍ර තේරීම, ප්‍රතිග්‍රහණය, ඇගයීම සහ නඩත්තු කිරීම යන එකතු සංවර්ධන ක්‍රියාදාමය පවත්වාගෙන යනු ලබන්නේ පුස්තකාලය සඳහා වෙන් කර ඇති වැය ශීර්ෂ, කාර්යාල නියෝග සහ මුදල් රෙගුලාසිවලට යටත්වය. එම නිසා වර්තමාන එකතු සංවර්ධන ක්‍රියාදාමය තුළට පාඨක තෘප්තිමත්භාවය ඇති කරන නව තොරතුරු මූලාශ්‍ර සහ සේවා ඇතුළත් කිරීම සහ ලිඛිත එකතු සංවර්ධන ප්‍රතිපත්ති සකස් කිරීම කාලීන අවශ්‍යතාවකි.

**අධ්‍යයනයේ වැදගත්කම**

මෙම අධ්‍යයනය මූලිකවම වැදගත් වන්නේ පුස්තකාලය ආරම්භයේ සිට මේ දක්වාම පුස්තකාල එකතුව පිළිබඳ අධ්‍යයනයක් හෝ ඇගයීමක් සිදු කර නොමැති බැවිනි. එසේම පුස්තකාල එකතුවෙහි පවතින තොරතුරු මූලාශ්‍ර පර්යේෂණවලට අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා ප්‍රමාණවත් වන්නේ ද යන්න තක්සේරු කිරීම සඳහා මෙම අධ්‍යයනය උපයෝගී කර ගත හැකි වේ. පුස්තකාලයේ සැබෑ වගකීම වන්නේ තොරතුරු සඳහා වන ඉල්ලුම සපුරාලීම වේ. මේනිසා පුස්තකාලයේ තොරතුරු සේවාවන් හා තොරතුරු මූලාශ්‍රවල ගුණාත්මකභාවය සම්බන්ධයෙන් පුස්තකාලයේ ක්‍රියාකාරිත්වය ඇගයීම ඉතා වැදගත් වේ. එසේම ප්‍රමාණාත්මක හා ගුණාත්මක විශ්ලේෂණය පුස්තකාලයේ කළමනාකරණ සහ සංවර්ධන ක්‍රියාවලියේ කොටසක් වශයෙන් සැලකිය හැකි අතර මෙම අධ්‍යයනය තුළින් එම කාර්යය ඉටු කිරීමට අවශ්‍ය පසුබිම සැකසේ. ආයතනයේ ප්‍රකාශිත අරමුණු සහ ඉලක්ක කරා ගමන් කිරීමේ දී පර්යේෂණ නිලධාරීන් හට පැවරී ඇති කාර්යභාරය වන්නේ ගොවිජන ක්ෂේත්‍රයට

අදාළ පර්යේෂණ තුළින් තොරතුරු ජනනය කිරීම හා බෙදාහැරීමයි. එම පර්යේෂණ සඳහා ලොව පුරා විසිරී ඇති නව තොරතුරු කරා ප්‍රවේශ වීමට අවශ්‍ය පහසුකම් සලසා දීමේ කාර්යය පැවරී ඇත්තේ පුස්තකාලය වෙතය. වර්තමාන එකතු සංවර්ධන ප්‍රතිපත්ති හා පුස්තකාල එකතුව සම්බන්ධව අධ්‍යයනය කිරීම තුළින් එහි ප්‍රබලතා සහ දුබලතා හඳුනා ගැනීමටත් එසේම මෙම අධ්‍යයනය තුළින් රැස්කරනු ලබන දත්ත උපයෝගී කර ගනිමින් පාඨක අවශ්‍යතාවලට ගැළපෙන පරිපූර්ණ ඵලදායී පුස්තකාල එකතුවක් ගොඩනැංවීමට හැකි වේ.

කාලීන තොරතුරු වෙත ප්‍රවේශ වීමට අවශ්‍ය නව තොරතුරු මූලාශ්‍ර සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම පිළිබඳව ආයතනයේ පර්යේෂණ උපාය මාර්ගවල සහ අනෙකුත් මූල්‍ය ප්‍රතිපත්ති ලේඛනවල ඇතුළත්ව තිබිය යුතුය. මෙම අධ්‍යයනය තුළින් කෙරෙන නිර්දේශ සහ යෝජනාවලින් එම කාර්යයට අවශ්‍ය පසුබිම සැලසෙන අතර ඉහළ කළමනාකාරිත්වයට මෙන්ම ප්‍රතිපත්ති සම්පාදකයන්ට තීරණ ගැනීමේ පහසුව එමගින් සැලසේ.

**අධ්‍යයනයේ අරමුණු**

මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ පවතින පුස්තකාල එකතුව පිළිබඳ ඇගයීමක් සිදු කිරීමයි. සෙසු අරමුණු වන්නේ දැනට පවතින පුස්තකාල එකතුවෙහි භාවිතය කුමන අයුරින් සිදුවේ ද යන්න අධ්‍යයනය කිරීම, පුස්තකාල එකතුවට අන්තර්ගත කළ යුතු නව තොරතුරු මූලාශ්‍ර මොනවා ද යන්න හඳුනා ගැනීම සහ ඒ තුළින් ලිඛිත එකතු සංවර්ධන ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම, තොරතුරු විමර්ශනයේදී පර්යේෂණ නිලධාරීන් මුහුණ දෙන ගැටලු හා බාධක හඳුනා ගැනීම සහ පවතින පුස්තකාල එකතුවෙහි ඵලදායිතාවය හා කාර්යක්ෂමතාව විමර්ශනය කිරිමයි.

**සාහිත්‍ය විමර්ශනය**

එකතු සංවර්ධන ප්‍රතිපත්ති සහ ඒ තුළින් පර්යේෂණවල තොරතුරු විමර්ශනයට සිදු කරනු ලබන බලපෑම පිළිබඳව ජාත්‍යන්තර සහ කලාපීය වශයෙන් පෙර සිදු කර ඇති අධ්‍යයනය මෙහි දී විමසා බැලේ.

Collection Management in Libraries කෘතිය තුළින් මහාපත්‍ර (1999) විසින් පුස්තකාල එකතු සංවර්ධනය සහ එකතු කළමනාකරණය සම්බන්ධව පුළුල් විවරණයක් ඉදිරිපත් කර ඇත. පුස්තකාල සඳහා එකතු සංවර්ධන ප්‍රතිපත්තිය වැදගත් වන ආකාරය සහ ඒ තුළින් ඉටු වන මෙහෙවර පිළිබඳ කරුණු මෙන්ම පුස්තකාල එකතු කළමනාකරණය පිළිබඳව ද කරුණු ඉදිරිපත් කර ඇත. මෙහි දී විශේෂ පුස්තකාලයක එකතු සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදනය සඳහා මග පෙන්වීමක් සිදු කර ඇති අතර පුස්තකාලයාධිපති ප්‍රමුඛ කාර්ය මණ්ඩලය, පාඨකයන් සහ කමිටු සාමාජිකයන්ගේ සහභාගිත්වයෙන් ඵලදායී පුස්තකාල එකතුවක් නිර්මාණය කළ හැකි ආකාරය පෙන්වා දී ඇත. එසේම විශේෂ පුස්තකාල මව් ආයතනයේ අරමුණු සහ ඉලක්ක හඳුනා ගෙන පුස්තකාල එකතු කළමනාකරණය කළ යුතු ආකාරය එහි දක්වා ඇත. මහාපත්‍ර ඉදිරිපත් කර ඇති වැදගත් අදහසක් වන්නේ පාඨකයන් හට සෑම අවස්ථාවක දී ම මුද්‍රිත ස්වරූපයේ තොරතුරු අවශ්‍ය නොවන බවයි. අවශ්‍ය වන්නේ තොරතුරු කරා ප්‍රවේශ වීම බැවින් වෙනත් මූලාශ්‍ර මගින් තොරතුරු ලබා දීම පුස්තකාලය විසින් සිදු කළ යුතු වේ. එම මූලාශ්‍ර මාර්ගගත දත්ත පද්ධති (Online Data Bases), සංයුක්ත තැටි විය හැකිය. කෙසේ වුව ද මහාපත්‍ර විසින් 1999 වසරේ සඳහන් කරන ලද වෙනත් මූලාශ්‍ර කාණ්ඩයට අද වන විට බොහෝ විද්‍යුත් මූලාශ්‍ර එකතුවී ඇත. මහාපත්‍ර දක්වන පරිදි කිසිදු පුස්තකාල එකතුවක් ස්ථිතික නොවන බැවින් එකතු සංවර්ධන ප්‍රතිපත්ති වරින්වර විමසුමට ලක් කළ යුතු වේ. පුස්තකාල හා තොරතුරු කළමනාකරණයේ දී පරිගණක භාවිතය සහ විශ්ව තොරතුරු හුවමාරුවට සම්බන්ධ නව තාක්ෂණික සොයා ගැනීම් යන සාධක එකතු සංවර්ධන වැඩසටහන්වල රටාව වෙනස් කිරීමට හේතු වන බව මහාපත්‍ර මෙයට වසර ගණනාවකට පෙර පවසා ඇති කරුණු අද වන විට සැබෑවෙමින් පවතී.

Evans and Spanaro (2005), Development Libraries and Information Center Collections කෘතිය මගින් ඵලදායී පුස්තකාල එකතු සංවර්ධන ප්‍රතිපත්තියක් සකස් කර ගැනීම මෙන්ම පුස්තකාලය සඳහා තෝරා ගත යුතු, අපහරණය කළ යුතු මූලාශ්‍ර තේරීම සහ ප්‍රතිග්‍රහණය කිරීම පිළිබඳ මඟ පෙන්වීමක් කර ඇත. විශ්වවිද්‍යාල පුස්තකාල, මහජන පුස්තකාල, විශේෂ පුස්තකාල සහ පාසල් පුස්තකාල එකතු සංවර්ධනයේ දී අනුගමනය කළ යුතු ක්‍රියාපිළිවෙළ සවිස්තරව දක්වා ඇත. එමෙන්ම තොරතුරු තාක්ෂණය හා සබැඳි අතථ්‍ය පුස්තකාල (virtual library) සංකල්පය පිළිබඳ කරුණු දක්වා ඇත. විශේෂ පුස්තකාලයන්හි එකතු සංවර්ධනයේ දී, පාඨකයින්ගේ

තොරතුරු අවශ්‍යතාව කෙබඳු අයුරින් සිදු වන්නේ ද? නව තොරතුරු මූලාශ්‍ර පර්යේෂණ සඳහා වැදගත් වන ආකාරය සහ තොරතුරු සේවා මගින් පර්යේෂණ සඳහා ක්ෂණික තොරතුරු ලබා ගැනීමේ හැකියාව පිළිබඳව ඉදිරිපත් කර ඇති කරුණු මෙහි දී වඩාත් වැදගත් වේ. තොරතුරු මූලාශ්‍ර භාවිත කිරීමේ දී අදාළ වන වාරණය, ප්‍රකාශන අයිතිය පිළිබඳ නීතිමය කරුණු මෙන්ම මූල්‍ය කළමනාකරණය පිළිබඳ වැදගත් කරුණු රාශියක් මෙම කෘතියෙහි සඳහන් කර ඇත.

The Importance of Library Resources in Conducting Research ලිපිය මගින් Jayasuriya (1996) පර්යේෂණ සඳහා පුස්තකාල සම්පත්හි වැදගත්කම පිළිබඳ කරුණු ඉදිරිපත් කර ඇත. පර්යේෂකයන් තොරතුරු කරා ප්‍රවේශ වීමේ දී කරනු ලබන විමර්ශන විමසීම් සහ ඒ සම්බන්ධව තොරතුරු ලබා දීමේ දී පුස්තකාලයේ කාර්යභාරය මෙහි දැක් වේ. එසේම පුස්තකාලයක තොරතුරු සංවිධානය කිරීම, ප්‍රධාන සුචි වර්ග, පුස්තකාල නාමාවලි, පාඨක උපදේශන සේවා පිළිබඳව මේ මගින් කරුණු ඉදිරිපත් කර ඇත. පර්යේෂණවලට අවශ්‍ය තොරතුරු ගවේෂණය කිරීම සඳහා භාවිත කරන මුද්‍රිත ග්‍රන්ථ හා වාර ප්‍රකාශන, මාර්ගගත තොරතුරු සේවා, සංයුක්ත තැටි, පුස්තකාල ජාල සහ අන්තර්ජාලය පිළිබඳව විස්තරාත්මකව කරුණු ඉදිරිපත් කර ඇත.

Guidelines for a Collection Development Policy Using the Conspectus Model, පුස්තිකාවෙහි Bilarz (2001) පුස්තකාල සඳහා ලිඛිත එකතු සංවර්ධන ප්‍රතිපත්තියක අවශ්‍යතාව පිළිබඳව සහ ඒ තුළින් අත්වන ප්‍රතිලාභ පිළිබඳව සංක්ෂිප්ත අදහස් ඉදිරිපත් කර ඇත. මේ අනුව නව තොරතුරු සම්පත් පුස්තකාලය තුළට පැමිණීම හේතුවෙන් එකතු සංවර්ධන ප්‍රතිපත්තිවල වෙනස්වීමක් සිදු වන ආකාරය පිළිබඳව පහදා දී ඇත. කතුවරයා සඳහන් කරන පරිදි එකතු සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදනය පුස්තකාල කාර්ය මණ්ඩලය සහ පාඨකයන්ගේ සහභාගිත්වයෙන් සිදු කිරීම තුළින් පුස්තකාලයේ කෙටි කාලීන හා දිගුකාලීන අරමුණු කෙරෙහි සැලකිලිමත් වීමට හැකි වේ. එසේම අයවැය සම්පාදනයට, අනෙකුත් පුස්තකාල සමග සිදු කෙරෙන සාමූහික ප්‍රතිග්‍රහණයට සහ පුස්තකාලයට තෝරාගත යුතු සහ නොගත යුතු ද්‍රව්‍ය පිළිබඳ හඳුනාගැනීමට ලිඛිත එකතු සංවර්ධන ප්‍රතිපත්තිය ඉවහල් වේ. එමෙන්ම ලිඛිත එකතු සංවර්ධන ප්‍රතිපත්තිය තුළින් අනාගත සැලසුම් සම්පාදනය කිරීමටත් ඉන් ප්‍රමුඛතා තීරණය කිරීමටත් (විශේෂයෙන්ම මූල්‍යමය සම්පත් සීමිත විට දී) සහාය

වන අතර මව් ආයතනයේ ප්‍රකාශිත අරමුණු කරා ළඟා වීමට විධිමත් ප්‍රතිපත්ති ප්‍රකාශ උපකාරී වන බව ද මෙම කෘතියෙහි සඳහන් කර ඇත.

### අධ්‍යයන ක්‍රමවේදය

ආයතනයේ පර්යේෂණ කටයුතු සිදු කරන කෘෂි සම්පත් කළමනාකරණ, පාරිසරික හා ජල සම්පත් කළමනාකරණ, අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර, මානව සම්පත් හා ආයතනනික සංවර්ධන සහ කෘෂි ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් යනාදී සියලු අංශ නියෝජනය වන පරිදි අහඹු ලෙස තෝරා ගත් පර්යේෂණ නිලධාරීන් 32 ක් නියැදිය ලෙස යොදා ගැනිණි. පර්යේෂණ නිලධාරීන් සමග සිදු කළ සම්මුඛ සාකච්ඡා සහ ප්‍රශ්නාවලි ඇසුරෙන් ප්‍රාථමික දත්ත රැස් කරන ලදී. ද්විතීයික දත්ත රැස්කරගනු ලැබුවේ පොත්පත්, පර්යේෂණ වාර්තා, ආයතනයේ වාර්ෂික වාර්තා, පුස්තකාල පරිග්‍රහණ ලේඛන, ග්‍රන්ථ සංසරණ සංඛ්‍යාලේඛන සහ අන්තර්ජාලයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙනි.

### දත්ත විශ්ලේෂණය

මූලික වශයෙන් ප්‍රමාණාත්මක දත්ත සරල සංඛ්‍යාන විධික්‍රම වන වගු සටහන්, ප්‍රස්තාර සහ ප්‍රතිශතමය අගයන් භාවිතයෙන් විශ්ලේෂණය කරන ලදී. ගුණාත්මක දත්ත සහ තොරතුරු විශ්ලේෂණයේ දී විස්තරාත්මක විධික්‍රම භාවිත කෙරිණි.

නියැදියට අයත් ප්‍රතිචාරීන්ගේ සාමාන්‍ය තොරතුරු, ප්‍රතිචාරීන්ගේ පුස්තකාල භාවිතය, තොරතුරු මූලාශ්‍ර භාවිතය, අන්තර්ජාල භාවිතය සහ තොරතුරු ගවේෂණයේ දී මුහුණ දෙන ගැටලු සහ ඒ සඳහා වන යෝජනා මෙහිදී විස්තර කෙරේ.

### ප්‍රතිචාරීන්ගේ වෘත්තීමය තොරතුරු

ආයතනයේ සියලු අංශ නියෝජනය කරමින් පර්යේෂණ නිලධාරීහු 32 ක් නියැදියට අයත් වූහ. වගු අංක 1 හි දැක්වෙන පරිදි නියැදියට කාන්තාවෝ 53% (17) සහ පිරිමි (47%) 15ක් ඇතුළත් වූහ.

වගුව 01: ස්ත්‍රී පුරුෂ භාවය හා සේවා කාණ්ඩය අනුව නියැදිය

| සේවා කාණ්ඩය | ස්ත්‍රී / පුරුෂ භාවය | | | | සමස්තය (32 = සංඛ්‍යාව) | |
|---|---|---|---|---|---|---|
| | කාන්තා (17 = සංඛ්‍යාව) | | පිරිමි (15 = සංඛ්‍යාව) | | | |
| | සංඛ්‍යාව | ප්‍රතිශතය% | සංඛ්‍යාව | ප්‍රතිශතය% | සංඛ්‍යාව | ප්‍රතිශතය% |
| අධිපර්යේෂණ | 1 | 5.9 | 3 | 20 | 4 | 12.5 |
| සහාය අධිපර්යේෂණ | 1 | 5.9 | 3 | 20 | 4 | 12.5 |
| ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී | 1 | 5.9 | 1 | 6.6 | 2 | 6.25 |
| පර්යේෂණ නිලධාරී | 14 | 82.3 | 8 | 53.4 | 22 | 69 |
| එකතුව | 17 | 100 | 15 | 100 | 32 | 100 |

මූලාශ්‍ර : අධ්‍යයන දත්ත ඇසුරින් කතුවරයා විසින් සකසන ලදී

**පුස්තකාලය භාවිත කිරීමේ රටාව**

පර්යේෂණ යෝජනාවලිය ලිවීමේ සිට පර්යේෂණ වාර්තාවේ අවසන් අදියර දක්වා ඇති වන තොරතුරු අවශ්‍යතා අනුව පර්යේෂණ නිලධාරීන් විසින් පුස්තකාලය භාවිත කිරීම සිදු වේ. ආයතනය මගින් පර්යේෂණ ව්‍යාපෘති මෙන්ම පුහුණු වැඩසටහන් ද පවත්වාගෙන යෑම නිසා පුස්තකාලය භාවිත කිරීමේ කාල සීමාව වෙනස් වේ.

වගුව 02: පුස්තකාලය භාවිත කිරීමේ රටාව

| පුස්තකාලය භාවිත කිරීම | සංඛ්‍යාව | ප්‍රතිශතය(%) |
|---|---|---|
| දිනපතා | 1 | 3.1 |
| සතිපතා | 11 | 34.4 |
| මාස්පතා | 15 | 46.9 |
| කාලාතුරකින් | 4 | 12.5 |
| භාවිත නොකරයි | 1 | 3.1 |
| එකතුව | 32 | 100 |

මූලාශ්‍ර : අධ්‍යයන දත්ත ඇසුරින් කතුවරයා විසින් සකසන ලදී

මෙහි පැහැදිලිව පෙනෙන කරුණ වන්නේ ප්‍රතිචාරීගෙන් අඩකටත් වැඩි පිරිසක් සතිපතා හෝ මාස්පතා පුස්තකාලය භාවිත කරන බවයි.

**පුස්තකාලය වෙතින් තොරතුරු ලබා ගැනීම සඳහා භාවිත කරන මාධ්‍යයන්**

03 වගු සටහනෙන් පෙන්නුම් කෙරෙන අන්දමට ප්‍රතිචාරීන්ගෙන් වැඩි පිරිසක් 81% (26) පුස්තකාලයේ ඇති තොරතුරු මූලාශ්‍ර වන පොත්, වාර ප්‍රකාශන, නිබන්ධන සියල්ලම භාවිත කරති. ප්‍රතිචාරීන්ගෙන් 13% (04) ක් පොත් පමණක් භාවිත කරන අතර වාර ප්‍රකාශන පමණක් භාවිත කරන ප්‍රතිචාරීන් ප්‍රමාණය 6% (2) කි.

වගුව 03 : පුස්තකාලය වෙතින් තොරතුරු ලබා ගැනීම සඳහා භාවිත කරන මාධ්‍යයන්

| තොරතුරු ලබා ගන්නා මාධ්‍යය | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| පොත් පමණක් | 04 | 13 |
| වාර ප්‍රකාශන | 02 | 6 |
| නිබන්ධන පමණක් | 00 | 00 |
| ඉහත සියල්ලම | 26 | 81 |
| එකතුව | 32 | 100 |

මූලාශ්‍ර : අධ්‍යයන දත්ත ඇසුරින් කතුවරයා විසින් සකසන ලදී

**පුස්තකාල එකතුව සංවිධානය කර ඇති ආකාරය**

ආයතනය විසින් කෘෂිකාර්මික ක්ෂේත්‍රය හා සම්බන්ධ සමාජ ආර්ථික ගැටලු පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීම හේතුකොට ගෙන එම විෂයයන්ට අයත් පොත් විශාල ප්‍රමාණයක් පුස්තකාල එකතුවට අන්තර්ගත කර ඇත. එසේම දේශීය වශයෙන් මෙම විෂයයන් හා සම්බන්ධව පළ කරනු ලබන්නේ සීමිත වාර ප්‍රකාශන ප්‍රමාණයක් බැවින් විදේශීය වාර ප්‍රකාශන වැඩි ප්‍රමාණයක දායකත්වය ලබා ගෙන ඇති අතර ඒවා අකාරාදීව සංවිධානය කර ඇත. ශ්‍රී ලංකාව තුළ ප්‍රකාශයට පත් කළ තොරතුරු මූලාශ්‍ර සහ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් විදේශයන්හි ප්‍රකාශයට පත් කර ඇති තොරතුරු මූලාශ්‍ර ඇතුළත් ශ්‍රී ලංකා එකතුව සහ අන්තර්ජාතික වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති තොරතුරු මූලාශ්‍ර, වෙන් වෙන් වශයෙන් පුස්තකාලය තුළ සංවිධානය කර තිබේ.

ප්‍රස්තාර 02 : විශ්ව දශම වර්ගීකරණයට අනුව පොත් එකතුව සංවිධානය කර ඇති ආකාරය




වර්ග පන්ති

මූලාශ්‍ර : අධ්‍යයන දත්ත ඇසුරින් කතුවරයා විසින් සකසන ලදී

වගුව 04 : විශ්ව දශම වර්ගීකරණයට අනුව පුස්තකාල පොත් එකතුව සංවිධානය කර ඇති ආකාරය

| වර්ග පංතිය | විෂයයන් | ශ්‍රී ලංකා එකතුව | ප්‍රතිශතය (%) | විදේශීය එකතුව | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|
| 099-000 | සාමාන්‍ය කෘති | 314 | 2.6 | 471 | 4.1 |
| 299-100 | දර්ශනය | 156 | 1.3 | 130 | 1.1 |
| 200-299 | ආගම | 34 | 0.28 | 19 | 0.16 |
| 300-399 | සමාජ විද්‍යාව | 7765 | 65.8 | 6681 | 59 |
| 400-499 | භාෂාව | 40 | 0.33 | 18 | 0.15 |
| 500-599 | ශුද්ධ විද්‍යාව | 327 | 2.7 | 94 | 0.63 |
| 600-699 | කෘෂිකර්මය සම්බන්ධ තාක්ෂණය | 2318 | 19.6 | 3259 | 28.8 |
| 700-799 | කලා ශිල්ප | 319 | 2.7 | 522 | 4.6 |
| 800-899 | සාහිත්‍යය | 80 | 0.67 | 12 | 0.1 |
| 900-999 | ඉතිහාසය | 444 | 3.67 | 39 | 0.34 |
| එකතුව | | 11797 | | 11283 | |

මූලාශ්‍ර : අධ්‍යයන දත්ත ඇසුරින් කතුවරයා විසින් සකසන ලදී

සමාජ විද්‍යා විෂයයට (300) සංඛ්‍යානය, දේශපාලන විද්‍යාව, ආර්ථික විද්‍යාව, නීතිය, මූල්‍ය කටයුතු, රාජ්‍ය පරිපාලනය, සමාජ සුබසාධනය, අධ්‍යාපනය සහ වාණිජ්‍යය, වැනි විෂයයන් ඇතුළත් වේ. එසේම කෘෂිකර්මය හා තාක්ෂණ විෂයය තුළ (600) ජල කළමනාකරණය, කෘෂිකර්මය, වන ජීවී විද්‍යාව, සත්ත්ව පාලනය, කළමනාකරණය සහ අලෙවිකරණය වැනි විෂයයන් අන්තර්ගත වී ඇත. මේ නිසා සමාජ විද්‍යා සහ කෘෂිකර්ම හා තාක්ෂණ විෂයයන් යටතේ විශාල පොත් ප්‍රමාණයක් ඒකරාශි වී ඇත.

**තොරතුරු ගවේෂණය සඳහා අන්තර්ජාලය භාවිත කිරීම**

අන්තර්ජාලය තුළින් විද්‍යුත් තොරතුරු මූලාශ්‍ර (Electronic resources) වෙත ඉක්මනින් හා පහසුවෙන් පිවිසීමේ හැකියාව නිසා නව තොරතුරු මූලාශ්‍ර කෙරෙහි නැඹුරු වී ඇති බව ප්‍රතිචාරීන්ගේ අන්තර්ජාලය භාවිත කිරීම පිළිබඳ දත්ත මගින් පෙන්නුම් කෙරේ.

වගුව 05: අන්තර්ජාලයෙන් ලබා ගන්නා තොරතුරු මූලාශ්‍ර

| තොරතුරු මූලාශ | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| වාර ප්‍රකාශන පමණක් | 3 | 9 |
| විද්‍යුත් මූලාශ්‍ර පමණක් | 8 | 25 |
| මාර්ගගත මූලාශ්‍ර පමණක් | 00 | 00 |
| වාර ප්‍රකාශන සහ මාර්ගගත මූලාශ්‍ර පමණක් | 4 | 13 |
| මාර්ගගත මූලාශ්‍ර සහ විද්‍යුත් පොත් පමණක් | 3 | 9 |
| ඉහත සියල්ල | 14 | 44 |
| එකතුව | 32 | 100 |

මූලාශ්‍ර : අධ්‍යයන දත්ත ඇසුරින් කතුවරයා විසින් සකසන ලදී

පර්යේෂණ නිලධාරීන්ගෙන් අඩකට වැඩි පිරිසක් එක් වර්ගයක මූලාශ්‍රවලට යොමුව පවතී. අන්තර්ජාලය වෙතින් ලබා ගත හැකි සියලු තොරතුරු මූලාශ්‍ර භාවිත කර ඇති සංඛ්‍යාව 44%(14) කි. මෙහි දී මාර්ගගත මූලාශ්‍රවල අන්තර්ගත තොරතුරු නිරතුරුවම යාවත්කාලීන වන හෙයින් එම තොරතුරු පර්යේෂණ කාර්යයේ දී වැඩි වශයෙන් භාවිත කර තිබේ.

වගුව 06 : තොරතුරු ලබා ගැනීම සඳහා අන්තර්ජාල පහසුකම් ලබා ගැනීම

| අන්තර්ජාල පහසුකම් ලබා ගන්නා ආකාරය | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| ආයතනයෙන් පමණි | 6 | 19 |
| පෞද්ගලිකව පමණි | 4 | 12 |
| දෙආකාරයෙන්ම | 22 | 69 |
| එකතුව | 32 | 100 |

මූලාශ්‍ර : අධ්‍යයන දත්ත ඇසුරින් කතුවරයා විසින් සකසන ලදී

පර්යේෂණ නිලධාරීන් සඳහා අන්තර්ජාල පහසුකම් ලබා දී ඇතත් නිදහස් ප්‍රවේශය සඳහා සලසා ඇති ඉඩප්‍රස්තා සීමිත බැවින් සියලු තොරතුරු මූලාශ්‍ර සඳහා ප්‍රවේශ වීමේ හැකියාව නොලැබේ. එබැවින් ප්‍රතිචාරීන්ගෙන් 19% ක් පෞද්ගලිකව අන්තර්ජාලය තුළින් තොරතුරු ගවේෂණය සිදු කර ඇත.

**තොරතුරු ගවේෂණය සඳහා පුස්තකාලයෙන් ලැබෙන දායකත්වය**

පුස්තකාලය විසින් මව් ආයතනයේ අරමුණු හා විෂය පථයන්ට අදාළ නව ප්‍රවණතා ඇතුළත් තොරතුරු මූලාශ්‍ර පුස්තකාල එකතුවට අන්තර්ගත කර ඇත. පර්යේෂණ සඳහා එම තොරතුරු ප්‍රමාණවත් නොවන අවස්ථාවල දී අන්තර් පුස්තකාල සහයෝගිතා වැඩපිළිවෙළ මගින් තොරතුරු අවශ්‍යතා සපුරාලීම සිදු කෙරේ. තොරතුරු ගවේෂණය පහසු කිරීම සඳහා සූචි පත්‍රිකා ගොනුව කර්තෘ, ග්‍රන්ථ නාමය සහ විෂයය අනුව අකාරාදීව ගොනු කර ඇත. පැරණි පුස්තකාල එකතුව පරිගණක ගතකිරීම සිදු කෙරෙමින් පවතින අතර පසුගිය දශක දෙකක පමණ ආසන්න කාලය තුළ ප්‍රතිග්‍රහණය කළ සියලු මුද්‍රිත ප්‍රකාශන පරිගණක ගතකර ඇත. එසේම ආයතනය ආරම්භයේ සිට වර්තමානය දක්වා ආයතනය විසින් ප්‍රකාශයට පත් කර ඇති සියලු ප්‍රකාශන සංඛ්‍යාංකකරණය (Digitization) කර ඇති අතර ආයතනයේ වෙබ් අඩවිය ඔස්සේ ප්‍රවේශ වීමේ පහසුකම් සලසා ඇත.

වගුව 07: තොරතුරු ගවේෂණයට පුස්තකාලයෙන් ලැබෙන දායකත්වය පිළිබඳ අදහස්

| සෑහීමකට පත් වීම | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| ඔව් | 16 | 50 |
| නැත | 10 | 31.2 |
| කිසිවක් කිව නොහැක | 6 | 18.8 |
| එකතුව | 32 | 100 |

මූලාශ්‍ර : අධ්‍යයන දත්ත ඇසුරින් කතුවරයා විසින් සකසන ලදී

පර්යේෂණ නිලධාරීන්ගෙන් 50% ක් පුස්තකාලයෙන් තොරතුරු ගවේෂණය සඳහා ලැබෙන දායකත්වය පිළිබඳ සෑහීමට පත් වී ඇත. නමුත් පුස්තකාලයෙන් තොරතුරු ගවේෂණය සඳහා ලැබෙන දායකත්වය පිළිබඳ සෑහීමකට පත් නොවූ (31.2%) පිරිසක් ද සිටින අතර ඒ සඳහා බලපාන හේතු මොනවා ද යන්න ඔවුන් විසින් ප්‍රකාශ කර ඇත.

වගුව 08: තොරතුරු ගවේෂණය සඳහා පුස්තකාලයෙන් ලැබෙන දායකත්වය පිළිබඳ සෑහීමකට පත් නොවීමට හේතු

| හේතු | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| තොරතුරු කරා ප්‍රවේශ වීමට නොහැකි වීම | 4 | 40 |
| විද්‍යුත් මූලාශ්‍ර නොමැති වීම | 4 | 40 |
| පාඨක සේවා ප්‍රමාණවත් නොවීම | 2 | 20 |
| එකතුව | 10 | 100 |

මූලාශ්‍ර : අධ්‍යයන දත්ත ඇසුරින් කතුවරයා විසින් සකසන ලදී

පර්යේෂණ නිලධාරීන්ගෙන් 40% ක් පුස්තකාලයේ ඇති තොරතුරු කරා ප්‍රවේශ වීමට නොහැකි වීම නිසා තොරතුරු ගවේෂණය සඳහා පුස්තකාලයෙන් සැපයෙන සේවාව සම්බන්ධයෙන් අතෘප්තිමත් භාවයට පත්ව ඇත. සූචි පත්‍රිකා ගොනුවක් මගින් විශාල

පුස්තකාල එකතුවක ඇති තොරතුරු ගවේෂණය අසීරු කාර්යයක් වන අතර ඒ සඳහා විශාල කාලයක් ද වැය කිරීමට සිදු වේ. පුස්තකාලයේ ඇති සියලුම තොරතුරු මූලාශ්‍රවල ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු (Bibliographic Information) පරිගණක ගත නොකිරීම නිසා කාර්යක්ෂමව තොරතුරු කරා ප්‍රවේශ වීමට නොහැකි වී ඇත.

පුස්තකාලය තුළ විද්‍යුත් මූලාශ්‍ර නොමැති වීම ද පුස්තකාලය පිළිබඳ සෑහීමකට පත් නොවීමට හේතු වී ඇත. පුස්තකාලය විසින් පුස්තකාල ජාල සහ අනෙකුත් පර්යේෂණ ආයතන හා එක්ව අන්තර් පුස්තකාල සහයෝගිතා වැඩසටහන තුළින් Jstore, Agora " Science Direct" CABI වැනි දත්ත පදනම් මගින් පර්යේෂණ නිලධාරීන්ගේ තොරතුරු අවශ්‍යතා සපුරාලීමට කටයුතු කළ ද එමගින් පර්යේෂණ සඳහා අවශ්‍ය සියලු තොරතුරු ලබා ගැනීමේ හැකියාව ලැබී නොමැත.

ප්‍රතිග්‍රහණය කරනු ලබන කාලීන තොරතුරු පිළිබඳ දැනුවත් නොකිරීම, වෙනත් ආයතන විසින් පළ කරනු ලබන වාර්ෂික වාර්තා පුස්තකාලයට ලබා නොගැනීම සහ අවශ්‍යම තොරතුරුවල ඡායා පිටපත් පුස්තකාලය තුළින් ලබා දීමට කටයුතු නොකිරීම පුස්තකාලය විසින් ලබා දෙන පාඨක සේවා ප්‍රමාණවත් නොවීමට බලපා ඇති සාධක වේ.

## කාර්යක්ෂම හා ඵලදායී ලෙස තොරතුරු ගවේෂණය කිරීම සඳහා කරනු ලබන යෝජනා

පුස්තකාලය වෙතින් වඩාත් කාර්යක්ෂම හා ඵලදායී අයුරින් තොරතුරු ගවේෂණය කිරීම සඳහා ප්‍රතිචාරීන් විසින් කර ඇති යෝජනාවලින් ප්‍රමුඛතාවය ලබා දී ඇත්තේ විද්‍යුත් මූලාශ්‍ර සඳහා ප්‍රවේශය ලබා ගැනීම සහ පුස්තකාලයේ ඇති තොරතුරු පරිගණක ගතකිරීම බව පහත සඳහන් වගුව මගින් නිරීක්ෂණය වේ.

වගුව 09 : කාර්යක්ෂමව හා ඵලදායීව තොරතුරු ගවේෂණය සඳහා ප්‍රතිචාරීන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

| යෝජනා | යෝජනා (47 සංඛ්‍යා) | ප්‍රතිශතය (%) |
|---|---|---|
| අන්තර්ජාලය තුළින් ලබා ගත හැකි සියලු විද්‍යුත් මූලාශ්‍ර වෙත ප්‍රවේශය සැලසීම | 17 | 53.1 |
| පුස්තකාලයේ ඇති තොරතුරු මූලාශ්‍ර පරිගණක ගත කිරීම සහ ඒ සඳහා ප්‍රවේශ වීමේ හැකියාව ලබා දීම | 13 | 40.6 |
| පුස්තකාලය විසින් ප්‍රතිග්‍රහණය කරනු ලබන නව තොරතුරු මූලාශ්‍ර පිළිබඳව දැනුවත් කිරීම | 5 | 15.6 |
| වෙනත් ආයතන විසින් පළ කරනු ලබන ප්‍රකාශන පුස්තකාලයට ලබා ගැනීම | 5 | 15.6 |
| අවශ්‍ය තොරතුරු මූලාශ්‍රවල ඡායා පිටපත් පුස්තකාලය තුළින් ලබා දීම | 2 | 6.25 |
| පුස්තකාලය වෙතින් බැහැර දෙන පොත් සහ වාර සඟරා ආපසු භාර දිය යුතු කාල සීමාව වැඩි කිරීම | 2 | 6.52 |
| නියමිත දිනයට භාර නොදෙන පොත් සඳහා අය කරන දඩ මුදල ඉවත් කිරීම | 1 | 3.1 |
| පර්යේෂණ නිලධාරීන් වෙතින් අස්ථාන ගතවන පොත් සඳහා ඒවායේ ඡායා පිටපත් නැවත පුස්තකාලයට භාර දීමට අවස්ථාව සැලසීම | 1 | 3.1 |
| ඉතා පැරණි පොත් වෙනම ස්ථානයක තැන්පත් කිරීම | 1 | 3.1 |

මූලාශ්‍ර අධ්‍යයනය ඇසුරින් පර්යේෂකයා විසින් සකස් කරන ලදී

ප්‍රතිචාරීන් විසින් කරන ලද යෝජනාවලින් ඵලදායී හා කාර්යක්ෂම අයුරින් තොරතුරු ගවේෂණය සඳහා ඔවුන් පුස්තකාලය වෙතින් අපේක්ෂිත සේවාවන් කවරේද යන්න ප්‍රකාශ වේ. ඒ අනුව පුස්තකාලය විසින් එකතු සංවර්ධන ප්‍රතිපත්ති සකස් කිරීමේදී එම කරුණු ද සැලකිල්ලට ගත යුතුව ඇත.

## නිගමන

වර්තමාන පුස්තකාල එකතුවෙන් 99% ක් වැනි විශාල ප්‍රමාණයක් මුද්‍රිත තොරතුරු මූලාශ්‍ර වේ.

ප්‍රතිචාරීන්ගෙන් 81% ක් තොරතුරු ගවේෂණය සඳහා පොත්, වාර ප්‍රකාශන සහ නිබන්ධන යන සියලු මාධ්‍ය භාවිත කරති.

ප්‍රතිචාරීන් සියලු දෙනා පර්යේෂණ සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට අන්තර්ජාලය භාවිත කරන අතර අන්තර්ජාලයෙන් ප්‍රවේශ විය හැකි සියලු තොරතුරු මූලාශ්‍ර භාවිත කරන පිරිස 44% කි.

පර්යේෂණ නිලධාරීන් තොරතුරු ලබා ගැනීම සඳහා ආයතනය මගින් ලබා දෙන අන්තර්ජාල පහසුකම් මෙන්ම පෞද්ගලිකව ලබා ගෙන ඇති පහසුකම් භාවිත කර ඇත.

තොරතුරු ගවේෂණයට පුස්තකාලයෙන් ලැබෙන දායකත්වය පිළිබඳ ප්‍රතිචාරීන්ගෙන් 50% ක් සෑහීමට පත් වී ඇති අතර 31.2% ක් සෑහීමකට පත් වී නොමැත. නියැදියේ ඉතිරි 18.8% මේ සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කර නොමැත. තොරතුරු කරා ප්‍රවේශ වීමට නොහැකි වීම, විද්‍යුත් මූලාශ්‍ර නොමැති වීම සහ පුස්තකාලයෙන් සැපයෙන පාඨක සේවා ප්‍රමාණවත් නොවීම අතෘප්තිමත් වීමට හේතු වී ඇත.

කාර්යක්ෂම හා ඵලදායී ලෙස තොරතුරු ගවේෂණය කිරීම සඳහා ප්‍රතිචාරීන් විසින් කරනු ලබන යෝජනාවලින් නිරීක්ෂණය වන්නේ පුස්තකාල එකතුවට නව තොරතුරු මූලාශ්‍ර එකතු කළ හැකි පරිදි එකතු සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ අවශ්‍යතාවයයි.

## යෝජනා

ප්‍රතිචාරීන් විසින් කාර්යක්ෂමව හා ඵලදායී ලෙසින් තොරතුරු ගවේෂණය සඳහා කරන ලද යෝජනා ද සැලකිල්ලට ගෙන පර්යේෂණ අවශ්‍යතාවලට ගැළපෙන පරිපූර්ණ ඵලදායී පුස්තකාල එකතුවක් ගොඩනැංවීමට අවශ්‍ය එකතු සංවර්ධන ප්‍රතිපත්ති සැලසුම් සකස් කිරීම සඳහා කරනු ලබන යෝජනා මෙසේය.

පර්යේෂණවලට අදාළ කාලීන හා වැදගත් තොරතුරු වැඩි ප්‍රමාණයක් අන්තර්ගතව ඇත්තේ විද්‍යුත් මූලාශ්‍ර වන වාර සඟරා සහ මාර්ග ගත දත්ත පද්ධතිවල බැවින් ඒ සඳහා අදාළ බලපත්‍ර ලබා ගෙන එම තොරතුරු කරා ප්‍රවේශ වීමට අවස්ථාව සලසා දීම. ඒ අනුව පුස්තකාල එකතුවට විද්‍යුත් මූලාශ්‍ර අන්තර්ගත කිරීම.

පුස්තකාලයේ ඇති සියලු තොරතුරු මූලාශ්‍ර පරිගණක ගතකිරීම, එම තොරතුරු ජාලගත කර ඒවා සඳහා ප්‍රවේශය ලබා දීම සහ ආයතනයේ වෙබ් අඩවියට තොරතුරු ඇතුළත් කිරීම.

පර්යේෂණ නිලධාරීන් ක්ෂේත්‍ර චාරිකාවලට සහභාගිවීම නිසා ඔවුන්ට නව ප්‍රතිග්‍රහණයන් පිළිබඳ දැනුවත් වීමට හැකියාවක් නොලැබෙන බැවින් අදාළ නාමාවලි සකස්කොට ඒ පිළිබඳව විද්‍යුත් තැපැල (e-mail) මගින් නව ප්‍රතිග්‍රහණයන් පිළිබඳව දැනුවත් කිරීම.

අන්තර් පුස්තකාල සහයෝගිතා පදනමින් වෙනත් ආයතනවල ප්‍රකාශන පුස්තකාලයට ලබා ගැනීම.

අවශ්‍ය තොරතුරුවල ඡායා පිටපත් පුස්තකාලය තුළින් ලබා ගැනීමට පහසුකම් සැලසීම.

පුස්තකාලය වෙතින් බැහැර ගෙන යන පොත් සහ වාර සඟරා ආපසු භාර දිය යුතු කාල සීමාව වැඩි කිරීම.

පුස්තකාලය තුළ පහසුවෙන් තොරතුරු ගවේෂණය කිරීම සඳහා භාවිත නොකරන පොත් සහ වාර සඟරා අපහරණය කිරීම.

**ආශ්‍රිත ග්‍රන්ථ**

1. උයන්ගොඩ, ජේ. (2011). සමාජීය විද්‍යා පර්යේෂණ යෝජනාවලියක් ලිවීම: න්‍යායික හා ප්‍රායෝගික මග පෙන්වීමක්. කොළඹ: සමාජ විද්‍යාඥයින්ගේ සංගමය

2. තලගල, ඩී. (1997. 1 ). අන්තර්ජාලය තුළින් විද්‍යා සහ තාක්ෂණ තොරතුරු සමුද්ධරණය. පුස්තකාල ප්‍රවෘත්ති, පි. 18-23

3. Agrarian Research and Training Institute Act. (1972, 5). Colombo: Department of Government Printing.

4. Biblarz , Dora. (2001). Guidelines for a Collection Development Policy Using the Conspectus Model. [on-line]. Available: http://www.ifla.org//VII/s14 [March 26, 2014].

5. Encyclopedia of Library and Information Sciences. (1971). New York: Marcel Dekker Inc, vol.5.3.

6. Evans, Edward and Spanaro, Magaret Zarnosky (2000). Development Libraries and Information Center Collections, ( 3 ed. ) . Colorado: Librarian Unlimited.

7. Jayasuriya, S. (1996, 4). The Importance of Library Resources in Conducting Research . 17. pp. 12-14.

8. Mahapatra, P.K. (1999) . Collection Management in Libraries , New Delhi: EssEss.

9. Nutt, A. The Role of Libraries in a Knowledge-Based Society: Estonian and European Experience. [on-line]. Available: http://www.academia.edu/ November 9, 2012].

# Reading habits among school students: with special reference to school in Dehiovita educational zone

D.G.R.L Gunarathne
Assistant Librarian
J.R.Jayewardene Centre

## ABSTRACT

Today readers are tomorrow leaders. People tend to read become knowledgeable persons. If child and elder people have good and correct reading habits, it is a good opportunity to make an intelligent society. The school students can obtain good quality education from successful reading. The main objective of this study is to explore and identify the reading habits of school students.The other objectives are to study the factors for upgrading their reading habits, the internet use for effective reading and to study what are the information some schools need. They compel for reading place and time spend for reading.The survey research method was used for this study. There are nearly 10,000 schools in Sri Lanka. The Kegalle district in Dehiovita region has 279 schools. The population of this study is A/L art subject students in schools. The sample was 137 students in three schools.Rathnavali Maha Vidylaya Mattamagoda, Sri Sena Maha Vidyalaya Imbulana in Dehiovita National school, Dehiovita. The above school students used as the sample for the study. A questionnaire was administered to obtain primary data among the sample. Interviews were also further done for collecting data. Reading habits are well planned and deliberate pattern of study which has attained a form of consistency on the part of students toward understanding academic subjects and passing at examinations. Reading habits determine the academic achievements of students to a great extent. Both reading and academic achievements are interrelated and dependent on each other. Students often come from different environments and localities with different levels of academic achievement. Therefore, they differ in the pattern of reading habits. Reading is an art of interpreting printed and written words and it is a basic

instrument of education. Reading is considered to be crucial for people from all cross sections of life for successfully coping with the complexities and challenges of the 21st century.

*Key word : Reading habits, school librarian, readership, infromation literacy, reading.*

## Introduction

Reading is an art of interpreting printed and written words and it is a basic instrument of education. Reading is considered to be crucial for people from all cross sections of life for successfully coping with the complexities and challenges of the 21stcentury. In recent times, the emergence of digital technologies and various modes of social interaction have hampered reading habits. Reading is considered necessary for the overall improvement of a human being. A large amount of reading is necessary for the purpose of education. The reading is essential opportunity of successful learning and reading is interconnected with the total educational development and educational achievement need of successful reading (palani, 2012). The students should know what they are reading" how, why, for better reading. If students are reading well, they can achieve many things to make their study period. Within this context, this study is aimed at investging the reading habits of school students with special reference to some selected schools in Kegall District. Therefore, successful reading is a very important opportunity for successful learning. A good reading habit is an important tool for the development of personalities and mental capacities. Reading is the passion of the greatest personalities of all times and since ages which helped to pass on knowledge through generations.

## Objective of the study

- The main objective of this study is to explore and identify the reading habits of school students.
- To study factors which affect for upgrading their reading
- To study the types of materials used for reading by students
- To identify the time the student spent for reading
- To study purpose of reading
- To identify the preferred student favorite place for reading
- To know what are the favorite material for reading

## Research methodology

The survey research method was used for this study. There are nearly 10,000 schools in Sri Lanka. The Kegalle district Dehiovita region has 279 schools. The population of this study is A/L arts students in schools. The study was limited to investigate the reading habits of these schools. Totally 140 questionnaires were distributed among these school students. Out of which 137 filled up questionnaires were received back. In this sample has fifty three male students and eighty four female students. The sample is in three schools namely Rathnavalee Maha Vidyalaya, Mattamagoda, Sri Sena Maha Vidyalaya Imbulana and Dehiovita National school Dehiovita. The above school students were used as the sample for the study. A questionnaire was administered to obtain primary data among the sample. Interviews were also done for collecting data.Data Analysis was done using spss, graphs and tables.

## Literature review

Anand S. Medar and Anand Y. Kenchakkanavar (2015)examined reading habits by the students of Karnatak Science Collage. The study adopted a survey based questionnaire method to use for data collection. Study found that a majority of the students visit library daily for reading. The largest number of respondents are interested in reading to pass the examination and to get a good job. Student's favorite reading place was central library and percentage was 86.17%. Finally, it was concluded that library professionals should encourage the students to utilize the library sources.

Owsu, Micheal (2014) examined reading habits among students and effects on academic performance: a study of students of Koforidia Polyphonic. The study sought to assess the reading habits among students and their effects on their academic performance. Figures and tables were used to illustrate the results of findings. Number of questionnaire distributed was 1052 and received back 1000. The study confirm that regarding habit has influence on academic performance and there is a relationship between reading habit and academic performance. The study recommended not to give handouts lecturers and they should have space to use the library.

Early, Jeffery (2011) leisure reading habits: Student's attitudes toward their in school reading compared to out of school reading. This study purposed to discover how student's attitudes toward their reading in school was compared to out of school reading. Data was collected for this from grade 10 to 12 using questionnaire and interviews. The study revealed that a variety of different factors contribute to the difference in reading outside of school compared to the reading that takes place in school.

Eamin Ali, A.K.Met. al (2013) reading habit of students in Social Sciences and Arts: a case study of Rajshani University. This paper tried to assess the reading habit of the students of a leading public university is Bangladesh

and identified the trends in their reading habit. Based on the findings of a questionnaire based survey. The paper also attempts to put forward recommendations for improving the reading habit of young students in particular and the large cross sections of people general.

## Data analysis

Reading place (Table 1)

**Rathnawali**

| | Frequency | Percentage | Valid Precentage | Cumulative Precentage |
|---|---|---|---|---|
| Library | 10 | 28.57 | 28.57 | 28.57 |
| House | 24 | 68.57 | 68.57 | 97.14 |
| Bus | 1 | 2.85 | 2.85 | 100.00 |
| Total | 35 | 100.00 | 100.00 | |

**Dehiowita**

| | Frequency | Percentage | Valid Precentage | Cumulative Precentage |
|---|---|---|---|---|
| Library | 17 | 25.4 | 25.4 | 25.4 |
| House | 9 | 13.4 | 13.4 | 38.8 |
| Bus | 41 | 61.2 | 61.2 | 100.00 |
| Total | 67 | 100.00 | 100.00 | |

**Imbulana**

| | Frequency | Percentage | Valid Precentage | Cumulative Precentage |
|---|---|---|---|---|
| Library | 9 | 25.71 | 25.71 | 25.71 |
| House | 1 | 2.85 | 2.85 | 28.56 |
| Bus | 25 | 71.42 | 71.42 | 100.00 |
| Total | 35 | 100.00 | 100.00 | |

**When consided their favorite place for reading the** above tables shows90 students (65.69%) were favorite for reading at house. Followed by library

36 (26.27%), bus 1 (0.72%) and class room 10 (7.29%)

Sources of reading (Table 2)

**Rathnawali**

| | Frequency | Percentage | Valid Percentage | Cumulative Percentage |
|---|---|---|---|---|
| News paper | 6 | 17.14 | 17.14 | 17.14 |
| Journal | 2 | 5.71 | 5.71 | 22.85 |
| Novel | 22 | 62.85 | 62.85 | 85.7 |
| Text book | 5 | 14.28 | 14.28 | 100.00 |
| Total | 35 | 100.00 | 100.00 | |

**Dehiowita**

| | Frequency | Percentage | Valid Precentage | Cumulative Precentage |
|---|---|---|---|---|
| News paper | 13 | 37.14 | 37.14 | 37.14 |
| Journal | 1 | 2.85 | 2.85 | 39.99 |
| Novel | 10 | 28.57 | 28.57 | 68.56 |
| Text book | 11 | 31.42 | 31.42 | 100.00 |
| Total | 35 | 100.00 | 100.00 | |

**Imbulana**

| | Frequency | Percentage | Valid Precentage | Cumulative Precentage |
|---|---|---|---|---|
| News paper | 17 | 25.37 | 25.37 | 25.37 |
| Journal | 4 | 5.97 | 5.97 | 31.34 |
| Novel | 31 | 46.26 | 46.26 | 77.6 |
| Text book | 16 | 23.88 | 23.88 | 100.00 |
| Total | 67 | 100.00 | 100.00 | |

**When considered their sources of reading totally the** above tables appeared majority of students are reading novel 63 (45.98%). Followed by journal 7 (5.10%), newspaper 36 (26.27%), text book 32 (23.35%) respectively.

Reading hours for a day (Table 3)

**Rathnawali**

| | Frequency | Percentage | Valid Precentage | Cumulative Precentage |
|---|---|---|---|---|
| 1 hour | 6 | 17.4 | 17.4 | 17.4 |
| 1.3 hour | 16 | 45.71 | 45.71 | 62.85 |
| 3.5 hour | 11 | 31.42 | 31.42 | 94.25 |
| more than 5 hour | 2 | 5.71 | 5.71 | 100.00 |
| Total | 35 | 100.00 | 100.00 | |

**Dehiowita**

| | Frequency | Percentage | Valid Precentage | Cumulative Precentage |
|---|---|---|---|---|
| 1 hour | 21 | 60.0 | 60.0 | 60.0 |
| 1.3 hour | 12 | 34.28 | 34.28 | 94.28 |
| 3.5 hour | 1 | 2.85 | 2.85 | |
| more than 5 hour | 1 | 2.85 | 2.85 | 100.00 |
| Total | 35 | 100.00 | 100.00 | |

**Imbulana**

| | Frequency | Percentage | Valid Precentage | Cumulative Precentage |
|---|---|---|---|---|
| 1 hour | 33 | 49.3 | 49.3 | 49.3 |
| 1.3 hour | 12 | 17.9 | 17.9 | 67.2 |
| 3.5 hour | 17 | 25.4 | 25.4 | 92.5 |
| more than 5 hour | 5 | 7.5 | 7.5 | 100.00 |
| Total | 67 | 100.00 | 100.00 | |

**When considered the time spent for reading** the majority of students spent time one hour – 60 (43.79%) for reading per day. One to three hour 40 (29.19%), three to five hour 29 (21.16%), more than five hour 8 (5.83%).

Favorite time for reading (Table 4)

**Rathnawali**

| | Frequency | Percentage | Valid Precentage | Cumulative Precentage |
|---|---|---|---|---|
| Morning | 13 | 37.14 | 37.14 | 37.14 |
| Afternoon | 2 | 5.71 | 5.71 | 42.85 |
| Evening | 9 | 25.71 | 25.71 | 68.56 |
| Night | 11 | 31.42 | 31.42 | 100.00 |
| Total | 35 | 100.00 | 100.00 | |

**Dehiowita**

| | Frequency | Percentage | Valid Precentage | Cumulative Precentage |
|---|---|---|---|---|
| Morning | 17 | 25.4 | 25.4 | 25.4 |
| Afternoon | 12 | 17.9 | 17.9 | 43.3 |
ජාතික ඩිජිටල් පුස්තකාලය සංඛ්‍යාංකකරණය කිරීමේදී OCR ප්‍රමිතිය භාවිත කරයි. OCR යනු යතුරුලියනය කරන ලද හෝ මුද්‍රණය කරන ලද පෙළ කේතාංකනය මගින් විද්‍යුත් පරිවර්තනයට ලක් කිරීමයි. පෙළෙහි භාෂාමය විශ්ලේෂණය මෙමගින් පහසු වේ. වඩාත් සංකීර්ණ සෙවුම් සහ වාක්‍යයක කොටස් ගවේෂණයේ දී OCR ප්‍රමිතිය පරිශීලකයාට වැදගත් වේ.

උසස් ආකෘති නිර්මාණය කිරීම සඳහා ජාතික ඩිජිටල් පුස්තකාලය DPI (Dots per Inch) ප්‍රමිතිය භාවිත කරයි. මේ අනුව සංඛිත සම්පත් සියල්ලක්ම DPI 300 ඝනත්වයකින් ලබාගනී. එමගින් අදාළ ලේඛනවල පැහැදිලි පිංතූරයක් (image) ලබාගත හැක.

සාමාන්‍යයෙන් ග්‍රන්ථයක් පෙළ, පිංතූර සහ ප්‍රස්තාර ආදියෙන් යුක්ත වේ. සංඛ්‍යාංකකරණයේදී මෙම තොරතුරු පැහැදිලි නොවන අවස්ථා දක්නට ලැබේ. එහිදී සංඛිත ලේඛන සංස්කරණය කිරීමට සිදු වේ. මුල්පිටපත සමඟ පරීක්ෂා කර යම් යම් විෂමතා තිබේ නම් ඒවා නිවැරදි කළ යුතුයි. මේ සඳහා ජාතික පුස්තකාලය ABBYY Fine Reader 12 Professional යන මෘදුකාංගය භාවිත කරයි. රූපවල පැහැදිලි බව, ලේඛනයේ පැහැදිලි බව, පිරිසිදු බව, වර්ණයන් පරීක්ෂා කර අනවශ්‍ය පැල්ලම්, ලකුණු ආදිය ඉවත් කිරීම මෙම මෘදුකාංගය මගින් සිදු කරයි.

සංඛිත ලේඛන TIFF සහ PDF ආකෘතියෙන් ජාතික ඩිජිටල් පුස්තකාලය සඳහා ලබාගනී. TIFF යනු සංඛ්‍යාංකකරණය කරන ලද පිටපතේ High Resolution Format යන්නයි. ජාතික ඩිජිටල් පුස්තකාලය මෙම ගොනු සංරක්ෂණ පිටපතක් වශයෙන් ගබඩාකර ගනී. PDF යනු Portable Document Format යන්නයි. දත්ත වෙනස් වීමකින් තොරව එහා මෙහා ගෙන යාහැකි වීම මෙහි ඇති විශේෂ වාසියයි. පිංතූර (image) සඳහා TIFF සහ JPG ආකෘති භාවිත කරනු ලැබේ. ශ්‍රව්‍ය තොරතුරු සංඛ්‍යාංකකරණයේදී WAV, MP3 ආකෘති ද, දෘශ්‍ය තොරතුරුවලදී AVI “ MPEG ආකෘති භාවිත කර ඇත.

ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු (Metadata) ලේඛනවලට වෙන වෙනම ගවේෂණය සඳහා පහසුවන ආකාරයට ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු සැකසීම සිදු කළ යුතු වේ. ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු සඳහා සම්මතකරණය ලෙස Dublin core යොදාගනී.

**සංඛිත යුගයේ එකතු කිරීමේ සංකල්ප**

සංඛිත යුගයේ එකතු සංවර්ධනය කිරීම ප්‍රවේශය මත පදනම් වූ මානයන් හතරකින් යුක්ත වේ. පුස්තකාලය සතු භෞතික සම්පත්, පුස්තකාලය සතු අස්පර්ශනීය සම්පත්, අනෙකුත් පුස්තකාල සතු භෞතික සම්පත් සහ අනෙකුත් පුස්තකාල සතු අස්පර්ශනීය සම්පත් වශයෙන් වේ (Gorman, 2003).

පුස්තකාලය සහ එකතු සංවර්ධනය යන්නෙහි අර්ථ දැක්වීම වෙන වෙනම කළ හැකි වුවත් ඒවා සැමවිටම ප්‍රවේශය යන සංකල්පය සමග බැඳී ඇත (Young, 1983).

**අධ්‍යයනයේ අරමුණු**

1. පරිශීලක අවශ්‍යතාවය සපුරාලීමට ජාතික පුස්තකාලයේ සංඛිත එකතුව සකස්විය යුතු ආකාරය සොයාබැලීම
2. සංඛිත සම්පත් සංවර්ධනය සම්බන්ධ ගැටලු සහ අභියෝග හඳුනාගැනීම

**ක්‍රමවේදය**

නිරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා, පසුගිය වර්ෂවල ප්‍රසම්පාදන තොරතුරු සහ ජාතික ඩිජිටල් පුස්තකාලය සතු ලිඛිත තොරතුරු මගින් ප්‍රාථමික දත්ත එක්රැස් කිරීම සිදු කරන ලදී.

**දත්ත විශ්ලේෂණය**

**සංඛිත එකතු සංවර්ධන කටයුතු**

සංඛිත තොරතුරු රැස්කිරීම සහ සංඛ්‍යාංකකරණය සම්බන්ධයෙන් පැහැදිලි ප්‍රතිපත්තියක් ජාතික පුස්තකාලය සතුව නොමැති වුවද සංඛිත එකතුව සඳහා සම්පත් ගොඩනැගීම නිරන්තරයෙන් සිදුවී ඇත.

1 වගුව -ශ්‍රව්‍ය දෘශ්‍ය සම්පත් සංඛ්‍යාංකකරණ තොරතුරු

| වර්ෂය | වැයකළ මුදල් | පරිවර්තනය | ප්‍රමාණය |
|---|---|---|---|
| 2010 | 131300.57 | VHS to DVD | 48 |
| 2011 | 63000.00 | VHS to DVD | 80 |
| 2012 | 73700.00 | AC to CD | 157 |

2010, 2011 සහ 2012 වර්ෂවලදී සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන අංශය මගින් ජාතික පුස්තකාලයේ ඇති ශ්‍රව්‍ය පට සහ දෘශ්‍ය පට DVD සහ CD පට වශයෙන් සකස් කරන ලදී. 2010 වර්ෂයේදී ජාතික පුස්තකාල එකතුවේ වීඩියෝ පට 48 ක් DVD බවට පත්කරන ලදී. 2011 වර්ෂයේදී වීඩියෝ පට 80 ක් DVD බවට පරිවර්තනය කරන ලදී. 2012 වර්ෂයේදී ශ්‍රව්‍ය පට 157 ක් CD බවට පත්කර ඇත. මෙම ශ්‍රව්‍ය පට 157 ජාතික පුස්තකාලය විසින් එක්රැස් කරන ලද ජනගී වලින් යුක්ත විය. මේවායේ ගොනු ස්වරූපය MP3 සහ Audio වශයෙන් ලබාගෙන ඇත.

2 වගුව - සංඛිත කරන ලද සහ සංඛිත කිරීමට බලාපොරොත්තු වන මුද්‍රිත පෙළ පිටු

| වර්ෂය | පිටු ප්‍රමාණය |
|---|---|
| 2015 | 80000 |
| 2016 | 100000 |
| 2017 | 150000 |
| 2018 | 200000 |

2015 වර්ෂයේ සිට සංඛ්‍යාංකකරණය කරන ලද සහ 2018 වර්ෂයේදී සංඛ්‍යාංකකරණයට යෝජනා වී ඇති මුද්‍රිත පෙළ පහත දැක් වේ. 2015 වර්ෂයේදී පිටු 80000 කින් ඇරඹුණු සංඛ්‍යාංකකරණ ව්‍යාපෘතිය 2016 වර්ෂයේදී පිටු 100000 දක්වාත්, 2017 වර්ෂයේදී 150000 දක්වාත් වැඩිවිය. 2018 වර්ෂයේදී පැරණි ගැසට් එකතුවේ වැඩි පෙළ ප්‍රමාණයක් සංඛ්‍යාංකකරණය කිරීමට බලාපොරොත්තු වේ. දළ වශයෙන් පැරණි ගැසට් එකතුවේ පිටු 700000 - 1000000 අතර ප්‍රමාණයක් ඇතැයි සැලකේ.

1 ප්‍රස්තාරය - සංඛිත කරන ලද සහ සංඛිත කිරීමට බලාපොරොත්තු වන මුද්‍රිත පෙළ පිටු




ප්‍රස්තාරය නිරීක්ෂණය කිරීමෙන් සංඛිත කිරීමට අදාළ සහ සංඛිත කිරීමට බලාපොරොත්තු වන පෙළ සම්බන්ධයෙන් පැහැදිලි අවබෝධයක් ලබාගත හැකිය. ක්‍රමක්‍රමයෙන් වර්ධනය වන ආකාරයක් පෙන්නුම් කරයි.

4 වගුව - සංඛිත කරන ලද මුද්‍රිත පෙළ වර්ගීකරණය අනුව

| ප්‍රකාශන වර්ගය | පිටු ප්‍රමාණය |
|---|---|
| දුර්ලභ ග්‍රන්ථ | 100317 |
| ජාතික ග්‍රන්ථ නාමාවලි | 39014 |
| පැරණි ගැසට් | 59756 |

දැනට ජාතික පුස්තකාලය මගින් සිදුකර ඇති දුර්ලභ ග්‍රන්ථ, ජාතික ග්‍රන්ථ නාමාවලි සහ පැරණි ගැසට් සංඛ්‍යාංකකරණය කරන ලද පිටු ප්‍රමාණය ඉහත වගුවෙන් දැක් වේ. ජාතික ග්‍රන්ථ නාමාවලිය සංඛ්‍යාංකකරණය අදියර දෙකක් යටතේ සිදුවිය. මේ දක්වා ප්‍රකාශයට පත්කර ඇති සියලුම ජාතික ග්‍රන්ථ නාමාවලි සංඛ්‍යාංකකරණය කර ඇත. ජාතික පුස්තකාලය විසින් දැනට හඳුනාගෙන ඇති දුර්ලභ එකතුවේ පොත් ද සංඛ්‍යාංකකරණය කර ඇත.

ශ්‍රී ලංකා රජයේ ගැසට් එකතුව ජාතික පුස්තකාලය සතු ප්‍රධාන එකතුන්ගෙන් එකකි. මෙම එකතුවේ 1888 සිට 1976 දක්වා සහ මේ දක්වා ජාතික පුස්තකාලයට ලබා ගන්නා ලද ගැසට් අයත් වේ. 1889 සිට 1976 දක්වා ගැසට් විශාල වෙළුම් වශයෙන් බැඳුම් කටයුතු කර ඇත. හංගුර තත්ත්වයට පත්ව ඇති මෙම ගැසට් එකතුව

සංරක්ෂණය කිරීමේ අරමුණෙන් සහ මාර්ගගත ගවේෂණ පහසුකම් ලබාදීම සඳහා ඒවා සංඛ්‍යාංකකරණය කිරීම ආරම්භ කර ඇත. ඒ සඳහා පහත ආකාරයෙන් මුදල් ප්‍රතිපාදන වෙන්කර ඇත. ගැසට් එකතුව සහ ජාතික ග්‍රන්ථ නාමාවලිය සංඛිත කිරීමට ද මෙම ප්‍රතිපාදන යොදා ඇත.

5 වගුව - ගැසට් සංඛ්‍යාංකකරණය සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කිරීම

| වර්ෂය | වෙන් කරන ලද මුදල (රු.) |
|---|---:|
| 2015 | 80000.00 |
| 2016 | 1,000,000.00 |
| 2017 | 1,5000,00.00 |
| 2018 | 2,000,000.00 |

සංඛ්‍යාංකකරණ කටයුතු සඳහා ජාතික පුස්තකාලය වෙන් කර ඇති මුදල් ප්‍රතිපාදන මෙසේය. (5 වගුව) 2014 වර්ෂයේදී සංඛ්‍යාංකකරණයට මුදල් වෙන් කර ඇති නමුත් ඊට අදාළ ගෙවීම් කටයුතු සිදුකර ඇත්තේ 2015 වර්ෂයේදීය. එබැවින් 2015 වර්ෂයේදී මුදල් වෙන් කර නොමැත. 2016 වර්ෂයේදී රු. 1,000,000.00 සහ 2017 වර්ෂයේදී රු. 1,5000,00.00 මුදල් ප්‍රමාණයක් වෙන් කර ඇත. 2018 වර්ෂයේදී රු. 2,000,000.00 ප්‍රතිපාදන වෙන් කිරීමට බලාපොරොත්තු වේ.

2 ප්‍රස්තාරය - සංඛ්‍යාංකකරණය සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කිරීම



6 වගුව - ජාතික විද්‍යා පදනමේ අනුග්‍රහය යටතේ සංඛිත කරන ලද මුද්‍රිත පෙළ

| වර්ෂය | පිටු ප්‍රමාණය | ප්‍රකාශන වර්ගය | ප්‍රමාණය |
|---|---|---|---|
| 2016 | 100000 | දුර්ලභ ග්‍රන්ථ | 328 |
| 2017 | 100000 (යෝජිත) | මණ්ඩලයීය ප්‍රකාශන | ෑ |

ජාතික විද්‍යා පදනම ක්‍රියාත්මක කරන ලද ජාතික සංඛ්‍යාංකකරණ ව්‍යාපෘතියේ අනුග්‍රහය යටතේ ජාතික පුස්තකාලයේ දුර්ලභ ග්‍රන්ථ එකතුවේ පොත් 328 (පිටු 100000) සංඛ්‍යාංකකරණය කරන ලදී. ජාතික විද්‍යා පදනමේ ජාතික සංඛ්‍යාංකකරණ ව්‍යාපෘතියේ මීළඟ අදියර යටතේ මණ්ඩලයීය ප්‍රකාශන සංඛ්‍යාංකකරණය සඳහා පියවර ගෙන ඇත. ඒ අනුව 2017 වර්ෂයේදී ජාතික පුස්තකාලයේ ප්‍රකාශන සංඛ්‍යාංකකරණය කිරීමට නියමිතය.

7 - වගුව විද්‍යුත් දත්ත පදනම් මිලදී ගැනීම්

| වර්ෂය | LISA (රු.) | Law Lanka (රු.) | DELNET (රු.) | CILIP (රු.) |
|---|---|---|---|---|
| 2015 | 4,26,428.00 | 14500.00 | 37275.00 | 96172.00 |
| 2016 | 5,07,250.00 | 14500.00 | 25242.00 | 82000.00 |
| 2017 | 5,39,000.00 | 21216.50 | 25000.00 | - |

ශ්‍රව්‍ය දෘශ්‍ය තොරතුරු සහ මුද්‍රිත පෙළට අමතරව ජාතික පුස්තකාලය මගින් දත්ත සමුදායන් ද මිලට ගනු ලැබේ. LISA - Library and Information Science Abstract දත්ත පදනම ජාතික පුස්තකාලය විසින් 1990 වර්ෂයේදී මිලට ගෙන ඇත. 1990 වර්ෂයේදී මෙම දත්ත පදනම CD වශයෙන් ලැබුණු අතර ඉන්පසු DVD වශයෙන් ද 2009 වර්ෂයේ සිට මාර්ගගත උපහැරණ අනුක්‍රමණිකාවක් වශයෙන් ජාතික පුස්තකාලය මිලදී ගෙන ඇත. 2018 වර්ෂයේදී සම්පූර්ණ පෙළ සහිත පුස්තකාල හා විඥාපන විද්‍යා මාර්ගගත අනුක්‍රමණිකාවක් ලබාගැනීමට අදහස් කර ඇත. ඊට අමතරව රජයේ ප්‍රකාශන සඳහා Law Lanka දත්ත පදනම සහ DELNET සහ (Developing Library Network) CILIP (Charted Institute of Library and Information) දත්ත පදනම් ද මිලදී ගෙන ඇත. නමුත් භාවිතය අවම වීම හේතුවෙන් CILIP දත්ත පදනම සඳහා ගෙවීම් 2017 වර්ෂයේ දී අත්හිටුවා ඇත.

7 - වගුව - DVD මිලදීගැනීම්

| වර්ෂය | DVD ප්‍රමාණය | ප්‍රතිපාදන |
|---|---|---|
| 2015 | 19 | 1385.00 |
| 2016 | 189 | 170105.00 |
| 2017 - ජුනි | 75 | 33750.00 |

ජාතික ඩිජිටල් පුස්තකාලයට 2015 වර්ෂයේ සිට මිලදීගත් DVD ප්‍රමාණය ඉහත දැක් වේ. 2015 වර්ෂය වන විටත් ජාතික පුස්තකාලය සතුව දහසකට අධික ශ්‍රව්‍ය දෘශ්‍ය එකතුවක් පැවතිණි.

ජාතික ඩිජිටල් පුස්තකාලය National Geographic සඟරාව මිලදීගනු ලැබේ. මුද්‍රිත ස්වරූපයෙන් ප්‍රකාශිත මෙම සඟරාව නූතනයේ ප්‍රකාශ වන්නේ විද්‍යුත් සඟරාවක් ලෙසයි.

ජාතික ඩිජිටල් පුස්තකාලය තොරතුරු සන්නිවේදන ධාරිතාව වැඩි කරමින්, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා 2017 වර්ෂයේදී යටිතල පහසුකම් වෙනුවෙන් රු. මිලියන 4.5 වෙන්කර ඇත.

**ගැටලු සහ අභියෝග**

සියලු සංඛිත අන්තර්ගතයන්වල බුද්ධිමය තාක්ෂණික සහ සංස්කෘතික අභියෝග මෙන්ම තාක්ෂණික ක්‍රියාවලිය, පිරිස් බලය, මූල්‍ය සම්පත්, සංරක්ෂණය, ප්‍රකාශන හිමිකම් නීතිය, බුද්ධිමය දේපළ පනත පිළිගැනීම සහ යටිතල පහසුකම් සංඛිත පුස්තකාලය ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාමේදී මුහුණදීමට සිදුවන ගැටලු සහ අභියෝග වේ. සංඛිත සම්පත්වල විවිධ ආකෘති ද ගැටලු මතු කරන අවස්ථා ඇත (Partha & Others, 2012). එම සටහන ආශ්‍රයෙන් ජාතික ඩිජිටල් පුස්තකාලයට මුහුණදීමට සිදුවූ අභියෝග සහ ගැටලු පිළිබඳව සාකච්ඡා කෙරේ. මෙම කරුණුවලට ආදාළව ජාතික පුස්තකාලය මුහුණ දුන් අභියෝග සහ ගැටලු ඩිජිටල් පුස්තකාලයට අදාළ ලිඛිත තොරතුරු ආශ්‍රයෙන් ලබාගන්නා ලද අතර ඩිජිටල් පුස්තකාලයට අදාළ ව වත්මන් තත්ත්වය මෙහිදී විග්‍රහ කෙරේ.

**තාක්ෂණික ක්‍රියාවලිය** - එකතු සංවර්ධනය පිළිබඳ වැදගත්ම ගැටලුවක් වන්නේ

තාක්ෂණික ක්‍රියාවලියයි. ජාතික ඩිජිටල් පුස්තකාලය සතුව පරිගණක රාශියක් ඇත. (Acer , RAM 4 GB, Intel 2,30 GHz). නමුත් සංඛිත පුස්තකාලය සමස්ත අරමුණු ඔස්සේ මෙහෙය වීමට දෘඪාංග, මෘදුකාංග මෙන්ම අධිවේගී ජාල පහසුකම් ද අත්‍යවශ්‍යය වේ. මෘදුකාංගය ස්ථාපනය කිරීමේදී සහ පරිශීලකයාට පහසුවෙන් ප්‍රවේශ විය හැකි ආකාරයෙන් තොරතුරු වර්ගීකරණය විශාල අභියෝගයක් විය. මෙහිදී විශේෂයෙන්ම ජාතික විද්‍යා පදනම, ජාතික පුස්තකාලයේ තොරතුරු තාක්ෂණ අංශය සමග එකතු වීම මගින් එම කටයුතු සාර්ථක කර ගන්නා ලදී. එසේම සංඛ්‍යාංකකරණ කටයුතු වලදී ද කාර්ය මණ්ඩලයට විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදුවිය. ජාතික පුස්තකාලයේ සංඛ්‍යාංකකරණ කටයුතු බාහිර ආයතනයක් මගින් සිදුකරනු ලැබේ. ජාතික ඩිජිටල් පුස්තකාලයේ අවශ්‍යතාවයන් අනුව එම ආයතනය මගින් සංඛාංකකරණ කටයුතු සිදුකරනු ලැබේ. එසේම සර්ව පහසුකම් නොමැති වීම සහ නීතිමය සාධක හේතුවෙන් පාඨකයාට දුරස්ථ ප්‍රවේශයන් ලබාදීම අපහසු විය.

**සංඛිත සම්පත් තෝරාගැනීම** - සංඛිත පුස්තකාලයට සම්පත් තෝරාගැනීම වඩාත් ගැටලු සහගතය. විද්‍යුත් සම්පත් බොහෝවිට භෞතික නොවන ස්වරූපයෙන් ලබා ගැනීමේදී ජාතික ඩිජිටල් පුස්තකාලය සංකීර්ණ ගැටලුවලට මුහුණපායි. ඒවායේ ප්‍රමිතිය, කල්පැවැත්ම, ගුණාත්මකභාවය, අව්‍යාජභාවය සහ විශ්වාසනීයත්වය ප්‍රධාන ගැටලු වේ. ජාතික පුස්තකාල සම්පත් සංඛ්‍යාංකකරණයේදී සහ සම්පත් තෝරා ගැනීමේ දී ප්‍රකාශන අයිතිය ඇතුළු අනෙකුත් සම්බන්ධිත නීතිරීතිවලට අනුකූලව ක්‍රියා කළ යුතු වේ. එබැවින් සම්පත් තේරීම ඉතා සංකීර්ණ ගැටලුවකි.

**පිරිස් බලය** - සංඛිත පුස්තකාල ක්ෂේත්‍රයට බලපාන තවත් ප්‍රධාන අභියෝගයක් වූයේ කාර්යක්ෂම සහ ගුණාත්මක සේවයක් ලබාගත හැකි සේවක පිරිසක් නොමැති වීමයි. සමාජය මුද්‍රිත පරිසරයේ සිට සංඛිත පරිසරය දක්වා ගමන් කිරීමේදී එම තත්ත්වයට මුහුණ දීමට ජාතික පුස්තකාලයට අවශ්‍ය වූ බැවින් 2005 වසරේ සිටම ඊට අවශ්‍ය පසුබිම සකස් කර ඇත. නමුත් එම කටයුතු සාර්ථක කර ගැනීමට අවශ්‍ය නිලධාරීන්ගේ ඌනතාවය නිසා ජාතික ඩිජිටල් පුස්තකාලයේ කටයුතු මන්දගාමී විය. ඩිජිටල් පුස්තකාලයේ කටයුතු සඳහා ස්ථිර කාර්ය මණ්ඩලයක් ලබා දී ඇත්තේ 2017 වර්ෂයේදීය.

**මූල්‍ය සම්පත්** - ශ්‍රී ලංකාවේ පුස්තකාල ක්ෂේත්‍රයට පොදු වූ ගැටලුවක් ලෙස මෙය

හඳුන්වා දිය හැක. සෘජු ප්‍රතිපාදන ලබාගැනීම දුෂ්කර බැවින් බාහිර ව්‍යාපෘති වශයෙන් ක්‍රියාත්මක වී ඩිජිටල් පුස්තකාලයේ කටයුතු විධිමත් කර ගැනීමට ජාතික පුස්තකාලය උත්සාහ දරා ඇත. මෙහිදී යම් යම් බාහිර ව්‍යාපෘති සඳහා වෙනත් ආයතන සමඟ සම්බන්ධ වීමට සිදුවිය.

**සංරක්ෂණය** - සංඛිත සම්පත් සංරක්ෂණය පුස්තකාල මුහුණ දෙන තවත් අභියෝග යකි. කවර ආකාරයකින් හෝ ලැබෙන ලේඛන සංරක්ෂණය පුස්තකාලයක ප්‍රධාන කාර්යයක් වේ. වේගවත් ලෙස වෙනස්වන තාක්ෂණයේ බලපෑම සමඟ සංඛිත ලිපි, ලේඛන සංරක්ෂණය සඳහා වන කාර්යය දුෂ්කරය. ඒවායේ වේගවත් යල්පැනීමේ ස්වභාවය පුස්තකාල හමුවේ ඇති ප්‍රධාන අභියෝගයකි. ජාතික ඩිජිටල් පුස්තකාලයේ ද විවිධාකාර සංඛිත සම්පත් ඇත. සංඛිත සම්පත් අහිමි වීම ද ප්‍රධාන ගැටලුවක් ලෙස හැඳින්විය හැක.

**ප්‍රකාශන හිමිකම් නීතිය / බුද්ධිමය දේපළ පනත** - සංඛිත පුස්තකාල හමුවේ ඇති වෙනස්ම ආකාරයක ගැටලුවකි. ලිපි ලේඛන සංඛ්‍යාංකකරණයට පෙර ඒ සඳහා අවසර ලබාගත යුතුය. අතිදුෂ්කර කාර්යයක් වන්නේ එයයි. එසේම සංඛිත පුස්තකාලය මගින් පාඨක ප්‍රවේශ ලබාදීම සීමාකිරීම ද මෙමගින් සිදු වේ. සංඛිත සම්පත් තේරීමේ සිට පරිශීලක ප්‍රවේශය දක්වා ම මෙම ගැටලුවට මුහුණ දීමට සිදු වේ.

**පිළිගැනීම** - පුස්තකාලයාධිපති හෝ පරිශීලකයා තවමත් සම්පූර්ණයෙන්ම මුද්‍රිත මාධ්‍ය වෙනුවට විද්‍යුත් මාධ්‍ය යොදාගැනීම පිළිබඳ විශ්වාස නොකරයි. පාඨකයාට විද්‍යුත් තොරතුරු ලබාගැනීම පහසුවකි. කෙසේ වෙතත් පර්යේෂණ ප්‍රජාව විශේෂයෙන් කාර්යක්ෂමතාවය, කාලය ඉතිරි කර ගැනීම සහ තොරතුරුවල නවතාවය සඳහා විද්‍යුත් තොරතුරු භාවිතා කරයි. නමුත් නීතිමය පසුබිමකදී විද්‍යුත් තොරතුරුවල වැදගත්කම ශ්‍රී ලාංකික සන්දර්භය තුළ ගැටලු සහගතය.

**යටිතල පහසුකම්** - සේවා පරිගණක, මෘදුකාංග සහ දෘඩාංග, ජාල පහසුකම්, අධිවේගී අන්තර්ජාල පහසුකම්, අවකාශය ආදී වශයෙන් මූලික යටිතල පහසුකම් සංඛිත පුස්තකාලය ගොඩනැගීමේදී අවශ්‍යම වේ. ජාතික සංඛිත පුස්තකාලය අවම පහසුකම් යටතේ ගොඩනැගුණු අතර 2017 වර්ෂයේ දී යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට පියවර ගෙන ඇත. පාඨක සේවා සැපයීමේ කාර්යක්ෂමතාවය සහ අන්තර්ජාල ප්‍රවේශ පහසුකම් සැලසීමට මෙනිසා අපහසු වී ඇත.

## නිගමන සහ යෝජනා

### නිගමන

දත්ත සමුදායන් මිලදී ගැනීම, විද්‍යුත් සම්පත් මීලදී ගැනීම මෙන්ම සංඛ්‍යාංකකරණ කටයුතු සඳහා ද ජාතික පුස්තකාලය 2005 වර්ෂයේ සිට අවධානය යොමුකර ඇත. ජාතික ඩිජිටල් පුස්තකාලය වශයෙන් නොවූවද 2005 වසරේ සිට ඊට අදාළ කටයුතු සිදුකර ඇත. සංඛිත තොරතුරු යුගයට පිවිසීමේදී ජාතික පුස්තකාලයේ මෙම ආරම්භය සාර්ථක බව තීරණය කළ හැක. නමුත් 2017 වර්ෂය වන තුරු පාඨක ප්‍රවේශ පහසුකම් සම්බන්ධයෙන් ප්‍රගතියක් පෙන්වා නොමැති බව නිගමනය කළ හැකිය. එයට හේතුවන්නට ඇත්තේ තීරණ ගැනීමට පැහැදිලි සන්ධාන ව්‍යුහයක් ස්ථාපිතව නොතිබීමයි. 2005 වර්ෂයේ සිටම ජාතික ඩිජිටල් පුස්තකාලයට අදාළ කාර්යයන් අංශ රාශියකින් සිදුවී ඇති නමුත් එහි සම්පූර්ණ වගකීම ගැටලු සහගතය. සංවර්ධනය වෙමින් පවතින රටවල් මුහුණපාන ප්‍රධාන ගැටලුවක් වන පුහුණු මිනිස් ශ්‍රමය මෙහිදී ද ගැටලුවක් වී ඇති බව පෙනේ. ජාතික ඩිජිටල් පුස්තකාලයේ කටයුතු සඳහා ප්‍රමාණවත් සහ නිත්‍ය කාර්ය මණ්ඩලයක් නොසිටීමද මෙම පසුබෑමට හේතු ලෙස පෙන්වාදිය හැක.

විශ්ලේෂිත තොරතුරු අනුව සංඛිත සම්පත් වර්ධනයට වෙන් කරන ප්‍රතිපාදන වැඩි වීමක් දක්නට ඇත. අධ්‍යයනයට තෝරාගෙන ඇත්තේ 2015 වර්ෂයේ සිට සංඛ්‍යාංකකරණයට වෙන්කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණයයි. ඒ අනුව ජාතික පුස්තකාලයේ එකතු සංවර්ධන ස්වභාවය වෙනස් වෙමින් පවතින බව නිගමනය කළ හැක.

සංඛිත එකතු සංවර්ධනය යන්න ප්‍රායෝගික දැනුම, නව අර්ථකථන සහ අත්දැකීම් වල සම්මිශ්‍රණයක් ලෙස වෙනස් වී ඇත. ජාතික ඩිජිටල් පුස්තකාලයේ සම්පත් විමර්ශනය කිරීමේදී පෙනී යන්නේ එහි සම්පත් යම් රාමුවකට සීමා වී ඇති බවයි. සංඛිත සම්පත් පුළුල් පරාසයක පවතී. ජාතික ඩිජිටල් පුස්තකාලය තුළ එම පුළුල් භාවය විද්‍යමාන වුවත් සම්පත්වල සීමිත බවක් සහ විද්‍යුත් පොත් ආදිය නොමැති බව ද නිරීක්ෂණය වේ. විද්‍යුත් සඟරා ද ඇත්තේද කීපයකි.

යටිතල පහසුකම් සංවර්ධනය සඳහා 2017 වර්ෂයේදී ප්‍රතිපාදන වෙන්කර ඇත. එමගින් ජාතික ඩිජිටල් පුස්තකාලය කෙරෙහි යම් මට්ටමක අවධානයක් යොමුවී ඇති බව පෙනීයයි.

සංඛිත තොරතුරු රැස් කිරීම සහ සංඛ්‍යාංකකරණයට පැහැදිලි ප්‍රතිපත්තියක් නොමැති වීම සහ සංඛ්‍යාංකකරණය, සංඛිත සම්පත් තේරීම මෙන්ම පාඨක සේවාව සැපයීමේදී ද සැබෑ බාධකයක් ලෙස ප්‍රකාශන හිමිකම් නීතිය ක්‍රියාත්මක බව නිගමනය කළ හැක.

ජාතික පුස්තකාලය මගින් සංඛ්‍යාංකකරණය කරන ලද තොරතුරු සම්පත් අධ්‍යයනයේ දී පෙනී යන්නේ රටේ සංස්කෘතික උරුමය ව්‍යාප්ත කිරීම සහ ආරක්ෂා කිරීමට සුදුසු එක් ක්‍රමයක් වන්නේ සංඛ්‍යාංකකරණය බවයි.

**යෝජනා**

ජාතික ඩිජිටල් පුස්තකාල කටයුතු සම්බන්ධයෙන් තීරණ ගැනීමට පැහැදිලි සංවිධාන ව්‍යුහයක් තිබීම වැදගත් බව පළමු යෝජනාව වශයෙන් ඉදිරිපත් කෙරේ. ජාතික පුස්තකාලය සංඛිත සම්පත් රැස් කිරීමක් සිදු කළා වුවද නිසි අයුරින් පාඨකයා වෙත යොමු වීමක් සිදුවී නැත. එනිසා ජාතික ඩිජිටල් පුස්තකාලය සම්බන්ධයෙන් කටයුතු කිරීමට හැකි නිසි නෛතික රාමුවක් හඳුන්වා දිය යුතු වේ.

ඉලක්ක පාඨක පිරිස හඳුනාගත යුතුය. පැහැදිලිව සහ පහසුවෙන් සැරිසරන පාඨක ප්‍රවේශ මුහුණතක් නිර්මාණය මගින් සංඛිත තොරතුරුවලට ප්‍රවේශය පුළුල් කළ යුතුය. දැනට භාවිත පාඨක ප්‍රවේශ මුහුණතේ යෝග්‍යතාව ඇගයීම මගින් මෙම වෙනස සිදු කිරීම සහ එමගින් පරිශීලක අවධානය යොමුකර ගත යුතු වේ.

ඉදිරියේදී විශාල පරිමාණයේ සංඛිත ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. අභ්‍යන්තර අරමුදල් සොයා ගැනීමේ දුෂ්කරතා ඇත්නම් සහයෝගිතාව මගින් සංඛිත තොරතුරු ප්‍රමාණය වර්ධනය කරගත යුතු වේ. පාඨකයා වෙත පුළුල් පරාසයක තොරතුරු සැපයීම සඳහා තොරතුරු සංඛ්‍යාංකකරණය මෙන්ම සංඛිත තොරතුරු ලබාගැනීම කෙරෙහි ප්‍රතිපාදන වෙන් කිරීම සුදුසු වේ.

ජාතික ඩිජිටල් පුස්තකාලයේ කාර්යයන් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ දැක්ම සහ මෙහෙවරෙහි අංගයක් ලෙස තිබිය යුතුය. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ කාර්යයන්, මෙහෙවර හෝ දැක්මෙහි සංඛිත සම්පත් පිළිබඳව පුළුල්ව සඳහන් වී නොමැත. ඉදිරියේ දී ජාතික ඩිජිටල් පුස්තකාලය පිළිබඳව ද පුළුල් නිර්නායක තිබීම වැදගත්ය.

විද්‍යුත් සම්පත් සහ දත්ත පදනම් අත්පත් කරගැනීමට නව ක්‍රමවේදයන් හඳුනාගත යුතුය. සමබර සංඛිත සම්පත් එකතුවක් ගොඩනැංවීමට ක්‍රියාත්මක විය යුතුය. විශ්ලේෂිත දත්ත අනුව පෙනී යන්නේ විද්‍යුත් සඟරා, විද්‍යුත් පොත් ආදිය ජාතික ඩිජිටල් පුස්තකාලය සතුව නොපවතින බවයි. ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට යෝජනා කෙරේ.

තිරසාර සහ වටිනා සංඛිත සම්පත් එකතුවක් ගොඩනැගීම සඳහා තාක්ෂණ විශාරදයින් තෝරා ගැනීම සහ විශේෂඥ සැලසුම් භාවිත කළ යුතු වේ. එමගින් මෘදුකාංග, සංඛිත සම්පත් සහ තාක්ෂණයේ වෙනස් වීමට මුහුණ දීමට හැකියාව ලැබේ. නවීන ආකාරයේ සම්පත් භාවිතය හා අවබෝධය අවශ්‍යය. විවිධාකාර ආකෘති හඳුනාග ැනීම, ඇගයීම සහ තෝරාගැනීම සඳහා නව නිපුණතා වැඩිදියුණු කිරීම අඛණ්ඩව කිරීම වැදගත් වේ. නිලධාරීන් විවිධ පුහුණු වැඩසටහන්වලට යොමු කිරීම මගින් අභියෝගය ජය ගැනීමට ජාතික පුස්තකාලය උත්සාහ කළ යුතුව ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ


1. Brennan, M. A. (1991), ˜Trends & issues in library & information science 1990. ERIC Digest'˜ Syracuse, NY : ERIC Clearinghouse on Information Resources. (ED 340 389)

2. Cogswell (J). The organization of Collection Management functions in academic research libraries. (J Acad Librarianship 13; 1987 ; 268-76

3. Demas, S. (1994) Collection development for the electronic library : A conceptual and organizational model. "Library Hi-Tech," 12(3), 71-80. (EJ 491 520)

4. Gorman, M (2003), Collection development in interesting times( A summary. Library Collections, Acquisitions, and Technical Services, 27, 459-462.

5. LaGuardia, C. & Bentley, S. (1992) July) Electronic databases : Will old collection development policies still work? "Online"˜ 16(4), 60-63. (EJ 447 462)

6. Marchionini, G. (1998) \. Digital Library Research and Development. In A. Kent (Ed.) Encyllopedia of Library and Information Science. Vol 63, Supplement 26. NY : Marcel Dekker. 259-279.

7. Partha Sarathi, Jena Sudhir Kumar and Chandra Das Kailash. Collection Development for a Academic Library in the Digital Age. Asian Academic Research Journal of Social Sciences & Humanities vol. 1, issu 2, Aug. 2012

8. Shad, J. G. (1992, March). The future of collection development in an era of fiscal stringency : A symposium. "Journal of Academic Librarianship," 18(1), 4-16 (EJ 443 408)

9. Young, H. (Ed.) (1983). The ALA Glossary of Library and Information Science. Chicago:American Library Association.

# කියවීම ප්‍රවර්ධනය කෙරෙහි විෂය විශේෂ කියවීම් කඳවුරුවල බලපෑම පිළිබඳ අධ්‍යයනයක්
# (ඌව පළාතේ තෝරාගත් පාසල් කිහිපයක විද්‍යා විෂය කියවීම් කඳවුරු ඇසුරින්)

එම්. කේ. එම්. අසිත සඳරුවන්
අධ්‍යක්ෂ
ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලය, බදුල්ල

National Library Research Symposium 2017

**සාරාංශය**

1997 වර්ෂයේ දී හඳුන්වා දෙන ලද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා තුළින් පාසල් පුස්තකාල ක්ෂේත්‍රයේ පිබිදීමට අවශ්‍ය ප්‍රස්තුත නිර්මාණය විය. එනම් පුස්තකාලය, පුස්තකාලය හා ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම, ගුරු පුස්තකාලයාධිපති භූමිකාව හඳුන්වා දීම, අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පුස්තකාල සංවර්ධන ඒකකයක් ඇතිවීම, කොළඹ විශ්වවිද්‍යාලයේ ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය ඇතිවීම ආදිය ප්‍රධාන වී ඇත. මේ තුළින් පාසල් පුස්තකාල ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයට විවිධවැඩසටහන් නිර්මාණය කොට ක්‍රියාත්මක කෙරිණ. මෙහිදී තොරතුරු මූලාශ්‍ර වෙත නිසි ලෙස ප්‍රවේශ වීමටත්, තොරතුරු ඇගයීම හා භාවිත කිරීමට අවශ්‍ය කුසලතා ගොඩ නගාගැනීමටත් අවශ්‍ය පහසුකම් සපයා ඇත. ඒ අතර 2005 දී දකුණු හා ගිනිකොණ දිග ආසියාවේ රටවලට ගැළපෙන තොරතුරු සාක්ෂරතා ආදර්ශකයක් ලෙස සවිබලකරණය 8 ආදර්ශය ඉදිරිපත් කිරීම ද සිදු කෙරිණි. මේ පිළිබඳව කලාප හා පාසල් පුස්තකාල භාර නිලධාරීන් විවිධ මට්ටමෙන් පුහුණු කරන ලදී. තව ද පළාත් මට්ටමෙන්, කලාප මට්ටමෙන් හා පාසල් මට්ටමෙන් පවත්වන ගුරු හා ශිෂ්‍ය කියවීම් ප්‍රවර්ධන වැඩසටහන් වලදී ද මෙම ආදර්ශය හඳුන්වා දුණි. ශිෂ්‍ය කියවීම් කඳවුරු එක් එක් විෂයන්ට සුවිශේෂ කර පැවැත්වීමට මෙම ආදර්ශයේ සංකල්ප ප්‍රයෝජනයට ගැනිණි. මේ පිළිබඳව විද්‍යාත්මකව සොයා බැලීමට අවශ්‍ය ප්‍රවේශය මෙම පර්යේෂණය තුළ අන්තර්ගත ය. මෙම කණ්ඩායම් මගින් ලබා ගන්නා ප්‍රතිචාර සොයා බලා විශ්ලේෂණය කර සවිබලකරණ 8 ආදර්ශයේ නව නිගමන හා යෝජනා ලබා දී ඇත.

**මූලික පද : කියවීම, කියවීම ප්‍රවර්ධනය, කියවීම් කඳවුරු**

**ගැටලුව හා ගැටලුවේ හැඳින්වීම**

මොනරාගල හා බදුල්ල යන දිස්ත්‍රික්ක දෙකින් ඌව පළාත සමන්විත වේ. එහි අධ්‍යාපන කලාප 08 කි. මොනරාගල දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කලාප තුන බිබිල, වැල්ලවාය හා මොනරාගල නම් වේ. බදුල්ල දිස්ත්‍රික්කයේ පස්සර, බදුල්ල, බණ්ඩාරවෙල, වැලිමඩ හා මහියංගණය ලෙස අධ්‍යාපන කලාප 05 ක් ඇත. මෙම සියලුම අධ්‍යාපන කලාප තුළ පාසල් 859 කි. ස්ථිර පුස්තකාල 299 ක් පමණ ද, කියවීම් කාමර 305 ක් ද, ඇති අතර ගුරු පුස්තකාලයාධිපතීන් 214 දෙනෙකු සේවයේ නිරතව සිටී. මෙම ගුරු පුස්තකාලයාධිපතීන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය හා එක්ව සේවාස්ථ ගුරු පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර එහි සඳහන් ප්‍රධාන තේමාව වශයෙන් සවිබලකරණය 8 තොරතුරු සාක්ෂරතා ආදර්ශයේ පහත දැක්වෙන උප මාතෘකා මුල් කර ගන්නා ලදී.

| **සවිබලකරණය 8 ආදර්ශයේ පියවර** | | **උප මාතෘකා** |
|---|---|---|
| 1 | ගැටලුව හඳුනා ගැනීම<br>(ගැටලු විශ්ලේෂණය) | වර්ග කිරීම සාකච්ඡා කිරීම<br>බුද්ධි කලම්භනය සංකල්ප<br>සිතියම් භාවිතය. |
| 2 | ගවේෂණය<br>(මාතෘකාවට අදාළ තොරතුරු<br>සොයා බැලීම) | විවිධ මූලාශ්‍ර හඳුනා ගැනීම<br>හොඳම මූලාශ්‍ර තේරීම හා ප්‍රවේශය. |
| 3 | තොරතුරු තේරීම<br>(අවශ්‍ය තොරතුරු සොයා බැලීම) | සාකච්ඡාව<br>කියවීම, සවන් දීම, බැලීම<br>තොරතුරු මූලාශ්‍ර ඇගයීම<br>සටහන් ගැනීම. |
| 4 | තොරතුරු සංවිධානය<br>(නිර්මාණයට අවශ්‍ය<br>තොරතුරු පෙළ ගැස්වීම) | කාඩ්පත් ක්‍රමය, පත්‍රිකා ක්‍රමය,<br>ලිවීම තොරතුරු විග්‍රහය සංකල්ප<br>සිතියම් KWL plus වැනි ක්‍රම<br>භාවිතය. |

| | | |
|---|---|---|
| 5 | නිර්මාණය<br>(ඉදිරිපත් කළ යුතු ආකෘතිය) | ලිවීම හෝ ඉදිරිපත් කරන ආකෘතිය තේරීම, වගු, ප්‍රස්තාර භාවිතය, සංස්කරණය ඉදිරිපත් කිරීමට සූදානම් කිරීම. |
| 6 | ඉදිරිපත් කිරීම<br>(ඉදිරිපත් කරන ආකාරය සොයා බැලීම) | විවිධ ඉදිරිපත් කරන රටා භාවිතය, ඉදිරිපත් කරන්නේ කාටද යන්න. |
| 7 | තක්සේරුව<br>(ඉදිරිපත් කරන ආකෘතිය ප්‍රතිපෝෂණය) | ස්වයං ඇගයීම, සමපදස්ථ ඇගයීම, ගුරු හා උපදේශනය. |
| 8 | නව අවස්ථා<br>(ප්‍රවර්ධනය කළ යුතු විවිධ අංශ) | සංස්කරණය/සමාලෝචනය/ප්‍රතිපෝෂණය වෙනත් විෂය පද්ධති සොයා බැලීම.<br>හඳුනා ගැනීම |

ඉහත තේමාවන් යටතේ 2013/2015 වර්ෂ සඳහා පළාත් හා කලාප මට්ටමින් පවත්වන ලද පාසල් පුස්තකාල සේවාස්ථ ගුරු පුහුණු වැඩසටහන් පහතින් දැක්වේ.

වගු අංක 1 : පාසල් පුස්තකාල සේවස්ථ ගුරු පුහුණු වැඩසටහන් 2013/2015

| වර්ෂය | පුහුණු වැඩසටහන් | දින ගණන | පුහුණු වැඩසටහන් ගණන | පුහුණු වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 2013 | ගුරු පුස්තකාලයාධිපති (පළාත් මට්ටමෙන්) | 2 | 3 | 165 |
| | ගුරු පුස්තකාලයාධිපති (කලාප මට්ටමෙන්) | 1 | 8 | 240 |
| | ගුරු පුස්තකාලයාධිපති සම්පත්දායක | 3 | 1 | 55 |
| 2014 | ගුරු පුස්තකාලයාධිපති සම්පත්දායක | 2 | 1 | 58 |
| | ගුරු පුස්තකාලයාධිපති (කලාප මට්ටමින්) | 1 | 8 | 245 |
| 2015 | ගුරු පුස්තකාලයාධිපති (කලාප මට්ටමින්) | 1 | 8 | 310 |

මෙම වැඩසටහන්වල දී සහභාගී වූවන්, වැඩසටහන් පිළිබඳ ඇගයීම් වාර්තාවක් සම්පූර්ණ කර දෙන ලදී. අනතුරුව පර්යේෂකයා එම ඇගයීම් වාර්තා විශ්ලේෂණයට භාජනය කරන ලදී. එම විශ්ලේෂිත ප්‍රතිඵලවලින් පහත සඳහන් කරුණු හෙළි විය.

1 උක්ත පුහුණු වැඩසටහන්, පාසල් පුස්තකාල ව්‍යවහාර වැඩසටහන් පවත්වා ගැනීමට ඉතා හොඳ මග පෙන්වීමක් වූ බව

2 වැඩසටහන් ඉතා ප්‍රායෝගික වුව ද පාසල් පද්ධතිය තුළ එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී විදුහල්පති හා ගුරුවරුන්ගෙන් ලැබෙන සහයෝගය මඳ බැවින් මේ පිළිබඳව ඔවුන් දැනුවත් කළ යුතු බව

3 පාසල් පුස්තකාල වැඩසටහන් අධීක්ෂණයට පැමිණෙන අධීක්ෂකවරු ද මෙම විෂය ක්ෂේත්‍රය පිළිබඳ ඇති මඳ අවබෝධය හේතුවෙන් ඔවුන්ගේ අධීක්ෂිත නිගමන පුස්තකාලයාධිපතිවරුන්ගේ පුස්තකාල ක්‍රියාකාර සමග සමපාත නොවීම හේතුවෙන් පරිපාලන ගැටලු මතු වීම. එහෙයින් පුස්තකාල අධීක්ෂකවරුන් සඳහා ද විධිමත් පුස්තකාල පුහුණුවීම් ලබා දිය යුතු බව

4 පාසල්/ගුරු පුස්තකාලයාධිපතිවරයාට විශාල ශිෂ්‍ය සංඛ්‍යාවක් ඇති පාසල් තුළ සවිබලකරණය 8 ආදර්ශය අනුව මෙවැනි ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඉටු කිරීමටත්, ඊට අදාළ තොරතුරු කුසලතා සිසුන් හට ඉගැන්වීමටත් ඉඩ ප්‍රස්තාව ඉතා අඩුය. එහෙයින් අනෙක් ගුරුවරු විසින් ද තොරතුරු කුසලතා

ඉගැන්වීමත්, පැවරුම් ක්‍රියාත්මක කිරීමේ ද විෂය භාර ගුරුවරයා ද පුස්තකාල සමග සම්බන්ධව කටයුතු කිරීමත් වඩාත් ප්‍රායෝගික බව පෙන්වා දී තිබුණි.

උක්ත වැඩසටහන්වලින් අනතුරුව පර්යේෂකයා පාසල් පුස්තකාල අධීක්ෂණ කටයුතුවල නිරත වූ අතර එහිදී ඉහත සඳහන් ප්‍රකාශවල සත්‍ය බව තවදුරටත්

තහවුරු විය. මීට පිළියම් ලෙස කලාප පාසල් පුස්තකාල සම්බන්ධීකාරකවරුන් 2012 වර්ෂයේ ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ දී පවත්වන ලද තෙදින නේවාසික වැඩමුළුවට යොමු කරන ලදී. ඊට අමතරව කලාප මට්ටමින් තෝරා ගන්නා ලද විදුහල්පතිවරුන් සඳහා පළාත් මට්ටමින් පාසල් පුස්තකාල පිළිබඳ දෙදින වැඩමුළු පවත්වන ලදී. තවදුරටත් සිසුන් තුළ තොරතුරු සාක්ෂර කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් කියවීම් කඳවුරු පැවැත්වීම සඳහා වැඩි අවධානයක් යොමු කරන ලදී. ඒ සඳහා ගුරු පුස්තකාලයාධිපතින් හා තෝරාගත් ගුරුවරුන් ගෙන්වා ගෙන සවිබලකරණය 8 ආදර්ශයේ පියවර පාදක කර ගනිමින් කියවීම් කඳවුරු පවත්වන ආකාරය හා ඊට අදාළ පාඩම් සටහන් සකස් කිරීම ප්‍රථමයෙන් සිදු කෙරිණි.

| වර්ෂය | පුහුණු වැඩසටහන් | දින ගණන | පුහුණු වැඩසටහන් ගණන | පුහුණු වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 2013 | කලාප පුස්තකාල සම්බන්ධීකාරක - කොළඹ විශ්වවිද්‍යාලයේ දී | 3 | 1 | 8 |
| 2013 | ගුරු පුස්තකාලයාධිපති සම්පත්දායක | 3 | 1 | 55 |
| | ශිෂ්‍ය කඳවුරු | 1 | 4 | 400 |
| 2014 | ගුරු පුස්තකාලයාධිපති සම්පත්දායක | 2 | 1 | 58 |
| | ගුරු පුස්තකාලයාධිපති හා විෂය භාර ගුරුභවතා | 2 | 1 | 30+30<br>60 |
| | ශිෂ්‍ය කඳවුරු | 1 | 9 | 900 |
| 2015 | ශිෂ්‍ය කඳවුරු | 1 | 8x2 | 1600 |

වගු අංක 2 ඃ කියවීම් කඳවුරු 2013/2015

2012 වර්ෂයේ දී ජාතික මට්ටමේ කියවීම් කඳවුර අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුග්‍රහය යටතේ ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු පුස්තකාල ඒකකයේ මෙහෙයවීමෙන් පවත්වන ලදී. මෙම ආදර්ශ කියවීම් කඳවුරු සවිබලකරණය 8 ආදර්ශය මූලික කොටගෙන එකී ක්‍රියාකාරකම් මෙහෙයවිණි. මේ සඳහා යොදාගත් පැවරුම් හා ක්‍රියාකාරකම් පහත මූලික ව්‍යුහය තුළින් සංවර්ධනය කර භාවිත කරන ලදී. මෙහිදී පවත්වන ලද කියවීම් කඳවුරුවල දි සවිබලකරණය 8 ආදර්ශයේ යෙදීම් පහත ලෙස සුවිශේෂි කර ගැනිණි.

| | | | |
|---|---|---|---|
| 1 | ගැටලු හඳුනා ගැනීම | - | මානසික සිතියම් සැකසීම බුද්ධි කලම්භනය |
| 2 | තොරතුරු ගවේෂණය | - | මුද්‍රිත මාධ්‍ය - පොතක කොටස් හඳුනා ගනිමින් අනුක්‍රමණිකාව හා පටුන භාවිතයෙන් තොරතුරුවලට ප්‍රවේශය. විද්‍යුත් මාධ්‍ය අන්තර්ජාල ලිපිනයන්ගේ (URL) ව්‍යුහය සෙවුම් යන්ත්‍ර භාවිතයෙන් තොරතුරු සෙවීම. |
| 3 | තොරතුරු තෝරා ගැනීම | - | කියවීම් ක්‍රම ශිල්පීය ක්‍රමවේද හා තොරතුරු ඇගයීම් ක්‍රම ශිල්ප හඳුනා ගැනීම. |
| 4 | තොරතුරු සංවිධානය | - | සටහන් ගැනීම හා සටහන් යෙදීම. කතන්දර සිතියම්වල රූපමය නිර්මාණයන් |
| 5 | නිර්මාණය | - | විවිධ තේමා භාවිතය. |
| 6 | ඉදිරිපත් කිරීම | - | රචනා, චිත්‍ර, කථාව, කවි, නාට්‍ය, කාටූන් ආදිය මගින් |
| 7 | ඇගයීම | - | කණ්ඩායම්වලට සහභාගි වූ ගුරුභවතුන් හා අදාළ නිර්ණායක අනුව ඇගයීම සිදු කිරීම. |

ඉහත රාමුවට අදාළව ගුරු පුස්තකාලයාධිපති හා ගුරු භවතුන් ගෙන්වා අදාළ උපදෙස් ලබා දී කියවීම් කඳවුරු සඳහා පාඩම් සටහන් මෙන්ම ශිෂ්‍ය ක්‍රියාකාරකම් පැවරුම් හා පාඩම් සටහන් සම්පත් දායකයන් ලවා අවශ්‍ය සංශෝධන සිදුකර අවසානයේ පොදු පාඩම් සටහන සකසන ලදී. එම පාඩම් සටහන හා පැවරුම් පත් තේමා කර ගනිමින් පළාත් හා කලාප අට තුළ පහත ලෙස කියවීම් කඳවුරු පැවැත්විණි.

| වර්ෂය | ස්ථානය | වැඩසටහන | | සහභාගිත්වය | | දින ගණන |
|---|---|---|---|---|---|---|
| | | ගුරු | ශිෂ්‍ය | ගුරු | ශිෂ්‍ය | |
| 2013 | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | ගුරු | ශිෂ්‍ය | 60 | | 3 |
| | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | ගුරු | | | 100 | 1 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2014 | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | ශිෂ්‍ය | 56 | | 3 |
| | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | ගුරු | | | 100 | 1 |
| | බිබිල කලාපය | | ශිෂ්‍ය | 32 | 60 | 1 |
| | මොනරාගල කලාපය | ගුරු | ශිෂ්‍ය | 32 | 58 | 1 |
| | වැල්ලවාය කලාපය | ගුරු | ශිෂ්‍ය | 33 | 58 | 1 |
| | වැලිමඩ කලාපය | ගුරු | ශිෂ්‍ය | 29 | 60 | 1 |
| | බණ්ඩාරවෙල කලාපය | ගුරු | ශිෂ්‍ය | ජ් | 62 | 1 |
| | මහියංගණය කලාපය | ගුරු | ශිෂ්‍ය | 35 | 60 | 1 |
| | බදුල්ල කලාපය | ගුරු | ශිෂ්‍ය | 32 | 60 | 1 |
| | පස්සර කලාපය | ගුරු | ශිෂ්‍ය | 37 | 57 | 1 |
| 2015 | බිබිල කලාපය | ගුරු | ශිෂ්‍ය | 33 | 75 | 1 |
| | මොනරාගල කලාපය | ගුරු | | 34 | | 1 |
| | වැල්ලවාය කලාපය | ගුරු | | 36 | | 1 |
| | මහියංගණය කලාපය | ගුරු | ශිෂ්‍ය | 30 | 100 | 1 |
| | බදුල්ල කලාපය | ගුරු | | 35 | | 1 |

වගු අංක 3 : කලාප මට්ටමින් කියවීම් කඳවුරු පැවැත්වීම

එම කියවීම් කඳවුරු අවසානයේ දී ශිෂ්‍ය සම්මුඛ සාකච්ඡා තුළින් ද, ගුරු අදහස් හා සාකච්ඡා කිරීම් තුළින් ද, කලාප පුස්තකාල සම්බන්ධීකාරක හා ගුරු උපදේශක නිරීක්ෂණයන්ගෙන් ද, පර්යේෂකයා විසින් සිදු කරන ලද අධීක්ෂණ තුළින් ද, පහත නිගමනවලට එළඹිය හැකි විය.

1 පංති කාමර ඉගැන්වීම් සඳහා කියවීම් කඳවුරුවල ක්‍රියාකාරකම් භාවිතයෙන් පාඩම් ඉගැන්වීම් වඩාත් ඵලදායී බව.

2 සිසුන්ගේ පුස්තකාල පරිහරණයේ වර්ධනයක් පෙන්වා ඇති බව.

3 ගුරු භවතුන් පාඩම් ඉගැන්වීමට ප්‍රථම අවශ්‍ය පූර්ව සැලසුම් පුස්තකාලය ඇසුරෙන් සකසා ගැනීම.

4 සිසුන් පැවරුම් ක්‍රියාත්මක කරන විට වෙනදාට වඩා ඒවායේ නිරත වීමේ ගුණාත්මක බව වර්ධනය වීම.

5 පොදු කියවීම් කඳවුරු වෙනුවට ඒ ඒ විෂය පාදක කරමින් වෙන වෙනම කියවීම් කඳවුරු සිදු කිරීම වඩාත් උචිත බව.

මේ අනුව පර්යේෂකයා මෙම කියවීම් කඳවුරු සංකල්පය පාසල් පද්ධතිය තුළ තවදුරටත් ව්‍යාප්ත කිරීමට විෂය විශේෂිත කියවීම් කඳවුරු ක්‍රියාත්මක කරන්නේ කෙසේ ද යන්න ගැටලුවක් ලෙස මතු කර ගන්නා ලදී. පර්යේෂකයා විද්‍යාවේදී උපාධිධාරියෙකු වීමත්, විද්‍යා විෂයට ලැදිකමක් දක්වීමත් හේතුවෙන් ජාතික හා පළාත් වශයෙන් වැදගත් වන විෂය විශේෂිතයක් ලෙස විද්‍යා විෂය තෝරා ගන්නා ලදී. මේ සඳහා පහත සාහිත්‍යමය ගවේෂණය වඩා හොඳ ප්‍රවේශයක් සැපයීය.

ඌව පළාත තුළ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ සමත්ව උසස් පෙළ විෂය මාලාවට ඇතුළත් වීම පහත ලෙස විග්‍රහ කෙරේ.

| පළාත | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|
| බස්නාහිර | 59.48 | 65.77 | 60.93 | 67.30 | 65.56 |
| මධ්‍යම | 46.57 | 53.39 | 48.46 | 56.51 | 57.59 |
| දකුණ | 52.09 | 57.40 | 53.08 | 60.33 | 62.86 |
| උතුර | 52.82 | 53.51 | 55.71 | 56.93 | 54.26 |
| නැගෙනහිර | 46.79 | 48.81 | 47.46 | 59.46 | 56.38 |
| වයඹ | 54.07 | 59.64 | 53.51 | 62.72 | 62.68 |
| උතුරුමැද | 42.38 | 48.84 | 42.54 | 54.80 | 56.09 |
| ඌව | 41.94 | 47.58 | 43.80 | 52.57 | 54.45 |
| සබරගමුව | 49.6 | 54.84 | 50.33 | 59.40 | 60.44 |

වගු අංක 4 : (මූලාශ්‍රය - විභාග දෙපාර්තමේන්තුව, ප්‍රතිඵල විශ්ලේෂණය 2007-2011)

ඉහත අධ්‍යයනයට අමතරව විභාග දෙපාර්තමේන්තු මූලාශ්‍ර විමසීමේ දී පැහැදිලි වනුයේ සියලුම විෂයයන්ගෙන් අසමත් ප්‍රතිශතයේ ඉහළම අගය ද ඌව පළාත අයත් කර ගෙන ඇති බවය. තව දුරටත් අධ්‍යයනයේ දී පැහැදිලි වූයේ සාමාන්‍ය පෙළ විභාගය තුළ ජාතික මට්ටමට ළඟා වූ සාධනීය පාසල් ඇත්තේ එකක් බවය. මේ අනුව පැහැදිලි වන්නේ සියලුම පළාත් අතුරින් ඌව පළාත තුළ සාමාන්‍ය පෙළ ප්‍රතිඵලවල පසුබෑමය.

විද්‍යා අධ්‍යාපනයේ ප්‍රගමනයට බෙහෙවින් බලපාන අවධියක් ලෙස අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සැලකිය හැකිය. ජාතික මෙන්ම පළාත් අධ්‍යාපනයේ එක් හැරවුම් ලක්ෂ්‍යයක් ලෙස මෙය වැදගත් වේ. එබැවින් මෙහි ප්‍රතිඵල විද්‍යා ක්ෂේත්‍රයට සෘජුවම බැලපෑම් කරයි. මේ පිළිබඳව වැඩිදුරටත් අධ්‍යයනය සඳහා ඌව පළාත තුළ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විද්‍යා ප්‍රතිඵල විශ්ලේෂණයකොට විමසා බැලිය හැකිය.

| මට්ටම | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|
| ජාතික මට්ටම | 48.50 | 47.41 | 48.27 | 61.72 | 62.40 |
| ඌව පළාත් මට්ටම | 37.80 | 35.86 | 35.76 | 57.61 | 52.11 |
| වෙනස | 10.70 | 11.55 | 12.51 | 10.11 | 10.29 |

වගු අංක 5 : (මූලාශ්‍රය - විභාග දෙපාර්තමේන්තුව ප්‍රතිඵල විශ්ලේෂණය 2007-2011)

ඉහත නිරීක්ෂණයන්ගෙන් අවබෝධ වන්නේ විද්‍යා විෂයයේ සාධනීය අගය ජාතික මට්ටම ආසන්නයට පැමිණීමට ඇති නොහැකියාවය. ඌව පළාතේ සිසුන් මෙසේ විද්‍යා විෂය සාධනයට දක්වන දුර්වලතාව උසස් පෙළ විද්‍යා අංශයට ඇතුළත් වීමට ද බලපානු ලබයි.

කවර ප්‍රතිපත්ති හා ක්‍රියාවලි යොදා ගත්ත ද, ගැටලුව එලෙසම පවතී. එමනිසා ක්‍රමවේදයන්ගේ යම් වෙනසක් ඇති කළ යුතු බව පැහැදිලි ය. විද්‍යා විෂය සන්ධාරය තුළ ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීමට පහත යෝජනා ද ඉදිරිපත්ව ඇත '' විද්‍යා විෂය සන්ධාරය තුළ ඉගෙනුම් ප්‍රවේශය එනම් ගැඹුරු ක්‍රමානුකූල අවබෝධාත්මක සමෝධානික ක්‍රියාවලියක් ලෙස යොදා ගත යුතු බව'' (සේනාධීර, 2006) අවධාරණය කරයි. මෙම අවධාරණයට අනුව ප්‍රසාරණය වන දැනුම හා තොරතුරු ග්‍රහණය කර ගැනීම සඳහා ගුරුභවතුන් මෙන්ම ශිෂ්‍යයන් ද වෙනත් උපාය මාර්ග ක්‍රමවේද ගොඩනගා ගැනීමට අවශ්‍ය සාක්ෂරතාව ප්‍රගුණ කළ යුතු බව පැහැදිලිය.

''ඕනෑම විෂය සැලසුමක සාක්ෂරතාව රඳා පවතිනුයේ පාසල, එහි වාතාවරණය, ගුරුවරුන් හා ඉගෙනුම් ඉගැන්වීම් අවස්ථාවන් යන සාධකයන්ගේ උපරිම උපයෝගි බව තුළින්ය'' (යුනෙස්කෝව 1980) ඉහත ගොඩනැගීමට අපේක්ෂා කරන උපාය

මාර්ගික ක්‍රමවේදය ඉගෙනුම් ඉගැන්වීම් අවස්ථා පුළුල් කරලීමටත්, ගුරුභවතුන්ගේ කාර්යසාධන ක්‍රියාවලියේ ප්‍රවර්ධනයටත්, පංති කාමර ප්‍රතිඵල ඇගයීම කාලීන අවශ්‍යතාවක් බව වැඩි දුරටත් පැහැදිලිය. එබැවින් විද්‍යා විෂයයේ ශිෂ්‍ය සාධනයට සවිබලකරණය 08 ආදර්ශයෙන් සංවිධානය කරගත් විද්‍යා විෂය කඳවුරු කවර ලෙස බලපෑම් කරන්නේ ද යන්න ප්‍රස්තුතයක් ලෙස ගැනීමට අවශ්‍ය පරිසරය නිර්මාණය වී ඇත. තෝරාගත් පාසල්හි ගුරු පුස්තකාලයාධිපති හා විද්‍යා විෂය භාර ගුරුභවතුන් 30 බැගින් ගෙන සවිබලකරණ 8 ආදර්ශයට අනුව ක්‍රියාකාරකම් හා පැවරුම් සකසන ලදී. මෙහි මූලික පුහුණු අවස්ථාවට කොළඹ විශ්වවිද්‍යාලීය පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ කථිකාචාර්ය මණ්ඩලයේ උපදේශකත්වය ද ලැබිණ.

**ක්‍රමවේදය**

මෙම විද්‍යා විෂය කියවීම් කඳවුරු සඳහා සවිබලකරණය 8 ආදර්ශයේ යෙදීම් මෙන්ම විද්‍යා විෂයේ ක්‍රියාවලීන් සමග ඇති භාවිතයන් යොදා ගන්නා ලදී.

| | | | |
|---|---|---|---|
| 1 | ගැටලු විශ්ලේෂණය | - | සංකල්ප සිතියම් බුද්ධි කලම්භන භාවිතය. |
| 2 | තොරතුරු ගවේෂණය | - | **මුද්‍රිත** - ශබ්දකෝෂ, පාරිභාෂිත වදන්මාලා, විද්‍යා විශ්වකෝෂ.<br>**විද්‍යුත්** - අන්තර්ජාලය විද්‍යා වෙබ් අඩවි.<br>ප්‍රායෝගික පරීක්ෂණය You tube" CD/ DVD |
| 3 | තොරතුරු තෝරා ගැනීම | - | කියවීම මැනීම, තේරීම, බැලීම, නිරීක්ෂණය, වර්ග කිරීම KWL plus භාවිතය හා අදාළ උපකරණ හඳුනා ගැනීම. |
| 4 | තොරතුරු සංවිධානය | - | පරීක්ෂණ ඇටවුම් සැකසීම හා අදාළ උපකරණ යොදා ගැනීම. |
| 5 | නිර්මාණය | - | අදාළ ඇටවුම් සැකසීම හා විවිධ නිර්මාණ අවස්ථා. |
| 6 | ඉදිරිපත් කිරීම | - | අදාළ පරීක්ෂණ නිගමන රචනා පැවරුම් හා ජර්නලයන්. |

7 ඇගයීම - කණ්ඩායම්වලට සහභාගී වූ ගුරු භවතුන් හා බාහිර අධික්ෂණය.

8 නව අවස්ථා - දෝෂ අවම කරමින් ඇටවුම් නැවත ගොඩ නැගීම.

මෙම විද්‍යා විෂයේ කියවීම් කඳවුරු තුළ කරන ලද ක්‍රියාකාරකම් අතර පහත දක්වා ඇති සිසු ක්‍රියාවලිය සලකා බලමු.




රූපය 1 : කියවීම් කඳවුරු කණ්ඩායම් ක්‍රියාකාරකම් සිදු කළ සැලැස්ම

මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස ඉහත 1, 2, 3, 4, 5 යන අවස්ථා පසු කරන අතර එක් ක්‍රියාකාරකමක් සඳහා පැයක් පමණ යොදා ගනී.

1 ගැටලු විශ්ලේෂණය - සංකල්ප සිතියම් (Fish born, Golden gate, මකුළු දැල ග්‍රැෆික් රූපණ ක්‍රම භාවිතය), බුද්ධි කලම්භන හා සාකච්ඡා භාවිතය.

2 තොරතුරු ගවේෂණය - මුද්‍රිත - විද්‍යා ශබ්දකෝෂ විද්‍යා විෂයයේ පාරිභාෂික වදන්මාලා විද්‍යා විශ්වකෝෂ (Children’s Encylopedia 2003,2007,2008) උදා : පළමුව විශ්වකෝෂය වෙත ප්‍රවේශ වන්න (Children’s Encyclopedia-2007) දෙවනුව Home හි ඇති Living things වෙත

| | | | |
|---|---|---|---|
| | | | ද, තෙවනුව Animals හා Apes අයිතම වෙත ද ප්‍රවේශ වන්න පසුව එහි ඇති Orange-utans දර්ශනය නරඹන්න පැවරුමේ ඇති ක්‍රියාකාරකම සිදු කරන්න |
| 3 | තොරතුරු තෝරා ගැනීම | - | කියවීම, මැනීම, තේරීම, බැලීම, නිරීක්ෂණය වර්ග කිරීම, KWL plus භාවිතය හා අදාළ උපකරණ හඳුනා ගැනීම හා ඒවා නම් කර ගැනීම. |
| 4 | තොරතුරු සංවිධානය | - | පරීක්ෂණ ඇටවුම් සැකසීම හා අදාළ උපකරණ යොදා ගැනීම. උදාහරණ (ඔක්සිජන් නිෂ්පාදන ඇටවුම සකසා ගැනීම) |
| 5 | නිර්මාණය හා ඉදිරිපත් | - | අදාළ ඇටවුම් සකසා විස්තර පරීක්ෂා කිරීම කිරීම, හා නිගමන යෝජනා ඉදිරිපත් කිරීම, රචනා පිළිතුරු පැවරුම් ඉදිරිපත් කිරීම හා ජර්නල සටහන් කිරීම. |

මෙසේ සිදු කරන ලද විද්‍යා විෂය පාදක වූ ශිෂ්‍ය කියවීම් කඳවුරු බොහෝ දෙනාට අපූරු අත්දැකීමක් විය. ඒ සඳහා ශිෂ්‍ය ගුරු හා නිරීක්ෂකයන්ගෙන් විවිධ ප්‍රතිචාර දක්වා තිබුණි.

''මෙවැනි සංකීර්ණ විෂයක් ප්‍රබෝධයෙන් හා ඉතා කැමැත්තෙන් මෙසේ ක්‍රියාකාරකම්වල නිරත වෙමින් ඉගෙනීමට හා ඉගැන්වීමට පහසු බව'' විද්‍යා විෂය භාර ගුරු භවතුන් 12 දෙනෙකුගේ ඍජු අදහස් විය. විද්‍යා විෂය වඩා සංකීර්ණ හා අපහසු යැයි බොහෝ ශිෂ්‍යයන්ගේ අදහස විය. මෙවැන්නක් ඉතා සරලව දැනුම හුවමාරු කර ගනිමින් විවිධ මූලාශ්‍ර භාවිත කරමින් හා ගැඹුරු ඉගෙනීමකට අවශ්‍ය ප්‍රවේශය මෙන්ම පහසුව මෙම කඳවුරු ක්‍රියාකාරකම් තුළින් ලැබී ඇත. එමගින් බොහෝ ගැටලු නිරාකරණය කර ගනිමින් සංකීර්ණ කොටස් ක්‍රමයෙන් සරල කර ගත හැකිය. මේ සඳහා ඇති තොරතුරු මූලාශ්‍ර බොහොමයකි. නමුත් සිසුන් මෙම මූලාශ්‍ර භාවිතය පිළිබඳව අනවබෝධයෙන් හා නොදැනුවත්කමින් සිටින බව පැහැදිලි

විය. එබැවින් විද්‍යා ඉගැන්වීම පමණක් නොව මෙම විවිධ මූලාශ්‍ර අධ්‍යයනය කිරීමට අවස්ථාවන් සැලසිය යුතුය. ඒ තුළින් සිසුන්ගේ විද්‍යා විෂය පිළිබඳ ඇති භීතිය ඉවත දමා පහසු ප්‍රවේශයන් ඔස්සේ විවිධ තොරතුරු භාවිතයන් යොදා ගනිමින් එම විෂයට ළැදියාව දක්වීමට පෙලඹී ඇත.

මීට අමතරව විද්‍යා විෂය භාර ගුරු භවතුන්ගෙන් ලද තවත් ප්‍රතිචාර වූයේ ''සිසුන්ට විවිධත්වයක් හා පහසුවක් සපයන බවයි'' විද්‍යාව යන්න විවිධ ප්‍රවේශයන් ඔස්සේ ඉගෙන ගත යුතු විෂය ධාරාවකි. නමුත් පංති කාමරයේ දී මීට අවශ්‍ය විවිධත්වය හා පහසුකම් සපයා දීමට අපහසු වී ඇත. විද්‍යාගාර තුළ උපකරණ බොහෝමයක් තිබුණ ද මේ සඳහා අවශ්‍ය ප්‍රවේශයන් හා මූලාශ්‍ර පිළිබඳව ගුරු භවතුන් හා සිසුන් දක්වන්නේ අඩු දැනුමකි. එබැවින් විවිධ ප්‍රවේශයන් සඳහා අවශ්‍ය මූලාශ්‍ර භාවිතයන් පිළිබඳව මෙවැනි කියවීම් කඳවුරුවල වැදගත්කම ඔවුන් පෙන්වා දී ඇත. තව ද ''විද්‍යා විෂයේ පාඩම් සකස් කර ගැනීමට ගුරු පුස්තකාලයාධිපති සහාය මෙන්ම එහි මූලාශ්‍ර හා සවිබලකරණ 8 ආදර්ශය මහඟු පිටිවහලක් වේ.'' පෙළ පොත් හා මූලාශ්‍ර 1 ක් හෝ 2 ක් පමණ ද දේශන ශෛලීන්ගෙන් ඉගැන්වීම සුවිශේෂීකර ගන්නා ගුරු භවතුන්ගෙන් සිසුන්ට අවශ්‍ය ගැඹුරු ඉගෙනුම් ප්‍රවේශය අහිමි වේ. එබැවින් විවිධ සම්පත් මූලාශ්‍ර මෙන්ම උපාය මාර්ගයන් ලෙස සවිබලකරණය 8 ආදර්ශය පාදක කර ගැනීම ගුරු භවතුන්ගේ ප්‍රශංසාවට ලක් වී ඇත. එක් ශෛලියකින් පමණක් පංතියේ ඉගැන්වීම් සඳහා සීමා වී ඇති ඔවුන් මෙවැනි ප්‍රවේශයන් පහසුවක් ලෙසත් නිර්මාණශීලි බවත් අගය කරයි. එසේම ගුරු පුස්තකාලයාධිපති හා පුස්තකාල ක්‍රියාවලිය සමග සමෝධානිකව කටයුතු කිරීමට හේතු වී ඇත. මෙහි වාසිය ඍජුවම ශිෂ්‍යයන්ට අත් වී ඇත.

මෙම කඳවුරු නිරීක්ෂණය කරන ලද ගුරු භවතුන් හා අධීක්ෂකවරුන්ගේ ප්‍රතිචාර අතර ''ඵලදායී ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියක් නිර්මාණය කිරීමට තොරතුරු සාක්ෂරතා සංකල්ප වටහා ගැනීම වැදගත් බව'' මේ අනුව සවිබලකරණ 8 ආදර්ශයේ අවස්ථා හා ඊට සමරූපීව විද්‍යා ක්‍රියාවලියේ සංකල්පයන් ගළපා සකස් කරන ලද පාඩම් සටහන් මහඟු ප්‍රවේශයක් සපයා ඇත. ඒ අනුව ඉතා විශාල තොරතුරු පද්ධති තුළින් අවශ්‍ය ප්‍රවේශයන් සොයා ගනිමින් මනා නිපුණත්වයකින් යුතුව සිසුන් යොමු වී ඇති බව පැහැදිලිය. තව තවත් මේ සඳහා ප්‍රවේශයන් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා විෂය පාදකව ගොඩනැගිය යුතු බව ඔවුන් අවධාරණය කරයි.

මෙහි දී කදිම ආකල්පමය වෙනසක් ඇති කර ගත් ගුරු භවතකු තුළින් දිස් වූයේ මෙවන් අදහසකි ''මා තුළ මෙම වැඩසටහන කෙරෙහි තද විශ්වාසයක් හට ගැනුණු අතර එය සිසුන් සඳහා ලබා දීමට ද එම යුතුකම ඉටු කිරීමට ද ඉදිරියේ දී මා පසුබට නොවෙමි'' යනුවෙන් ඔහුගේ නිරීක්ෂණ හා සමපදස්ථ ඇගයීම සිදු කර ඇත.
කියවීම් කඳවුරු සඳහා සහභාගි වූ ශිෂ්‍ය ප්‍රතිචාර අතර සිසුන් 30 දෙනෙකු පමණ දක්වා තිබුණේ '' අපි නොදන්නා සියලු දේවල් ඉගෙන ගැනීමට අවස්ථාවක් වූ බව හා අපහසු අමාරු දේවල් සරලව අවබෝධ කර ගැනීමට පහසු වුණා'' යනුවෙනි. මෙම ප්‍රතිචාර සැලකිල්ලට ගැනීමේ දී සවිබලකරණ 8 ආදර්ශ ප්‍රවේශයන් තුළින් ගොඩනගා තිබූ ක්‍රියාකාරකම් පහසු වී ඇත. සාම්ප්‍රදායික ගුරු ඉගැන්වීම හා අසා සිටීම සඳහා මෙම ක්‍රියාවලිය ප්‍රබල ආකල්පමය අභියෝගයක් වී ඇත. තව ද ඔවුන්ගේ හැසිරීම් හා විවිධ ක්‍රියාකාරකම් සඳහා දක්වන ලද ප්‍රතිචාර නිරීක්ෂණයේ දී පැහැදිලි වන්නේ පීඩනයකින් හා භීතියකින් තොරව පහසුවෙන් මෙහි නිරත වන බවයි. තවත් සිසු පිරිසක් කියා සිටියේ ''දැනුම වැඩිකර ගැනීමටත් සැඟවී ඇති කුසලතා වර්ධනය කර ගැනීමටත් මෙය ඉවහල් වූ බවයි''.

විද්‍යා ක්‍රියාවලිය තුළ වූ නිරීක්ෂණය, වර්ගීකරණය, මැනීම සංඛ්‍යා සම්බන්ධතා, කල්පිත ගොඩනැගීම පරීක්ෂණ පැවැත්වීම ආදී වූ විමසුම් ප්‍රවේශයන් සඳහා මෙම ක්‍රියාවලිය වඩා සරල වී ඇති බව හා විවිධ කුසලතා ප්‍රවර්ධනය කර ගැනීමට උපකාරයක් ව ඇත. මතකය වැඩි කිරීම, ඉතා සංකීර්ණ විෂය කොටස් සරල කර ගැනීම හා සංකල්පනා ගොඩනගා ගැනීම ආදී වූ කුසලතා පිළිබඳව ද කියවීම් කඳවුරු තුළින් ශිෂ්‍යයන් දක්වන ලද ක්‍රියාකාරකම් ඔස්සේ සනාථ වේ,

සමස්ත ප්‍රතිචාර සැලකිල්ලට ගැනීමේ දී පංති කාමරයේ සිර වී සිදුවන ඉගෙනුමට වඩා නිදහස් ක්‍රියාකාරකම් පාදක විමර්ශනශීලී ඉගෙනුම් කඳවුරු විද්‍යාව වැනි විෂය විශේෂ සඳහා ද ඉතා හොඳින් ගැළපෙන බවත් වඩා ගුණාත්මක ප්‍රතිඵල බොහොමයක් සිසුන් අත්පත් කර ගන්නා බවත් ප්‍රතිචාරවලට අමතරව සාකච්ඡාවන් හා සමපදස්ථ නිරීක්ෂණයන්ගෙන් මනාව පැහැදිලි වේ. සවිබලකරණ 8 ආදර්ශය මූලික කොට ගෙන සකසා ගත් විද්‍යා විෂයයේ කියවීම් කඳවුරු ක්‍රියාවලිය තුළින් ශිෂ්‍ය සාධනයේ මෙන්ම විවිධ කුසලතාවල ද ධනාත්මක ප්‍රවේශයන් ලබා ගෙන ඇති බව තව තවත් තහවුරු වී ඇත.

**නිගමන හා යෝජනා**

පාසල් පුස්තකාල හා ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානය ලෙස ගොඩනැගෙමින් පවතින අධ්‍යාපනයේ නව ප්‍රවණතා පිළිබඳ වූ කාර්ය භාරය පුළුල් වීමත් සමග තොරතුරු සාක්ෂරතා ප්‍රවේශයක අවශ්‍යතාවය හඳුනා ගනිමින් එකී විෂය පථය තුළ ඇති වූ ගැටලු අපේක්ෂිත නිගමන හා යෝජනා ඉදිරිපත් කිරීම.

- පන්ති කාමර වාතාවරණය හා ගුරු ඉගෙනුම් - ඉගැන්වීම් කළමනාකරණයේ ව්‍යුහිත වෙනස්කම් විය යුතුය.
- පාසල් කාලසටහන් / කාලච්ඡේද සඳහා යෙදෙන කාල රාමුවේ සංශෝධනය වීම.
- විෂය ගුරු භවතුන් හා විදුහල්පතිවරුන් 8 හි භාවිතයන් හා න්‍යායන් පිළිබඳව දැනුවත් කිරීම.
- අධීක්ෂණ සහ නියාමන කාර්ය මණ්ඩල 8 හි භාවිතයන් හා න්‍යායන් පිළිබඳව දැනුවත් කිරීම.
- පළාත් මට්ටමින් කලාප මට්ටමින් ලැබෙන මෙම සවිබලකරණ 8 හි අත්දැකීම් හා නව්‍ය යෝජනා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් සැකසීම.
- විමර්ශන හා ගවේෂණශීලී ඉගෙනුම් ප්‍රවේශයකට අවශ්‍ය ගුරු  හා විෂය මාලාවේ වෙනස්වීම් හා පෝෂණය කිරීම.
- සිසුන් මනා තොරතුරු සාක්ෂරතා ආදර්ශයක් සහිත ඉගෙනුම් අත්දැකීම් ඉගෙනුම් පුරුදු හා ක්‍රම ශිල්ප යොදා ගැනීමට යොමු කිරීම.
- ප්‍රසාරණය වන තොරතුරු මෙන්ම දැනුම ග්‍රහණය කර ගැනීම සඳහා අවශ්‍ය දැනුම සිසුන්ට මෙන්ම ගුරු භවතුන්ට ලබා දීම.
- සවිබලකරණ 8 මගින් යාවජීව හා ස්වයං ඉගෙනුම් ප්‍රවේශයන්ට අදාළ කුසලතා දියුණු කිරීම.
- විද්‍යා විෂයට මෙන්ම සවිබලකරණ 8 ආදර්ශය වෙනත් විෂයන්ට ද කියවීම් ප්‍රවර්ධන කටයුතු සඳහා පුළුල්ව භාවිත කිරීම.
- විද්‍යා අධ්‍යාපනයේ ශිෂ්‍ය සාධන ප්‍රවර්ධනයට අවශ්‍ය යෝජනා හා ක්‍රියාවලින් ගොඩනැගීම.

# සිංහලයට පරිවර්තිත ඉන්දීය ප්‍රබන්ධ සාහිත්‍ය පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක අධ්‍යයනයක් (1948 - 2015)

උදිත අලහකෝන්
සහකාර පුස්තකාලයාධිපති
පුස්තකාල හා විඥාපන විද්‍යා ජාතික ආයතනය

සජීවනී ජයසේකර
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
පුස්තකාල හා විඥාපන විද්‍යා ජාතික ආයතනය

**සාරාංශය**

එක්තරා කාලයක හුදෙක් භාෂා පද්ධති දෙකක් අතර පැවති ක්‍රියාවලියක් වූ සාහිත්‍ය පරිවර්තනය වර්තමානයේ සංස්කෘතික පද්ධති අතර සිදුවන ක්‍රියාවලියක් බවට පත් වෙමින් තිබේ. මේ අනුව පරිවර්තකයා අන්තර් සංස්කෘතික මැදිහත්කරුවෙකු ලෙස ක්‍රියා කරයි. මේ නිසා ජාතික සහ සංස්කෘතික සීමා ඉක්මවන අත්දැකීමක් ලබා දීමට පරිවර්තන සාහිත්‍ය සමත් වේ. (Bernaka, 2012) විශේෂයෙන් පරිවර්තන සාහිත්‍යයේ වත්මන් පුළුල් ව්‍යාප්තියෙහි වර්ධනයට දායක වූ ප්‍රමුඛතම සාධකයක් ලෙස ගෝලීයකරණය හැඳින්විය හැකිය. සංස්කෘතික විසරණය යනු මෙම ගෝලීයකරණය රැඳී තිබෙන ප්‍රධාන කුලුනකි. එහි දී පරිවර්තන සාහිත්‍යයේ භූමිකාව තීරණාත්මකවේ. එහෙයින් මෙම ගෝලීයකරණ යුගයේ දී ලෝක සාහිත්‍ය යන යෙදුම යථාර්ථයක් බවට පත් කිරීමට පරිවර්තන සාහිත්‍ය අත්‍යවශ්‍ය සාධකයක් වේ. (මුස්තාපා, 2014) පරිවර්තන සාහිත්‍යයේ වැදගත්කම තවත් ආකාරයකට දකී. මේ අනුව වර්තමානයේ ලොව පුරාම ජනවාර්ගිකත්වයේ නාමයෙන් විවිධ ඛණ්ඩනයන් සිදු වෙමින් පවතී. එහි ප්‍රතිඵලයක් ලෙස සිදු වන වාර්ගික විරසකයන් අවම කර ගැනීමට සංස්කෘතීන් යා කරන පාලමක් ඉදි කිරීම අද දවසේ අත්‍යවශ්‍ය කාර්යයකි. මෙම කාර්යයේ දී පරිවර්තන සාහිත්‍යයට ඉහළ වටිනාකමක් හිමි වේ.

ශ්‍රී ලංකාවට ද පරිවර්තන සාහිත්‍යය සම්බන්ධයෙන් දිගු ඉතිහාසයක් තිබේ. 19 සියවස වැනි කාලවකවානුවක දී ආගමික ග්‍රන්ථ පරිවර්තනයට ප්‍රමුඛ අවධානය යොමු වුව ද 20 සියවස මුල්භාගය වන විට එය ප්‍රබන්ධ පරිවර්තනය වෙතට යොමු වන විට දක්නට පුළුවනි. මේ අනුව රාමායනය, මහාභාරතය, අරාබි නිසොල්ලාසය, ගලිවර්ගේ චාරිකා සිංහලයට

පරිවර්තනය වූ මුල්ම ප්‍රබන්ධ සාහිත්‍ය ලෙස සැලකේ. මෙලෙස ඇරඹි විශ්ව ප්‍රබන්ධ සාහිත්‍ය සිංහලයට පරිවර්තනය වීම වර්තමානය වනවිට සීඝ්‍ර වර්ධනයක් මෙන් ම විවිධත්වයක් ද අත් කරගෙන සිටී. විවිධ දශකවල ද විවිධ භාෂාමය සාහිත්‍ය ප්‍රමුඛත්වයට පත් වුව ද ආරම්භයේ සිට අද දක්වාම ඉන්දීය ප්‍රබන්ධ සාහිත්‍ය පරිවර්තනය වෙත දක්වන ලද අවධානය අඛණ්ඩව පැවතීම සුවිශේෂී ලක්ෂණයකි. භූගෝලීය වශයෙන් පමණක් නොව සමාජ, ආර්ථික, දේශපාලනික මෙන් ම සංස්කෘතික වශයෙන් ද ඉන්දියාව ශ්‍රී ලංකාවේ සමීපතම අසල්වාසියා වීම මීට ප්‍රබල හේතුවක් වී ඇත. ප්‍රාන්තීය භාෂා ගණනාවකින් මෙන්ම ඉංග්‍රීසි භාෂාවෙන් ද සාහිත්‍යකරණයේ යෙදෙන සාහිත්‍යකරුවන් රැසක් සිටින භූමිභාගයක විවිධත්වය වටහා ගැනීමට මෙම පරිවර්තන සාහිත්‍ය බෙහෙවින් ඉවහල්වේ. භාෂාවන් ගණනාවකින් භාෂණයේ සහ ලේඛනයේ යෙදෙන ඉන්දියාව තුළ දී පවා පරිවර්තන සාහිත්‍යයේ තීරණාත්මක වටිනාකම බුකර් සම්මානලාභී ඉන්දීය නවකතාකරුවකු වන අමිතව් ඝෝෂ් එය මෙසේ එක් වාක්‍යයකට සාරාංශ කරන බව මුස්තාපා (2014) සඳහන් කරයි. "බහුභාෂාමය රටක් ලෙස අපට අගනා පරිවර්තන සාහිත්‍යයක් නොමැති නම් අපගේ විනාශය අත ළඟය."

**මූලික පද : ඉන්දියානු සාහිත්‍යය, පරිවර්තන කෘති, දකුණු ඉන්දීය සාහිත්‍යය, ප්‍රබන්ධ සාහිත්‍යය**

මෙම අධ්‍යයනයෙහි මූලික අරමුණ වන්නේ 1948-2015 දක්වා වසර 77 ක කාලය පුරා සිංහලයට පරිවර්තනය වූ ඉන්දියානු ප්‍රබන්ධ පිළිබඳ විශ්ලේෂණයක යෙදීමය. මෙහි දී නවකතා, කෙටිකතා, පද්‍ය සහ නාට්‍ය යන ප්‍රබන්ධමය ශානර වෙත පමණක් අවධානය යොමු කර ඇත. ඒ අනුව ඒ ඒ දශකවල පළවූ කෘති, සාහිත්‍ය ශානරය, භාෂාව, කර්තෘ, පරිවර්තක, ප්‍රකාශක සහ පිටු පරාසය යනාදී සාධක මත සංඛ්‍යාත්මකව විශ්ලේෂණයට බඳුන් කර තිබේ. මේ සඳහා දත්ත රැස් කිරීමේ මූලාශ්‍ර ලෙස ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය, සිංහල පරිවර්තන සාහිත්‍ය ග්‍රන්ථ නාමාවලිය, ජාතික පුස්තකාල සූචිය යොදා ගැනුණි. මේ අනුව මෙම වසර 77ක කාල සීමාව තුළ සිංහලයට පරිවර්තනය වී ඇති ඉන්දියානු ප්‍රබන්ධ කෘතිවල එකතුව 488 කි. ප්‍රතිශත දැක්වීමේ දී ආසන්න පූර්ණ සංඛ්‍යාවට ගණනය කර ඇත.

### කාලවකවානු අනුව විශ්ලේෂණය

මෙම කාලපරාසය තුළ ඒ ඒ දශකයන්හි ඉන්දියානු ප්‍රබන්ධ සිංහලයට පරිවර්තනය වී ඇත්තේ පහත සඳහන් ආකාරයටය.

| කාල පරාසය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 1948-1950 | 04 | 1% |
| 1951-1960 | 17 | 3% |
| 1961-1970 | 40 | 8% |
| 1971-1980 | 08 | 2% |
| 1981-1990 | 19 | 4% |
| 1991-2000 | 91 | 19% |
| 2001-2010 | 173 | 35% |
| 2011-2015 | 136 | 28% |
| | 488 | 100% |

1 වගුව : කාල පරාසය අනුව විශ්ලේෂණය

මේ අනුව පැහැදිලි වන්නේ ඉන්දීය ප්‍රබන්ධ සාහිත්‍ය වෙත මෙරට පරිවර්තකයන්ගේ අවධානය වැඩි වශයෙන් යොමු වී ඇත්තේ 2000 දශකය තුළ බවය. එය සංඛ්‍යාත්මකව 309ක් වන අතර සමස්ත කෘති සංඛ්‍යාවේ ප්‍රතිශතයක් වශයෙන් ගත්විට 63% කි. මෙහි දී වර්ෂ 1948-1950 සහ 2011-2015 කාල පරාසයන්හි වර්ෂ ගණනෙහි අඩුව ව්‍යතිරේකයක් ලෙස ගත හැකිය. එහෙත් 2011-2015 දක්වා වසර පහ තුළ පමණක් පළ වී ඇති කෘති සංඛ්‍යාව 136ක් වීම සුවිශේෂී තත්ත්වයකි. එමෙන් ම 1970 දශකයේ ඉන්දීය පරිවර්තනවල සීඝ්‍ර අඩුවීම ද අවධානයට ලක් විය යුත්තකි.

### සාහිත්‍ය ශානර අනුව විශ්ලේෂණය

ප්‍රබන්ධ සාහිත්‍ය ශානර ප්‍රධාන වශයෙන් නවකතා, කෙටිකතා, පද්‍ය සහ නාට්‍ය වශයෙන් වර්ග කළ හැකිය. අදාළ කාල සීමාව තුළ මෙම ශානරවලට අයත් ඉන්දියානු ප්‍රබන්ධ සිංහලයට පරිවර්තන වූ ආකාරය 2 වගුවෙන් සංඛ්‍යාත්මකව දැක්වේ.

| ශානරය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| නවකතා | 270 | 55% |
| කෙටිකතා | 94 | 19% |
| පද්‍ය | 74 | 15% |
| නාට්‍ය | 35 | 7% |
| ප්‍රබන්ධ (පොදු) | 18 | 4% |
| | 488 | 100% |

1 වගුව : ශානරීය විශ්ලේෂණය

නවකතාවට සාපේක්ෂව කෙටිකතා, පද්‍ය සහ නාට්‍ය යන ශානර වෙත පරිවර්තකයන්ගේ අවධානය යොමු වී ඇත්තේ ඉතාමත් අල්ප වශයෙන් බව පෙනේ.

**භාෂාමය විශ්ලේෂණය**

ඉන්දියාවේ රාජ්‍ය භාෂාව හින්දි වන අතර එයට අමතරව ප්‍රාන්තීය භාෂා රැසකින් භාෂණයේ සහ ලේඛනයේ යෙදෙන ජනතාවක් එහි වෙසෙති. එහෙයින් ප්‍රබන්ධ සාහිත්‍ය තුළ ද මෙම භාෂාමය විවිධත්වය දැකිය හැකිය. එමෙන් ම ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රබන්ධකරණයේ නියැළෙන ලේඛන පිරිසක් ද එහි සිටිති. මෙම භාෂාමය විවිධත්වය සිංහල පරිවර්තකයන් විසින් ග්‍රහණය කරගෙන ඇති අයුරු 3 වගුවෙන් නිරූපණය කෙරේ.

| භාෂාව | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| ඉංග්‍රීසි | 122 | 25% |
| බෙංගාලි | 99 | 20% |
| සංස්කෘත | 92 | 19% |
| දෙමළ | 69 | 14% |
| හින්දි | 52 | 11% |
| ඉන්දියානු (පොදු) | 20 | 4% |
| මලයාලම් | 10 | 3% |
| උර්දු | 06 | 1% |
| මරාඨී | 06 | 1% |
| පන්ජාබි | 06 | 1% |
| කන්නඩ | 03 | 0.5% |
| ඔරියා | 02 | 0.3% |
| තෙලිඟු | 01 | 0.2% |
| | 488 | 100% |

3 වගුව : භාෂාමය විශ්ලේෂණය

මෙයින් පෙනී යනුයේ සමස්තයක් වශයෙන් ඉන්දියානු භාෂා 12 කට අයත් ප්‍රබන්ධ කෘති සිංහලයට පරිවර්තනය වී ඇති බවයි. ඒ අතරින් ප්‍රමුඛස්ථානය හිමි වන්නේ ඉංග්‍රීසි භාෂාමය ප්‍රබන්ධවලටය. (122) ඉන්පසු, මෙරට පරිවර්තකයන්ගේ ඉහළ සැලකිල්ලක් යොමු වී ඇත්තේ පිළිවෙළින් බෙංගාලි (99), සංස්කෘත (92), දෙමළ (69) සහ හින්දි (52) යන භාෂා සාහිත්‍ය වෙතය. ශ්‍රී ලංකාවට ආසන්නයේ පිහිටා ඇති දකුණු ඉන්දියාවේ ප්‍රාන්තවල ප්‍රධාන භාෂා හතරක් (04) භාවිතා කෙරේ. එනම්, තමිල්නාඩුවේ දෙමළ, කර්නාටකයේ කන්නඩ, කේරලයේ මලයාලම් සහ ආන්ද්‍ර ප්‍රදේශයන්හි තෙලිඟු වශයෙනි. ශ්‍රී ලංකාවට ආසන්නතම ඉන්දියානු කලාපය වන දකුණු ඉන්දියාවේ ප්‍රබන්ධ සාහිත්‍ය වෙත මෙරට පරිවර්තකයන් දක්වා ඇති අවධානය 4 වගුවේ සඳහන් වේ.

| භාෂාව | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| දෙමළ | 69 | 84% |
| මලයාලම් | 10 | 12% |
| කන්නඩ | 03 | 3% |
| තෙලිඟු | 01 | 1% |
| | 83 | 100% |

4 වගුව : දකුණු ඉන්දීය භාෂාමය විශ්ලේෂණය

මෙයින් පැහැදිලි වන්නේ මලයාලම්, කන්නඩ සහ තෙලිඟු සාහිත්‍යයට යොමු වී ඇති අවධානය ඉතාමත් පහළ මට්ටමක පවතින බවයි.

**කර්තෘත්ව විශ්ලේෂණය**

සමස්තයක් ලෙස අධ්‍යයනයට පාදක වන කාලසීමාවේ දී ඉන්දියානු කතුවරු 188කගේ ප්‍රබන්ධ කෘති සිංහලයට පරිවර්තනය කර ඇත. ඒ අතරින් වැඩිම වාර ගණනක් සිංහලයට පරිවර්තනය කර ඇති කතුවරු පස්දෙනා පිළිබඳ තොරතුරු 5 වගුවේ දැක් වේ.

| කතුවරයා | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| ආර්. කේ. නාරායන් | 47 | 24% |
| රබීන්ද්‍රනාත් තාගෝර් | 41 | 22% |
| කාලිදාස | 18 | 8% |
| සරත්චන්ද්‍ර චට්ටෝපාධ්‍යාය | 14 | 7% |
| මුංෂි ප්‍රේමචාන්ද්‍ර | 13 | 10% |

5 වගුව : කර්තෘත්ව විශ්ලේෂණය

මේ අනුව සිංහල පාඨකයා වෙතට වැඩි වශයෙන් ම ළඟාවීමේ භාග්‍ය ලත් ඉන්දියානු කතුවරයා ලෙස ආර්. කේ. නාරායන් හැඳින්විය හැකිය. මීළඟ ස්ථාන හතර පිළිවෙළින් හිමිවනුයේ රබීන්ද්‍රනාත් තාගෝර්, කාලිදාස, සරත්චන්ද්‍ර චට්ටෝපාධ්‍යාය සහ මුංෂි ප්‍රේමචාන්ද්ටය. ස්වකීය එක් කෘතියක් පමණක් සිංහලයට පරිවර්තනය වී ඇති කතුවරුන් සංඛ්‍යාව 140 කි.

ඉන්දියානු ප්‍රබන්ධ සිංහලයට පරිවර්තනය කිරීමේ දී දක්නට ලැබෙන තවත් විශේෂ ලක්ෂණයක් වන්නේ ඇතැම් විට එකම කර්තෘගේ සමහර කෘති පරිවර්තකයන් කීපදෙනෙකු විසින් සිංහලයට නඟා තිබීමයි. මෙලෙස වැඩිම පරිවර්තකයන් සංඛ්‍යාවක් විසින් සිංහලයට පරිවර්තනය කර ඇති ඉන්දියානු ප්‍රබන්ධය වන්නේ රබීන්ද්‍රනාත් තාගෝර්ගේ ගීතාංජලී කාව්‍යයයි. එය පරිවර්තකයන් හය දෙනෙකු විසින් සිංහලයට පෙරළා ඇත.

| පරිවර්තක | වර්ෂය |
|---|---|
| ආනන්ද ගුණසේකර | 1950 |
| හෙට්ටිගේ බැස්ටියන් | 1970 |
| කේ. බී. සුගතදාස | 1984 |
| කුසුම් දිසානායක | 1992 |
| විනී විතාරණ | 2004 |
| එඩ්මන්ඩ් ජයසූරිය | 2010 |

6 වගුව : ගීතාංජලී පරිවර්තන

එමෙන් ම සිංහල පරිවර්තකයන්ගේ ඉහළ ම අවධානය දිනාගෙන ඇති ඉන්දියානු කතුවරුන් දෙදෙනා වන ආර්. කේ. නාරායන් සහ රබීන්ද්‍රනාත් තාගෝර්ගේ කෘතිවල පරිවර්තන පිළිබඳ වැඩිදුර විග්‍රහයක් කිරීම වැදගත්ය.

ආර්. කේ. නාරායන්ගේ නවකතා සියල්ලම (14) සිංහලයට පරිවර්තනය වී තිබේ. මෙම කෘති පරිවර්තකයන් කීප දෙනෙකු විසින් පරිවර්තනය කර ඇති බැවින් පරිවර්තන සංඛ්‍යාව 47ක් වැනි ඉහළ අගයක් ගෙන ඇත. ඔහුගේ කෘතියක් ප්‍රථම වරට සිංහලයට පරිවර්තනය කර ඇත්තේ 1950 දීය. එය Tiger of Mulgudi කෘතියයි. නිපුණ ප්‍රකාශනයක් වන එහි පරිවර්තකයා ඩී. බී. මල්ලිකාරච්චිය. එහෙත් 1960 සහ 1970 දශකයේ ඔහුගේ එකදු කෘතියක් හෝ සිංහලයට පරිවර්තනය වී නොමැත. 1980 දශකයේ එක් කෘතියක් ද 1990 දශකයේ කෘති නවයක් ද පරිවර්තනය වී ඇත. මේ අනුව සිංහලයට පරිවර්තනය වී ඇති ආර්. කේ. නාරායන්ගේ සමස්ත කෘති සංඛ්‍යාව වන 47 න් 31 ක් ම පළ වී ඇත්තේ 2000 වසරෙන් පසුවය. එයින් ද කෘති 27 ක් 2003-2007 දක්වා වසර 05 තුළ පළ වී තිබේ.

ග්‍රන්ථ නාම වශයෙන් ගත් කල්හි ආර්. කේ. නාරායන්ගේ කෘති 21 ක් සිංහලයට පරිවර්තනය කර ඇත. මෙයින් කෘති 13 ක් පරිවර්තකයන් කීප දෙනෙකු විසින් සිංහලයට නඟා තිබීම විශේෂත්වයකි. මේ අනුව Dark Room පරිවර්තකයන් සිව් දෙනෙකු විසින් ද Bachelor of Arts, The Guide, Grandmother's Tale, The English Teacher, Under the Banyan Tree, Financial Expert සහ Swami and Friends පරිවර්තකයන් තිදෙනෙකු විසින් ද Tiger of Mulgudi, Painter of Signs, Waiting for Mahathma, World of Nagaraj සහ Man Eater of Mulgudi පරිවර්තකයන් දෙදෙනෙකු විසින් ද සිංහලයට පෙරළා තිබේ.

ආර්.කේ. නාරායන්ගේ කෘති වැඩි වශයෙන් ම සිංහලයට පරිවර්තනය කිරීමේ ගෞරවය හිමි වන්නේ ගුණතිලක මැටියගනේටයි. ඔහු විසින් පරිවර්තනය කර ඇති නාරායන්ගේ කෘති සංඛ්‍යාව පහකි. ගුණදාස යාපා කෘති තුනක් ද ප්‍රේමසිරි මාහිංගොඩ, සිරිල් චන්ද්‍රසේකර ගුණවර්ධන සහ සමන් පුෂ්ප ලියනගේ කෘති දෙක බැගින් ද සිංහලයට නඟා ඇත.

ආර්. කේ. නාරායන්ගේ සිංහල පරිවර්තන කෘති ප්‍රකාශකයන් 20 ක් විසින් ප්‍රකාශයට පත් කර තිබේ. ඒ අතරින් වැඩිම කෘති සංඛ්‍යාවක් පළ කර ඇත්තේ ඇස්. ගොඩගේ සමාගම සහ විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය මඟිනි. මෙම ආයතන දෙකම කෘති හත (07) බැගින් ප්‍රකාශයට පත් කර ඇත.

රබීන්ද්‍රනාත් තාගෝර්ගේ කෘති 41 ක් ලෙස සිංහලයට පරිවර්තනය වී ඇත. නාරායන්ගේ මෙන් ම එය මෙවන් ඉහළ සංඛ්‍යාවක් වීමට හේතුව තාගෝර්ගේ ඇතැම් කෘති පරිවර්තකයන් කීප දෙනෙකු විසින් සිංහලයට නඟා තිබීමයි. තාගෝර්ගේ කෘතියක් පළමු වතාවට සිංහලයට පරිවර්තනය වන්නේ 1948 දීය. එය සුභාෂිණී නම් නවකතාවයි. බැස්ටියන් ප්‍රකාශනයක් වන එය විලියම් ද අල්විස්ගේ පරිවර්තනයකි.

ග්‍රන්ථ නාම වශයෙන් ගත් විට තාගෝර්ගේ කෘති 15ක් සිංහලයට පරිවර්තනය කර ඇත. මෙයින් කෘති හයක් (06) පරිවර්තකයන් කීප දෙනෙකු විසින් සිංහලයට පෙරළා තිබේ. මේ අනුව ගීතාංජලී පරිවර්තකයන් හය දෙනෙකු විසින් ද The Wreck තිදෙනෙකු විසින් ද The Gardner, Gora, Chaturangaiy Stray Birds දෙදෙනෙකු විසින් ද පරිවර්තනය කර ඇත.

තාගෝර්ගේ සිංහල පර්වර්තන කෘති 40 න් 23 ක් ම පළ කර ඇත්තේ 2000 වසරෙන් පසුවය. 1970 දශකයේ පළ වී ඇත්තේ එක් කෘතියක් පමණි.

රබීන්ද්‍රනාත් තාගෝර්ගේ විශේෂත්වයක් වන්නේ ඔහු නවකතා, කෙටිකතා, පද්‍ය සහ නාට්‍ය යන ශානර සියල්ලෙන් ම ලේඛනකරණයේ යෙදීමය. ඒ අනුව ඔහුගේ නවකතා 16 ක් ද පද්‍ය කෘති 13 ක් ද කෙටිකතා සංග්‍රහ 05 ක් ද නාට්‍ය 04 ක් ද වෙනත් ප්‍රබන්ධ 02 ක් ද සිංහලයට නඟා ඇත.

තාගෝර්ගේ කෘති පරිවර්තනයේ දී වැඩිම දායකත්වයක් සපයා ඇත්තේ ආනන්ද අමරසිරි සහ විලියම් ද අල්විස්ය. ඔවුන් දෙදෙනාම කෘති තුන බැගින් පරිවර්තනය කර ඇත. ටෙනිසන් පෙරේරා, අනඳපිය කුඩාතිහි, ධර්මදාස ගුණවර්ධන හා සුදත් මාස්කෝරාල කෘති දෙක බැගින් පරිවර්තනය කර තිබේ.

තාගෝර්ගේ පරිවර්තන වැඩිම සංඛ්‍යාවක් ප්‍රකාශයට පත් කර ඇත්තේ ඇස්. ගොඩගේ සමාගමය. එය කෘති 11 කි ඇම්. ඩී. ගුණසේන සමාගම කෘති 07 ක් ද සරසවි ප්‍රකාශන සමාගම කෘති 04 ක් ද පළ කර තිබේ.

**ඉන්දියානු ඉංග්‍රීසි සාහිත්‍යය**

දේශීය භාෂාවන්ගෙන් ප්‍රබන්ධකරණයේ යෙදෙන ලේඛකයන්ට අමතරව ඉංග්‍රීසි භාෂාව තම නිර්මාණකරණයේ භාෂා මාධ්‍ය බවට පත් කරගත් ඉන්දියානු ලේඛකයන් රැසක් සිටී. මෙයින් ඇතැමෙක් ඉන්දියානු භූමියේ ම ජීවත් වන අතර තවත් සමහරු විදෙස් රටවල වාසය කරති. තම රටේ රැඳී සිටිමින් ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රබන්ධ නිර්මාණය කළ හා කරන ලේඛකයන් අතරින් ආර්. කේ. නාරායන්, කමලාදාස් කුෂ්වන්ත් සිං, භවානි භට්ටාචාර්ය, මුලක් රාජ් ආනන්ද්, අරුන්දතී රෝයි, අරවින්ද් අඩිගාඩ චේතන් භගත්, රාජා රාඕ යනාදීන් ප්‍රමුඛස්ථානයක් ගනී. එමෙන් ම සල්මාන් රුෂ්ඩි, වී. එස්. නයිපෝල්, අනීටා දේසායි, කිරාන් දේසායි, ජුම්පා ලහිරි, කමලා මන්කන්ඩයා, වික්‍රම් සෙත් යනාදීන් විදේශයන්හි ජීවත් වෙමින් ප්‍රබන්ධ ලේඛනකරණයේ නියැළෙන ලේඛකයන් (ඩයස්පෝරා ලේඛකයන්) අතරින් කැපී පෙනේ. මෙම ලේඛකයන් ඇතැමෙකු බුකර් සම්මානයෙන් පිදුම් ලබා ඇත. එය එංගලන්තයේ ප්‍රකාශිත ඉංග්‍රීසි භාෂාවෙන් ලේඛනයේ යෙදෙන ප්‍රබන්ධ කතුවරුන් සඳහා පිරිනැමෙන ත්‍යාගයකි. මේ වන විට ඉන්දියානු කතුවරුන් දස දෙනෙකුට බුකර් සම්මානය හිමි වී ඇත. ඒ අතරින් සල්මාන් රුෂ්ඩි, වී. එස්. නයිපෝල්, අනීටා දේසායි, අරුන්දතී රෝයි, කිරාන් දේසායි සහ අරවින්ද් අඩිගා යන ලේඛකයන්ගේ කෘති එකක් හෝ ඊට වඩා සිංහල පාඨකයාට පිළිගැන්වීමට පරිවර්තකයන් කටයුතු කර ඇත. එහෙත් රොහින්ටන් මිස්ත්‍රි, ඉන්ද්‍ර සිංහ, අමිතව් ඝෝෂ් සහ ජීත් තයිල් යන ලේඛකයන්ගේ එකදු කෘතියක් හෝ සිංහලයට පරිවර්තනය කර නොමැත.

**පරිවර්තක විශ්ලේෂණය**

ඉන්දියානු ප්‍රබන්ධ කෘති සිංහල පාඨකයා අතට පත් කිරීම සඳහා දායක වී ඇති පරිවර්තකයන් සංඛ්‍යාව 235 කි. එම පරිවර්තකයන් අතරින් ප්‍රමුඛස්ථානය හිමි වන්නන් 7 වගුවේ දැක් වේ.

| පරිවර්තක | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| ගුණතිලක මැටියගනේ | 30 | 6.1% |
| උපාලි ලීලාරත්න | 24 | 3% |
| බොබී ජී. බොතේජු | 13 | 5% |
| චින්තා ලක්ෂ්මී සිංහාරච්චි | 10 | 2% |
| සේනාරත්න වීරසිංහ | 09 | 1.9% |

7 වගුව : පරිවර්තක විශ්ලේෂණය

මෙයින් පෙනී යන්නේ ඉන්දියානු ප්‍රබන්ධ සිංහල පාඨකයාට හඳුන්වා දීමේ දී ගුණතිලක මැටියගනේගේ දායකත්වය කැපී පෙනෙන බවය. එමෙන් ම මෙම ඇතැම් පරිවර්තකයන් විශේෂිත භාෂා සාහිත්‍යයකට හෝ ශානරයකට වැඩි අවධානය යොමු කර ඇති බව පෙනේ. බොබී ජී. බොතේජු ඉන්දියානු කෙටිකතා පරිවර්තනය වෙත විශේෂ නැඹුරුවක් දක්වා අති අතර උපාලි ලීලාරත්න දෙමළ සාහිත්‍ය වෙත ද, චින්තාලක්ෂ්මී සිංහාරච්චි බෙංගාලි සාහිත්‍ය වෙත ද තම අවධානය මුළුමනින්ම යොමු කර ඇත. එමෙන් ම පරිවර්තිත කෘති සංඛ්‍යාව අනුව පරිවර්තකයන්ගේ ගණන මෙසේ දැක්විය හැකිය.

| කෘති පරාසය | පරිවර්තක සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 10 ට වැඩි | 03 | 1% |
| 6-10 | 12 | 5% |
| 2-5 | 63 | 27% |
| එකක් පමණක් | 157 | 67% |
| | 235 | 100% |

8 වගුව : පරිවර්තිත කෘති සංඛ්‍යාව සහ පරිවර්තකයන් ගණන

### ප්‍රකාශක විශ්ලේෂණය

ඉන්දීය ප්‍රබන්ධ සිංහල පාඨකයා අතට පත් කිරීමට උත්සුක වී ඇති ප්‍රධාන ග්‍රන්ථ ප්‍රකාශකයන්ගේ දායකත්වය 9 වගුවෙහි දැක්වේ. ඉන්දීය ප්‍රබන්ධ පරිවර්තන පළ කර ඇති සමස්ත ප්‍රකාශකයන් සංඛ්‍යාව 110 කි. මේ අතරින් අතිබහුතරය වාණිජ ප්‍රකාශකයන් වන අතර රාජ්‍ය සහ කර්තෘ ප්‍රකාශකයන් ද ඊට දායක වී ඇත.

| ප්‍රකාශක | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| ඇස්. ගොඩගේ | 125 | 26% |
| විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය | 51 | 10% |
| ඇම්.ඩී. ගුණසේන | 37 | 8% |
| ෆාස්ට් පබ්ලිෂිං | 30 | 6% |
| සරසවි | 18 | 4% |

9 වගුව : ප්‍රකාශක විශ්ලේෂණය

මෙයින් පැහැදිලි වන්නේ ඉන්දීය ප්‍රබන්ධ පරිවර්තන පාඨකයා වෙත පිරිනැමීමට ඇස්. ගොඩගේ සමාගම ප්‍රධාන වශයෙන් කටයුතු කර ඇති බවය. විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය සහ ඇම්. ඩී. ගුණසේන යන ප්‍රකාශකයන් පිළිවෙළින් ඊළඟ ස්ථාන දෙක හිමි කරගෙන තිබේ. එක් ඉන්දියානු ප්‍රබන්ධ පරිවර්තනයක් පමණක් පළ කර ඇති ප්‍රකාශකයන්ගේ ගණන 60 කි.

**පිටු ගණන විශ්ලේෂණය**

සිංහලයට පරිවර්තනය වී ඇති ඉන්දියානු ප්‍රබන්ධවල පිටු පරාසය විශ්ලේෂණය ද වැදගත් වේ. මන්ද, ප්‍රබන්ධ පරිවර්තකයන්ගේ නැඹුරුව මෙන් ම පාඨකත්වය පිළිබඳ යම් අවබෝධයක් එයින් ලබාගත හැකි හෙයිනි. ඒ පිළිබඳ සංඛ්‍යාත්මක තොරතුරු 10 වගුවේ දැක්වේ.

| පිටු පරාසය | කෘති සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 48-100 | 107 | 22% |
| 101-200 | 197 | 40% |
| 201-300 | 116 | 24% |
| 301-400 | 43 | 9% |
| 401-500 | 18 | 4% |
| 500 ට වැඩි | 07 | 1% |
| | 488 | 100% |

10 වගුව : පිටු පරාස විශ්ලේෂණය

සමස්ත කෘති සංඛ්‍යාව වන 488න් 420 ක් ම (86%) පිටු 48-300 දක්වා පරාසයට අයත් කෘති බව පැහැදිලිය. මෙයින් ද බහුතරය පිටු 101-200 දක්වා පරාසයට අයත් වේ.

**සමාලෝචනය**

1948-2015 දක්වා සිංහලයට පරිවර්තනය වූ ඉන්දියානු ප්‍රබන්ධ පිළිබඳ ඉහත විශ්ලේෂණය අනුව එකී පරිවර්තනවල කාලානුක්‍රමික රටාවේ පැහැදිලි ලක්ෂණ හඳුනා ගත හැකිය. ඒ අනුව 21 වන සියවසෙහි ගෙවී ගිය වසර 15 තුළ ඉන්දියානු ප්‍රබන්ධ සිංහලයට පරිවර්තනය වීම ඉහළ සීඝ්‍රතාවක් අත් කර ගෙන ඇත. විශේෂයෙන් 1990 දශකයේ මැද භාගයේ පමණ සිට සිදු වෙමින් පවතින සංස්කෘතික ගෝලීයකරණය මීට හේතු විය හැකිය. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සබඳතා පුළුල් වීමත් රටවල් අතර සංක්‍රමණය ව්‍යාප්ත වීමත් ආනයන අපනයන කටයුතු ලිහිල් වීමත් මෙම තත්ත්වයට බලපා ඇති බව පෙනේ. එමෙන් ම 1970 දශකයේ ඉන්දියානු ප්‍රබන්ධ පරිවර්තනය අවම මට්ටමක පැවතීම සැලකිය යුතු කරුණකි. මෙම දශකයේ දී පැවැති ඉංග්‍රීසි සහ රුසියානු සාහිත්‍ය පරිවර්තනයේ ආධිපත්‍ය ඊට හේතු වූ බව පැහැදිලිය.

අනෙකුත් ශානර අභිබවා නවකතා වෙත පරිවර්තකයන්ගේ යොමු වීම සාමාන්‍ය තත්ත්වයකි. ස්වතන්ත්‍ර ප්‍රබන්ධයන්හි ද දැකිය හැක්කේ මීට සමාන්තර තත්ත්වයකි. මීට හේතුව මෙරට පාඨක සමාජය තවමත් පද්‍ය, කෙටිකතා, සහ නාට්‍ය වැනි ශානර කියවීම් කෙරෙහි දක්වන අඩු නැඹුරුව වේ. අනෙකුත් ශානරවලට වඩා නවකතාව අධිනිශ්චය වීම අනෙකුත් බොහෝ රටවල ද දැකිය හැකිය. පද්‍ය වැනි ශානරයන් වෙනත් භාෂාවකට පරිවර්තනය කිරීමේ දුෂ්කරතාව නිසා පද්‍ය කෘති පරිවර්තනය වෙත අඩු අවධානයක් යොමු වී ඇති බව පෙනේ. විශේෂයෙන් අරුත, රිද්මය, රූපක හා ව්‍යංගය ද රැකගෙන පද්‍ය වෙනත් බසකට පෙරළීම පහසු කාර්යයක් නොවේ. පරිවර්තනය වී ඇති නාට්‍ය කෘතිවලින් අතිබහුතරයක් සංස්කෘත නාට්‍ය වේ. විශේෂයෙන් සාහිත්‍ය විචාරය සම්බන්ධයෙන් සංස්කෘත විචාර කලාවේ බලපෑමත් පාසල් සහ විශ්වවිද්‍යාල පාඨමාලා සඳහා සංස්කෘත නාට්‍ය නිර්දේශ කර තිබීමත්, ඒ තත්ත්වයට හේතු වී ඇත. සංස්කෘත පද්‍ය හා නාට්‍ය පරිවර්තන කෘති 1950 දශකයේ සිට 2000 දෙවන දශකය දක්වා ම අඛණ්ඩව පළ වන්නේ එහෙයිනි. 2000-2009 දක්වා කාලය තුළ ශුන්‍ය තත්ත්වයට පත් වන සංස්කෘත පරිවර්තන 2011-2013 කාල සීමාව තුළ යළිත් වර්ධනීය තත්ත්වයක් අත් කරගනී. මෙයට ප්‍රධාන වශයෙන් ම හේතු වී ඇත්තේ ඇස්. ගොඩගේ සමාගම විසින් පැරණි සම්භාව්‍ය කෘති යළි මුද්‍රණය කිරීම සඳහා දියත් කරන ලද ව්‍යාපෘතියයි. එහෙත් 2014-2015 කාල සීමාව තුළ යළිත් එම තත්ත්වය වෙනස් වනු දක්නට ලැබේ.

ඉන්දියානු සාහිත්‍යයේ භාෂාව අනුව සලකා බැලීමේ දී සිංහලයට පරිවර්තනය වී ඇති ප්‍රධාන භාෂාවන් පහෙන් සංස්කෘත හැර අනෙකුත් භාෂා එනම්, ඉංග්‍රීසි, බෙංගාලි, දෙමළ සහ හින්දි ප්‍රබන්ධ පරිවර්තනවල ප්‍රකාශනය 1990 දශකයේ සිට සීඝ්‍ර වර්ධනයක් අත් කරගනී. මේ අතරින් දෙමළ සාහිත්‍ය පරිවර්තනයේ වර්ධනය කැපී පෙනේ. 1948-1989 දක්වා ම ඉන්දියානු දෙමළ ප්‍රබන්ධයන් සිංහලයට පරිවර්තනය වී නැති එහෙත් 2000 දශකයේ කෘති 25ක් ද 2011-2015 දක්වා වසර පහ තුළ පමණක් කෘති 40 ක් ද සිංහලයට පරිවර්තනය කර ඇත. කෙසේ වෙතත්, 1990න් පසු ඉන්දියානු ඉංග්‍රීසි සාහිත්‍යයේ පරිවර්තනවල ආධිපත්‍ය අඛණ්ඩව වර්ධනය වේ. සංස්කෘතික ගෝලීයකරණයේ භාෂාව ලෙස ඉංග්‍රීසි පෙරමුණට පැමිණීම හේතු කොටගෙන 21 සියවස තුළ ඉන්දියානු ඉංග්‍රීසි සාහිත්‍යයේ විශාල පිබිදීමක් දක්නට පුළුවන. විශේෂයෙන් ඉංග්‍රීසි භාෂාව හරහා දේශ සීමා ඉක්ම වූ පාඨකත්වයන් ආමන්ත්‍රණය කිරීමට ඉන්දියානු ප්‍රබන්ධකරුවන්ට හැකි වී ඇත. ගෝලීයකරණයත් සමඟ නාගරික සහ අර්ධ නාගරික ඉන්දියානු සමාජයේ සිදු වන පරිවර්තනයන් මෙම ප්‍රබන්ධකරුවන්ගේ මූලික තේමාත්මක මානය වී තිබේ. ශ්‍රී ලංකික සමාජය තුළ ද මෙම පරිවර්තනය අඩු වැඩි වශයෙන් සිදු වෙමින් පවත්නා බැවින් මෙරට පරිවර්තකයන් එම කෘති පරිවර්තනයට ආශක්ත වී ඇති බව පැහැදිලිය. මෙය සංස්කෘතික ගෝලීයකරණය ප්‍රබන්ධ සාහිත්‍යයට බලපාන ආකාරය පිළිබඳ අගනා සාක්ෂියකි. මෙහි දී ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රබන්ධකරණයේ යෙදුණු පෙර පරම්පරාවේ ලේඛකයන් වන ආර්. කේ. නාරායන්, මුල්ක් රාජ් ආනන්ද්, අනීටා දේසායි, කුෂ්වන්ත් සිං, වික්‍රම් සෙත් යනාදීන්ට අමතරව 21 සියවස ලේඛනකරණයට පිවිසි චේතන් භගත්, අරවින්ද් අඩීගා, කිරාන් දේසායි, ජුම්පා ලහිරි වැනි ප්‍රබන්ධකරුවන් වෙත සිංහල පරිවර්තකයන්ගේ අවධානය යොමු වී තිබීම වැදගත්ය. මේ අතරින් චේතන් භගත්ට විශේෂ ස්ථානයක් හිමි වේ. බාහිර ලෝකය තුළ අතිශයින් ම ජනප්‍රිය ඉන්දියානු ප්‍රබන්ධකරුවා බවට පත්ව ඇත්තේ ඔහුය. Time සඟරාව ඔහුව හඳුන්වන්නේ ලොවට බලපෑම් කළ හැකි විශිෂ්ට පුද්ගලයන් සියදෙනා අතරින් කෙනෙකු ලෙසය. New York Times පුවත්පතට අනුව චේතන් භගත් යනු වැඩිම අලෙවියක් හිමි ඉංග්‍රීසි බසින් නවකතා රචනයේ යෙදෙන ලේඛකයාය. එමෙන්ම ඇමෙරිකා එක්සත් ජනපදයේ Fast සමාගම පවසන ආකාරයට ඔහු ව්‍යාපාරික ලෝකයේ වඩාත් නිර්මාණාත්මක පුද්ගලයන් සියදෙනාට ඇතුළත්ය. චේතන් භගත් 2015 දක්වා නවකතා 06 ක් නිර්මාණය කර ඇති අතර ඒ සියල්ලම සිංහලයට පරිවර්තනය වී තිබේ. මෙම කාර්යයහි වැඩි ගෞරවය දිලීප ජයකොඩිට හිමි වේ. ඔහු චේතන් භගත්ගේ කෘති 05 ක් ම සිංහලයට නඟා තිබේ.

කෙසේ වෙතත් සිංහල පරිවර්තකයන්ගේ ප්‍රධාන අවධානය සර්වකාලීනව දිනාගත් ඉන්දියානු ලේඛකයන් දෙදෙනෙකු සිටී. එනම්, ආර්. කේ. නාරායන් සහ රබීන්ද්‍රනාත් තාගෝර්ය. 1950 දශකයේ සිට වර්තමානය දක්වා ම ඔවුන්ගේ කෘති පරිවර්තනය වන අතර නිරන්තරයෙන් පුනර් මුද්‍රණය කෙරේ.ඔවුන් විසින් තම ප්‍රබන්ධ හරහා විනිවිදින තේමාවන් මිනිස් විෂය සමඟ සදාතනිකව බැඳී තිබීම මීට හේතු විය හැකිය. පූර්ව නූතන, නූතන මෙන් පශ්චාත් නූතන යන සියලු ආකාරයේ පාඨක ප්‍රවර්ග මෙම ප්‍රබන්ධ වෙත ආකර්ෂණය වන්නේ එහෙයිනි.

ඉන්දියානු ප්‍රබන්ධ වැඩි වශයෙන් ම සිංහලයට නඟා ඇති පරිවර්තකයන් අතරින් සේනාරත්න වීරසිංහ සහ චින්තා ලක්ෂ්මි සිංහාරච්චි පරිවර්තන කාර්ය ආරම්භ කරනුයේ 1980 දශකයේ දීය. අනෙකුත් පරිවර්තකයන් තිදෙනා වන ගුණතිලක මැටියග නේ, බොබී පී. බොතේජු සහ උපාලි ලීලාරත්න 1990 දශකයේ දී පරිවර්තන කාර්ය අරඹා ඇත. අකල් මරණයකට ගොදුරු වූ චින්තා ලක්ෂ්මී සිංහාරච්චි හැර අනෙක් පරිවර්තකයන් සිව්දෙනාම මේ දක්වා අඛණ්ඩව පරිවර්තන කාර්යයේ නියැළෙති. චින්තා ලක්ෂ්මිගේ විශේෂත්වය වූයේ ඇය බෙංගාලි සාහිත්‍ය බංග බසින්ම සිංහලයට පරිවර්තනය කිරීමය. බොබී පී. බොතේජු කෙටිකතා ශානරය වෙත වැඩි අවධානයක් යොමු කර ඇත. සිංහල පාඨකයාට දෙමළ සාහිත්‍ය හඳුන්වා දීමේ දී උපාලි ලීලාරත්න කරන ලද දායකත්වය විශිෂ්ට මට්ටමක පවතී.

ඉන්දියානු ප්‍රබන්ධ පරිවර්තන සිංහල පාඨකයාට පිරිනැමීම සඳහා දායක වූ ප්‍රකාශකයන් කලින් කලට විවිධත්වයෙන් යුක්ත වේ. එහෙත් 1980 දශකයේ සිට මේ දක්වා මෙම කාර්යයේ පෙරමුණ ගැනීමට ඇස්. ගොඩගේ සමාගම සමත් ව තිබේ. මෑත කාලයේ සිට විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය සහ ෆාස්ට් පබ්ලිෂිං ආයතනය ඉන්දියානු ප්‍රබන්ධ පරිවර්තන ප්‍රකාශනය වෙත වැඩි අවධානයක් යොමු කර ඇත.

මුල් කෘතිය ප්‍රකාශයට පත් වූ වසර සහ පරිවර්තනය පළ වූ වසර අතර පරතරය මෑත කාලීනව අඩු වන ආකාරය නිරීක්ෂණය කළ හැකිය. චේතන් භගත්ගේ කෘති නිදසුනකට ගතහොත් මෙම පරතරයේ සාමාන්‍ය වසර 4% ක් පමණ වේ. රටවල් අතර සංස්කෘතික අවබෝධය පුළුල් කිරීමේ අර්ථයෙන් ගත් විට මෙය සාධනීය ප්‍රවණතාවකි. මන් ද, ගෝලීය පුරවැසිභාවයක් වෙත ගමන් කිරීමේ දී අනෙකුත්

රටවල (මෙහි දී සමීපතම අසල්වැසියාගේ) සමාජ සංස්කෘතික වෙනස්කම් වටහා ගැනීම අත්‍යවශ්‍ය සාධකයක් වන හෙයිනි.

සිංහලයට පරිවර්තනය කිරීම සඳහා ප්‍රබන්ධ කෘති තෝරා ගැනීමේ දී ඉන්දියාවේ සාහිත්‍ය ඇකඩමි සම්මාන ලාභී කෘති තෝරා ගැනීමට පරිවර්තකයන් අවධානය යොමු කර ඇත්තේ මඳ වශයෙනි. මෙය ඉන්දියාවේ ප්‍රධාන ලිඛිත භාෂා 24ක විශිෂ්ටතම සාහිත්‍යමය කෘති සඳහා වාර්ෂිකව පිරිනැමෙන සම්මානයකි. නිදසුනක් ලෙස 1960 සිට 2015 දක්වා විශිෂ්ටතම ඉන්දියානු ඉංග්‍රීසි නවකතාව වෙනුවෙන් කතුවරු 19 දෙනෙකු සම්මානයට පාත්‍ර වී ඇත. ඒ අතරින් සිංහල පාඨකයා වෙත පැමිණ ඇත්තේ ආර්. කේ. නාරායන්, රාජා රාඕ, මුල්ක්රාජ් ආනන්ද්, චමන් නහල් සහ අනීටා දේසායි යන කතුවරුන් සය දෙනා පමණි. රාමා මේථා, අරුන් රෝයි, නයනතාරා සගාල්, වික්‍රම් සෙත්, අමිතව් ඝෝෂ්, ශාෂි දේශ්පාන්ද්, සුනේත්‍රා ගුප්තා, කිරාන් නගරකර්, අමිත් චෞද්රි, උපමන්යු චැටර්ජි, රූපා බජ්වා, මාලනී රාඕ, ඊස්ටර් ඩේවිඩ් සහ සයිරස් මිස්ට්‍රි යන සම්මානලාභී අනෙකුත් ලේඛකයන් සිංහල පාඨක ප්‍රජාවට තවමත් ආගන්තුකය. එමෙන් ම බුකර් සම්මානයෙන් පිදුම් ලද රොහින්ටන් මිස්ත්‍රි, ඉන්ද්‍ර සිංහ, අමිතව් ඝෝෂ් සහ ජින් තයිල් ද තවමත් සිංහල පාඨක සමාජය වෙත පැමිණ නොමැති ලේඛකයන්ය. අනෙකුත් ඉන්දියානු භාෂා සාහිත්‍යය පරිවර්තන සම්බන්ධයෙන් ද දැකිය හැක්කේ මීට සමාන්තර තත්ත්වයකි. එහෙයින් විවිධත්වයෙන් යුත්, වඩාත් උසස් ප්‍රබන්ධ සාහිත්‍යයක රසය සිංහල පාඨකයා වෙත රැගෙන ඒමට පරිවර්තකයන්ගේ අවධානය යොමු වීම වැදගත් වේ. මන්ද පරිවර්තකයා යනු සංස්කෘතින් අතර පාලමක් ඉදි කිරීමේ කාර්යයේ නියැලී සිටින්නෙකු බැවිනි. ඔහු/ඇය සංස්කෘතීන් අතරට මැදිහත් වන අයෙකු වන බැවිනි. සංස්කෘතික ගෝලීයකරණය දරාගත හැකි සමාජයක් බිහි කිරීමේ දී පරිවර්තකයාගේ භූමිකාව වඩාත් ප්‍රතිඵලදායක වනු ඇත්තේ එවන් උසස් සාහිත්‍යයක ඇසුර පාඨකයාට ලබා දෙන්නේ නම් පමණි.

ආශ්‍රිත ග්‍රන්ථ


1. Bernaka, Anna (2012). The importance of translation studies for development Education, Development Education Review Issue 14, PP. 12-17

2. Chaudri, Supriya (2012). Translation and world literature. onlinelibrary. Willey.com. accessed on 15.007.2007

3. Mustapa, Sabina K. Amitav (2013). Translation, a bridge for cultural hybridity in a globallied literary world. www.ijhssi.org.accesied on 25.07.2017

4. Wikipedia.org/wiki/sahityaacademy awards.accessed on 01.08.2017

# දේශීය ඥානය අඛණ්ඩ පැවැත්මට ජන කවියෙහි ශාස්ත්‍රීය දායකත්වය පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්

ආර්. ඩී. ආනන්ද තිස්ස
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති
ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය

**සාරාංශය**

ජන කවිය හඳුන්වන්නේ 'හදවත් ගීත' නමිනි. සාමාන්‍ය ජනයාගේ ජීවන සටන පවත්වාගෙන යාමේ දී විඳින්නට සිදුවන අනේකවිධ දුක්ඛ දෝමනස්සයන් හා වින්දනය ජනකවියේ පදනම ලෙස සැලකිය හැකිවේ. ජන කවිවලින් ප්‍රතිනිර්මාණය වී ඇත්තේ ජන ජීවිතයේ පවතින කටුක බව නිසා ඇතිවුණු සංතාප සිතුවිලි සමුදාය හෙවත් වේදනාවේ ප්‍රතිරාවය බොහෝ විට ජන කවියෙන් විද්‍යමාන වේ. කාව්‍යයකින් ඉදිරිපත් කරන අදහස් අනෙක් බසකින් පැවසිය හැකිය.වචන ද අනෙක් බසකට පෙරළිය හැකිය. එහෙත් ශබ්දාර්ථ දෙකෙහි සංකලනයෙන් සිද්ධ වූ සමස්ථාර්ථවත් වින්දනය හෙවත් කාව්‍යය පරිවර්තනය කිරීම අසීරු ය. කවියා භාෂාවේ ව්‍යංජන ශක්තියෙන් උපරිම ප්‍රයෝජන ගන්නෙකි. ශාස්ත්‍රීය ලේඛනයේ දී මෙන් අර්ථය අවබෝධ කර ගැනීම පිණිස පමණක් වචන භාවිතයක් කාව්‍යයෙහි නොමැත.

'දැනුම' හෙවත් 'ඥානය' යන ව්‍යවහාරය වර්තමානයේ පෘථුල වශයෙන් ව්‍යාප්ත වී පවතින්නකි. මෙහි අර්ථය, 'දැනීම' නොහොත් මානවයා විසින් විවිධ විෂයයන් හා කරුණු පිළිබඳ රැස්කර ගත් දැනුම් සම්භාරයකි. අනුරාධපුර යුගයේ රචිත සියබස්ලකර නම් ග්‍රන්ථයේ 'පෙදෙන් බුදු සිරිතැ' යන නිර්දේශයෙන් ආරම්භ වූ කාව්‍ය සම්ප්‍රදාය ක්‍රමයෙන් විකාසනය වී කෝට්ටේ යුගයේ දී විස්තෘත සාහිත්‍යාංගයක් බවට පරිවර්තනය විය.

නව්‍ය අංග ලක්ෂණ රාශියකින් පෝෂණය වූ කවිය විදග්ධ සම්ප්‍රදායෙන් බැහැර ව ජනතාවගේ හදවතට වඩාත් සමීප සාහිත්‍යාංගයක් බවට පත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ජන කවිය බිහි විය. පොදු ජනතාවගේ ජීවන අත්දැකීම් කාව්‍යමය ස්වරූපයෙන් හා සරල බස් වහරින් ප්‍රකාශිතව වාචනා මාර්ගයෙන් පරම්පරානුයාතව පවත්වා ගෙන යාම මෙහි විශේෂත්වයකි. මහනුවර රාජ්‍ය සමයේ දී විවිධ ක්ෂේත්‍රයන්හි ව්‍යාප්ත වෙමින් වඩාත් පෝෂණය වූ ජනශ්‍රැති සම්ප්‍රදාය හා ජන කවිය දේශීය ඥානය අඛණ්ඩව පවත්වා ගැනීමටත්, පොදු ජනතාවගේ

සිතුම් පැතුම් අනාගත පරම්පරාවට දැනුම්වත් කිරීමටත් විවිධ ස්වරූපයන් යටතේ ව්‍යාප්ත වී ඇත. ඒවායේ අන්තර්ගත විෂය ක්ෂේත්‍රය අනුව වර්ගීකරණයන් ද දක්නට ලැබේ.

**මූලික පද : ගැමි ගී, ජන කවිය, ජනශ්‍රැති අධ්‍යයනය, දේශීය ඥානය, සිංහල කාව්‍ය සම්ප්‍රදාය**

## හැඳින්වීම

පොදු ජනතාව උදෙසා, පොදු ජනතාව විසින් ගොඩනගන ලද ජන කවිය, ජනශ්‍රැතිය හා ජන සාහිත්‍යය සම්ප්‍රදාය දීර්ඝ කාලයක් මුළුල්ලේ පරම්පරානුයාතව පැවතෙන්නකි. උගතුන්, රජවරුන් හා ප්‍රභුවරුන් කේන්ද්‍ර කරගත්, විදග්ධ භාෂා ව්‍යවහාරයක් සහිත සම්භාව්‍ය සාහිත්‍යය මහා සම්ප්‍රදාය ලෙස ද, පොදු ජන ව්‍යවහාරයක් වූ ජනකවිය චූල සාහිත්‍ය සම්ප්‍රදායක් වශයෙන් ද සලකනු ලැබේ. බටහිර මතවාද අනුව යමින් කුලවාදී සමාජය පදනම් කරගෙන සිංහල ජනකවිය චූල සාහිත්‍ය සම්ප්‍රදායක් වශයෙන් හුවාදැක්වුව ද එය චූල සාහිත්‍ය සම්ප්‍රදායට අයත් නොවේ. (සිරිසේන, 2007)

පොදු ජනතාවගේ අව්‍යාජ අත්දැකීම් කාව්‍යමය ස්වරූපයෙන් නිර්මාණය කරන ලද ජන ගායනා (ගැමි ගී), ජන කවි හා ජන කථා ආදිය සහ 685කට වඩා වැඩි සීගිරි කුරුටු ගී (සීගිරි පද්‍ය) ඇසුරෙන් ශ්‍රී ලාංකික ජනතාවගේ සිතුම් පැතුම් හා පුරුෂාර්ථ පිළිබඳ සාහිත්‍යමය වටිනාකමක් සහිත තොරතුරු අන්තර්ගත වේ. සිංහල සාහිත්‍යයේ අපට හමුවන පැරණිම පද්‍යාවලිය සීගිරි කැටපත් පවුරේ සටහන් කරන ලද කාව්‍යාවලිය වේ. (එහි ම) කෝට්ටේ යුගයෙන් පසු පුළුල් සාහිත්‍යාංගයක් බවට පත් වූ ජනකවිය මහනුවර රාජ්‍ය සමයේ දී විවිධ ක්ෂේත්‍ර කරා ව්‍යාප්ත වෙමින් වඩාත් පෝෂණය විය.

ජන කවියා තමාට ඇති වූ දුක් පීඩාවන් ප්‍රකාශ කළ අතර එම නිර්මාණවල ගැඹුරු කාව්‍ය සංකල්පනා දක්නට නොලැබේ. වෙහෙස වී තේරුම් ගත යුතු අදහස් ජන කාව්‍යවල දක්නට නැත. මේ ලක්ෂණය පොදු ජනතාවගේ නිර්මාණයක් සේ පිළිගැනෙන සීගිරි ගීවල ද දක්නට ලැබේ. වර්තමානිකයන්ට සීගිරි ගී තේරුම් ගැනීමට අපහසු වී ඇත්තේ සීගිරි ගීවල භාවිත කාව්‍යෝක්තියේ පවත්නා ගැඹුරක් නිසා නොව එවක භාෂාව තේරුම් ගැනීමට ඇති අපහසුතාවය නිසාය. ජන කවියේ දක්නට ලැබෙන පොදු ලක්ෂණ කීපයක් මෙසේ ය.

(අ) ජන කවි සරල හා අව්‍යාජ ලක්‍ෂණවලින් යුක්ත ය.

(ආ) ජන කවි සංක්ෂිප්ත යී කෙටියෙන් යමක් පැවසීම පොදු ලක්‍ෂණයකි.

(ඇ) සියුම් උපහාසය දක්නට ලැබේ.

(ඈ) ව්‍යංගයෙන් හා ද්වනියෙන් යමක් පැවසීම.

(ඉ) අශ්ශීල වර්ණනා හා යෙදුම් දක්නට නොලැබීම.

(ඊ) දේශීයත්වය දක්නට ලැබීම.

(උ) උපමා හා රූපක කවි සමයෙන් ගත් ඒවා නොවීම.

ජන කවිවල පවතින වැදගත් ලක්ෂණය නම් අව්‍යාජත්වය හා කිවයුත්ත ඍජුවම ප්‍රකාශ කිරීමයි. ඔවුන් අතිශයෝක්තියෙන් කරන ලද විස්තර හා අනවශ්‍ය යෙදුම් භාවිත කර රසිකයා මුළා කිරීමට උත්සුක නොවූහ. තම සිතට ඇති වූ හැඟීම් ඍජු ලෙසට පැවසූ අවස්ථා ජනකවියෙහි දක්නට ලැබේ.

| | |
|---|---|
| පාන්දරට කිතුලෙන් බාගෙන | බොනවා |
| මාන්දමට හබරල තම්බා | කනවා |
| හීන්දර කෝටු මිටි බැඳ | විකුණනවා |
| ඕන් ඔය ලෙසට අපටත් කල | යනවා |

ජන කවිවල පවතින වැදගත් ලක්ෂණයක් නම් සංක්ෂිප්ත බව හෙවත් කිවයුක්ත කෙටියෙන් පැවසීමයි.සංක්ෂිප්ත බව කාව්‍යයේ හරය බව ජන කවියා තේරුම් ගෙන සිටියහ. අතිශයෝක්තියෙන් වර්ණනා කරමින් විශේෂණ යොදමින් කරන වර්ණනා දක්නට ලැබෙන්නේ විදග්ධ කාව්‍ය සම්ප්‍රදායේ ය. රූමත් ස්ත්‍රියක මහ මග යනු දුටු තරුණයෙක් ඔහු සමග විවාහ වීමට කැමති වුවහොත් දිව්‍ය සැප සම්පත් ලබා දෙන බව පවසයි.

| | |
|---|---|
| බුලත් කඩා දෙමි තොල් රතු කර | ගන්ට |
| සපු මල් කඩා දෙමි කොණ්ඩේ සර | සන්ට |
| දිව සළු ගෙනත් දෙමි බඳ වට සර | සන්ට |
| එතොත් ලබා දෙමි දිව සැප වළ | දන්ට |

අපහාස වචනයෙන් කථා නොකර ඥානාන්විතව ඇය මෙසේ උත්තර දෙයි.

බුලත් මොටද කස්තුරි කපුරු කන මට
සපුමල් මොටද නාමල් පළඳිනා මට
දිව සළු මොටද පට සළු ගවසනා මට
අන් හිමි මොටද මගේ රන් කඳ ගෙදර කොට

කුඹුරු යායක් මැදින් හුදකලාව ගමන් කරන රූමත් තරුණියක දුටු තරුණයෙක් ඒ අසල වූ අම්බලමක නතර වී යාමට කථා කරයි.

අල්ලා ගෙන නෙරිය අතකින් කිම ද නගෝ
වසා ගෙන දෙතන අතකින් කිම ද නගෝ
හිමියෙක් නැති ගමන් තනියම කිම් ද නගෝ
අම්බලමේ නැවතී අපි යමු ද නගෝ

මේ අවස්ථාවේ තරුණිය ඔහුගේ අදහස වටහා ගෙන කදිම පිළිතුරක් ලබා දෙයි.

අල්ලා ගෙන නෙරිය මඩ තැවරෙන හින්දා
වසා ගෙන දෙතන බිළිඳුගේ කිරි හන්දා
බාල මස්සිනා පස්සෙන් එන හින්දා
යන්නම් අය්යණ්ඩි ගම රට දුර හන්දා

**පර්යේෂණයේ අරමුණු**

පර්යේෂණයේ ප්‍රධාන අරමුණු යටතේම සෙසු අරමුණු පිළිබඳව ද සංක්ෂිප්ත විස්තරයක් මේ යටතේ සඳහන් කෙරේ.

**ප්‍රධාන අරමුණ**

දේශීය ඥානය අඛණ්ඩව පවත්වා ගැනීමට ජන කවියෙහි ශාස්ත්‍රීය දායකත්වය පිළිබඳ අධ්‍යයනය කිරීම.

**සෙසු අරමුණු**

(අ) විවිධ ස්වරූපයෙන් වර්ග කළ හැකි ජන කවිය පිළිබඳ අධ්‍යයනය කිරීම.

(ආ) කාව්‍ය සම්ප්‍රදායෙහි වෙනත් විෂය ක්ෂේත්‍රයක් නියෝජනය කරන ජන කවියෙහි අන්තර්ගත විෂය පරාසය පිළිබඳ ශාස්ත්‍රීය විමර්ශනයක් කිරීම.

(ඇ) ජන කවියෙන් නිර්දේශිත දේශීය ඥානය උද්ග්‍රහණයකොට එහි ශාස්ත්‍රීය මෙහෙවර විචාරාත්මකව හා විශ්ලේෂණාත්මකව අධ්‍යයනය කිරීම.

(ඈ). ජන කවියේ විශේෂත්වය හඳුනාගැනීම හා එහි අපූර්වත්වය නූතන අධ්‍යාපන කටයුතුවල දී භාවිතයට ගැනීමේ ඇති අවස්ථා නිරීක්ෂණය කිරීම.

(ඉ). වර්තමාන පරපුරට ජන කවියේ විෂය පරාසය පිළිබඳ අවබෝධයක් ලබා දී ඒවා රසවින්දනය පිළිබඳ රුචිකත්වයක් ඇතිකරලීම.

**3. පර්යේෂණ ක්‍රමවේදය**

අද්‍යතන යුගයේ කථිත ව්‍යවහාරයක් නොවන ජන කවි සම්ප්‍රදාය අස්පෘශ්‍ය සම්පතක් වන හෙයින් මෙම අධ්‍යයනයේ දී මුද්‍රිත හා අමුද්‍රිත මෙන් ම ප්‍රකාශිත හා අප්‍රකාශිත සාහිත්‍ය මූලාශ්‍ර පාදක කර ගන්නා ලදි. පසුබිම් තොරතුරු සපයා ගැනීම පිණිස කෝෂ ග්‍රන්ථ, ශබ්ද මාලා, ග්‍රන්ථ නාමාවලී හා නිඝණ්ටු ආදිය ද, මෙම විෂයට ඍජුව ම සම්බන්ධිත විෂය නිර්දේශ ග්‍රන්ථ, පාඨ ග්‍රන්ථ හා පද්‍ය සංග්‍රහයන් ද භාවිත කෙරිණි.

වර්තමානය දක්වා ම ග්‍රන්ථාගත නො වූ මුඛ පරම්පරාගත ශාස්ත්‍රීය වශයෙන් වැදගත් වන ශ්‍රී ලංකාව පුරා විසිරී පවත්නා ජන කාව්‍ය හා ජනශ්‍රැති මූලාශ්‍රයන් පමණක් නොව ක්ෂේත්‍රයේ විද්වත් ප්‍රජාව හා කලාකරුවන් සමඟ පැවැත් වූ සම්භාෂා ආශ්‍රිත දැනුම ද මෙම පර්යේෂණ අධ්‍යයනය සඳහා උපයෝගී විය.

**දේශීය ඥානය ව්‍යාප්තව ඇති විවිධ විෂය ක්ෂේත්‍ර හඳුනා ගැනීම.**

දේශීය ඥාන ප්‍රණාලියක අන්තර්-ක්‍රියාකාරී උපාංග ත්‍රිවිධාකාරයක් දක්නට ලැබේ. (අ) ඥාන පරම්පරාව (knowledge Generation), (ආ) ඥාන පරිවහනය (Transmission of knowledge) හා (ඇ) පද්ධතියේ ක්‍රියාකාරී පහසුව සලසන ආයතනික මිශ්‍රය (Institutional Mix) වශයෙනි. සමස්ත ඥාන උත්පාදන ක්‍රියාවලිය, ඥාන පරිවහනය සහ දේශීය දැනුම් පද්ධතිය ඇතුළත භාවිතයට ගැනීමට අවශ්‍ය පහසුකම් සලසනු ලබනුයේ ආයතනික මිශ්‍රය මගිනි. පොදුවේ සලකන කල දේශීය දැනුම විවිධ උප මාතෘකා යටතේ අධ්‍යයන හා පර්යේෂණ කටයුතුවල දී සාකච්ඡා කෙරේ. එකී අංග මෙසේ සංක්ෂිප්තව හඳුනාගත හැකිය.

**දේශීය දැනුම** (Indigenous knowledge)

කිසියම් රටකට ආවේණික වශයෙන් ප්‍රභවය වූ (ස්වයං-සිද්ධ) හෝ ස්වාභාවිකව නිෂ්පාදිත දැනුම වශයෙන් කෙටියෙන් හැඳින්වේ. ලොව සෑම රටකම ස්වදේශීය දැනුම භාවිතය එහි සංවර්ධන ඉලක්ක ජයගැනීමට මහත් පිටිවහලක් සපයනු ලබයි.

**සාම්ප්‍රදායික දැනුම** (Conventional knowledge)

පරම්පරාගත උපදේශය හෝ ඉගැන්වීම හා පරම්පරාගත අත්දැකීමෙන් ඉදිරියට ගෙන යන දැනුම වශයෙන් සරලව අර්ථ කථනය කෙරේ. පෙරදිග ශිෂ්ටාචාරයකට හිමිකම් කියන ආසියානු කලාපයේ රටක් වශයෙන් අපගේ සාම්ප්‍රදායික දැනුම භාවිතයෙන් අත්පත්කර ගත හැකි ප්‍රතිලාභ රාශියකි. නමුත් බටහිර චින්තනය දේශීය දැනුමට ගැරහීම හා ඒවා ප්‍රතික්ෂේප කිරීම සැලසුම් සහගතව කරන ලදි.

**පාරම්පරික දැනුම** (Traditional knowledge)

පරම්පරානුයාත දැනුම හෙවත් පරපුරෙන් පරපුරට ලබා දෙන දැනුම සෑම ජන සමාජයකටම උරුම වූවකි. මෙම දැනුම පරම්පරා ගණනාවක් තිස්සේ ප්‍රයෝජනයට යොදා ගෙන, අත්හදාබලන ලද්දක් වූ අතර එහි ජේටන අයිතියෙහි උරුමකරුවන් වූයේ අපේ මුතුන්මිත්තන් ය. අත්හදාබැලීම් හා භාවිතය මගින් වැඩි දියුණු කරන ලදුව දැනපුරුද්ද, දැකපුරුද්ද, කළපුරුද්ද හා පළපුරුද්ද අනුව මුඛ පරම්පරාගතව දැනුම හා තොරතුරු පරිවහනය වූ ආකාරය අපගේ නිරීක්ෂණයට භාජනය කළ යුතු ය.

පාරම්පරික දැනුම වශයෙන් හැඳින්වෙන පාරම්පරික ඥානය හෙවත් දැනුම අපේ ජන සාහිත්‍යය නියෝජනය කෙරෙන ජනශ්‍රැතියෙහි ආරක්ෂා වී ඇත්තේ පහත දැක්වෙන ක්ෂේත්‍ර තුනක් යටතේ ය.

(අ) ජනශ්‍රැතියට අයත් ශ්‍රැති වහරෙහි දැනුම.

පුරාණෝක්ති, ආඛ්‍යාන, ජනකතා, කවි කතා, ජන කවි, ප්‍රස්තා පිරුළු හා තේරවිලි ආදියට පිවිසි දැනුම.

(ආ) ඇදහිලි සහ විශ්වාසයන්හි අන්තර්ගත දැනුම.

ශාන්ති කර්ම, අභිචාර විධි, කෘෂිකර්මය වැනි ජන කර්මාන්තවලට අයත් සිරිත් විරිත්, පූජෝත්සව හා ජන නාට්‍යය ආදියෙහි එන දැනුම.

(ඇ) ශ්‍රැති වහරට අයත් නොවන දැනුම.

කලා ශිල්ප, ඇඳුම් විලාසිතා, කෑම බීම, ගෘහ නිර්මාණ ශිල්පය වැනි විවිධ සංස්කෘතික උපාංගවලින් පිවිසි පාරම්පරික දැනුම ආදී වශයෙනි. මේ ආකාරයෙන් පැරැන්නන්ගෙන් ලැබෙන දැනුම යාවත්කාලීන කර ගනිමින් ශ්‍රී ලංකාවේ මානව, සමාජ හා ආර්ථික සංවර්ධනය උදෙසා භාවිත කිරීමේ අවස්ථා පිළිබඳ පර්යේෂණ කිරීමේ අවස්ථා නිරීක්ෂණය කළ හැකිය.

**දේශීය ඥානය අඛණ්ඩ පැවැත්ම උදෙසා ජන කවියේ ශාස්ත්‍රීය දායකත්වය**

සිංහල කවිය ප්‍රාග් බෞද්ධ යුගයෙන් ඔබ්බට පිවිසෙන බව විශ්වාස කෙරේ. ලක්දිව ලේඛන විධිමත් ව සකස්වෙමින් වැඩෙන්නට වූ මුල් අවධියේ පවා ලිය වුණු ශිලා ලේඛන කීපයක් ම පද්‍යයෙන් රචනා වී තිබීම මේ සම්බන්ධයෙන් තවත් වැදගත් වේ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ මරදන්කඩවල අසල කොස්සවකන්ද (කොස්ගොඩ කන්ද) නම් ස්ථානයෙන් ද, දකුණු පළාතේ මාගම් පත්තුවේ කිරින් ද සමීපයේ ද තිබී හමු වූ ශිලා ලේඛන මෙම කාරණය සම්බන්ධයෙන් වැදගත් නිදසුනකි. ජන කවියේ ඉතිහාසය විජයාවතරණය දක්වා ඈත ඉතිහාසයකට දිව යන්නක් බව සඳහන් වුවද,

ජන කවියේ උපත සිදුවූයේ කවදාද යන්න ජන කවියාටම ගැටලුවක් වී ඇත.

අහස උපන් තැන සකි නුබ දන්නවද
පොළව උපන් තැන සකි නුබ දන්නවද
මුහුද උපන් තැන සකි නුබ දන්නවද
සීපද උපන් තැන සකි නුබ දන්නවද

මේ පැනයට තවත් ජන කවියෙක් මෙසේ පිළිතුරු ලබා දී ඇත.

අහස උපන්නේ අස්විද නැකතින් නොවෙද
පොළව උපන්නේ පුවපුටු නැකතින් නොවෙද
මුහුද උපන්නේ මුවසිරි නැකතින් නොවෙද
සීපද උපන්නේ වීණාවෙන් නොවෙද

පූර්වෝක්ත කවියේ සඳහන් ආකාරයට උපත ලැබූ ජන කවිය මහනුවර යුගයට අයත්වන බව පවසන අතර ඒවා 19 වන සියවසේ අගභාගයට වඩා ඈතට නොදිවෙන බව භාෂා විශාරදයෝ හා වාග් විද්‍යාඥයෝ පවසති. ජන කවිය හා ප්‍රස්ථා පිරුළු අතර අවියෝජනීය සම්බන්ධතාවක් දක්නට ලැබේ. ජන කාව්‍ය වෙන ම කොටස් වශයෙන් රචිත ව, දැනටමත් භාවිත වන යහපත් පදමාලා සහිත තවත් ග්‍රන්ථ කීපයක් ද දක්නා ලැබේ.

ජන කවියන් විසින් නිර්මාණය කරන ලද වර්තමානයේ ද සම්භාවනාවට පාත්‍ර වී ඇති යශෝදරාවත, පුරාණ තුන් සරණය හෙවත් හිමගත වර්ණනාව, වෙස්සන්තර ජාතක කාව්‍යය හා පත්තිනි හෑල්ල යනාදී කාව්‍යයන් භක්තිමත් ව ගායනා කළ හැකි, අසන්නා පහන් සංවේගයට පත්කරන, ප්‍රශස්ත භක්ති කාව්‍ය විශේෂයක් වශයෙන් විශිෂ්ටත්වයට පත් වී ඇත. කෘෂිකාර්මික පරිසරයේ කෙතේ හා කමතේ දී සිය පාළුව හා කාන්සිය නැතිකර ගැනීමට බිහි වූවක් වශයෙන් ද සම්මානිත ජන කවිය නිර්මාතෘවරයෙක් නොමැති විශිෂ්ට සාහිත්‍යාංගයකි.

දේශීය ඥානය අඛණ්ඩ පැවැත්මට ජන කවියෙහි ශාස්ත්‍රීය දායකත්වය අතිවිශාල

පරාසයක් තුළ විහිදී ව්‍යාප්ත වී ඇති ආකාරය මෙම පර්යේෂණයෙන් මතුකර දක්වනු ලැබේ. ඒ අනුව දේශීය ඥානය අඛණ්ඩව පවත්වා ගැනීමට මුඛපරම්පරාගතව පවත්වා ගෙන එන ජන කවිය එහි අන්තර්ගත විෂය කරුණු අනුව විවිධ ස්වරූපයන් යටතේ වර්ග කළ හැකිය.

**ප්‍රහේලිකා හා තේරවිලි කවි**

පැරණි සමාජයේ අවුරුදු උත්සව ආදී වෙනත් අවස්ථාවල විවිධ විනෝදාත්මක අවස්ථා දක්නට හැකි විය. එහිදී භාවිත වූ කවි සාහිත්‍යමය අතින් පමණක් නොව වාචනා මාර්ගයෙන් පවතින අලිඛිත දැනුම ආරක්ෂා කිරීමේ දී ඉහළ අගයක් ගෙන ඇත. ප්‍රහේලිකා හා තේරවිලි කවි යටතේ තුන් තේරවිලි කවි, බෙහෙත් තේරවිලි, වෙද ගැට, දහම් ගැට හා ටීකා සිව්පද ද විමර්ශනය කෙරේ.

ප්‍රහේලිකා හා තේරවිලි කවිවලින් ජනතාවට දැනුම පමණක් නොව සාහිත්‍යය රසය ලබාදීමත්, විවිධ අභියෝග හමුවේ නොසැලී අනේක විධ දුක්පීඩා විඳගත් ආකාරයත්, එයින් අපට ලබාගත හැකි ආදර්ශයත් මෙහි දී විශේෂ අවධානයට ලක් වී ඇත. ප්‍රහේලිකා හා තේරවිලි කවි විනෝදාස්වාදය, ඥානය හා තර්කන ශක්තිය වඩවන්නක් විය. සාහිත්‍යමය වශයෙන් කවි ප්‍රහේලිකා යනු සාහිත්‍යයේ දියුණු අවස්ථාවකි.

සිංහල සාහිත්‍යයේ පමණක් නොව පාලි සාහිත්‍යයේ ද උසස් ග්‍රන්ථ අතර විවිධාකාර ප්‍රහේලිකා පාඨ හා කවි සටහන් ඇත. මේවා ගද්‍ය පද්‍ය දෙවර්ගයටම පොදු වූවකි. කව්සිළුමිණ, කාව්‍යශේඛරය, ගුත්තිල කාව්‍ය ආදී කාව්‍ය ග්‍රන්ථවලත්, උම්මග්ග ජාතකය වැනි ගද්‍ය ග්‍රන්ථවලත් මේ ලක්ෂණ දක්නට ලැබේ. දහම් ගැට ගීය, දහම් ගැට හා පදාර්ථ, දහම් ගැට කවි, දහම් ගැට මාලාව ආදී වශයෙන් සිංහල සාහිත්‍ය ඉතිහාසයෙහි ප්‍රහේලිකා පොත් දක්නට ලැබේ. ප්‍රහේලිකා සාහිත්‍යය කෙතරම් පණ්ඩිතාශ්‍රයෙන් ලියැවුණ ද එය ජනතාවට සමීප විය. පැරණි දහම් ගැටවල සඳහන් එවැනි ප්‍රහේලිකාවලින් එය සනාථ වේ.

මී දෙන දමා පි - වස්සන් උනා පි
අමුඩු ගලවා පි - ගොපොලු දිවගොස් ලො වළදා පි

මෙම ප්‍රහේලිකාවේ අර්ථ මෙසේ දැක්වේ. මී දෙන දමා පි මහී ධනය අතැර දැමීය, වස්සන් උනා පි සසර සැරිසරන්නන්ගෙන් (ගිහි ගෙයින්) අත්විදිති, අමුඩු ගලවා පි උකුණු කෙස්වැටිය කපා දමන ලදි, ගොපොලු දිවගොස් ලො වළදා පි සිදුහත් කුමරු (ගොපොලු) මහබිනික්මන් කර ලොකෝත්තර වූ නිවන් අනුභවය කළේය.

මේ ආකාර වූ ගැඹුරු අර්ථයක් ප්‍රකාශ කරන සරල ගැමි වදන් ඇති ප්‍රහේලිකාවක් දරුවන්ගේ කවියක් වශයෙන් භාවිතයේ ඇත.

අම්බලමේ පිනා පිනා - වලන් කදක් ගෙනා ගෙනා
ඒක බිඳපි ගොනා ගොනා - ඒකට මට හිනා හිනා

මේ කවියේ 'අනේක ජාති සංසාරං' යන ගාථා පාඨයෙන් කියැවෙන ගැඹුරු අර්ථය ඇතැයි විද්වත්හු ද ප්‍රකාශ කරති. දහම් ගැට මෙන් ම ඖෂධ ප්‍රහේලිකා ද සරල අයුරින් නිර්මාණය වී ඇත. වටිනා ඖෂධයක් සාදා ගන්නා ආකාරය එහි සැඟවුණු අරුත්වලින් ප්‍රකාශ වේ.

සුරතින් පියයුරු මලවා ගන්නේ - එම පියයුරු කිරි මුබය ගාන්නේ
පෙම්කර අප මුණිරජ වැඩ උන්නේ - වමනෙට යහපති කැඳ පිස ගන්නේ

තුන් බෝ අත්තක සහ මුලින් ගෙන කොටා මලවා බඳිනු. එම කිරි මුඛයේ ගානු. අසටු බෝ පොතු කැඳ පිස දෙනු. සර්ප විෂ මර්ධනයට ඖෂධ විධියක් රැගත් ප්‍රහේලිකා කවියක් ලෙස එය සැලකේ. එම කවියේ නියම අර්ථය හා වාච්‍යාර්ථය සලකා බැලීමේ දී අසභ්‍ය කවි හොඳින් මතක සිටිනවා සේ ම ඖෂධ විධියක් පාඩම්කර ගැනීමට විධිමත් ක්‍රමයක් ලෙස එය භාවිත කර ඇත.

ප්‍රහේලිකා කවි අතර ගැනෙන තේරවිලි කවිය සිංහල ගැමි සමාජයේ කා අතරත් නිරන්තර සාකච්ඡාවට බඳුන්වූවකි. විශේෂයෙන් කුඩා දරු දැරියන්ගේ සිට ලොකු කුඩා සැම දෙනෙකුගෙන්ම බුද්ධිය වඩවන්නා වූ ද කාව්‍ය විශේෂයක් වශයෙන් ඒවා සම්මානිත ය.

ගසට නමකි ගස මැරුණම වෙන නමකි
ගෙඩියට නමකි ගෙඩිය ලෙල්ලට නමකි
මදයට නමකි මද කනකොට වෙන නමකි
මෙතුන් පදේ තෝරාලා කියන් සකි

මෙම තේරවිලි කවියේ පිළිතුර ද මෙසේ දැක්වේ.

ගසට 'ගොයම්' ගස මැරුණම 'පිදුරු' ගස
ගෙඩියට 'වී' ගෙඩියේ ලෙල්ලට 'දහයි' බස
මදයට 'සහල්' සුඹුලට 'කුඩු' කියන ලෙස
කනවිට 'බත්' මාලු සමඟින් බොහොම රස

ජනතාවට සමීප සාහිත්‍ය අංගයක් ලෙස පෝෂණය වූ ප්‍රහේලිකා හා තේරවිලි කවි අතීතයේ සිට දේශීය ඥානය අඛණ්ඩව පවත්වා ගැනීමට විසල් මෙහෙයක් කර ඇත. මෙම කවි අතර වර්තමානය දක්වා සංග්‍රහ නොවූ කටවහරේ තිබෙන කවි රාශියක් ද ඇත. ඒවා අත්පත්කර ගෙන මතු පරපුරේ ප්‍රයෝජනය සඳහා ආරක්ෂා කිරීම කාලීන යුතුකමක් මෙන් ම වගකීමකි.

**පැරණි සමාජයේ ස්වරූපය හෙළිවන කවි**

දඩයම් යන අවස්ථාවක තමන් මුහුණ දෙන අත්දැකීම් අන් අයට පැවසීම, කුලබේදය අනුව පුද්ගල වර්ගීකරණය, වංසවත් මිනිසුන්ගේ ක්‍රියාකලාපය විස්තර කිරීම ආදී ක්ෂේත්‍ර රාශියක මෙබඳු කවි පැතිරී ඇත.

මාමයි මමයි වනාන්තරේ යන කලට
කුළුමීමෙක් ආවයි මට අනින්නට
වටපිට බැලිමි ගසකුත් නැත නගින්නට
පිටපොට ගසා නැග්ගයි මාමගේ කරට

හාස්‍ය ඇතුළත් කර නිර්මාණය කර ඇති මෙම කවිය තමාට සිදු වූ අත්දැකීම තවෙකෙකුට විස්තර කිරීමට භාවිත කර ඇත.

**ජීවිතය විනිවිද දුටු උපදේශාත්මක කවි**

ජීවිතයට ඉතාමත් වැදගත් උපදේශයක් සිව්පදයකින් නිර්මාණය කර ගැනීමට ජනකවියාට හැකි වී ඇත. හුදු රසයට වඩා උපදෙසක් ලබා දීම ජන කවියාගේ අරමුණ නොවුණත් එය සිදු වී ඇත.

කන්දක් තිබෙන පලියට එහි මැණික් නැත
වනයක් තිබෙන පලියට එහි සඳුන් නැත
ගජෙක් හිටිය පලියට ගජමුතු නො මැත
ඔළුවක් තිබුණ පලියට මිනිසෙකු නො මැත

මිනිසත් ආත්මය ලද පමණින් ඔහු මිනිසකු නොවේ. වර්තමාන ශ්‍රී ලාංකික සමාජය දෙස විමර්ශනාත්මකව විපරම් කිරීමේ දී හා බොහෝ සංවර්ධන ඉලක්ක ජය ගැනීම සඳහා කෙරෙන බහුකාර්ය යෝජනා ක්‍රමවල දී ඔළුක් පමණක් ඇති බුද්ධියෙන් තොර වූවන් කොපමණක් සිටීද යන්න සක්සුදක් සේ පැහැදිලි වන කරුණකි.

**විවිධ වෘත්තීන් හා බැඳුණු කවි**

වෘත්තීන් හා සම්බන්ධ කවි ක්ෂේත්‍ර රාශියක් යටතේ විස්තාරණය වී ඇත. එවක පැවති සමාජ තත්ත්වය අධ්‍යයනය කිරීමේ දී වෘත්තීයමය වශයෙන් ඒවා මෙසේ සංක්ෂිප්තව හඳුනාගත හැකිය.

(අ) සකපෝරුවේ කවි (කුඹල් කවි) : කුඹල් (වළන් හා මැටි භාණ්ඩ) කර්මාන්තය.

පැරණිතම වෘත්තියක් වශයෙන් කුඹල් කර්මාන්තය ආශ්‍රිත රැකියා සඳහන් කළ හැකිය. ඒ අනුව දීර්ඝ ඉතිහාසයක් ඇති කුඹල් කර්මාන්තයෙහි මහනුවර අවධියෙහි දී බඩහැල කුලයේ පිරිස නියුක්ත වූ බව ආනන්ද කුමාරස්වාමි මහතා පවසයි. දවසකට වළං පහක් සැපයූ කුඹලෙකුට දිවෙලට ඉඩම් හරියක් ලැබුණු බව 10 වන මිහිඳුගේ සෙල්ලිපියෙහි ද සඳහන් වෙයි. වළං තැනීමේ දී කුඹලාට සකපෝරුව උදව් වෙයි. එය කෙතරම් අගේකොට සැලකේ ද කියතොත් දීග දෙන දුවට ද සකපෝරුවක් දයාද වශයෙන් ලබාදුන් බව රොබට් නොක්ස් සඳහන් කරයි. කුඹල් කුලයට අයත් කුඹල්ලු උඩුකය වසා ඇඳුම් අඳින්නට තහනම් වූවෝ වෙති. (කරුණාරත්න, 2011)

(ආ) කම්මලේ කවි (යමන්නා) : යපස් උණු කිරීම හා ලෝහ (යකඩ) කර්මාන්තය.

පුරාණ වෘත්තීන් අතර යකඩ ආශ්‍රිත කර්මාන්ත ද වැදගත් වෙයි. යපස් එකතු කර ඒවා උණුකර යකඩ තනා ගැනීමටත්, එම යකඩ උපයෝගී කර ගැනීමෙන් අවශ්‍ය අවි ආයුධ තනා ගැනීමටත් සිංහලයෝ දැනසිටියහ. යකඩ කර්මාන්තය මෙරට පැවති කර්මාන්ත අතුරෙන් ප්‍රධාන ස්ථානයක් ගත් බව රොබට් නොක්ස් ද පවසයි. (එහි ම) මහනුවර අවධියෙහි ලංකාවේ යපස් තිබුණු ප්‍රදේශ හා කර්මාන්ත කළ ස්ථාන එකසිය හැත්තෑවක් පැවති බව මන්දාරම් පුවත කවියෙන් ප්‍රකාශ වේ.

හම්බන්තොට ගිරුවා ඌව දෙදුම්බර බිම් තැන්නා
සපරගමුව හා සත්කෝරළේ මන්නාරම තිබෙනා
යකඩ ලොහෝ කම්මල් එකසිය හැත්තෑ පමනා
කරවා දහස් ගණන් නිරතුරු නො කඩව වැඩ කරනා

එවකට ලෝහ කර්මාන්තයෙහි නියුක්ත වූ පිරිස ආචාරී කුලයට හෙවත් නවන්දන්නා කුලයට අයත් වේ. මේ කුලයේ රන් රිදී වැඩ කරන්නෝ, ආචාරීන්, නමින් ද, යකඩින් අවි ආයුධ සාදන්නෝ, නවන්දන්නා වශයෙන් ද, යපස් උණුකොට යකඩ සාදන්නෝ, යමන්නන්, වශයෙන් ද හඳුන්වා ඇත. රොබට් නොක්ස්ට අනුව රන්කරුවන් පිළිබඳ තොරතුරු සඳහන් වන්නේ මෙසේ ය. මේ අවධියේ රන්කරුවෝ බොහෝ ධනවත් ය. දියුණුය, මහනුවර පදිංචි වී රජ්ජුරුවන්ගේ රන්කම් පට්ටලයේ නියුක්ත වූ රන්කරුවෝ විශේෂයෙන් දියුණුය. (එහි ම)

(ඇ) (රෙදි) විවීම හා බැඳුණු කවි : පේෂ කර්මාන්තය හා කපු යන්ත්‍රයේ කවි : කපු කැටීමේ ශිල්පය.

ඈත අතීතයේ සිට ශ්‍රී ලංකාවේ පේෂ කර්මාන්තය දියුණුව පැවති බවට වංශ කථාවල මෙන් ම ජන සාහිත්‍ය සම්ප්‍රදායෙහි තොරතුරු සඳහන් වෙයි. විජය රජුට කුවේණිය හමුවන මොහොත පිළිබඳ තොරතුරු මහාවංශයේ විස්තර කර ඇත. පූර්ව ඓතිහාසික යුගයෙහි පවා මෙරට විසූ පිරිස් වස්ත්‍ර ඇඳි බවට එය හොඳ ම සාක්ෂියකි. පන් නෙළා නූල් කැට රෙදි වියා පඬු පොවා කඨින සිවුරු අසූවක් එක් රැයක් එක් දවසකින් නිම කර පූජා කළ බව පූජාවලියෙහි සඳහන් වේ. මේ සියල්ල එක් රැයකින් නිම කිරීමට

නම්, මෙම කර්මාන්තයෙහි නිපුණත්වයක් ලැබූ වෘත්තිකයන් බොහෝ සිටින්නට ඇත.

කපු නූලෙන් රෙදි විවීම බෙරවායන් කළ බව ද, රන් හුයෙන් රෙදි විවීම ඉන්දියාවෙන් ගෙන්වන ලද චාලියන් (සලාගමයන්) කරන ලද බව ද ආනන්ද කුමාරස්වාමි පවසයි. කපු වැවීම කළ අන්දම පහත සඳහන් කවියෙන් විස්තර වෙයි.

මූකලන් කොටා කපු ඇට ඉසින්නේ
දෙපෙන් වෙලා පැලපත ලොකුවට යන්නේ
සමසක් ගිය කලට මල් බොකල වන්නේ
වෙසක් මසට සුරතල් මල් පිපෙන්නේ

(ඇ) කරත්ත කවි : කරත්ත දක්කීම හා තවලම් මඟින් භාණ්ඩ ප්‍රවාහනය.

පැරණි වෘත්තීන් අතර ගැල්කරුවාට ප්‍රධාන තැනක් ලැබෙයි. ඈත අතීතයෙහි සිටම සිංහලයෝ ගමනාගමනය සහ බඩු ප්‍රවාහනය සඳහා ගැල උපයෝගී කර ගෙන ඇත. එදා ප්‍රධාන මාර්ගවල බඩු භාණ්ඩ ප්‍රවාහනය සඳහා ගැල උපයෝගී කර ගෙන ඇත. වනදුර්ග හා ගිරිදුර්ග පසු කර ගෙන යා යුතු මහාමාර්ග නොමැති ගම්වලට බඩු භාණ්ඩ ප්‍රවාහනය කරනු ලැබුයේ තවලම්වලිනි. ගැල්කරුවා තමා විඳින දුකත්, ගොන්බාන විඳින දුකත් එකම දුකක් වශයෙන් සලකා ඇත. එම දුක්මුසු පුවත ඔහු ප්‍රකාශ කර ඇත්තේ මෙපරිද්දෙනි.

වයිර ගොනා දණ ගහලා අදින කොට
මයිල ගොනා පැන්නයි පස්සට හොරට
මොකද කරන්නේ පූරුවෙ කල පවට
පව් කළ ගොනෝ ඇදපන් ගාල ගාවට

පෙර කර්ම එල දෙන බැවින් කර්මය ගෙවීම පිණිස ගාල ගාවට කෙසේ හෝ ඇද ගෙන යන ලෙස ඉල්ලයි.

බර වැඩිවෙලා ගොන් බානට උනු අවුලේ
කර වණ කෙළේ ඇයි දූයි මුගේ නැද්ද මොළේ
මරලා මූ දම්මොතින් හොඳයි කැලේ
පොත බලලා පඩි දෙනකන් සිටු ගාලේ

බොහෝ අවස්ථාවල ගැල පදවා ඇත්තේ ගැල් හිමියා නොව කුලීකාරයෙකි. ගැලට වැඩියෙන් බඩු පටවා ගොනාගේ කර වණ වුවහොත් තමාට සිදුවන කරදර පිළිබඳ ව ද ජන සාහිත්‍යයෙහි සඳහන් වේ.

(ඉ) පතල් කවි : පතල් හා ඛනිජ කර්මාන්තය.

ශ්‍රී ලංකාවේ මිනිරන් කර්මාන්තය ආරම්භ වූයේ ඉංග්‍රීසි අධිරාජ්‍යවාදයට මේ රට යටත් වීමෙන් පසුව ය. යටත් විජිතයක් ව පැවති අවධියෙහි මෙරට ආරම්භ වූ වෘත්තියක් වශයෙන් මෙම කර්මාන්තය හැඳින්විය හැකිය. ඒ අනුව පතල් කර්මාන්තය ද මෙරට පැවති තවත් වෘත්තියක් වශයෙන් ඉතිහාස ගත වේ. පතල් කර්මාන්තය ආශ්‍රිත ජීවන වෘත්තියෙහි කටුකත්වය ද, ගෙදර දී විවිධ ආහාර වර්ග ගනිමින් ජීවත් වූ ගැමියාට විවිධත්වයෙන් තොර ඒකාකාර ආහාර වේලක් ගැනීමට සිදු වූ බව පහත සඳහන් ජනප්‍රිය ජනකවියෙන් ප්‍රකාශිත ය.

ඉන්නේ දුම්බරයි මහ කළු ගලක් යට
කන්නේ කරවලයි රට හාලේ බතට
බොන්නේ බොර දියයි පූරුවේ කළ පවට
යන්නේ කවදා ද මව්පියො දකින්නට

මිනිරන් පතල්වල මිනිසුන් මෙන් ම ස්ත්‍රීන් ද වැඩ කළ බව සඳහන් වේ. මිනිරන් කැබැලි කිරීම, ශුද්ධ කිරීම හා තේරීම ආදී කටයුතුවල ඔවුන් නියුක්ත ව ඇති බව පහත ජනකවියෙන් ප්‍රකාශ වේ.

කළුවන් කළු රුවයි මංගෝ දිලිසෙනවා
මිනිරන් තෝරන්න දින ගණනට එනවා
මිනිරන් තේරුවොත් ළඳේ නුඹ කළු වෙනවා
ළඟනම් ගෙදර මුර ඇරුනම මම එනවා

(ඊ) ඔරු පාරු කවි : ඔරු පාරු මඟින් මහජනතාව හා භාණ්ඩ ප්‍රවාහනය.

වෘත්තියක් වශයෙන් ගැල්කරුවා මෙන් ම, පාරුකාරයෝ ද ගංගාවල බඩු බාහිරාදිය ද මිනිසුන් ද ගෙන ගොස් ඇත. ශ්‍රී ලංකාවේ පැවැති විවිධ වෘත්තීන් පිළිබඳවත්, ඒ ඒ වෘත්තීන්ට අදාළ කටයුතු පිළිබඳවත් සාහිත්‍යමය වශයෙන් වැදගත් තොරතුරු ජන සාහිත්‍යයෙන් ලබා ගත හැකිය. (ගුණසේකර, 2004) අසරණයන්ගෙන් අයුතු ලෙස මුදල් ඉපැයීම මේ කවියෙන් ධ්වනිත වෙයි.

මාතර ගඟේ ඉන්නා කිඹුලිගෙ පැටියා
තල්ල සුදයි බෙල්ලේ ගෝමර කැටියා
යන එන ඔරු පාරු නවතා ගෙන සිටියා
මිනී නොකයි මාතර කිඹුලිගේ පැටියා

ඔරුපාරු පදින්නන් අතරින් බිහි වූ එම වෘත්තිය හා සම්බන්ධ ජනකවි බහුල වශයෙන් වාර්තා ස්වරූපයෙන් රචිත ය. එම කවියෙන් ප්‍රකාශ වන්නේ ඔරුපාරුවලින් බදු අය කිරීම පිළිබඳ තොරතුරකි.

මීට අමතර වශයෙන් වෙනත් වෘත්තීන් හා සම්බන්ධ කවි වශයෙන් පන්නන් කවි (පන් නෙළීම) : පන් වැවීම හා පන් කැපීම, පැදුරු මාලේ කවි : පැදුරු විවීමේ ශිල්පය, හේන් ගොවිතැන හා සම්බන්ධ කවි : හේන් ගොවිතැන හෙවත් සල ගොවිතැන, පැල් කවි (පැල් රැකීම) හා කුරක්කන් කවි (කුරක්කන් කැපීම) නෙළුම් කවි, (වල් නෙළීම), ගොයම් කවි හා කමත් කවි : අස්වැන්න  ලබාගැනීම ආදී ක්ෂේත්‍රවල විසිරී ඇත. ඒවා නාමිකව පමණක් මෙහි සඳහන් කරනුයේ ලිපිය දීර්ඝ වීම වළක්වා ගැනීම පිණිස බව විශේෂයෙන් සඳහන් කළ යුතුය.

ජන කවියෙහි තවත් ප්‍රභේද කීපයක් ද නිරීක්ෂණය විය. කෙළි සෙල්ලම් හා ඇදහිලි සම්බන්ධ කවි (පත්තිනි ඇදහිල්ල, සොකරි නැටුම, අං කෙළිය, පොල් කෙළිය, ඔළිඳ කෙළිය, ඔංචිලි වාරම් කවි හා රබන් පද)  ඥාති සම්බන්ධතා හා නෑනා මස්සිනා සම්බන්ධ කවි (නෑනාට හා මස්සිනාට කිවූ කවි, මාතෘ ප්‍රේමය හා සබැඳි කවි හා නැන්දාට හා මාමාට කී කවි)  සමාජ ගැටලු හා සම්බන්ධතා පිළිබඳ කවි

(කුල භේදය විවරණය හා උපහාසය සබැඳි කවි, මිනිස් ගති ලක්‍ෂණ, ප්‍රේමය හා අනුරාගය නිරූපිත කවි) ආදී වශයෙන් ඒවා විවිධ ඉසව් කරා පැතිරී ඇත.

**පර්යේෂණයේ නිගමන හා යෝජනා**

පූර්වෝක්ත පර්යේෂණයේ ප්‍රතිඵල සංක්ෂේපයෙන් දක්වන්නේ නම්, ජන කවියෙන් හෙළිදරව් වන වෘත්තීය කුසලතා හා ගුණාංග, තමනට පැවරුණු කටයුතු කෙරෙහි කැපවීම, ශිල්පීය ඥානය, ඉවසීම, උපේක්‍ෂාව, ධෛර්ය, උත්සාහය, ඔරොත්තුදීමේ ශක්තිය, අපිස් ගුණය, මැදහත් බව, ආත්ම සංයමය, ප්‍රතිභාව හා පරාර්ථය යන කරුණු ඉස්මතු කර දක්විය හැකිය. එමෙන් ම ජීවිත පරිඥානයෙන් හෙබි පැරණි සිංහලයෝ පරිසර වස්තුන්හි හැඩරුව, ක්‍රියාකාරිත්වය හා ගති ස්වභාවය නිරීක්‍ෂණය කොට, එම ලක්‍ෂණ අප්‍රකට ආකාරයට අන්තර්ගතකොට ප්‍රහේලිකා හා තේරවිලි වශයෙන් ඉදිරිපත් කළහ.ඒවා අසන්නන්ගේ කල්පනා ශක්තිය වැඩි දියුණු කිරීමට ද, රස වින්දනය හා විනෝදය පිණිස ද හේතු විය. ජන කවියේ අන්තර්ගත දේශීය ඥානය, සෞන්දර්ය උපදේශනය, ආගමික ශික්‍ෂණය, සංවරය හා ජන කවියාගේ ජීවන දර්ශනය විස්මයජනක හෙයින් පර්යේෂණයට උචිත බව පැහැදිලි විය.

(අ) පාසල් අධ්‍යාපනයේ විෂය නිර්දේශයන්ට හා විෂය මාලාවලට දේශීය දැනුම ඇතුළත් කිරීම හා අධ්‍යයනය කිරීමට අවස්ථා සැලසීම.

(ආ) දේශීය ඥානය විද්‍යාත්මක දෘෂ්ටියෙන් නිරීක්‍ෂණය නො කිරීම.

(ඇ) දේශීය අවශ්‍යතා හා චින්තනය මත පදනම් වූ අධ්‍යාපන ක්‍රමයක් සැලසුම් කිරීම හා එය ක්‍රියාත්මක කිරීම.

(ඈ) විද්වත් වෘත්තික විද්‍යායතනයක් හා පර්යේෂණ පුස්තකාලයක් ආරම්භ කිරීම.

(ඉ) දේශීය දැනුම සංවිධානය කිරීම, ආරක්‍ෂණය හා සංරක්‍ෂණය සඳහා සුදුසු පියවර ගැනීම.

උසස් අධ්‍යාපන ආයතනවල විෂය නිර්දේශයන්ට ජනශ්‍රැති අධ්‍යයනය ඇතුළත් කර ප්‍රායෝගික භාවිතයට ඇති අවස්ථා නිර්මාණය කිරීම හා පර්යේෂකයන් විසින් ජනශ්‍රැති සාහිත්‍යයක් බිහි කිරීම ද යෝජනා කරනු ලැබේ.

**සමාලෝචනය**

ජන කවියෙහි ප්‍රභේද වන ප්‍රහේලිකා හා තේරවිලි කවි, ජීවිතය විනිවිද දුටු උපදේශාත්මක කවි, විවිධ වෘත්තීන් හා බැඳුණු කවි, කෙළි සෙල්ලම් හා ඇදහිලි හා සම්බන්ධ කවි, ඥාති සම්බන්ධතා හා නෑනා මස්සිනා සම්බන්ධ කවි, සමාජ ගැටලු හා සම්බන්ධතා පිළිබඳ කවි, දිවුරීම් හා දිවිසිටීම හා උපදේශ කවි, දරු නැලවිලි ගී, තලමල කවි, බඹර කැපීම, තේරවිලි කවි, තුන් තේරවිලි කවි, බෙහෙත් තේරවිලි, දහම් ගැට, ටීකා සිව්පද වැනි ජන කවි හා ජනශ්‍රැති ක්ෂේත්‍රය විස්තීර්ණ භාවයෙන් අලංකෘත බැවින් මෙම පර්යේෂණ අධ්‍යයනය ජන කවියේ එක් පැතිකඩක් වන ශාස්ත්‍රීය මෙහෙවරට පමණක් සීමා කිරීමට සිදු විය. මෙම අද්විතීය සාහිත්‍යාංගයේ ප්‍රවර්ධනය උදෙසා වර්තමාන පාසල් සිසුන්ට එහි අපූර්වත්වය සිත් ගන්නා ආකාරයෙන් ඉගෙනීමට සැලැස්වීම. දැනුමේ සදාතනික ආරක්ෂකයා වන පුස්තකාලයන් හා ලේඛනාගාර විසින් එකී දැනුම ආබද්ධකර ගෙන සංවිධානයකොට පරිශීලකයන්ට ලබා දීම කාලීන සමාජ අවශ්‍යතාවකි.

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. කරුණාරත්න, ඩේවිඩ් (2011), එදා හෙළදිව, කොළඹ : ඇම්. ඩී. ගුණසේන
2. කහඳගමගේ, පියසේන, (2008), කෙතක මහිම : කෙම් පහන්. කොළඹ : ඇම්. ඩී. ගුණසේන
3. ගමගේ, නිමල් ජේ. (1986), සිංහල ජනකවියේ සාහිත්‍යමය අගය හා සංස්කෘතික ලක්ෂණ
4. ගුණසේකර, ලාල් (2004), හදබැඳි ජනකවි, මහනුවර : පෙරකුම් ප්‍රකාශකයෝ
5. සිරිසේන, කොත්මලේ (2007), සිංහල ජනකවි, නුගේගොඩ : සරසවි ප්‍රකාශකයෝ

6. තාක්ෂණය, වෛද්‍ය ක්‍රමය සහ කෘෂිකර්මයට අදාළ ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික දැනුම. (1983)

7. කොළඹ : යුනෙස්කෝ ආයතනය, (ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික දැනුම පිළිබඳ සම්මන්ත්‍රණ වාර්තාව, 1983)

8. බ්‍රෝහියර්, ආර්.එල්., (2001), ලක්දිව පුරාතන වාරිමාර්ග. පරි. පියසේන, එල්. කොළඹ : මහවැලි කේන්ද්‍රය

9. වීරසිංහ, අමරදාස, (1986), සිංහල ජනශ්‍රැතිය හැදෑරීම : කෙටි හැඳින්වීමක්, ගල්කිස්ස : සංස්කෘති ප්‍රකාශනය

**10.** Indigenous Knowledge and Sustainable Development. (1969 Nugegoda : University of Sri Jayewardenapura, Sri Lanka Resource Centre for Indigenous Knowledge

12. (Proceedings of the first National Symposium on Indigenous Knowledge and Sustainable Development, Colombo, March 19-20, 1994)

# Criteria to assess the effectiveness and efficiency in an academic library: a review of the literature

M.P.P. Dilhani
Senior Assistant Librarian
Postgraduate Institute of Medicine

R. Amarasekara
Deputy Librarian
Open University of Sri Lanka

**Abstract**

The paper which is based on an observational study of the researchers' daily work experiences and review of literature identified constraints to performance assessment in academic libraries and has attempted to give solutions. Further the study explores Academic Librarians may have to move ahead by revisiting the fundamental questions in this new environment, by cleaning up existing practices, delivering scholarly information and by doing the research to identify truly pertinent indicators.

*Keywords: Academic Libraries; Sri Lanka; Effectiveness; Efficiency*

## Introduction

Academic libraries are considered as the heart of academia, hence it directly supports teaching, learning, research and other academic programmes conducted in the university system. The major role of an academic library, be it a conventional or electronic, is to enable its users to identify, locate, gain access to and provide the standard and scholarly information resources which they require. To perform this function, the academic library should

provide effective and efficient service to its user community while developing a qualitative collection for the benefit of the users. It is equally important to assess the effectiveness and efficiency of academic library resources and its services. These factors include policies, principles, techniques, procedures and the problems associated with Library Services.

Effectiveness can be defined as a degree to which given objectives are achieved. An activity is considered effective, if it maximizes the results it was set to produce. Library effectiveness is the level of library services that are sufficient and suited to the library community needs. Efficiency is the amount of resources utilized to reach a given objective. An activity is effective if it minimizes the use of resources or produce better results with same resources. Performance is the effectiveness of the provision of services by the library and the efficiency of the allocation and use of resources in providing services. According to the International Standard Organization (ISO) Standard 11620; Performance Indicators for Libraries, "Performance" has been defined as "effectiveness of the provision of services by the library and the efficiency of the allocation and use of resources in providing services". As the definition indicates, both services and resources management are considered in measuring the performance. Therefore, high quality of library performance is of vital importance for the efficient and effective library management, which will result in a high degree of user satisfaction.

According to the ISO Standard 11620 Performance Indicators for Libraries, "Quality" has been defined as "totality of features and characteristics of a product or service that bear on the library's ability to satisfy stated or implied needs". Because libraries are service oriented organizations, the quality of a library is often treated as the quality of the service but truly it must also be connected with collection, staff, facilities, space etc.
Performance is measured by using a set of performance indicators.

Performance indicators are management tools designed to assist library managers in determining how well their service is performed. According to ISO Standard 11620 Performance Indicators for Libraries, Performance Indicators are "Numerical, symbolic or verbal expression, derived from library statistics and data used to characterize the performance of a library". It also says that the purpose of library indicators is to function as tools to assess the quality and effectiveness of services provided by a library and of other activities allocated by the library to such services and other activities.

Various performance indicators can be used to evaluate library performance, which will give a clear picture of the effectiveness and efficiency of the library. These indicators are created by comparing quantitative data such as library statistics, accounts details etc. Comparable performance measures apply not only to library services but to all aspects of library functions including collection development and its usage, handling of inter-library loans, library space and seating etc.

In the international library field, important documents have been published as guides to evaluate performance in libraries. The first is published in 1998, by ISO11620: International Standard on Library Performance Indicators, which was developed by the International Standard Organization. In this, a series of 29 performance indicators have been identified to measure all aspects of library performance apart from library promotion, human resources and user education. It has clearly and distinctly described each indicator, and are accompanied by suggestions regarding data collecting methods and a description indicating how to most accurately interpret each indicator. The use of library standards as guides for assessing effectiveness is documented by Kania (1988),Kaser (1982), and Lynch (1982). These standards are applicable to all types of libraries worldwide. Another important document published is the International Guidelines for Performance in Academic Libraries,

which was developed by the University Libraries and other general Research Libraries Section of the International Federation of Library Associations and Institutions (IFLA) in 1996. This also gives 17 specific criteria for measuring performance of academic libraries and it has been used to evaluate academic library performance in many countries. A significant difference in the IFLA list of indicators is that, it contains no attempt to measure either cost effectiveness or cost efficiency. The third document is the Standards for Libraries in Higher Education, developed by the Association of College and Research Libraries (ACRL) for the American Library Association (ALA) in the year 2004. These indicators are intended to apply to all types of libraries in higher education, from technical institutes to research universities, and therefore, are not very prescriptive. These standards provide both a quantitative and a qualitative approach to assessing the effectiveness of a library and its librarians. They encourage the use of input, output, and outcome measures in relation to the institution's mission statement. All these documents emphasize the importance of library performance measurement and the need for data collection by libraries. They also identify the need to customize indicators to suit the local institutions depending on its type as in whether it is a university library, research library or public library etc. In addition, the IFLA, ISO, ALA and several reputed institutions including Society of College and National and University Libraries (SCONUL), have developed indicators to be used in library performance measurement.

Although there exist indicators to measure library performance developed by several reputed organizations, literature shows that most studies have used their own combinations of indicators to suit the library under study. This is important as these are different types of libraries with unique characters in different settings, and serving different user populations. Therefore, it is important to decide on the most suitable performance indicators for the individual libraries under study. Some countries have developed national

criteria to measure library performance using internationally recognized standards as guides. Two researchers of the National Library of Malaysia have initiated developing performance indicators for national libraries in Asia and Oceania. While countries like Austria and Poland have already developed criteria to measure performance of their libraries, Sri Lanka too has initiated the process.

**Criteria to Measure Effectiveness and Efficiency in an academic library**
Six essential factors must be considered when selecting criteria for performance measurement. Firstly, indicators selected must be appropriate for the purpose to which it will be used. That is, the unit and scale must be suitable and the process of measurement should be compatible with the library's procedures, physical layout etc. Secondly, they must be valid, meaning that the indicator must measure what it is intended to measure. Thirdly, they must be reliable, meaning the results obtained using the indicator must be reproducible under same circumstances. Fourthly, they must be practical, that is, the indicator must use data that can be made available by the library with a reasonable time and effort. Fifthly, it must be comparable with libraries with same level, and finally and most importantly, an indicator must be informative in content, meaning that it should provide information for decision making such as budget allocation, goal setting, prioritizing services etc. Cameron (1978) underscored the difficulty in establishing measurable criteria for success and observed that one of the reasons for the lack of progress in studies of organizational effectiveness is the tendency of researchers to do a fine-grained analysis of causes but a coarse grained analysis of effects. (p. 625).

To measure effectiveness and efficiency of a library, suitable criteria or performance indicators must be selected. For this, the initial requisite of a good knowledge of the library to be evaluated and its functions are essential, according to which, suitable criteria will be selected.

Criteria should be selected to cover all the aspects as inputs, outputs and outcomes of the library. Inputs are the raw materials of a library, the money space, collection, equipment and staff out of which a program can arise. Outputs serve to quantify the work done, i.e., number of books circulated, number of reference questions answered. Outcomes are the ways in which library users are changed due to the library's resources and programs.

**Criteria which can be used to measure input of the academic library**

- **Percentage of the total library budget spent on monographs**
  Total amount of money spent on purchasing monographs during the financial year, calculated from the purchase invoice values obtained from library accounts or payments section taken as a percentage of the total library budget will indicate the percentage of budget spent on monographs.

- **Percent of total library budget spent on serials**
  Same as in above, the total amount of money spent on purchasing serials during a financial year, calculated from the purchase invoice values obtained from the library accounts or payments section taken as a percentage of the total library budget will indicate the percentage of budget spent on serials. Whether a higher percentage should be spent on serials depends on the type of library, whether university is engaged in many research and the user population i.e. includes more postgraduate students.

- **Cost per user**
  This indicator relates to the cost of the library services to the number of users who use the library. For practical reasons, the number of

library users can be considered as the number of users who had visited the library during the last year ( or the studied time period). If the library does not maintain such statistics, the number of book loans can be used as an estimation of the number of users. Dividing on recurrent expenditure of the library in the full financial year by the total number visiting the library will give cost per user. This will help to justify expenditure of funds.

- **Cost per library visit**

  This will assess the cost of the services of the library in relation to the number of visits. Number of visits can be taken by counting the number of persons entering or leaving the library. Total recurrent expenditure in a full financial year divided by total number of visits per year will give the cost per library visit.

- **Ratio of monographs to total number of users (Students and faculty)**

  This indicates the number of monographs available in the library per user.Dividing of total number of monographs in the library by the per user. Dividing of the total number of monographs in the library by the total number of users will give result the gives an idea about the exiting collection.

- **Ratio of monograph volumes added per year to total number of users (students and faculty)**

  This indicator gives the number of newly added monographs during a year per user. This could be considered as a better indicator to measure the collection development than the previous indicator as this accounts only the current acquisitions, material which can be assumed to be used by the current users. In contrast, the total collection may contain monographs which are not referred or circulated any more.

- **Ratio of total expenditure to information resource to total number of users (student and faculty)**

  The total expenditure for purchasing monographs, CDs, Posters, Maps etc. and subscribing serials as a ratio to total number of users will give the per user expenditure on information resources.

- **Ratio of library staff to total number of users (student and faculty)**

  Total number of users divided by the total number of library staff, including the librarian and non-academic staff will indicate the number of users served by a single library staff member. This indicates also an efficient service can be expected from the library.

- **Ratio of usable library space to total number of users (student and faculty)**

  An academic library should provide adequate space for users to refer material, to study, to do their assignments etc. Space taken by book racks, counter and other library materials are not considered here. The space available for users is calculated in a suitable measure and dividing it by the total number of users will give the per head space available.

- **Ratio of library seating to total number of users (student and faculty)**

  Total number of users divided by the total number of seating available in the library including study carols will indicate ratio of seating to users.

- **Ratio of computer workstations to total number of users (students and faculty)**

Nowadays, most of the university libraries provide networked computer facilities to its users, and this can also be used as a criteria to measure the effectiveness of the library. Total number of users divided by available number of computer work stations will indicate the number of users for a computer.

**Criteria which can be used to measure output of the academic library**

- Market penetration - Measuring the percentage of target population reached will give the market penetration. Though theoretically all the registered students (undergraduate and postgraduate) and academia are the library members, not all of them use the library facilities and services. How many persons visited the library (or borrowed books) during the last year divided by the total number of registered users will give the percentage of population reached by the library. A higher percentage is considered as good market penetration.

- Proportion of sought material obtained

  Here, a sample list of titles sought by at least one user, and are available in the library collection are taken, and out of it, how many were available in the library at the time the user needed will be found out. Percentage of number of obtained material out of total number sort will indicate availability of title required by users.

- Opening hours

  University libraries usually remain open during the regular working hours of the university, and a few additional hours i.e till 7 or 8 p.m and some hours during the week end. Opening hours can vary during the examination period. Usually the library opening hours are decided

by the management and the user opinions are not considered. Opening hours compared to demand will vary with the demand, which is difficult to measure anyway. (Difference between what they'd like and what they really need, etc., and who decided, etc.). This is a criterion which is difficult to compare with other academic libraries as the demand may vary.

- Catalogue Effectiveness

Be it a card catalogue or an electronic one, the effectiveness of the catalogue play an important role for users in finding the material they need. This can be measured by monitoring known item search. Percentage of users who were successful in finding a known material they were interested in as compared to the total number of catalogue users for a known item will indicate the catalogue effectiveness. However, this criterion is subjective. The catalogue effectiveness in terms of known item searches depends on various factors such as the quality of the data in the catalogue, the quality of the software used for searching and the user knowledge on using the software.

- Titles availability

This is the percentage of titles owned by the library that are immediately available to the users. This gives the measurement of copies of titles that are present in the library at the disposal of the users, either for borrowing or in house reference. Only the books which are on stacks are taken as available books, and books which are issued, lost or still in the processing of cataloging, classification, binding etc. should not be included here. Out of a random list of titles, how many are available in the library at the given time will be checked, and the percentage of books available within the library out of the number of titles sought in the random sample drawn could be found. Percentage of this criterion depends on the number of copies available from each title, length of the loan period and number of titles allowed to be borrowed at a time.

- Collection coverage (availability of books)

  Checking the availability of titles with compared to an expert checklist or bibliography on a selected subject will show the title availability on that particular subject. (can calculate the percentage of checklists/ bibliographies held).

- Collection coverage (balanced collection)

  There should be a balance in distribution of books to varying disciplines in the library. More or less an equal number of books must be present for each discipline. This could be easily measured by counting the number of books in each discipline using the catalogue.

- Collection use

  Ideally, in measuring this, statistics on books issued, referred and photocopied must be considered. But since most of the university libraries do not maintain photocopy and reference statistics, statistics on books issued during a year can be taken to indicate the collection use. This, however, is not a very successful indicator as it does not consider the total collection use.

- Ratio of circulation to total users (students and faculty)

  This is an indicator which can be easily measured as most of the university libraries keep circulation statistics. This, divided by the total number of users will indicate the circulation per head.

- ILL speed

  Time taken by the library to respond to an interlibrary loan, from receiving the request, locating the material, copying if it is an article and finally sending to the requested library is considered here.

- Reference fill rate

  Time taken to answer a reference query indicated the effectiveness of the library.

- Number of reference questions answered correctly

  This should be measured on random days of the week, weeks of the month etc. Count the total number of reference questions asked during the day, and the number of them that could be answered correctly. Percentage also can be found.

- Acquisition speed

  Time taken to acquire a title requested from the library is measured here from the time to making the request to the time the material arrives to the library. This shows the efficiency of library functions, but it also depends on external factors such as the response speed of the book seller, mode of delivery (via air mail, currier etc., mode of communication i.e via postal service, email etc.

- Book processing speed

  Once books are acquired to the library, time taken for processing as putting data and other stamps, cataloguing, putting tables and covers etc. takes time. Average time taken to process a book can be found out by recording time taken for book processing in the sample. This is indicated of the effectiveness of the library.

- Shelving accuracy

  Shelving of books is a task performed by library assistance. Correct shelving helps user in easy location of the book, therefore, it is important that the shelving is accurate. To measure this, a random sample of titles according to the class number order should be taken

and physically checked from the shelves whether their shelving order is correct. Number of accurately shelved books against the total number of titles considered will give the percentage of titles shelved accurately.

**Criteria which can be used to measure outcome of the library**

- User satisfaction

This is one of the most important aspects in measuring performance of a library. As libraries are service oriented organizations, the profit gained by the library is the satisfaction of users. Users of a university library are students and staff. Their satisfaction in library services such as opening hours, study facilities, availability of material, attitudes of library staff etc. can be measured. A survey can be conducted using a questionnaire to evaluate user satisfaction.

Considering user opinions as a criterion to measure library effectiveness and efficiency has some drawbacks. User opinions are subjective in nature. i.e one user may be satisfied while another is not for the same library service. Also a person who has never witnessed high quality, may consider low quality as high. Also a person may show an affinity to be bias towards central tendency in rating questionnaire statements. Also, one may answer questions without quite reading them. This may lead to errors in final findings and conclusions.

- Library staff satisfaction

Job satisfaction of library employees plays an important role in library service as there is a positive correlation between job satisfaction and increased productivity. In other words, a happy employee is a "better" employee, which is often defined as a "more productive" employee.

Therefore, employees been satisfied with their jobs leads to effective and efficient library function. Level of job satisfaction can be measured using a questionnaire asking to rank statements in regard to the they do Job.

**Factors affecting the reliability and validity of data collected**

There are at least three major issues that need to be taken in to account in assessing the reliability and validity of data of an academic library: consistency through time; ease vs. utility in gathering data; and values, meaning, and measurements.

- Consistency

  Lack of consistency in the way data are collected from institution to institution and in the way data are collected over time within the same institution creates problems for describing cross sectional comparisons and time series trends. With no processes in place to guarantee compliance with standard divisions, comparability of data across institutions may legitimately be questioned. One possible way to overcome inconsistencies from institution to institution is to develop standards for reporting data.

- Ease vs. Utility

  A library may select performance indicators which need data that can be easily gathered. What is easy to measure is not necessarily what is important to measure.

- Values and Meaning

  Association of Research Libraries(2017),There is a danger of blurring the distinction between the value system that is reflected in certain indicators and the indicators themselves. For example, in developing

a system of measures to track library performance regarding the cost of serial subscriptions or of monographs, there are certain values behind the numbers that can be fundamentally different from library to library. These values and the interruption of the measures therefore may have meaning only in the context of local circumstances. For example, a low unit cost for serial subscriptions may be extremely important for one institution, while another may assert that high quality service can be guaranteed only by acquiring the most costly scientific and technical journals, thus yielding a higher unit cost per serial subscription. Another ratio that is often calculated is library expenditures per student or faculty. It is difficult to decide whether the library that spends more per student or per faculty offer better service.

**Conclusion**

It is recommended that evaluation on libraries, particularly academic libraries, should take into consideration users' criteria and not merely from researchers' or librarians' own criteria. Users' point of views on what are the desired characteristics of academic libraries should be incorporated in the systems' features so that the libraries can serve as what they are expected to be. These will contribute to a holistic domain of user-centered evaluation criteria where academic libraries should and must be efficiently and effectively supporting academic or educational tasks. In providing effective service and resources in university libraries, the librarian should cater for varying level of users within and outside the university. Library resources need to be used adequately in order to justify the huge amount invested in them

**Recommendations**

The following recommendations are based on the findings of the results:

- The university library should attract users by ensuring that current library materials are acquired, stocked and made available for information needs of its users In addition, books, journals and other library materials should be well arranged on the shelves, and each shelf well labeled for easy retrieval and accessibility.

- Library services should be given more attention. This would promote effective library service and create users' awareness to services available in the library.

- There is a need for a more and better service and larger library resources.

- Better access must be provided; this may be achieved through increased awareness and exposure to library resources.

- An enabling library environment should be provided for library personnel in order to make them to be alive to their professional responsibilities from time to time.

## References

1. ACRL Board of Directors. ACRL Standards for Libraries in Higher Education [online] [accessed 22 December 2006] Available from World Wide Web: <http://www.ala.org/alalacrllacrlstandardslstandardslibraries.htm>

2. Adegun, A., Oyewumi, O., Oladapo, Y., Sobalaje, A., 2015.,Effectiveness of Library Service and Resources in an African University., Information and Knowledge Management., Vol.5, No.3.

3. Arya, S., & Talukdar, K. D. (2010). Use and effectiveness of internet services and resources in the Delhi College of Engineering Library: A case study. Library Hi Tech News, 27(3), 12–19.

4. Association of Research Libraries (2017), Statistics and Assessment, http://www.arl.org/focus-areas/statistics-assessment

5. Byrne, Alex (1995) CAUL performance indicators [online] [accessed 22 December 2006]

6. Available from World Wide Web: <http://www.caul.edu.au/meetings/pertind.htm>

7. Cameron. K. (1978). Measuring organizational effectiveness in institutions of higher education. Administrative Science Quarterly, 23(4), 604.632.

8. Derfert- Wolf, Lidia, Gorski, Marek M., Marcinek, Marzena "Quality of academic libraries - funding bodies, librarians and users Perspective: A Common Project of Polish

9. Research libraries on comparable measures" World Library and Information Congress:

10. 71 st IFLA General Conference and Council <http://www.ifla.org/IV/ifla71/Programme.htm> [accessed 27 December 2006]

11. Kyrillidou, Martha, (1998) An Overview of Performance Measures in Higher Education and Libraries. ARL Newsletter 197 [Online]., Available from World Wide Web: <http://www.arl.org/newsltr/197 / overview.html> [accessed 27 December 2006]

12. Mundt, Sebastian. (2003) Benchmarking user satisfaction in academiclibraries - a case study. Library and Information Research, [Online] Winter 2003.27 (87), pp 29-37.

13. Available from World Wide Web: <http://eprints.rclis.org/archive/00003420/0 1 /article87 mundt.pdt> [accessed 22 December 2006]

14. Peterson, D. 2009?, 'Criteria to assess organizational effectiveness and efficiency '. Sri Lanka University Library Association., Colombo.

15. Razilan A. Kadir, Wan A. K.W. Dollah, Fatimah A. Saaid, Diljit S.2009, Academic Digital Library's Evaluation Criteria: User-Centered Approach, World Academy of Science, Engineering and Technology International Journal of Social, Behavioral, Educational, Economic, Business and Industrial Engineering Vol:3, No:6.

16. SCONUL Measuring user satisfaction: a practical guide for academic libraries. [online].[accessed 30 December 2006].

17. Town, Stephen "Academic library performance, quality and evaluation in the UK and Europe" .. Library Assessment [online] 2005, Available from World Wide Web: <http://www.libqual.org/documents/ adminlStephenGreecePaper.doc> [accessed 27 December 2006]

# පාසල් සිසුන් කියවීමට යොමු කරවීම, හුරු කරවීම හා රුචිකත්වය වර්ධනය සඳහා "සිත්ගත් ග්‍රන්ථයන්හි රුවගුණ" අත්පොත ඇසුරින් ක්‍රියාකාරී පර්යේෂණයක්

ප්‍රියානි බාලසූරිය
පුස්තකාලයාධිපති
ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය කොළඹ

**සාරාංශය**

වත්මන් තාක්ෂණික ලෝකයත් සමඟ හැදෙන වැඩෙන දරුවන් තුළ කියවීමේ පුරුද්ද ක්‍රමක්‍රමයෙන් ගිලිහී යනු දක්නට ලැබේ. නමුත් මිනිසාගේ සාර්ථකත්වයට කියවීම හා ලිවීම අවශ්‍ය වේ. වර්තමානයේ දරුවන් මෙන්ම තරුණ හා වැඩිහිටි පරපුරද මුද්‍රිත මාධ්‍ය ඔස්සේ කියවීමට ප්‍රිය කරති. අප රටේ විද්‍යුත් තාක්ෂණය භාවිත කරමින් කියවීමට පහසුකම් ඇත්තේ අතළොස්සකට පමණි. අනාගතයේ රට භාර ගැනීමට සිටින බාල පරම්පරාව කියවීමට පුරුදු පුහුණු කරවීම වැඩිහිටි පරපුරේ වගකීමකි.

තවමත් අප රටේ බාල පරපුරට බහුලව හා පහසුවෙන් කියවීමට ඇති තොරතුරු මූලාශ්‍ර වන්නේ මුද්‍රිත මාධ්‍ය පොත්පත්ය. පොත් කියවීම නිසා අපට ලබා ගත හැකි ප්‍රයෝජන, අත්දැකීම් සහ වින්දනය පිළිබඳව සාහිත්‍යධර මාර්ටින් වික්‍රමසිංහ මහතා විසින් පවසන ලද "පොත්පත් ඉතා හොඳ යහළුවෝය''.ඇතැම් පොත්, සතුටු සාමිචී කථාවෙන් සන්තෝසවන, දොඩමලු වන මිතුරන් වැන්න. සමහර පොත් දරදඬු පණ්ඩිතයන් වැන්න. සමහර පොත් ලැජ්ජාවෙන් හැකිලෙන ගතානුගතික ගැහැනුන් වැන්න.සමහර පොත් පිපිණු හදවත් ඇති අයහට සුන්දර ගැහැනුන් වැන්න"(දයාපාල, 1996)

යන ප්‍රකාශය පදනම් කරගෙන පාසල් දරුවන් කියවීමට යොමු කර, හුරු කර ඒ සඳහා රුචිකත්වය වර්ධනය කර, එය ඔවුන්ගේ ජීවන පුරුද්දක් බවට පත් කිරීම

මෙම පර්යේෂණයේ අරමුණ විය.
පර්යේෂිකාව වන මා විසින් කියවීමේ අත්පොතක් භාවිතයට හුරු කරවීම ඔස්සේ පාසල් දරුවන් පොත් කියවීමට පොලඹවා ඇත. ආරම්භයේදී අපහසුවෙන් හා අකැමැත්තෙන් වුවද කියවීම සඳහා යොමු වූ දරුවන් ක්‍රමක්‍රමයෙන් කියවීමට හුරු වීම තුළින් පොත්පත් කියවීම තම ජීවන පුරුද්දක් බවට පත්කොට ගෙන ඇත. මෙම පර්යේෂණ සඳහා සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ 1 ඒ වර්ගයේ ජනප්‍රිය පාසලක, 7-9 ශ්‍රේණිවල ඉගෙනුම ලබන සිසුන් සියයක (100) නියැදියක් තෝරා ගන්නා ලදී.

එවකට පර්යේෂිකාව ගුරු පුස්තකාලයාධිපති ලෙස සේවය කරන අතරතුර "සිත්ගත් ග්‍රන්ථයන්හි රුවගුණ" නම් කියවීමේ අත්පොත සිසුන්ට භාවිත කිරීමට සලසන ලදී. එහි ඇතුළත් අභ්‍යාස සඳහා සිසුන් එදිනෙදා තමන් විසින් කියවන ලද පොත්පත්වලට අනුව පිළිතුරු සැපයීම කළ යුතු විය. එමඟින් සිසුන්ගේ කියවීම මෙන්ම ලිවීම සංවර්ධනය කරන ලද අතර, සිසුන්ගේ නිර්මාණශීලීත්වය ද ඔපනංවා ගැනීමට මඟ පෑදිනි. එම නිසා දරුවන් පසු කලෙක දී හොඳ නිර්මාණශීලී ලේඛකයන් බවට ද පත් විය.

ඕනෑම පුරුද්දක් කුඩා කල සිටම පුරුදු පුහුණු කළ යුතු වේ. දරුවන් හට පොතපත කියවීම කළ යුතුය, යනුවෙන් උපදෙස් ලබා දීම පමණක් ප්‍රමාණවත් නොවේ. මන්ද ඔවුන් කියවූ දෙය පිළිබඳව තම අදහස් සටහන් කර තැබීමට ද පුරුදු පුහුණු කළ යුතු වේ. එසේම ඔවුන් කියවූ දෙය පිළිබඳව තොරතුරු මෙන්ම එම කෘති පිළිබඳ තම අදහස් සටහන් කර තැබීමට ද පුරුදු කළ යුතු වේ. එමගින් ඔවුන් ලේඛනයටද ඉබේම හුරුවනු ඇත. එසේම කුඩා දරුවන් පොතපත කියවීමටද පුරුදු වීමට නම් ඔවුන් හා පොතපත කියවීමේ වටිනාකම අවබෝධ කර දිය යුතු වේ. එමෙන්ම කියවීමට අවශ්‍ය තොරතුරු සම්පත් සැපයීම සහ කාලය වෙන් කර දීමද වැඩිහිටි අපගේ යුතුකමකි.

**මූලික පද : කියවීමේ පුරුදු, කියවීමේ රුචිකත්වය, කියවීම සංවර්ධනය, කියවීමේ ප්‍රවර්ධනය, පාසල් සිසුන්, ක්‍රියාමූලික පර්යේෂණ**

**හැඳින්වීම**

දරුවෙකු විසින් උපයා ගනු ලබන උසස් මානසික ක්‍රියාවක් ලෙස ද්විතීයික අධ්‍යාපන කාලසීමාව තුළ දරුවා තමා දැනඋගත් ශබ්ද සංකේත චින්තන හැකියාවන් ඉස්මතු කර ගැනීම සඳහා ආදේශ කරගනු ලැබීම දැක්විය හැකිය. මෙම චින්තන ශක්තිය තුළින් සමාජයේ ඉදිරි මග නිගමනය වේ. දරුවෙකු තුළ ඇති නිසර්ග ශක්තීන් වැඩි දියුණු වීමට කියවීම මගින් ලැබෙනුයේ විශාල පිටිවහලකි. මේ අන්දමින් කියවීමට ප්‍රවේශය ලබන දරුවා සිය ද්විතීයික හා උසස් අධ්‍යාපනය ලබන කාල සීමාවට සීමා නොවී කියවීම පුරුද්දක් ලෙසින් ජීවිතයට සම්මාදන් කර ගැනීමට නම් බාල කාලයේ සිටම කියවීමට අවශ්‍ය පරිසරය පහසුකම් සැපයීම මෙන්ම දරුවා කියවන ලද දෑ අගය කිරීමට කටයුතු කිරීම ද අත්‍යවශ්‍යයෙන්ම සිදු විය යුතුය.

කියවීම යන පදයත් සමග අපට සිහිපත් වන්නේ කිසියම් පාඨ ග්‍රන්ථයක්, පෙළ පොතක්, පුවත්පතක් ආදිය කියවීම යන්නයි. නමුත් වර්තමානයේ කියවීමේ සංකල්පය තොරතුරු සාක්ෂරතාව හා බැඳි පුළුල් පරාසයක ව්‍යාප්තව පවතී. පාසල් සිසුන් අතර කියවීමේ රුචිය අඩු වෙමින් පවතින බව බොහෝ දෙනෙකුගේ මතයයි. මෙය භාෂා කුසලතාව හීනවීමට බලපාන බව පැහැදිලි සාධකයකි. එසේම ඔවුන්ගේ වින්දනාත්මක සහ නිර්මාණාත්මක කුසලතාවන් ද දුර්වල මට්ටමක පවතින බව ගම්‍ය වේ. මෙහි පශ්චාත් ප්‍රතිඵලය වන්නේ සංවේදීතාව අඩු, අභියෝගවලට මුහුණ දිය නොහැකි, සාරධර්ම පිරිහුණු නව යොවුන් පිරිසක් සමාජ ගතවීමයි. නමුත් අප රටේ කියවීමේ කුසලතාව ආශ්‍රිත පාඩම් පෙර පාසල් අවධියේදීත්, විධිමත් අධ්‍යාපනය තුළ පළමු ප්‍රධාන අවධියේ සිට විශ්වවිද්‍යාල අධ්‍යාපනය දක්වාත් ක්‍රියාත්මක වේ. කියවීමේ රුචිය අඩු වීමට බලපාන හේතු ලෙස කියවීමේ පහසුකම් සැපයීමේ ඌනතාව, යොමු කිරීමක් නොමැති වීම, පුරුද්දක් නොමැතිකම, වෙලාවක් නොමැතිකම (උපකාරක පන්ති නිසා), විෂය නිර්දේශවලට පමණක් සීමාවී කියවීම, කියවීම සඳහා ක්‍රියාකාරකම් සැලැස්මක් නොමැතිකම . (අධ්‍යාපන අමාත්‍යාංශය, පුස්තකාල සංවර්ධන ඒකකය, 2006)

කියවීම මානව ඉතිහාසය තරමටම අතීත උරුමයක සම්භවය ඇති ප්‍රකාශන මාධ්‍යයකි. මිනිසා මුලින්ම ග්‍රහණය කරගනු ලබන්නේ ශබ්ද සංකේත අයත් භාෂාව වන අතර එය මව්බස ලෙසින් හඳුන්වනු ලබයි. කියවීම සක්‍රීය කටයුත්තකි. ඇස විසින් ලබා

ගන්නා පණිවිඩ මොළය වෙත සන්නිවේදනය කරනු ලබයි. අප විසින් යමක් කියවන විට විවිධ ක්‍රියාශීලී කාර්යයන් සමග බද්ධ වීමේ හැකියාවන් නිසර්ගයෙන්ම උපත ලබනු ඇත.

වාග් විද්‍යාඥයින් සඳහන් කරන අන්දමට අර්ථය සහිත මුද්‍රිත රටාවක් සහ ශබ්ද සංඝටනය කියවීම ලෙස අර්ථ දැක්විය හැකිය. ප්‍රාථමික අවස්ථාවේ සිටින දරුවෙකු අළලා මෙම නිර්වචනය සාධාරණ වුවද ද්විතියික අධ්‍යාපනය ලබන දරුවෙකු සම්බන්ධයෙන් මෙම හඳුන්වාදීම සාධාරණ නැත.

අකුරු දැන හඳුනාගෙන වාක්‍යය තේරුම් ගෙන කියවීම, කියවීමට ඉගෙන ගන්නා ප්‍රධාන අවධියේ ලක්ෂණයයි. දරුවෙකු කුඩා කතන්දරයක්, ළමා පුවත්පතක්, ළමා සඟරාවක් කියවා තේරුම් ගන්නේ මෙම අවධියේය. කියවීම සරල වූද, යාන්ත්‍රික ක්‍රියාවලියට ඔබ්බෙන් පිහිටි දෙයකි. කියවීම දෘශ්‍යමය තොරතුරු සඳහා මෙන්ම දෘශ්‍ය මය නොවන තොරතුරු සඳහාද බලපානු ඇත.

දෘශ්‍යමය තොරතුරු ⟶ කියවීම ⟵ දෘශ්‍යමය නොවන තොරතුරු

මගතොට යනෙන විට දරුවා සිය නෙත ගැටෙන බොහෝ දේ කියවනු ඇත. ඒ සියල්ල කියවීම වුවත් සාර්ථක ලෙසින් සඳහන් කළොත් ඒ මෙසේය.

- වචන සංකේත ශබ්ද නගා කියවීම
- අකුරු හඳුනාගෙන කියවීම
- නිශ්ශබ්ද කියවීම
- විවේචනාත්මක කියවීම
- දැනුම ලබා ගැනීම සඳහා කියවීම
- රසවින්දනය වෙනුවෙන් කියවීම

මානව අයිතිවාසිකම් ප්‍රඥප්තියට අනුව කියවීම වෙන් වෙන් වූ අභිප්‍රේරණ සාධක දැනහඳුනා ගැනීමේදී පළමුව ළමයා දැනහඳුනා ගැනීම වැදගත්ය. ළමයා යනු වැඩිහිටියා මෙන් තනිව පෝෂණය විය නොහැකි ඔවුන්ගේ මග පෙන්වන වයසේ

සිටින සියලු දෙනා මගින් බැව් නිර්වචනය වේ. ඒ අනුව පාසල් යායුතු වයසේ පසුවන සියලු දෙනාම දරුවන් ලෙසින් හඳුන්වා දීම සාධාරණ වේ. මෙම හඳුන්වාදීමට අනුව පෙනී යන්නේ දරුවන් කියවීම සඳහා වූ පෙලඹීම ස්වයං ලෙස සිදු නොවන කාර්යයක් බවයි. මේ නිසා දරුවන්ට කියවීම වෙනුවෙන් වූ රුචිකත්වයක් ඇතිකරලීම වැඩිහිටි පාර්ශ්වයන්ගෙන් සිදුවිය යුක්තක් හෙවත් යුගයේ අවශ්‍යතාවයක් බවට පරිවර්තනය වී ඇත.

දරුවන්  කියවිමට හුරු කරවීම සම්බන්ධව කරන ලද පර්යේෂණවලින් පෙන්වා දී ඇත්තේ දරුවන් කියවීමට හුරු කිරීමට නම් ඔවුන්ව අභිප්‍රේරණය කළ යුතු බවය. අභිප්‍රේරණය යනු  පුද්ගලයා තුළ සහජයෙන්ම සිදුවන පෙලඹවීමකි. නිශ්චිත කාර්යක් සඳහා යම් පුද්ගලයෙකුට අභ්‍යන්තර සහ බාහිර ලෙසින් ඇතිවන්නා වූ ශක්තීන් උත්පාදනය කිරීමේ බලවේගය අභිප්‍රේරණයන් ලෙස අර්ථ දක්වා ඇත. දරුවන්ගේ කියවීම සඳහා අභිප්‍රේරණ සපයා දීම අධ්‍යාපනයේ අනිවාර්ය අවශ්‍යතාවයකි.කියවීම පුරුද්දක් ලෙසින් පෝෂණය ලැබූ කල්හි එය දරුවන්ට ඉතාම රසවත් අත්දැකීමක් ලෙසින් සංවර්ධනය වෙනු ඇත. දරුවන් ලෙසින් අප හඳුන්වන්නේ වැඩිහිටියන් මෙන් තනිව පෝෂණය විය නොහැකි වුවත් විවිධ අත්දැකීම් ස්වීය ග්‍රහණය සඳහා හසුකර ගැනීමට ප්‍රයත්න දරන ජීවී පරම්පරාවක් නම් ඔවුන් තුළ කියවීම සඳහා ස්වයං උත්තේජනයක්  ඇතිවීම සඳහා වැඩිහිටි පාර්ශ්වයන් විසින් අභිප්‍රේරණ ලබා දීම යුගයේ අවශ්‍යතාවයක් ලෙස හඳුන්වා දීම සහේතුක වේ.

විභාග ශිල්ප ක්‍රම පිළිබඳ ග්‍රන්ථයෙන් (කෝකර්, 1987) පෙන්වාදෙන අන්දමට විභාගාපේක්ෂක දරුවන්ගේ මෙම පසුගාමීත්වයට හේතුවී ඇත්තේ ඔවුන්ගේ බුද්ධිය පිළිබඳ ගැටලු නොව පෙළපොත සහ ගුරුවරයා මත පමණක් යැපී සිටිනවා හැර අමතර පත පොත මගින්  විෂයය පිළිබඳ සහ විෂයය ලබන අත්දැකීම් ඔස්සේ බාහිර දැනුම ලබා ගැනීම සඳහා වූ අපේක්ෂාවන් නොමැති වීමයි. මේ නිසා කියවීම වෙනුවෙන් අභිප්‍රේරණ ලබා දීමේ අවශ්‍යතාවය මව් පිය ඇතුළු වැඩිහිටි පාර්ශ්වයන් විසින් හඳුනා ගැනීම යුගයේ අවශ්‍යතාවයක්ව පවතී.

දරුවන්ගේ කියවීම සඳහා ආරය සහ පරිසරය බලපාන බව අධ්‍යාපන මනෝ විද්‍යාඥයන්ගේ අදහසයි. ආරය මව්පියන්ගේ උරුමතාවයක් සමඟ බැඳී තිබුනද,

එයින් මිදෙන දරුවා පරිසර සාධක වලින් පෝෂණයවී කියවීමේ හැකියාවන් ලබා උසස් සාධන මට්ටමට පත් වෙන බව විවිධ පර්යේෂණයන් මඟින් සනාථ වී ඇත. කියවීම සංවර්ධනය සඳහා අවශ්‍ය පරිසර සාධක අහිමි දරුවන්ගේ අධ්‍යාපනය කාර්ය සාධක මට්ටම ඌන බවත් එය දරුවාගේ ජීවිතය පුරාවට බලපාන සාධකයක් බවත් පිළිගත් සත්‍යයකි.

ඇමරිකා එක්සත් ජනපදයේ පාසල් 4000 කින් පළමුවන ශ්‍රේණියේ සිට දොළොස්වන ශ්‍රේණිය දක්වා වූ ශිෂ්‍යයන්ගේ කියවීමේ ප්‍රවර්ධනය අළලා සිදු කළ අධ්‍යයනයන් මඟින් පෙන්වා දී ඇත්තේ දරුවන්ගේ සමාජ පරිසරය කියවීම සඳහා බලපාන බවයි. නිවසේදී සිය වැඩිහිටියන් කරන කියන දේ අනුගමනය කිරීමට දරුවන් පෙලඹෙති. නිවසේ වැඩිහිටියන් පොත්පත් කියවීමට පුරුදු වී සිටී නම් දරුවා ද එම රටාවට පුරුදු වෙයි. සිය දරුවන්ගේ කියවීමේ ගති පුරුදු අළලා මහා බ්‍රිතාන්‍යයේ දෙමාපියන් 2600ක් සම්බන්ධව සිදු කරන ලද අධ්‍යයනයකදී 40% ක්ම සඳහන් කළේ තමන්ගේ බාල කාලයට වඩා ඔවුන්ගේ දරුවන් පතපොත කියවීම සඳහා යොමුවී සිටින බවයි.

වර්තමානයේ දරුවන්ගේ කියවීම පෙළ කියවීම සහ තිරය කියවීම වශයෙන් ප්‍රභේද දෙකකින් යුක්ත වුව ද විද්‍යුත් මාධ්‍යයන්ගේ සම්ප්‍රාප්තියත් සමඟ දරුවන් පෙළ කියවීමෙන් මිදී තිරය කියවීම සඳහා යොමු වීමේ ප්‍රවණතාවය වර්ධනය විය. පරිගණකය මගින් මෙන්ම අන්තර්ජාලය සමඟ සිදු කෙරෙන ගනු දෙනු නිසා දරුවා මුද්‍රිත සාහිත්‍යන්ගෙන් ඈත් වීම සාමාන්‍ය සංසිද්ධියක් විය. මෙම තත්ත්වය වෙතින් දරුවා මුදාගෙන හර සාහිත්‍යයන් සඳහා යොමු කිරීමට අවශ්‍ය පසුබිම සකසා ගැනීමට නම් දරුවන් කියවන ලද පොතපත පිළිබඳ ස්වයං ඇගයීමකට, අධ්‍යයනයට හුරු කරවීමට කටයුතු කළ යුත්තේ කෙසේද යන්න විමසා බැලීම කාලීන අවශ්‍යතාවකි.

පර්යේෂිකාව ගුරු පුස්තකලායාධිපතිනියක් වශයෙන් කටයුතු කිරීමේදී පාසල් සිසුන් කියවීමට හුරු කරවීම හා රුචිකත්වය ප්‍රවර්ධනය වෙනුවෙන් කරන ලද ක්‍රියාකාරකම් රැසකි. ඒ අතර කියවීම් කඳවුරු පැවැත්වීම, කියවීම් සමාජ පවත්වාගෙන යාම, පොත් මලු හා පොත් පෙට්ටි සැකසීම, පංති පුස්තකාල පවත්වාගෙන යාම, බිත්ති පුවත්පත් සකස් කරවීම, කියවීම් පැය, කතන්දර පැය, සියලු වැඩ අතහැර සැවොම එක් දිනක මිනිත්තු පහළොවක් කියවීමට යොමු කරවීම වැනි වැඩසටහන් හා පුස්තකාල

අත්පොත භාවිත කරවීම ආදිය විශේෂිත වේ. ඒ අතුරෙන් පුස්තකාල අත්පොත නිෂ්පාදනය කර ගැනීමට පසුබිම් සැකසුන කාර්යයමූල පර්යේෂණය පිළිබඳව මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් ඉදිරිපත් කෙරේ.

විශේෂයෙන් පාසල් වේලාව තුළදී දරුවන්ගේ කියවීමේ රුචිය වර්ධනය සඳහා පාසල් පුස්තකාලයක අරමුණු සකස්විය යුතු බව පිළිගත යුතු තත්ත්වයකි. එසේ වූවත් පාසල් පුස්තකාල සේවාව තුළින් ළමා පාඨකයින්ට උපරිම සේවාවක් ලැබෙනවාද? යන්න විමසිල්ලට ලක්විය යුතුව ඇත. මව් පිය වැඩිහිටි පාර්ශ්වයන් තම දරුවාට පුස්තකාලය හඳුන්වාදීම සඳහා උනන්දු නොවීමත් පුස්තකාල කළමනාකාරීත්වය මඟින් දරුවන්ගේ අවශ්‍යතාවයන් සහ දරුවන් පුස්තකාලය වෙත ආකර්ෂණය කරගැනීමට කටයුතු නොකිරීමත් යන සංසිද්ධීන් තුළින් ගිලිහී ගිය කියවීමේ පසුගාමීත්වයට පිළියමක් ලෙස "සිත්ගත් ග්‍රන්ථයන්හි රුවගුණ " අත්පොත භාවිතය මගින් කියවීම සඳහා ඔවුන් යොමුකර, හුරුකර ඔවුන්ගේ කියවීමේ රුචිකත්වය වර්ධනය කළ හැකිද යන්න මෙම අධ්‍යයනයේ ගැටලුව ලෙස හඳුන්වා දිය හැක.

අධ්‍යයනයේ අරමුණු

පාසල් සිසුන් කියවීමට පුරුදු කිරිම හා කියවීමේ රුචිකත්වය වර්ධනය කරවීම සඳහා පුස්තකාල අත්පොතක් ලෙස භාවිත කිරීමට සැලැස්වූ "සිත්ගත් ග්‍රන්ථයන්හි රුවගුණ" කෘතිය භාවිතය සමග පාසල් දරුවන් කියැවීමට පෙළඹවීම හා පුරුදු කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු වේ. එසේම සෙසු අරමුණු ලෙස ,

- පාසල් දරුවන්ට පොතක් විධිමත්ව ග්‍රන්ථ විද්‍යාත්මකව කියවීමට හුරු කරවීම.
- පාසල් දරුවන්ට තමා කියවන ලද පොතක අන්තර්ගතය සැකෙවින් ලියා දැක්වීමට හුරු කරවීම.
- ඔවුන් පොත කියවා ලබා ගත් දැනුම විශ්ලේෂණය කිරීමට හුරු කරවීම.
- ඔවුන් අත්පත් කරගත් දැනුම සංස්ලේෂණයකොට භාවිතයට හුරු කරවීම.
- පාසල් දරුවන්ගේ කියවීමේ රුචිකත්වය ප්‍රවර්ධනය කිරීම.

**පර්යේෂණ ක්‍රමවේදය**

ක්‍රියාකාරී පර්යේෂණ ක්‍රමවේදය නැතහොත් කාර්යමූල පර්යේෂණ ක්‍රමවේදය (Action Research Methods) අනුගමනය කරමින් මෙම අධ්‍යයනය සිදුකරන ලදී. ක්‍රියාමූලික පර්යේෂණ යනු තමන්ගේ විවිධ ක්‍රියාකාරකම් පිළිබඳ ව තමාටම කළ හැකි පර්යේෂණ ක්‍රමයකි. ක්‍රියාමූලික පර්යේෂණ ගුරු පර්යේෂණ වශයෙන් හඳුන්වන අතර ක්‍රියාමූලික පර්යේෂණයේ නියැළීමෙන් ගුරුවරුන්ට තමන්ගේ පන්ති කාමරයේ ඉටු කරන කාර්යය වඩාත් සාර්ථක ව කිරීමට මග පෑදේ. (රණතුංග, 2014)

ඕනෑම පර්යේෂණයකදී ප්‍රාථමික දත්ත, ද්විතීයික දත්ත හා තෘතීයික දත්ත යන තොරතුරුවල පවත්නා සත්‍යතාවය පිළිබඳව ගම්‍යකරණ ගැටලු සහගත තත්ත්වයන් පවත්නා බැවින් මූලික වශයෙන් මෙම අධ්‍යයනයේ දී පර්යේෂිකාව විසින් නිර්මාණය කරගන්නා ලද ප්‍රාථමික දත්ත පාදක කරගන්නා ලදී.

කාර්යමූල පර්යේෂණයකදී පළමුවෙන්ම අදාළ ගැටලුව හඳුනා ගන්නා ලද අතර එම ගැටලුව අවම කර ගැනීම සඳහා වූ අදහසට අදාළ උපක්‍රම හා ඉලක්ක හඳුනාගැ- නීම කළ යුතුය. ඉන්පසු සාමාන්‍ය සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර එමගින් හඳුනාගත් ප්‍රතිඵල මගින් සාමාන්‍යයෙන් සැලැස්මේ වෙනස්කම් කළ යුතුය. අනතුරුව ක්‍රියාකාරිත්ව පියවර 1 ක්‍රියාත්මක කර එහි ප්‍රතිඵල මත තීරණ ගත යුතුය. ඊළගට ක්‍රියාකාරිත්ව පියවර 2 ක්‍රියාත්මක කර එහි ප්‍රතිඵල හඳුනාගත යුතුය. හඳුනාගත් ප්‍රතිඵල මත ක්‍රියාකාරිත්ව පියවර 3 ක්‍රියාත්මක කර එහි ප්‍රතිඵල හඳුනාගෙන ක්‍රියාකාරිත්ව පියවර 4 ක්‍රියාත්මක කළ යුතුය. මෙසේ පියවර කිහිපයක් මගින් විවිධ උපක්‍රම භාවිත කරමින් අපේක්ෂිත ඉලක්ක කරා ළගා වෙනතුරු ක්‍රියාත්මක කළ යුතුය. මෙලෙස පියවරක් ක්‍රියාත්මක කර එහි ප්‍රතිඵල විමසා බලා අවශ්‍ය වෙනස්කම් කරමින් යළි යළිත් ක්‍රියාත්මක වන නිසා මෙම ක්‍රියාමූලික පර්යේෂණ සර්පිලාකාර ආකෘතියට අනුව සිදු කෙරේ. සැලැස්මේ ක්‍රියාකාරිත්වය අධ්‍යයනයකොට අපේක්ෂිත ඉලක්ක කරා ළගා වී ඇත්නම් එය සුදුසුම විකල්පය ලෙස තෝරාගෙන ක්‍රියාත්මක කරනු ලබයි.

මෙම පර්යේෂණය සඳහා සබරගමු පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, 1 AB වර්ගයේ ජනප්‍රිය බාලිකා පාසලක් පාදක කරගනු ලැබීය. එම පාසලේ 7-9 ශ්‍රේණිවල ඉගෙනුම

ලබන සිසුන් සංගහණය වූ අතර ඒ අතුරින් සිසුන් සියයක් (100) අහඹු ලෙස තෝරාගෙන පර්යේෂණයට ලක් කරන ලදී.

**පර්යේෂණ ගැටලුව**

පාසලේ 6 - 11 ශ්‍රේණිවල ඉගෙනුම ලබන සෑම සිසුවියකටම පාසල් පුස්තකාලයේ සාමාජිකත්වය ලබාදී තිබූ අතර පුස්තකාල කාලපරිච්ඡේදයේ දී අනිවාර්යෙන්ම පුස්තකාලයට යායුතු බැවින් පුස්තකාලයෙන් පොතක් බැහැර ගෙනයාම අනිවාර්ය කර තිබිණි. ඒ හේතුවෙන් සිසුවියන් තම පුස්තකාල කාලපරිච්ඡේදයේ පුස්තකාලයට යෑමත් කුමන හෝ අතට අසුවන පොතක් රැගෙන යාම හා ඊළග දිනයේ එය නැවත භාරදීමත් සිදු කෙරිණ. ඔවුන් ගෙන යන ලද පොත් කියවනු ලැබුවේද යන්න විමසා බැලූ විට බොහෝ දෙනෙකුගේ පිළිතුරු වූයේ"නැත" යන්න හෝ "කියවීමට වේලා මදි " බවය.

මෙහිදී පැහැදිලි වූයේ පාසල් සිසුවියන් පොත් කියවීමට ප්‍රියතාවක් නොමැති බව සහ පොතක් නිවරදිව කියවීමට හුරුවක් මෙන්ම තාක්ෂණිකව පොතක් ක්‍රමානුකූලව කියවන ආකාරය පිළිබඳ දැනුමක් ද ඔවුන්ට නොමැති බවය. ඒ අනුව පර්යේෂිකාවට පාසල් සිසුවියන්ගේ පොත් කියවීම සම්බන්ධව පවතින ගැටලු හඳුනාගත යුතු බවත් ඒවාට සුදුසු විසඳුම සොයාගෙන සිසුවියන්ව දැනුවත් කර පොත් කියවීම සඳහා යොමු කර ගැනීම මෙන් ඊට හුරුකර ඒ සඳහා රුචිකත්වයක් වර්ධනය කරවීම සඳහා කටයුතු කිරීම වගකීමක් බව අවබෝධ කර ගත්තාය.

එම ගැටලු හඳුනා ගැනීමට හා ඒ සඳහා සුදුසු විකල්ප විසඳුම සොයා ගැනීමටත් ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා පර්යේෂිකාව විසින් කාර්යමූල පර්යේෂණයක් ක්‍රියාත්මක කරන ලදී.

**පර්යේෂණයේ සීමා**

කියවීම පිළිබඳව කථා කරන විට වර්තමානයේ විවිධ කියවීමේ මාධ්‍ය ඇත. කියවීම කළ හැකි විවිධ ආකාරයන් පිළිබඳව විද්වතුන් විසින් ආකෘති හා උපදෙස් ඉදිරිපත් කර ඇත. මෙම පර්යේෂණය මගින් කියවීමේ එක් අංගයක් වන මුද්‍රිත මාධ්‍ය පොත්

කියවීම විධිමත්ව සිදු කරන්නේ කෙසේද යන්න පිළිබඳව පමණක් පරීක්ෂා කරනු ලැබේ.

එසේම පාසලේ සියලු සිසුවියන් එවකට පාසලේ ප්‍රධාන පුස්තකාලය පරිශීලනය කරන පාඨකයින් වුවද නව යොවුන් වියේ (ගැටවර වියේ ) එනම් සංක්‍රාන්ති සමයේ හෙවත් කුණාටු අවධියේ පසුවන දරුවන් මේ සඳහා තෝරා ගන්නා ලදී. මෙම වියේ දරුවන්ව තෝරාගැනීමට හේතු වූයේ මෙම අවධියේදී බුද්ධි වර්ධනය මෙන් තර්කානුකූල චින්තන රටාවන් නව යොවුන් වියේ පසුවන ළමයා තුළ (ගැටවරයා තුළ) වර්ධනය වන නිසාය. මෙම අවධියේ දරුවන් කුතුහලයෙන් පසුවන අතර තමාට අහන්න දකින්න ලැබෙන දෑ මෙන්ම හමුවන දෑ පිළිබඳවද වඩාත් විමසිල්ලෙන් පසු වෙති. එම නිසා මෙම යොවුන් වියේ පසුවන දරුවන්ට නව ක්‍රියාකාරකම් හඳුන්වාදීම පහසු සේම එවන් කාර්යන්හි නිරත වීමට ඔවුන් වඩාත් ප්‍රිය කරන නිසාය. ඒ අනුව පාසලේ 7 - 9 ශ්‍රේණිවල ඉගෙනුම ලබන සිසුවියන්ගෙන් මෙම නියැදිය සමන්විත වේ.

**සාහිත්‍ය විමර්ශනය**

කියවීම මානව ඉතිහාසය තරමටම මිනිසා සමඟ බද්ධ වූ සංසිද්ධියක් වූවද මේ පිළිබඳ සංකල්ප ගොඩනගමින් විද්‍යාත්මක අධ්‍යයනයන් ආරම්භ වූයේ 19 වන ශතවර්ෂය ආරම්භයේ පටන්ය. මුද්‍රණ කර්මාන්තය දියුණු වීමෙන් පසු සිදුවන මුද්‍රිත සාහිත්‍යන්ගේ සංවර්ධනයත් සමඟ පෙළ කියවීම අළලා සිදු කරන ලද අධ්‍යයනයන් බොහෝය. සාක්ෂරතාවය සමඟ දැනුම වෙනුවෙන් මුද්‍රිත මාධ්‍යන්ගේ ආකර්ෂණය, ප්‍රවර්ධනය සහ කියවීම සඳහා අභිප්‍රේරණ මුල් කරගත් අධ්‍යයනයන් සිදු විය. 20 වන ශතවර්ෂයේ සිදු වුණ විද්‍යුත් මාධ්‍යයන්ගේ සංවර්ධනය සමඟ කියවීමේ පසුගාමීත්වයට විකල්ප ලෙස කියවීම සඳහා අභිප්‍රේරණ ගොඩනැගීමේ අවශ්‍යතාවය ඉස්මතු විය.

ද්විතියික ශ්‍රේණිවල දරුවන්ට තම නිවස තුළ අභිප්‍රේරණ ලැබේ නම් අනිවාර්යෙන්ම එම වයසේ දරුවන් වෙතින් කියවීමේ හුරුව ඇති වෙන බව මනෝ විද්‍යාඥයන්ගේ අදහසයි. නමුත් විශාල නගරයන්හි, ජනාකීර්ණ ප්‍රදේශයන්හි නිවැසි ද්විතීයික ශ්‍රේණියන්හි ඉගෙනුම ලබන දරුවන් පාසලෙන් බාහිරව කියවනු ලබන පොත් පත්

ඉතා සීමිත බැව් සමීක්ෂණයන් මඟින් පෙන්වා දී ඇත. වයස අවුරුදු 12 සිට 15 අතර වෙසෙන ගැහැනු දරුවන් සහ පිරිමි දරුවන් රහස් පරීක්ෂක කතා, අද්භූත කතා හැරෙන්නට සෙසු පොත් කෙරෙහි දක්වන ප්‍රතිචාර ඉතා අල්ප මට්ටමක පැවතුණි. නමුත් මෙම උභය පාර්ශ්වයන් තුළම පුවත්පත් කියවීමට දක්වන ලද අභිරුචිය ඉහළ මට්ටමක පැවතුණි. මෙම ප්‍රවණතාවයද පාසල සහ කාලය අනුව විවිධ වෙනස්කම් ප්‍රදර්ශනය කරන ලදී. ග්‍රාම විද්‍යාලයන්හි ද්වීතීයික ශ්‍රේණිවල දරුවන් තුළ චිත්‍රකතා පුවත්පත් කියවීමට තිබුණ නැඹුරුතාවය සෙසු විද්‍යාලයන්හි එම මට්ටමේ දරුවන්ට සාපේක්ෂව බලන විට අඩු මට්ටමක පැවතුණි.

දරුවන්ගේ කියවීමේ රුචිකත්වය අභිප්‍රේරණය කිරීම සඳහා ළමා පොත්පත් සහ පුවත්පත් මඟින් ලැබෙන දායකත්වය අළලා සිදුවන මෙම අධ්‍යයනයේදී දරුවන් වෙත ඉදිරිපත් කරන ලද ප්‍රශ්නාවලි සහ මව්පියන් සමඟ වූ සම්මුඛ සාකච්ඡාවන් පදනම් කරගන්නා ලදී. මෙහි දී දරුවන් 60 ක් වෙත ප්‍රශ්නාවලි ඉදිරිපත් කරන ලදී. එම ප්‍රශ්නාවලියේ දී දරුවන් තමන්ට අවශ්‍ය පුවත්පත් සපයා ගන්නේ කෙසේද? යන්නට ලබාගත් දත්ත විශ්ලේෂණය මේ අන්දමට සිදුවිය. එහිදී දෙමාපියන් විසින් ළමා පුවත්පත් මිලදී ගත් දරුවන් 90% ක් ද, තමා විසින් මිලට ගන්නා දරුවන් 5% ක් ද, මිතුරන්ගෙන් ලබා ගන්නා දරුවන් 3%ක් ද, වෙනත් මාධ්‍ය මඟින් 2% ක් ද විය. මෙම අධ්‍යයනයේදී සම්මුඛ සාකච්ඡාවක සඳහන් වන්නේ කියවීමේ රුචිය බිඳීමට රූපවාහිනිය බලපා ඇති බව ඇතැමුන්ගේ මතය වූවත් ප්‍රබන්ධ කතා ටෙලි නාට්‍ය බවට නැඟීමෙන් දරුවන් අදාළ පොත්පත් කියවීමට යොමුවන බවයි. අඹයහළුවෝ, මඩොල්දූව, හත්පණ ඊට නිදර්ශන ලෙස ඉදිරිපත්කර ඇත.

දරුවන්ට කියවීම ප්‍රියජනක විෂයක් වීමත් සමගින්ම කියවීම පුරුද්දක් ලෙස ජීවිතයට සම්බන්ධ වීමට නම් ප්‍රාථමික අවධියේ කියවීමේ ආභාසය ලැබිය යුතුය යන උපකල්පනය මත පදනම් වුණ අධ්‍යයනය සඳහා වූ නියැදියට අර්ධ නාගරික පාසල් ශිෂ්‍යයින් 500ක් දෙනා සම්බන්ධ කරගන්නා ලදී. 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා වූ ග්‍රාහකයන් අතර පැවැත්වූ සම්මුඛ සාකච්ඡා මඟින් කියවීම පිළිබඳ දරුවන්ගේ ආකල්ප විමසුමකට ලක්විය. ලබාගත් ප්‍රතිඵල මඟින් පෙනී ගියේ දිනපතා පත්‍රයක් කියවන ග්‍රාහකයින්ගේ ප්‍රතිශතය 18%ක් බවත්, අතිරේක කියවීම් සඳහා උනන්දුව නොදක්වන ග්‍රාහකයින්ගේ ප්‍රතිශතය 82% ක් වන බවත්ය. පාසල් පුස්තකාල පහසුකම් නොලත්

මෙම පාඨශාලාවේ දරුවන් සඳහා මව්පියන්ගේ කියවීමට ලැබෙන දායකත්වය ඉතා පහළ මට්ටමක පැවතුණි. නිවස ආශ්‍රිතව පොත්පත් එකතුවක් පවත්වාගෙන යන වැඩිහිටියන්ගේ සංඛ්‍යා ව 8% ක් තරම් දුර්වල මට්ටමක පැවතුණි.

ඉගැන්වීම් ක්‍රියාවලියෙහි මධ්‍ය සහ මහා විද්‍යාල පුස්තකාලවලින් ලැබෙන දායකත්වය පිළිබඳ අනුරාධපුර දිස්ත්‍රික්කය අළලා සිදු කරනු ලබන අධ්‍යයනයන් මඟින් පෙන්වා දෙන්නේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාසල් පුස්තකාල 32ක් අතරින් පුස්තකාල 20 ක්ම සිය පුස්තකාලය පවත්වාගෙන යන්නේ ගෘහ විද්‍යාගාරයේ හෝ වෙනත් කුඩා කාමරයක බවයි. ජාතික පුස්තකාලය මඟින් පාසල් පුස්තකාල වෙනුවෙන් ප්‍රමිති ප්‍රකාශයට පත් කළද, ඊට අනුකූල ලෙස කටයුතු කිරීමට පාසල් පුස්තකාල වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සහ මානව සම්පත් පිළිබඳව ඇති ඌනතාවයන් ගැටලු සහගත තත්ත්වයන් ඇතිකරනු ලබන බැව් මෙම අධ්‍යයනයෙන් ලබා ගත් නිගමන තුළින් පෙන්වා දී තිබේ.

ද්විතීයික ශ්‍රේණියන්හි ඉගෙනුම ලබන දරුවන් සහ විවේකය සඳහා කියවීම පිළිබඳ අධ්‍යයනය උපයෝගී කර ගන්නා ශ්‍රී ලාංකික දරුවන් 300ක් සම්බන්ධ කරගන්නා ලදී. පාසල් පුස්තකාල ආශ්‍රිත මෙම අධ්‍යයනයේදී පාසල් පුස්තකාල ආශ්‍රිත දරුවන්ගේ කියවීම පිළිබඳ ආකල්ප නිරීක්ෂණය කරන ලදී. ඒ සමඟම පුස්තකාලයේ දැනුම සංවිධානය සහ කියවීමේ ද්‍රව්‍ය ස්ථානගත කිරීම පිළිබඳවත්, කියවීමේ ද්‍රව්‍ය ලබා ගැනීමේදී දරුවන් මුහුණදෙන ගැටලු පිළිබඳවත් අධ්‍යයනය කරන ලදී. දත්ත රැස්කිරීම ප්‍රශ්නාවලියක් මඟින් සිදු විය. ලබාගත් දත්ත විශ්ලේෂණයේදී පෙනී ගියේ ද්විතීයික ශ්‍රේණියන්හි දරුවන් කියවීමේ කටයුතුවලදී පාසල් පුස්තකාලයන් සමඟ සම්බන්ධතාවයන් නොපවත්වන බවය. ඔවුන් පාසල් පුස්තකාලය පරිශීලනය කළේ අධ්‍යයන කටයුතු සහ ගෙදර වැඩ (home - work)වෙනුවෙන් පමණි. පුස්තකාල සම්පත් එකතුව පිළිබඳ ඔවුන් තුළ තෘප්තිමත් බවක් නොවූවද, අධ්‍යයන කටයුතු වෙනුවෙන් සහ සම වයස් මට්ටමේ මිතුරන් ආශ්‍රය ගොඩනගා ගැනීමට පුස්තකාල මඟින් ලැබෙන අවස්ථාවන් පිළිබඳ දැක්වූ ප්‍රතිචාර යහපත් විය.

නව පරපුරේ දරුවන් තුළ කියවීමේ රුචිකත්වය පිරිහීමට පත්ව ඇතැයි වූ උපකල්පනය පදනම් කරගත් අධ්‍යයනය මඟින් ශ්‍රී ලාංකික දරුවන් තුළ තොරතුරු

තාක්ෂණ හැකියාවන් වර්ධනය කිරීමට පවතින අවස්ථාවන් අධ්‍යයනය කරන ලදී. මේ සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ පාසල් දරුවන් 315 දෙනෙකු සම්බන්ධ කරගත් අතර ප්‍රශ්නාවලියක් ආධාරයෙන් දත්ත එක්රැස් කරන ලදී. සිය විවේකය ගත කරන අන්දම අළලා වූ ප්‍රශ්නාවලියේදී 92% දෙනාගේ අදහස වූයේ තරගකාරී අධ්‍යයනය තුළ කාලය පිළිබඳ ගැටලුව නිසා කියවීමට ඇති අවස්ථාවන් අහිමිවන බවයි. වෙනත් රටවල යෞවන සාහිත්‍ය අළලා වූ ප්‍රබන්ධ කතා කියවීමට අවස්ථාවක් ඇත්තේ නම් කියවීම වෙත මීට වඩා යොමුවීමක් සිදුවන බව ඔවුන්ගේ අදහස විය.

අධ්‍යාපන පර්යේෂණ පිළිබඳ ජාතික පදනම විසින් සිදු කරන ලද පර්යේෂණයන් මඟින් පෙන්වා දෙන්නේ වයස අවුරුදු 9-11 අතර වයස් කාණ්ඩයේ දරුවන් රූපවාහිනී නැරඹීමට වඩා පතපොත කියවීමට වැඩි ප්‍රවණතාවක් දක්වන බවයි. මෙම අධ්‍යයනය සඳහා ( National Federation of Educational Research 2008) දරුවන් 4500 ක් සම්බන්ධ කරගෙන ඇති අතර ඔවුන්ගෙන් 60% ක් ම සඳහන් කළේ රූපවාහිනී නැරඹීමට වඩා පතපොත කියවීම සඳහා ඔවුන් තුළ උනන්දුවක් ඇති බවයි. මෙම සංසිද්ධිය අළලා මීට අවුරුදු හතරකට පෙරාතුව සිදු කරන ලද අධ්‍යයනයකින් පෙන්වා දුන්නේ පතපොත කියවීමට උනන්දුව ( National Federation of Educational Research 2008 ) ඇති දරුවන්ගේ ප්‍රතිශතය 50%ක් බවයි. මව්පිය පාර්ශ්වයන් 2600 ක් අළලා සිය දරුවන්ගේ කියවීම පිළිබඳ විමසීමේදී ඔවුන්ගෙන් 40% ක් ම ප්‍රකාශ කළේ තමන්ගේ බාල කාලයට සාපේක්ෂ ලෙස බලන විට අද දවසේ ඔවුන්ගේ දරුවන් තුළ කියවීමේ ගති පුරුදු පිළිබඳ සංවර්ධනාත්මක ලක්ෂණයන් පැහැදිලි ලෙසින්ම දක්නට ලැබෙන බවයි. (www.nfer.ac.uk)

කියවීමේ පුරුදු පිළිබඳව මෙම අධ්‍යයනය සඳහා බර්කිනා පාසේ ප්‍රදේශයේ කුඩා මහජන පුස්තකාල සම්බන්ධකර (kevan 2008 p. 202-210) ගන්නා ලදී. 2005 මාර්තු මාසයේ සිදු කරන ලද මෙම සමීක්ෂණයට ද්විතීයික ශ්‍රේණිවල පාසල් දරුවන් සම්බන්ධ වූ අතර ප්‍රදේශ අටකින් ශිෂ්‍ය නියැදිය තෝරා ගන්නා ලදී. කියවීම් පුරුදු ගණනය කිරීමේ නිර්ණායකයන් ලෙස පුස්තකාලය සමඟ ඇති කියවීමේ සම්බන්ධතාවය සහ පුස්තකාලය සමඟ ඇති සම්බන්ධතාවයක් නොමැති පිරිසගේ කියවීමේ පුරුදු අතර වූ සහසම්බන්ධතාවයන් අධ්‍යයනය කරන ලදී. අධ්‍යයනයට

සම්බන්ධ නියැදිය ප්‍රමාණවත් ලෙසින් නියෝජනයක් ලබා නොදුන්නද ඉදිරිපත් කරන නිගමන සහ යෝජනා මගින් පෙනී ගියේ මනාව සංවිධානය වූ පුස්තකාලයක පුස්තකාල උපයෝජකයන් සහ කියවීමේ ද්‍රව්‍ය අතර පවත්නා සම්බන්ධතාවය විශිෂ්ට මට්ටමක පවතින බවයි.

ඩිජිටල් මාධ්‍යන්ගේ සම්ප්‍රාප්තිය සමග කියවීමේ පුරුදු වෙනස් වීමේ සහ සම්බන්ධතාවය අධ්‍යයනය කිරීමේදී මුද්‍රිත මාධ්‍යයන්හි සම්භවය පුස්තකාලයක අතීත උරුමය සමඟ වූ දැනුම් සම්භාරයක් වන අතර ඒ සඳහා ඉහළ සාධිකාරී වටිනාකමක් ඇති වූ උපන්‍යාසය සමඟ විද්‍යුත් මාධ්‍ය සහ උපයෝජක හැසිරීම අතර අන්තර් සම්බන්ධතාවය අධ්‍යයනය කරන ලදී. මේ අතර ඩිජිටල් මාධ්‍යයන්හි පවතින ආකර්ෂණීය තොරතුරු සමුද්ධරණ උපාංග භාවිතයට ඇති පහසුව බොහෝ දෙනාට එකවර සේවා සැපයීමේ හැකියාව නිසා සම්ප්‍රදායික කියවීමේ පුරුදුවලින් මිදී ඩිජිටල් මාධ්‍ය වෙත අනුගත වීමට ඉහළ ප්‍රවණතාවයක් ඇති බව මෙම අධ්‍යයනය මගින් පෙන්වා දී ඇත.

**පර්යේෂණයේ ක්‍රියාපිළිවෙළ**

**පළමු අදියර**

පුස්තකාලයට පැමිණෙන සිසුවියන් පුස්තකාලය තුළ හැසිරෙන ආකාරය පිළිබඳ අවධානය යොමු කළ අතර ඔවුන් පොත් තෝරන ආකාරය සහ වෙනත් තොරතුරු සම්පත් පිළිබඳ ඔවුන්ගේ ප්‍රතිචාර, පොත් බැහැර ගෙනයාම, ආපසු නියමිත දිනට පුස්තකාලයට පැමිණීම, පොත් ආපසු භාරදීම ආදිය පිළිබඳව විමසිලිමත් විය. එසේම ඔවුන් සමග සාකච්ඡා කිරීම මගින් පොතක් නිවැරදිව කියවීමට ඇති අවබෝධය, එනම් පොතක කර්තෘ, ග්‍රන්ථ නාමය, ප්‍රකාශක, පටුන, පෙළ ආදී මූලික කරුණු පිළිබඳ ඔවුන්ගේ අවබෝධය ඉතා පහළ මට්ටමක පවතින බව අනාවරණය විය. තවද තම වයසට උචිත තම විෂයයට සමගාමීව පොත් තෝරා ගැනීමට ඇති හැකියාව මෙන්ම පුස්තකාලයෙන් පොත් රැගෙන යනුයේ බොහෝ විට අනිවාර්ය කර ඇති නිසා බවද ඔවුන් විසින් ප්‍රකාශ කරන ලදි.

මෙවන් පසුබිමක් යටතේ පාසල් පුස්තකාල සේවාවක් පවත්වාගෙන යාමෙන් සිසු දරුවන්ට පුස්තකාලය මගින් ලබා දෙන සේවාව ඵලදායී නොවන බැවින් පළමුවෙන්ම

පොතක් තෝරා ගැනීමේදී වැදගත් වන මූලික කරුණු අනුව පොතක් නිවැරදිව හඳුනා ගැනීමටත්, පුස්තකාලයේ ඇති පොත්වලින් තම වයසට උචිත හා විෂයය සමගාමී පොත් තෝරාගන්නා ආකාරය පිළිබඳවත් පුස්තකාලයට පැමිණෙන සෑම සිසුවියක්ම දැනුවත් කරන ලදී. අනතුරුව තමා කියවන ලද පොත පිළිබද තොරතුරු සහ දෙන ලද ආදර්ශයන් අභ්‍යාස පොතක සටහන් කර ගෙන ඒමට උපදෙස් දෙන ලදී. පොදුවේ පන්තියේ සියලුම සිසුවියන් දැනුවත් කරන ලදී. නමුත් පර්යේෂණයක් සඳහා විශේෂිත නියැදියක් අවශ්‍ය වූ බැවින් පන්ති භාර ගුරුවරු හරහා පර්යේෂණය සඳහා අදාළ නියැදිය ද 7 - 9 ශ්‍රේණිවලට අදාළ පන්තිවලින්ම තෝරා ගන්නා ලදී. එවකට පාසලේ උදෑසන අතිරේක කාලපරිච්ඡේදයක් ක්‍රියාත්මක වූ අතර නියැදියට අදාළ සිසුවියන් සෑම බ්‍රහස්පතින්දා දිනකම එම කාලපරිච්ඡේදයේදී පුස්තකාලයට කැඳවා ඔවුන් සඳහා විශේෂිත ක්‍රියාකාරකම්වල නිරත කරන ලදී.

**දෙවන අදියර**

එම මගපෙන්වීම හා උපදෙස්වලට අනුව සිසුවියන් මුල් අවස්ථාවලට වඩා වැඩි උවමනාවකින් පුස්තකාලයේ පොත් තෝරා ගැනීමත්, ඔවුන් රැගෙන ගිය පොත කියවා ආපසු භාර දෙනවිට, තමා විසින් සකස් කරගත් ආකෘතියට අනුව තම අභ්‍යාස පොතේ, තමා කියවන ලද පොත, පිළිබඳ තොරතුරු ලියා රැගෙන ඒමට පෙලඹී සිටියහ. එම සෑම පොතක්ම කියවා බලා නිවැරදිව තොරතුරු සටහන් කර තිබූ සිසුවියන්ව ඇගයීමට ලක් කළ අතර අඩුපාඩු සහිතව ලියා තිබූ සිසුවියන්ට නැවත උපදෙස් ලබාදෙන ලදි. මාසයක් පමණ මෙම අභ්‍යාස කළ විට සිසුවියන්ගේ කියවීමේ හුරුවේ වර්ධනයක් වීමේ ප්‍රවණතාවයක් ඇති විය.

**තෙවන අදියර**

පාසල් සිසුවියන් මෙම ක්‍රියාකාරකමට ප්‍රිය කිරීම හේතුවෙන් දීර්ඝකාලීන පුරුද්දක් බවට පත්කරලීමට පුස්තකාල අත්පොතක් නිර්මාණය කර සිසුවියන් අතට පත්කරලීම සුදුසු බව පර්යේෂිකාව විසින් අවබෝධ කරගන්නා ලදී. අනතුරුව පාසලේ කළමනාකාරිත්වයේ අනුදැනුම ඇතිව "සිත්ගත් පොත්හි රුවගුණ" නමින් හුරුබුහුටි අත්පොතක් නිෂ්පාදනය කරන ලදී. (පහත දැක්වෙනුයේ එම අත්පොතෙහි ඡායාරූපය)



අත්පොතේ පිටකවරයේ ඇතුලත මෙලෙස නිම කරන ලදී.

මෙම අත්පොතෙහි මුල් පිට කවරයේ සිට පසුපස පිටකවරය දක්වාම සිසුන්ට පොත් පත් කියවීමේ වටිනාකම පිළිබඳ විද්වතුන්ගේ අදහස්, පොත් සුරක්ෂිතව පරිශීලනය කළ යුතු ආකාරය, කියවීම සඳහා කාලය වෙන්කර ගැනීම පිළිබඳ උපදෙස්, නිර්මාණාත්මකව සටහන් කරන ලදී. පොතෙහි ඇතුළත පිටු වෙන් කරනු ලැබුවේ සිසුවියන් කියවන ලද පොත් පිළිබඳ තොරතුරු සටහන් කිරීම සඳහාය. එසේම සෑම පිටුවක අවසානයේ සිසුවිය විසින් සටහන් කරන ලද තොරතුරු පරීක්ෂා කරබලා පුස්තකාලයාධිපති විසින් ඇගයීමක් කිරීමට ද අවස්ථාව සලස්වන ලදී. (පහත දැක්වෙනුයේ එම ආදර්ශ පිටුවක් හා සිසුවියන් විසින් පුරවන ලද පොතක පිටු කිහිපයකි.)



මෙලෙස සකස් කරන ලද අත්පොත පළමුවෙන් නියැදියට අදාළ සිසුවියන් සඳහා ලබාදී ඔවුන් එය පරිශීලනය කරන ආකාර නිරීක්ෂණය කරන ලදී. මෙම අත්පොත පාසලෙන් ලබාදුන් දෙයක් බැවින් ඉතා උවමනාවෙන් එය භාවිත කිරීමටත් පුස්තකාලයට එනවිට පුරුද්දක් ලෙස ගෙන ඒමටත් එහි පෙරටත් වඩා හොඳින් අදාළ ආකෘතියට අනුව තොරතුරු සටහන් කිරීමටත් සිසුවියන් පුරුදු වූහ. අත්පොතෙහි සටහන් කළ යුතු බැවින් ඔවුන් නිතරම පොත් කියවීමට පෙලඹුන අතර පුස්තකාලයෙන් බැහැර ගෙනායමට ලබා දෙනුයේ එක් පොතක් වුවත් ඔවුන් පොත් දෙකක් ගෙනයාමට අවසර ඉල්ලීමට පවා පෙලඹිණ. ඒ අනුව පැහැදිලි වනුයේ සිසුන්ගේ කියවීමේ රුචිකත්වය ද වර්ධනය වූ බවය.

**සිව්වන අදියර**

තෝරා ගන්නා ලද නියැදිය සමග කරන ලද මෙම ක්‍රියාකාරකම් මගින් අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීමට හැකි වූ බැවින් 7 - 9 ශ්‍රේණිවල සියලුම සිසුවියන් සඳහා මෙම අත්පොත පරිශීලනය කිරීමට අවස්ථාව ලබා දෙන ලදි. ගුරු පුස්තකාලයාධිපති සිසුවියන් ලියන ලද සටහන් කියවා බැලීමත් අඩුපාඩු පෙන්වා දීමටත් කටයුතු කරන ලදි. පසු කලෙක පාසල් පුස්තකාලය භාවිත කරන සෑම සිසුවියක් විසින්ම පරිශීලනය කළ යුතු අනිවාර්ය අත්පොතක් බවට පත් විය. එය පාසලේ 4 ශ්‍රේණියේ සිට උසස් පෙළ දක්වා සෑම ශ්‍රේණියකම සෑම සිසුවියකටම පරිශීලනය කිරීමට අවස්ථාව සලසන ලදි.

පාසල් සිසුවියන්ගේ කියවීමේ පුරුදු ඇති කරලීම සඳහා මෙන්ම කියවීමේ රුචිකත්වය වර්ධනය කරවීම සඳහා කරන ලද මෙම කාර්යයමූල පර්යේෂණය සාර්ථක විය. සාහිත්‍ය මාසය හා කියවීම් මාසය වෙනුවෙන් පවත්වන විවිධ තරගවලට විශේෂයෙන් ප්‍රබුද්ධ පාඨකයින් තේරීම වැනි අවස්ථාවලදී සිසුවියන් තේරීමේ දී මෙම අත්පොත සඳහා ලකුණු ලබාදීම ආදිය සිදු කරන ලදී.

**මෙම අත්පොත භාවිතයෙන් ලබා ගත හැකි ප්‍රයෝජන**

මෙම අත්පොත භාවිතයෙන් පාසල් සිසුවියන්ට ලබා ගත හැකි ප්‍රයෝජන රැසකි. එනම් සිසුවියන් සතියක් පාසා තමන් විසින් කියවන එක් එක් පොත පිළිබඳ තොරතුරු සටහන් කර මෙම අත්පොත ලියා අවසන් කර නැවත එය කියවන විට, තමන් කියවා ඇති පොත් ප්‍රමාණය, කවර විෂයන්ට අයත් පොත් කියවා තිබේද? කුමන ලේඛකයින්ගේ පොත කියවා තිබේ ද? කුමන ප්‍රකාශකයින්ගේ පොත් කියවා තිබේද? ආදී ප්‍රශ්න සඳහා පිළිතුරු සපයා ගැනීමට මෙන්ම තමා කියවන ලද පොත්වල සඳහන් කරුණු සිහිපත් කර ගැනීමටත් හැකියාව ලැබුණි.

තවද මෙම අත්පොතෙහි ඇතුළත් අනෙකුත් අභ්‍යාස සඳහා පිළිතුරු සැපයිමේදී යම් කෘතියක අන්තර්ගතය සැකෙවින් ලියා තැබීමට පුරුදුවීම, එහි අන්තර්ගත කරුණු ඇගයීමට/ විශ්ලේෂණය කිරීමට පුරුදු වීම, එසේම කෘතියක් ඇගයීමට එනම් එහි ගුණදොස් පහදමින් විචාරය කිරීමට කුඩා කල සිටම හුරුවක් ලැබීම ආදී අරමුණු රැසක් ඉටුකර ගැනීමට හැකිවිය. තවද එම කොටස් සඳහා පිළිතුරු සැපයීමේ දී සිසුවියන් තම නිර්මාණශීලි කුසලතාව භාවිත කරමින් ඉතාමත් අලංකාර ලෙස කරුණු ගොනු කර තිබිණි. මේ නිසාම අනාගත ලේඛක පරපුරක් බිහිකරලීමට මේ ක්‍රියාකාරකම ඉවහල් කර ගත හැක.

එසේම මෙම අත්පොතේ තමා විසින් ලියන ලද සටහන් විවේක වේලාවක කියවීමේ දී මුලින්ම ලියූ ඒවායේ අඩුපාඩු, පසුව ඒවා සකස් කරගත් ආකාරය, මුල් අවස්ථාවන්ට වඩා පසු අවස්ථාවන්හි දී ලියන ලද සටහන්වල නිර්මාණශීලි බව ආදිය ඔවුන්ටම ඇගයීමට හැකිය. ඒ වාගේම එය කියවන විට රසාස්වාදයක් ද ලබා ගැනීමට හැකි වේ.

## නිගමන

- තමා කියවන දෑ පිළිබඳව ඇගයීමට ලක්කරන බව අවබෝධ කරගත් පසු සිසුන් ඉතා උවමනාවෙන් හා අරමුණක් ඇතිව කියවීම සඳහා පෙලඹීමේ අවශ්‍යතාවයක් ඇති විය. කියවන ලද පොත පිළිබඳව අදහස් ලිවීමේදී ඔවුන් කියවීම අර්ථාන්විතව කර තිබූ බවට දක්නට ලැබුණි.
- පාසල් සිසුන්ගේ කියවීම ප්‍රවර්ධනය වෙනුවෙන් කරන ලද මෙම ක්‍රියාකාරකම මගින් ලිවීමේ අඩුපාඩු හඳුනාගැනීමට හැකි වූ අතර එම අඩුපාඩු සකසා ගැනීමට මෙමගින් ඔවුන්ට හැකි විය.
- එසේම අදාළ ආකෘතියේ එක් එක් කොටස් සඳහා පිළිතුරු සැපයීමේදී සිසුවියන්ගේ නිර්මාණශීලි කුසලතා වර්ධනය කර ගැනීමට හා ඔප මට්ටම් කරගැනීමට අවස්ථාව ලැබිණි.
- මෙම අත්පොත පරීක්ෂා කර බැලීමට ගුරු පුස්තකාලයාධිපති මැදිහත් වන බැවින් පාසල් සිසුවියන් හා ගුරු පුස්තකාලයාධිපති අතර සුහදතාවය වර්ධනය කර ගැනීමට හැකි වන අතර ඒ තුළින් පාසල් පුස්තකාලය මගින් ක්‍රියාත්මක කරන විවිධ ක්‍රියාකාරකම්වලදී ශිෂ්‍ය සහයෝගය පහසුවෙන් ලබා ගත හැකි විය.
- ඒ ඒ සිසුවියන් කියවීමට රුචි කරන පොතපත හඳුනා ගැනීමට, ඒවා කියවීමට ඔවුන් වඩාත් ප්‍රිය කරනුයේ ඇයි? ආදී මතු පර්යේෂණ, සමීක්ෂණ සඳහා මෙම අත්පොත භාවිත කිරීමට පුස්තකාලයාධිපතිට හැකිය. පුස්තකාල සම්පත් අත්පත් කර ගැනීමේදී ද සිසු අවශ්‍යතාවන් හඳුනාගෙන ඒවා ලබා ගැනීමට මෙය උපකාර කරගත හැක.

## යෝජනා

- ගුරු පුස්තකාලයාධිපතිවරුන්ට තම පාසල් සිසුන්ගේ කියවීම ප්‍රවර්ධනය සඳහා මැදිහත්වීමට මෙවැනි ක්‍රියාකාරකමක්/ අත්පොතක් භාවිතයට හුරු කරවීම මගින් කළ හැකිය.
- මෙම කාර්යය අඛණ්ඩව විධිමත්ව කරගෙන ගියහොත් සිසුන්ගේ නිර්මාණශීලිත්වය වර්ධනය කළ හැකි වේ. මෙහිදී නිසි මාර්ගෝපදේශයක් ලබා දීම සහ අඛණ්ඩ අධීක්ෂණයක් කිරීම අත්‍යවශ්‍ය වේ.

- අරමුණකින් තොරව පොත් කියවීම වෙනුවට ඒ සඳහා අරමුණක් සහිතව ආකෘතියක් අනුව කියවීමට පුරුදු කිරීමෙන් අවබෝධාත්මක කුසලතා වර්ධනය කෙරෙහි ගැඹුරුතාවයක් ඇති කළ යුතුය.
- මෙම අත්පොතට පුස්තකාල විද්‍යාවේ මූලික සංකල්ප එනම් වර්ගීකරණය, පුවත්පත් ලිපි ගොනු පිළිබඳව ඒවා සකස් කරන ආකාරය එහි වැදගත්කම, ගෘහස්ථ පුස්තකාලයක් පවත්වාගෙන යාමට අවශ්‍ය උපදෙස් ආදී කරුණු ඇතුළත් කර සිසුන්ට මග පෙන්වීම කළ හැක.

ආශ්‍රිත ග්‍රන්ථ


1. අධ්‍යාපන අමාත්‍යාංශය, පුස්තකාල සංවර්ධන ඒකකය, (2006) පාසල් පුස්තකාල ක්‍රියාකාරකම් සංවර්ධනය සහ ළමා කියවීම් රුචිකත්වය ප්‍රවර්ධනය (උපදේශ සංග්‍රහය), බත්තරමුල්ල.
2. අධ්‍යාපන මනෝ විද්‍යා සංග්‍රහය සංස්. රාජා ගුණවර්ධන රෝලන්ඩ් අබේපාල (1999), කොට්ටාව සාර ප්‍රකාශන.
3. ජාතික පුස්තකාල හා විඥාපන හා විද්‍යා ආයතනය (2006). පුස්තකාල හා තොරතුරු විද්‍යා ගුරුවරුන් (ගුරු පුස්තකාලයාධිපතීන්) සඳහා දිශාභිමුඛ වැඩසටහන් අත්පොත. කොළඹ විශ්වවිද්‍යාලයීය.
4. ජයනෙත්ති දයාපාල, ගැමි දිවිය මගේ විදුහලඃ (මාර්ටින් වික්‍රමසිංහ සිරිත) (1996) කොළඹ ශ්‍රී ලංකා සමාජ සංස්කෘතික පර්ෂදය.
5. රණතුංග, රමණි රේණුකා, (2014 සැප්තැම්බර්) ක්‍රියාමූලික පර්යේෂණ (Action Research) - කුමක්ද? ගවේෂණ, 23, (සැප්තැම්බර් - දෙසැම්බර් )18 - 20

# ආයුර්වේද වෛද්‍ය ශාස්ත්‍රය අධ්‍යයනයට පරිශීලනය කළ යුතු තොරතුරු මූලාශ්‍ර පිළිබඳ අධ්‍යයනයකි

පී. එම්. අයෝමි
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති
දේශීය වෛද්‍ය විද්‍යායතනය

**සාරාංශය**

රටක නීරෝගිමත් පරපුරක් බිහි වීමට නම් ලෙඩ දුක් වලින් තොර සමාජයක් නිර්මාණය විය යුතුය. ජීවිතය පවත්නා කාල සීමාව, බොහෝ කල් ජීවත් වීමේ ශක්තිය හා ලෙඩ වලින් වැළකී සිටීම ආයුර්වේදය යන්නට නිර්වචනය වේ. වර්තමාන සමාජයේ දැඩි අවධානයක්, නැඹුරුවක් ආයුර්වේදය කෙරෙහි බලපා ඇත. ආයුර්වේද, යුනානි හා සිද්ධ යන විෂය ත්‍රිත්වයෙන් ආයුර්වේදය සැදුම් ලද්දක් වේ. ආයුර්වේද ඉතිහාසය හා විකාශනය මෙන්ම විෂයක් ලෙස සංවර්ධනය වී වර්තමානය වන විට විශ්වවිද්‍යාල අධ්‍යාපනයට ඇතුළත් වීම දක්වා විග්‍රහ කර ඇත. දැනුම සන්නිවේදන කිරීමේ නවීන මාධ්‍ය ප්‍රබල, වුවද ශ්‍රී ලාංකීක ජන සමාජය තුළ, තොරතුරු මූලාශ්‍ර යටතේ, ප්‍රචලිත, මුද්‍රිත පොත්වලට අමතරව පරිශීලනය කළ යුතු තොරතුරු මූලාශ්‍ර පිළිබඳ විමසා බැලීමක් මෙම අධ්‍යයනය තුළින් සිදුකර ඇත. එමෙන්ම 2010 සිට 2015 දක්වා වසර 5ක කාල පරාසයක් තුළ ආයුර්වේද විෂය පදනම් කරගෙන ප්‍රකාශයට පත් වී ඇති මුද්‍රිත ග්‍රන්ථ පිළිබඳ විමසා බැලීමක් ද සිදු කර ඇත. ආයුර්වේද යන මූලික විෂය හා සහ සම්බන්ධිත විෂය ග්‍රන්ථ, නාම යටතේ ප්‍රකාශයට පත් වී ඇති මුද්‍රිත පොත් පිළිබඳ විමසා බැලීමට ජාතික ග්‍රන්ථ නාමාවලිය විමර්ශනය කර ඇත. ඒ තුළින් විෂය හෝ විෂය සමගාමී කරුණු ප්‍රකාශයට පත් වී නොමැති බවට කරුණු අනාවරණය විය.

ආයුර්වේදය විෂය අධ්‍යයනයේ දී පරිශීලනය කළයුතු තොරතුරු මූලාශ්‍ර ලෙස පුස්කොළ පොත්, අත් පිටපත්, පුරාණ වෛද්‍ය ග්‍රන්ථ, සඟරා, පුවත්පත්, පශ්චාද් උපාධි නිබන්ධන මෙම අධ්‍යයනය තුළින් හඳුනාගෙන ඇත. ආයුර්වේදය විෂය දැනුම් සංවර්ධනයේ දී මෙම තොරතුරු මූලාශ්‍ර පරිශීලනය කිරීමේ වැදගත්කම මෙම අධ්‍යයන තුළින් අනාවරණය කර ඇත. මෙම තොරතුරු මූලාශ්‍ර ප්‍රකාශයට පත් නොවීම, අන්තර්ගත දැනුම කෙරෙහි අවබෝධයක්

නොතිබීම, ප්‍රාථමික මූලාශ්‍ර සංරක්ෂණය නොවීම, පාඨකයා පරිශීලනයට යොමු නොවීම, අනුක්‍රමණිකා නොතිබීම, භාෂාමය ගැටලු ආදී ගැටලු තොරතුරු මූලාශ්‍ර පරිශීලනය කිරීමේ ගැටලු ලෙස හඳුනාගැනීමට හැකි විය. එමෙන්ම මෙම ගැටලු සඳහා ගතයුතු ක්‍රියාමාර්ග හා යෝජනාද මෙම අධ්‍යයනය තුළින් ඉදිරිපත් කර ඇත. අධ්‍යයනයට යම් පහසුවක් සලසා ගැනීම සඳහා වසර 5ක කාලයක් තුළ ප්‍රකාශයට පත් වී ඇති මුද්‍රිත ග්‍රන්ථ කෙරෙහි පමණක් අවධානය යොමු කර අත්‍යවශ්‍ය තොරතුරු මූලාශ්‍ර විග්‍රහ කර ඇත. එමෙන්ම වර්තමාන සමාජයෙන් ඉතා සීග්‍රයෙන් රෝග ව්‍යාප්ත වන බැවින් රෝග වළක්වා ගැනීමට අවශ්‍ය දැනුම සන්නිවේදනය කිරීමට කර්තෘවරුන් හා පර්යේෂකයන් පෙළඹවීමට යම් වැඩපිළිවෙලින් සකස් කළ යුතුය. ආයුර්වේද විෂයේ මුද්‍රිත පොත් ප්‍රකාශයට පත් කිරීමට කර්තෘවරුන්ට යම් සහනයක් හෝ ආධාර ලබා දීම හා ප්‍රාථමික තොරතුරු මූලාශ්‍ර සංරක්ෂණයට රජය මඟින් පියවර ගත යුතු බව යෝජනා කිරීම.

**මූලික පදඃ තොරතුරු මූලාශ්‍ර, ආයුර්වේදය**

**හැඳින්වීම**

ලෝකයේ පෙරදිග වෛද්‍ය විද්‍යාත්මක කරුණු පොදු එකඟතාවයකට ගෙන ඒම සම්බන්ධව පැවතුණු ලෝකයේ ප්‍රථම වාර්තාගත සෞඛ්‍ය සම්මේලනය වන හිමාලයේ ඍෂි සම්මේලනයේ දී වෛද්‍ය විද්‍යාව හඳුන්වාලීමට යොදාගත් පදය ආයුර්වේදයයි. (පතිරත්න, 1992) ආයුර්වේදය යනු මුළුමහත් වෛද්‍ය විද්‍යාවයි. ආන්ෂික දැනුමක් නොවේ. එසේ නම් වෛද්‍ය විද්‍යාව රසායනික හා භෞතික සංසිද්ධියකි. එම රසායනික හා භෞතික සංසිද්ධිය ජීවය මෙන්ම ජන්මියාගේ උපත හා සම්බන්ධ වූ ස්වභාවයකි. ඒ නිසා වෛද්‍ය විද්‍යාවේ ඥාන සම්භාරයෙහි මූලය සම්බන්ධ සංකල්ප ජාතික වෛද්‍ය විද්‍යාව ලෙස ද හැඳින්විය හැකිය. (පතිරත්න, 1992) ඓතිහාසික තොරතුරු මූලාශ්‍රවල සඳහන් වන පරිදි ආයුර්වේදය මහබඹුගේ සිය නුවණින් අවබෝධ කර නිම වූවක් ලෙස ද මානුෂික ඥාන ධනවලින් එකක් ලෙස ද සැලකිය හැක. එසේම ග්‍රීසියේ (යුනානයේ) දේශීය වෛද්‍ය ක්‍රමය හර්මන් ඇපලෝ ආදී දෙවිවරුන්ගෙන් ද මිසරයේ දේශීයේ වෛද්‍ය ක්‍රමය තොත් ඔරිසස් ආදී දෙවිවරුන්ගෙන් ලැබුණු බවත් පොතපතෙහි සඳහන්ව ඇත. (ආරියදාස, 1982) වේදය යන්නෙන් උතුම් දැනගැනීම යන අදහස ද ශාස්ත්‍ර යන්නෙන් අනුශාසනය යන

අදහස ද කලා යන්නෙන් චාතුර්යය යන අදහස ද ප්‍රධාන වශයෙන් අපේක්ෂිතය. සාමාන්‍යයෙන් ආයුර්වේදය ලෙඩවලින් වැළකී සිටීම, ලෙඩ නසාලීම හා ලෙඩට අවැසි බෙහෙත් පිළියෙළකොට යෙදීම යන තුන්කොටස පිළිබඳ උපදෙස් දරා සිටින හෙයින් ශාස්ත්‍රයක් වශයෙන් ද පරපුර විවිධාකාරයෙන් මෙන්ම ඉතා පෘථුල ආකාරයෙනුත් ක්‍රියාත්මක කළ යුතුව තිබුණු හෙයින් කලාවක් වශයෙන් ද හඳුන්වනු ලැබේ.

ආයුර්වේද වෛද්‍ය ශාස්ත්‍රය හැදෑරීමේ දී පරිශීලනය කළ යුතු තොරතුරු මූලාශ්‍ර පිළිබඳ විමසා බැලීමක් මෙම අධ්‍යයනය මගින් සිදු කර ඇත තොරතුරු ප්‍රචාරය වන සන්නිවේදන මාධ්‍ය කොතරම් බිහිවූව ද මුද්‍රිත පොතට සුවිශේෂී ස්ථානයක් හිමි වේ. එබැවින් 2010 සිට 2015 දක්වා වසර 5 ක කාල පරාසය තුළ ආයුර්වේද විෂය පදනම් කරගෙන ප්‍රකාශයට පත් වී ඇති මුද්‍රිත ග්‍රන්ථ පිළිබඳ විමසා බැලීම් ද සිදු කර ඇත.

ආයුර්වේදය යන්නට නිර්වචන සලකා බැලීමේ දී ආයු පැවැත්වීම, විඳීම, මර්දනය කිරීම ආදි දිවි යහතින් ගෙනයාමට අදාළ උපදේශ ඇතුළත් ශාස්ත්‍රය වෛද්‍ය ශාස්ත්‍රය යනුවෙන් හරිස්චන්ද්‍ර විජයතුංග ගේ ප්‍රායෝගික සිංහල ශබ්ද කෝෂයෙන් පළමු වෙනි කාණ්ඩයේ සඳහන් ව ඇත. ශ්‍රී සුමංගල ශබ්දකෝෂයේ පළවෙනි කොටසේ සඳහන් පරිදි ආයුෂ, ජීවිතය පවත්නා කාලසීමාව, බොහෝ කල් ජීවත්වීමේ ශක්තිය යනුවෙන් දක්වා ඇත. සිව්වැදෑරුම් වූ හිත ආයුෂ, සුභ ආයුෂ, දුක්ඛ ආයුෂ යන මේවා ද ආයුෂය හට හිතකර සහ අහිතකර විෂයෝද ආයුෂයාගේ ප්‍රමාණය හා ස්වරූප ලක්ෂණ ද යම් ශාස්ත්‍රයක් කියන ලද්දාහු නම් එය ආයුර්වේදය නමැයි කියනු ලැබේ. (චරක, 1960) ශරීරය චක්ෂුරාදී ඉන්ද්‍රිය, මනස සහ ආත්මය හෙවත් චේතනා ධාතුව යන මොවුන්ගේ සංයෝගය ආයුෂ නම් ධාරි ජීවිත නිත්‍ය අනුබණ්ඩ යන පර්යාය නාමයන්ගෙන් ආයුෂයම කරීතිතයි. යම් ආයුර්වේදයක් මිනිසුන්ගේ ඉනපර යන දෙලොවෙහිම අර්ථ සාධනයෙහි හිතකර ද වේදය දන්නවුන් විසින් පුදන ලද පුණ්‍යතම වූ ඒ ආයුර්වේදය මෙහි වර්ණනා කරන්නෙමු (චරක, 1960).

ආයුෂ (දීර්ඝ ජීවිතය) පිළිබඳ වේදය (උසස් ශාස්ත්‍රය) ආයුර්වේදයයි. ජීවිත ජීවන චිර, ජීවන ධාරි , නිත්‍යග අනුකණ්ඩ යන මේවා අයුෂ්ශබ්දයට පර්යායව සිටීම ශරීරය ජීව දෙකෙහි සංයෝගය ජීවන නම් වේදය යනු අයහපත් දේ වැලඳ ගැනීමට උවමනා වන දැනීම දෙන උතුම් උපදෙස් පරපුරයි. විද්‍යා ශාස්ත්‍රය අනුශාසනය යන අර්ථ ද වේද ශබ්දයෙහි ඇත. (ආරියදාස, 1982)

**ආයුර්වේද විෂයේ මුලාරම්භය**

ලෝකයේ ප්‍රථම චිකිත්සා ක්‍රමය වන ආයුර්වේදය බිහිවූයේ භාරතීය විද්වතුන්ගේ ඥානගර්භයෙහි ය. ආයුර්වේදයට අධිපති දෙවියන් වන්නේ ධනවන්ත්‍රිය. ආයුර්වේද වෛද්‍ය ක්‍රමයට අමතරව යුනානි හා සිද්ධ යනුවෙන් වෛද්‍ය ක්‍රමය පිළිබඳවද ඓතිහාසික ග්‍රන්ථවල සඳහන් වේ සිද්ධ වෛද්‍ය ක්‍රමය දකුණු ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තයේ ද යුනානි වෛද්‍ය ක්‍රමය ග්‍රීසියේ හර්මන් ඇපලෝ ආදී දෙවිවරුන්ගෙන් ද බිහි වී ඇත ලංකා ඉතිහාසයේ රාවණා සමය දේශීය වෙදකමේ ස්වර්ණම යුගය ලෙසත් රාවණා දක්ෂ රසායන වෛද්‍යවරයෙක් ලෙසත් හඳුන්වා ඇත. (ආරියදාස, 1982) විල්ඩියුරන්ට් නමැති ඉතිහාසඥයා සඳහන් කරන අන්දමට ලෝක වෛද්‍ය ඉතිහාසයෙහි මුල්ම රෝහල පිහිටුවීමේ ගෞරවය හිමිවන්නේ පණ්ඩුකාභය රජතුමාටය ලංකාවේ දේශීය වෙදකමේ උප්පත්තිය, වර්ධනය හා පෝෂණය ගමේ පන්සල ආශ්‍රිතව සිදු විය. පන්සලේ හාමුදුරුවරු සංස්කෘත භාෂාව ඉගෙන ගෙන සංස්කෘත වෛද්‍ය ග්‍රන්ථ සිංහලට පරිවර්තනය කළහ. දායක ළමයින් පන්සලේ නවත්වාගෙන වෙදකම උගන්වා ගෙදර යැවූහ. මේ රටේ භික්ෂූන් වහන්සේලා රට වැස්සන්ගේ මානසික රෝග සුව කිරීම සඳහා වෙදකම ඉගෙන ගෙන වෙද පොත් ලියා වෙදකම උගන්වා වෙදුන් තනා ඇති බව පූජාවලිය කර්තෘ මයුරපාද පිරිවෙන්පති බුද්ධපුත්‍ර මා හිමි යෝගාවර්ණය නමැති සංස්කෘත වෛද්‍ය ග්‍රන්ථයට ලියා ඇති සන්නයෙහි සඳහන් වේ. අත්තරගම හාමුදුරුවෝ, පොතුවිල හාමුදුරුවෝ, ඩබ්ලිව්. දානියෙල් ප්‍රනාන්දු වෙද මුදළිඳු, ඇම්. ඇස්. පී. සමරසිංහ වෙද මුදළිදු, පණ්ඩිත වික්‍රමාරච්චි වෙද රාලහාමි, බානගල වෙදරාලහාමි ආදීහු ද පන්සලෙන් බිහි වූ වෛද්‍යවරු වූහ. පුරාණ කාලයේ ඖෂධ පැළෑටි වැඩි වශයෙන් වවන ලදදේ පන්සල් භූමිවලය. පන්සලේ වෙද හාමුදුරුවෝ එම වෛද්‍ය ශාස්ත්‍රය ප්‍රධාන දායකයාට උගන්වන ලදී. (සරණංකර හිමි, 1985). එසේ බිහි වු වෙද පරපුරවල වෙද මහත්වරු විසින් පසුකාලීනව වෛද්‍ය සංගම් පිහිටුවා ගෙන ඇත.

ශ්‍රී ලංකා සිද්ධ වෛද්‍ය සංගමය යනුවෙන් සංවිධානයක් යාපනයේ සිද්ධ වෛද්‍යවරුන් 1924 දී ප්‍රථම වරට ඇරඹූහ. යාපනයේ ලංකා ආයුර්වේද විද්‍යාලය 1925 දී පිහිටුවා ගනු ලැබුවේ සිද්ධ වෛද්‍ය ජේ. බස්තියන් පිල්ලේ මහතාගේ ප්‍රයත්නයේ ප්‍රතිඵලයක් වශයෙනි. මුළු දිවයිනේම පිහිටුවා තිබු වෛද්‍ය සංගම් එකසිය ගණනක් එකතුව 1928 දී සමස්ත ලංකා ආයුර්වේද වෛද්‍ය සම්මේලනය (All Ceylon Ayurvedic

Practioners Congress) පිහිටුවන ලදී. 1929 දී ස්වදේශ වෛද්‍ය විද්‍යාලය ආරම්භ කළේ ශිෂ්‍යයන් 72 න් යුක්තවයි. 1929 ජුලි 19 දා වික්‍රමාරච්චි වෙද පඬිතුමා ගම්පහ යක්කල ශ්‍රී ලංකා සිද්ධායුර්වේද විද්‍යාලය (ගම්පහ වෙද විදුහල) ආරම්භ කළේය. 1957 දී ස්වදේශ වෛද්‍ය දෙපාර්තමේන්තුව ආරම්භ කර ගරු සෞඛ්‍ය ඇමති ඒ.පී. ජයසූරිය මහතා ආයුර්වේද ඖෂධ සංග්‍රහයක් සකස් කිරීමට කමිටුවක් පත් කළේය. ආයුර්වේද දෙපාර්තමේන්තුව, ආයුර්වේද වෛද්‍ය සභාව, ආයුර්වේද විද්‍යාලය හා ආරෝග්‍යශාලා මණ්ඩලය, ආයුර්වේද පර්යේෂණ කාරක සභාව යන මේවා පළමුවරට පිහිටුවනු ලැබුවේ 1961 අංක 31 දරණ ආයුර්වේද පනතේ විධිවිධාන අනුවයි. 1961 වන තෙක් සිංහල (ස්වදේශ), සිද්ධ (ද්‍රවිඩ), ආයුර්වේද (භාරතීය), යුනානි (මරක්කල) විසින් පැවැත්වුණු වෛද්‍ය ක්‍රම සියල්ලම ආයුර්වේද යන එකම නමින් ගැනෙන සේ නීතිගත අර්ථ නිරූපණයක් කර වෙදරාල යන්න ආයුර්වේද වෛද්‍යවරයා යන්න වෙනසකට පත් වූයෙත් මෙම පනතිනි. 1962 දී නාවින්න වෛද්‍ය බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ ආයතනය ආරම්භ කරන ලදී. මෙවැනි ආයතන හා විශ්ව විද්‍යාලවලින් ආයුර්වේද අධ්‍යාපනය ව්‍යාප්ත කිරීම සිදු විය. අයුර්වේද අධ්‍යාපනයේ පදනම ද්‍රව්‍ය ධර්ම විද්‍යාවයි. එය මූලික වශයෙන් කොටස් තුනකි. එනම් ද්‍රව්‍ය අධ්‍යයනය, ඖෂධ ද්‍රව්‍ය අධ්‍යයනය, ආහාර ද්‍රව්‍ය අධ්‍යයනයයි. මෞලික සිද්ධාන්ත- දෝෂධාතු මල විඥානය, පදාර්ථ විඥානය, සංස්කෘත, ආයුර්වේද ඉතිහාසය, ශරීර ක්‍රියා, ශරීර විඥානය, ද්‍රව්‍ය ගුණ විඥානය, රස ශාස්ත්‍රය, භෛෂජ්ජ කල්පනා, ස්වෘතවෘත අගද, ශල්‍යශාලක්‍ය, නිධාන චිකිත්සා (කාය චිකිත්සා), බාල රෝග (කෞමාරභෘත්යව), ප්‍රසෘති තන්ත්‍ර, ස්ත්‍රී රෝග යන ආදිය ආයුර්වේද විෂයන් වේ.

විශ්වවිද්‍යාල අධ්‍යාපනයකින් ලැබිය හැකි ප්‍රතිඵල වනුයේ ආයුර්වේද මූලධර්ම අධ්‍යයනය, විකාශනය වීම, ඒ පිළිබඳ අවබෝධය පුළුල්වීම, පැරණි හා නවීන ද්‍රව්‍ය ධර්මතා ඥානය යාවීම, එයින් නව ශක්‍යතාවක් හඳුනාගැනීමට ලැබීම, පර්යේෂණාත්මක වෛද්‍ය විද්‍යා ඥානය ගොඩනැංවීම, කුසලතා පූර්ණ වෛද්‍යවරු හෙවත් හෙටට ගැළපෙන වෛද්‍යවරුන් බිහිවීම, වෛද්‍ය ක්‍රමවල ඇති දුර්වලතා මඟහැරීයාම, රෝගීන්ට අවස්ථාවෝචිත නියමිත ප්‍රතිකාර පෙර අපර දෙදිග භේදයකින් තොරව සුදුසු අවස්ථාවේදී ලබා දීමට හැකිවීම, ස්වාධීන සංස්කෘතියක් තුළ නිරවුල්

වෛද්‍ය අධ්‍යාපන සංකල්පයක් බිහිවීම, විශේෂයෙන් දැනට යටපත් වී ඇති ශල්‍ය වෛද්‍ය පශ්චාද් උපාධියක් සඳහා සුදුසු පසුබිම ගොඩනැගීම, ආයුර්වේදයේ අතීත සමෘද්ධිමත් භාවය ගැන පමණක් ආවර්ජනය කිරීමෙන් නොසෑහී යළි එය ප්‍රකෘතිමත් කිරීමට ඉඩ ලැබීමයි.

**තොරතුරු මූලාශ්‍ර**

මෙම විෂය ක්ෂේත්‍රයන් අධ්‍යයන කිරීමෙහිලා විමර්ශනය කළ යුතු තොරතුරු මූලාශ්‍ර අතරින් පුස්කොළ පොත්, අත්පිටපත්, ඖෂධ සංග්‍රහ, නිගණ්ඩු පොත්, සඟරා, පුවත්පත් හා නිබන්ධන ප්‍රමුඛ ස්ථානයක් ගනු ලැබේ.

දේශීය වෙදකම අඩංගු පුස්කොළ පොත් අතරින් වරයෝගසාරය, යෝගරත්නාකර, භෛසජ්ජ කල්පනා, යෝග ශතකය, අරිෂ්ට ශතකය, මාධව නිධානය, විෂ අත්පොත, යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම්, නක්ෂත්‍ර වෙද පොත, සිද්ධිසාර, සර්ප විෂ වෙද පොත, වට්ටෝරු පොත්, කැඩුම්බිඳුම් වෙදකම, චිකිත්සා ග්‍රන්ථ, අරිෂ්ට ශතකය, සර්වාංග වෙදකම, සර්ප විෂ වෙදකම යන ආදී විෂයන් අඩංගු පුස්කොළ පොත් ප්‍රධාන තැනක් ගනියි. සිංහල, පාලි, සංස්කෘත හා දෙමළ භාෂාවෙන් ලියන ලද ලාංකේය වෙද පොත් මහත් රාශියක් ලංකාවේ මෙන්ම පිටරට වලද තැන්පත් කර ඇත. අපේ පුස්කොළ පොත් මේ වන විටත් පැරීසියේ ජාතික පුස්තකාලයෙත්, Museedel'Homme කෞතුකාගාරයෙත්, පුරාණ බැවේරියා රාජ්‍යයේ මියුනික්හි රාජ්‍ය පුස්තකාලයෙත්, බ්‍රිතාන්‍ය පුස්තකාලයෙත් තැන්පත් කර ඇත,

දේශීය හා විදේශීය වශයෙන් විසිරී පවතින මෙම පුස්කොළ පොත් සූක්ෂම චිත්‍රපට වලට ගෙන එක්තැන් කර ඒ පිළිබඳ විස්තරාත්මක නාමාවලී පිළියෙළ කිරීම වෛද්‍ය ශාස්ත්‍රීය ඉතිහාසය හදාරන විද්‍යාර්ථයින්ට මෙන්ම ආයුර්වේද වෛද්‍යවරුන්ට, ඖෂධ විද්‍යාඥයින්ට හා ඖෂධ නිෂ්පාදකයන්ටද කෙරෙන ඉමහත් සේවයක් වෙයි, ඇතැම් පුස්කොළ පොත්වල ඒවා ලියු වර්ෂය හෝ ලීවේ කවුරුන් විසින්ද යන්න සඳහන් නොවුණද ඇතැම් පුස්කොළ පොත්වල ලියූ වර්ෂයද සඳහන් කර ඇත. වට්ටෝරු හා මන්ත්‍ර පොතක එම පොත ලියා නිම කළ වර්ෂය ලෙස 1859 ක් වු මාර්තු මාසයේදීය යන්න සඳහන් කර ඇත. පුස්කොළ පොත්වල සඳහන් බෙහෙත් වට්ටෝරුවල අත්දුටුවයි, ප්‍රත්‍යක්ෂයි, නිට්ටාවට සුව වේ යනුවෙන් සඳහන් වේ. ගද්‍ය හා පද්‍යයෙන්

රෝග ලක්ෂණ හා බෙහෙත් වට්ටෝරු විස්තර කර ඇත. එහි ඇති එක් බෙහෙත් වට්ටෝරු කිහිපයකට උදාහරණ පහත දැක් වේ.

රතටයි, ඉදිමුනටයි - හක්කැට, අරළු, සහිඳ ලුණු, තිප්පිලි පුස්කර වු දා පෙන මෙමාවක පමණ ගෙන මුරුංගා පොත් යුසින් අඹරා ගුළි මුරුංගා පොතු යුසින් අඹරා ගුළි කර ලෙ තබා ඇස ගානු පටල කැපෙයි. එළකිරි රත් හදා තලතෙල් එක්ක පුරවලලිය ගානු. මී පැණි එළගිතෙල් වංඩා පිං ගටා ඇස ගානු. ඇසේ රත කැපෙයි. රණවරා කොළ වුත්තා දියෙන් කාකාරා ඇස පිට ගානු. ඉදිමුනටයි.

**ඉසරදේට** - ඉගුරාති කුළු, සුදු ලූනු, සහිඳ ලුණු මේවා අඹරා ගිතෙලට කලතා පදමට සිඳ තබා නස්න කරනු. කෝමාරිකා පින්දුන ඇතුලේ තිප්පිලි රිදී තුන්නං සියඹලා කොළ පල්මානික්කං කුඩා පලවෙඩුරෙවෙවඩා පිටෙගාටකුලංබුවයි. මීටම නෙල්ලි, සුදු ලූනු කෝමාරිකා ගුලිකර පවනේ වෙලා තබා ගලගා ඇල් දියෙන් ඇස ගානු පටක කැපෙයි.

එමෙන්ම දින වකවානු සඳහන් නොවන පුස්කොළ පොතක ආයුර්වේද තෛලයක් වන ලෝකනාථ තෛලයට උදාහරණයක් පහත දැක් වේ.

| | |
|---|---|
| ආලවඩන මෙනෙල හිස බැඳපුසු දවසක් ඇරනෙල් | හරිමිනෙන් |
| කාල පැමිණෙනරොග ආවත් බාල කර දෙයි | මෙනැනෙන් |
| බාල වන සේම ගුණ ඇති රසිවරුන් | පෙරදෙසනෙන් |
| ආල වඩන සන්නි විනාසය තෛලයයි | නමකියනෙන් |

**රත්පිත් විකාරයට බෙහෙත්**

රත්පිත් විකාරයට අත් කහ, ගොටුකොළ, නික කොළ, තිත්තකුරු, මැටි කොටා පුහුල් මදත් එක්ක පුහුල් ඉස්මෙන් ඉස ගලලනු. කරල් හැබ තන කිරෙන් නස්න කරනු. බඩට දෙන බෙහෙතට කිතුල් පැණි මනාව, දෙහි ඇඹුල් මනාවයි එකට වක්කර කඩ වැස්ම බැද ගිනි හැඩේ තියනු. නව රුවක් දෙනු.

**ග්‍රහිණා තෛලය**

උළුහාල් පතක් ගෙන වතුර මනා
අට එකට කකාරා පෙර තබ මනා
තලතෙල් පතක් ඉට මනා
වැල්මී සාදික්කා කරාබු වසවාසි මනා
ගඩුත් සීගතු තෙනකට ගති තෝ තිනා
ගෙඩියෙහි පිට ගා පාතට අදිමිනා
වැඩියෙන් තිබතොත් ඕ හට පොවගනා
සියලුම ලෙගෙඩි නසනෙයි දැනා

මුල් කාලීනව පන්සල් ආශ්‍රිතව තිබූ පුස්කොළ පොත් පසුකාලීනව ආයතන, දෙපාර්තමේන්තු, විශ්වවිද්‍යාල පුස්තකාලවල, කෞතුකාගාර යන ස්ථාන වල තැන්පත් කර ඇත. පන්සල්වල තැන්පත් කර ඇති පුස්කොළ පොත් සම්බන්ධයෙන් කේ. ඩී. සෝමදාස මහතා විසින් ප්‍රකාශයට පත් කරන ලද පුස්කොළ පොත් නාමාවලි 3කි. එහි ප්‍රථම භාගයේ දිස්ත්‍රික්ක 13 ක විහාරාරාම 913කින් එකතු කරන ලද පුස්කොළ පොත් 44329 ක් පිළිබඳ ග්‍රන්ථ නාම අකාරාදීව ගොනු කර ඇත. එහි ද්විතීය භාගයේ දිස්ත්‍රික්ක 16 ක විහාරාරාම 674 කින් එකතු කරන ලද පුස්කොළ පොත් 3222ක විස්තර ග්‍රන්ථ නාම අකාරාදීව ගොනු කර තිබේ. එමෙන්ම තෘතීය භාගයේ බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ ඇති ලංකාවේ පුස්කොළ පොත් 4000ක පමණ ග්‍රන්ථ විද්‍යාත්මක විස්තර දක්වා ඇත. පුස්කොළ පොතේ නම, පත්තිරු ගණන, බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ ප්‍රවේශ අංකය ආදිය මෙම පුස්කොළ පොත් නාමාවලියට ඇතුළත් වේ.

1985/1988 වර්ෂ වලදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ ආධාර ඇතිව ශ්‍රී ලංකා රජය ලෝක සෞඛ්‍ය සංවිධානය සමඟ ක්‍රියාත්මක කළ දේශීය වෛද්‍ය ක්‍රමය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මූල්‍යාධාර ලබමින් නාවින්න බණ්ඩාරනායක අනුස්මරණ පර්යේෂණායතනයේ පුස්තකාලයට අයත් දේශීය පරිත්‍යාගශීලීන් විසින් පරිත්‍යාග කරන ලද පුස්කොළ පොත් අතරින් තෝරාගත් පුස්කොළ පොත් 100 ක් කියවා අත් අකුරින් පිටපත් කර මුද්‍රණය කර ඇත. එය තල්පතේ පිළියම් ලෙස වෙළුම් 1 සිට 22 දක්වා මුද්‍රණය කර ඇත. මෙම පොත් ආයුර්වේද විෂය අධ්‍යයනයේ දී ප්‍රායෝගික වශයෙන් අත්හදා බැලියහැකි වටිනා කෘති පෙළකි.

ආයුර්වේද දැනුම පාරම්පරිකව රැකගත යුතු හෙයින් පුස්කොළ පොත් වලින් පසුව ආයුර්වේද දැනුම, වෙදහෙදකම් වෙදමහත්වරුන්ගේ අත්අකුරෙන් ලියා ඇත. ඇතැම් වෙද අත්පොත්වල ලිඛිත වර්ෂය හා ලියූ කර්තෘවරුන් පිළිබඳව සඳහන් කර තිබුණද ඇතැම් අත් පිටපත්වල එසේ සඳහන් කර නොමැත. මෙම වෙද පොත් පාරම්පරිකව වෙද පරපුර විසින් රැක ගෙන ඇත. වෙද අත්පොතක ඇති නිදසුනක් පහත දැක් වේ.

වැදූ අයගේ ගිනියමට
කුර මුළුත් සහ බැබිල මුළුත් ගෙන
අට එකට සිදූවා කකාරමින් ගෙන
ගුළිත් සමඟ කරලා දුන්නොතින
වැදූ අයගේ සැමගිනි යන්න සමින

**සීතල සන්නියට**
ඉඟුරු මිරිස් ගෙන කකාරමින්නේ
දොඩම් ඇඹුල් වක්කර දීපන්නේ
ඊටම වල් ඉඟුරු අර ගන්නේ
පොලුත් එක්ක කොටමින් මිරිකන්නේ

ළිපතබමින් අමු වී ගිය කල
කලක ලනු බැබෙනා පදමට ආකල
පෙරා රැගෙන තෙල් ඇස ගා කල
සීතල සන්නිය දුරු වෙයි එම කල

**කනේ කිනිතුල්ලාට**
කනේ කිනිතුල්ලාට දිවුල් මඳ යුෂ වක් කරනු
ඊටම දිවුල් කොළ යුෂ ලුණු දියෙන් කන වක් කරනු
මීටම මුරුංගා පොතු යුෂ ලුණු දියෙන් කන වක් කරනු

**වන වලට** - හීරැස්සපළු තෙල් එඬරු දලු කොටා ඉසමට හීනටි හාල් දමා රොටි උයා බඳනු සැම වනවලටයි.

**හිසේ රුදාවට** - ළිප මැද තියෙන අළු මේස හැඳි 1, ගම්මිරිස් ඇට 15 ක් සිනිඳුවට අඹරා ගන්න.මේ පිටි මිශ්‍රණය ඉහත අළු දමා කලවම් කරන්න. දෙහි ගෙඩියක ඇඹුල් ගෙන විනාඩියක් රත් කරලා අළු සමඟ මිශ්‍ර කරන්න. පරණ පාන්කඩ කැබැල්ලක් ගෙන නළලේ පමණට ඉරා බේත්වලින් පැලැස්තරයක් දමන්න. විනාඩි 5ක් තබන්න. ඇල් දියෙන් නාන්න.

**බඩේ ගිනියම** - බඩේ ගිනියම අයට බැබිල මුල්, කලාඳුරු, කුර මුල් අට එකට කාකාරා දෙනු. වැදූ ගෙයි ගිනියමට යහපති.

**බළලාකෑවාට**- කරවිල යුසින් හූනු අතගානු.

**උල් ඇදෙන්නට** - කැබිරිත්ත මුල් තළා අමුකහ පොල් කිරෙන් අඹරා මුහුණ පාදා බඳිනු. උල් ඇදෙයි. අත්දුටුවයි.

**නියගලා විසට** - නියගලා විසට හාතාවාරිය අල අඹරා පොවනු. නිවිති කොළ අඹරා පොවනු.

**ඉරිවාරදෙට** - බැබිල දලු තනකිරෙන් අඹරා එයින් නස්න කරනු, ගුණ වෙයි. අත්දුටුවයි.

මෙම වෙද අත්පොත්වල ඇති වෛද්‍ය ක්‍රම ඉතා සරලය. ඇතැම් ඒවා ගද්‍යයෙන් ද පද්‍යයෙන් ද විස්තර කර ඇත. රෝග ලක්ෂණ, රෝග විනිශ්වය සහ ඒ සඳහා ප්‍රතිකාරය මෙන්ම ඖෂධ පිළියෙල කර ගන්නා ආකාරය ද සඳහන්ව ඇත. මෙම අත්පිටපත්වල සඳහන් බෙහෙත් වට්ටෝරුවල ද අත්දුටුවයි, ප්‍රත්‍යක්ෂයි, නිට්ටාවට සුව වේ, සත්තයි, යහපති යනුවෙන් සඳහන් කර ඇත.

ආයුර්වේදය මහා ග්‍රන්ථ සමූහයකින් පරපෝෂිතව පැවතියේය. ආයුර්වේද වෛද්‍ය දැනුම ලබා ගැනීමට විමර්ශනය කළ යුතු අත්‍යවශ්‍ය අග්‍රණ්‍යයේලා සැලකෙන ග්‍රන්ථ නාමයන් පහත දැක්වේ. චරක සංහිතාව, සුශෘත සංහිතාව, අෂ්ටාංග හෘදය සංහිතාව, අෂ්ටාංග සංග්‍රහය, ශාරංගධර සංහිතාව, භාව ප්‍රකාශ, චක්‍ර දත්තය, භෛසජ්ජ රත්නාවලිය, යෝගරත්නාකරය, වංගසේන සංහිතාව, යෝග සංග්‍රහය, ගද විනිශ්චය, මාධව නිධානය, වටිකා ප්‍රකරණය, තෛල පංචශතකය, ස්ත්‍රී චිකිත්සාවලිය,

මාධවපදාර්ථ ව්‍යාඛ්‍යාවලිය, බ්‍රහ්ම සංහිතා, සංස්කෘත ශබ්දාර්ණවය, ලක්දිව රක්ත රෝග සංග්‍රහය, සුශෘත, ශාරීර ව්‍යාඛ්‍යාව, ද්‍රව්‍ය විඥානය, භේල සංහිතා, කායික විඥානය, සෞඛ්‍ය විඥානය, පදාර්ථ සංග්‍රහ, ස්නේහ විධිය, රසරත්න සමුච්චය, ත්‍රිදෝෂ තත්ත්ව විවරණය,මහෞධ නිඝණ්ටුව, රස ශාස්ත්‍රය, රසායන වාජීකරණය, රසඔසු සෙවුම, දේශිය වෛද්‍ය ශබ්ද කෝෂය, ආයුර්වේද ඖෂධ සංග්‍රහය, දේශීය චිකිත්සා සංග්‍රහය, කෞමාරභෘතය, ද්‍රව්‍ය, ගුණ විඥානය, ජ්වර නිධාන ග්‍රන්ථය, කුමාර තන්ත්‍ර ව්‍යාඛ්‍යාව, පංචකර්ම චිකිත්සා, විෂම ජ්වර තත්ත්ව විඥානය, ගෘහෞෂධ චින්තාමනි, ශබ්ද කෝෂ. මෙහි සඳහන් ඇතැම් ග්‍රන්ථ නාම පොත් සංස්කෘත භාෂාවෙන් රචිත වේ. එබැවින් ආයුර්වේද දැනුම පෝෂණයෙහිලා සංස්කෘත දැනුම ලබා ගැනීම ද අත්‍යවශ්‍ය සාධකයක් වේ.

ආයුර්වේද ග්‍රන්ථ අතරින් ප්‍රමුඛ ස්ථානය හිමිවනුයේ චරක සංහිතාවටයි. එම ග්‍රන්ථයෙහි කර්තෘ චරක මුනිවරයා දක්වා ඇත්තේ චරකයෙහි දැක්වෙන දෑ වෙනත් ග්‍රන්ථයන්හි තිබිය හැකිය. එහෙත් චරකයෙහි නොදැක්වෙන දෙයක් වෙන ග්‍රන්ථයක නැත. අෂ්ටාංග හෘදය සංහිතාව චරකයට අයත් බොහෝ දේ උපුටාගෙන සම්පාදනය කර ඇති ග්‍රන්ථයකි. හරදන්-උල්- එ රෂිඩ් නමැති අරාබි රජතුමාගේ කාලය තුළ චරකය සරක් නමින් අරාබි බසට පරිවර්තනය කර ඇත. චරක සංහිතාව සූත්‍රක, නිදාන, විමාන, ශාරීර, ඉන්ද්‍රිකය චිකිත්සා, කල්ප, සිද්ධි යනුවෙන් කොටස් 8 ට බෙදී ඇත.

කොළඹ යුගයේ පිළියෙල වී මුද්‍රණයෙන් එළිදුටු වෙදපොත් හා කතුවරු පහත දක්වා ඇත. යෝග සංග්‍රහය/රත්නපාල හිමි, ගද විනිශ්චය/සර්නේලිස් සිල්වා, වෛද්‍යාතතංසය/ශ්‍රීධර රාජසුන්දරආරච්චි, වටිකා ප්‍රකරණය/අල්විස්, ඊ.එස්. ඩී. අයිලප්පෙරුම, තෛල පංච ශතකය/ අල්විස්, ඊ.එස්. ඩී. අයිලප්පෙරුම, ස්ත්‍රී චිකිත්සාවලිය/අභයරත්න ඩී. එච්. එස්., මාධව පදාර්ථ ව්‍යාඛ්‍යාව/බටුවන්තුඩාවේ පඬිතුමා, සංස්කෘත ශබ්දාර්ණවය /ශ්‍රී සෝරත නාහිමි, දේශීය වෛද්‍ය ශබ්දකෝෂය/ ඥානවිමල හිමි, කිරිඇල්ලේ, ආයුර්වේද ඖෂධ සංග්‍රහය/ජයසිංහ ඩී. ඇම්. වෙද පඬිතුමා ඇතුළු වෛද්‍ය මණ්ඩලය.

සිද්ධ වෛද්‍ය දැනුම අඩංගු ද්‍රවිඩ භාෂාවෙන් ලියැවුණු පද්‍ය 12006 කින් සමන්විත පරරාසසේකර වෛද්‍යායකම් නමැති මහා වෛද්‍ය ග්‍රන්ථ සහ එබඳුම විශාලත්වයක් ඇති සේකරාසසේකර වෛද්‍යාකම් නමැති ග්‍රන්ථය ද අංග සම්පූර්ණ ශ්‍රේෂ්ඨතම චිකිත්සා ග්‍රන්ථ දෙකකි.

සඟරා ද ආයුර්වේද වෛද්‍ය දැනුම පෝෂණයෙහිලා ඉවහල් වුවද ලංකාවේ ප්‍රකාශයට පත් කරන ආයුර්වේද සඟරා දුබල වීම ගැටලුවකි. Sri Lanka Journal of Indigenous Medicine සුවය යන සඟරා ලංකාවේ ප්‍රකාශයට පත් කරන සඟරා දෙකයි. නමුත් විදේශීය සඟරා බොහෝ ප්‍රමාණයක් ආයුර්වේද වෛද්‍ය දැනුම පෝෂණයට ඉවහල් කර ගත හැක.

IndianJournal of Medical Microbiology" Journal of Lipid Research" Medicinal & Aromatic Plant Abstract" Plants Medica" Indian Journal of Phamacology" HamdardMedicus" Indian Journal of Dermatalogy"Venereology"Leprology" The Indian Journal of Pharmacology"The Indian Journal of Nutrition & Dietetics" Pharmacological Review" Journal of Natural Products"SachithraAyueveda"Global Ayurveda යන සඟරා එසේ ප්‍රකාශයට පත් වන සඟරා අතරින් කිහිපයකි.

ආයුර්වේද වෛද්‍ය දැනුම අධ්‍යයනය කිරීමෙහිලා ආයුර්වේද, සුබසෙත, ඉරහඳ යන පුවත්පත් ඉවහල් කර ගත හැක. තොරතුරු මූලාශ්‍ර යටතේ පර්යේෂණ නිබන්ධන පරිශීලනය ද ආයුර්වේද වෛද්‍ය දැනුම පෝෂණය කිරීමෙහිලා අත්‍යවශ්‍ය වේ. පාරම්පරික වෙද පොත් ඇසුරු කර ගනිමින් වර්තමාන සමාජ අවශ්‍යතාවලට සරිලන ලෙස ඖෂධ නිෂ්පාදනය, නිමැවුම හා පාරිභෝගික ආකර්ශණීයභාවය ඇති කර ගැනිමෙහිලා පර්යේෂණ කිරීම වැදගත්ය. එමෙන්ම විශ්වවිද්‍යාල උපාධිය සඳහා ද ආයුර්වේද විෂය අන්තර්ගත බැවින් දර්ශනපති, පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවන් සඳහා ඉදිරිපත් වන උපාධි අපේක්ෂකයන් ද ආයුර්වේද හා යුනානි යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළ පර්යේෂණ සිදු කරනු ලැබේ.

ආයුර්වේද විෂයක් ලෙස හැදෑරීමේදී විශේෂයෙන්ම බෙහෙත් පැළෑටි පිළිබඳව මනා අධ්‍යයනයක් ලැබිය යුතුය. බෙහෙත් පැළෑටි පිළිබඳව අවබෝධයක් නොමැතිව ආයුර්වේද වෛද්‍ය ක්‍රමයට අදාළ බෙහෙත් පිළියෙල කිරීම උගහටය. එවැනි බෙහෙත් පැළෑටි පිළිබඳව අවබෝධයක් ලැබිය හැකි ආයුර්වේද බෙහෙත් පැළෑටි පිළිබඳ ග්‍රන්ථ නාම පහත දක්වා ඇත.

Atlas of Microscopy of Medicinal Plants" A Modern Herbal" Herbs and Astrology" Ayurvedic flora Medica" The illustrated herbal hand book" Comprises of Medicinal Plant cultivation" Ayurvedic Narcotic" Medicinal Plants" Medicinal Plants used in Ceylon'

ඖෂධීය ශාක සංග්‍රහය නමැති ග්‍රන්ථ නාමය උදාහරණ ලෙස ගත්විට එහි බෙහෙත් පැළෑටි විස්තර කර ඇති ආකාරය පහත දක්වා ඇත.

උදා, අංකෙන්ද

හැඳින්වීම

උද්භිද විද්‍යාත්මක නාමය AcronychinPedunculata

JamboliferaPedunculata

Acranychincyminosmafmuell

කුලය - Rutaceae (ජම්බීර)

ව්‍යවහාර්ය නාම - පර්යාය නාම හා ද්‍රව්‍ය ගණ

පර්යාය නාම විවරණය - ව්‍යවහාර්ය අංග

උද්භිද විද්‍යාත්මක විස්තරය - ආයුර්වේද ශාස්ත්‍රානුකූල විස්තරය ගුණ කර්ම, දෝෂ කර්ම, ප්‍රධාන කර්ම ව්‍යවහාරික රෝග අවස්ථා

අඩංගු නිෂ්පාදිත ඖෂධ - ප්‍රධාන රසායනික සංඝටක

**කෘෂි විද්‍යාත්මක විස්තරය**

**(අතිරේක තොරතුරු)**

ආයුර්වේදය විෂයක් ලෙස අධ්‍යයනය කිරීමේදී මුද්‍රිත මාධ්‍යයට අමතරව විද්‍යුත් මාධ්‍ය ඔස්සේ ද තොරතුරු මූලාශ්‍ර වලට පිවිසිය හැක. http;//www.agri.ruh.ac.lk/ medicinalplants/index.html යටතේ රුහුණු විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ Crop Science දෙපාර්තමේන්තුව මඟින් බෙහෙත් පැළෑටි පිළිබඳ වෙබ් අඩවියක් පවත්වාගෙන යනු ලැබේ. ආයුර්වේද ඖෂධ සංස්ථාව http/www/ayurvediccrop/ gov.lk/web, දේශීය වෛද්‍ය සභාව http.//www.indigenousmedimini.gov.lk දේශීය වෛද්‍ය අමාත්‍යාංශය http;//www.indigenous medimini.gov.lk යන වෙබ් ගවේෂණයන් තුළින් ආයුර්වේද විෂයට අදාළ තොරතුරු සමුද්ධරණය කර ගත හැක. උද්භිද නාම සිංහලෙන් සඳහන් වෙබ් ලිපිනය වන්නේ http;dh.web.org/place. name/bot2sinhala.html. කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ වෙබ් ලිපිනය http;iim.cmb.ac.lk, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය http;www.kln.ac.lk/institute/wickramarachchi, යාපනය විශ්වවිද්‍යාලයේ සිද්ධ දෙපාර්තමේන්තුවේ වෙබ් ලිපිනය http;//www.sid.ka.ifn.ac.lk යන වෙබ් ගවේෂණයන් ආයුර්වේද විෂය අධ්‍යයනයේදී උපකාරී වේ.

ආයුර්වේද සංගම් බිහි වීමෙන් පසු එදා සිටි ප්‍රභූ වෙදමහත්වරු විසින් මාධවය, සාරසංක්ෂේපය, වෛද්‍ය චින්තාමණිය, ප්‍රයෝග සමුච්චය, භේසජ්ජ මංජුසාව, සරස්වතී නිඝණ්ටුව, සිදෙධෟෂධනිඝණ්ටුව, වනවාසනිඝණ්ටුව, අරිෂ්ටශතකය, අරිස්ට මාලාව, යෝගමාලාව, යෝගමුක්තාවලිය, යෝගාදාරණය, යෝගසේකරය, බාලග්‍රහශාන්තිය, භෛසජය දර්පණය, ද්‍රව්‍ය ගුණ දීපනිය, වෛද්‍යාභිධානය, කුමාරෞෂධ දර්ශනය, කුමාරෞෂධ මාලාව, වරයෝග සංග්‍රහය, භේසජ්ජ මංජුසා අකාරාදිය, ඖෂධ මුක්තාහාරය, නාඩි ක්‍රමය, ස්නේහවිධිය, තෛලපංච ශතකය, අරිෂ්ටාසව ප්‍රකරණය, වටිකා ප්‍රකරණය, ආයුර්වේද ව්‍යාකරණ, වෛද්‍ය මාලාව, ද්‍රව්‍යගුණ දර්පනය යනාදී වූ වෙද පොත් රැසක්ම මුද්‍රණයෙන් එළිදැක්වීමට කටයුතු කර ඇත. නමුත් මෙම විෂය ක්ෂේත්‍රයේ ප්‍රකාශන පළ කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේ දී 2010 සිට 2015 දක්වා වසර පහක කාල සීමාව තුළදී ප්‍රකාශයට පත් කර ඇත්තේ ඉතා සීමිත ප්‍රමාණයකි.

**2010**

1 සිරුර සුවපත් කරන ආයුර්වේදීය ආහාර /මොල්ලිගොඩ, එස්.පී.

2 දිවි සුරකින දිව ඔසු /ෆොන්සේකා, පාලිත

3 රුවයට සුවයට හෙළ ඔසු / අමරසිංහ, ඊබට්

4 මව් පදවියට පෙර වදනක් / ආයුර්වේද දෙපාර්තමේන්තුව

5 මව් පදවිය ලබන ඔබටඃගැබිනි සමයේ සුළු ආබාධ/ ආයුර්වේද දෙපාර්තමේන්තුව

6 මව් පදවිය ලබන ඔබට ගැබිනි සමයේ පෝෂණය හා හදිසි අවස්ථා/ කරුණාරත්න, වයි.ඒ.යු.ඩී. සහ කොඩිතුවක්කු, එන්. ඩී.

**2011**

1 සුවය දෙන අත් බෙහෙත් / පෙරේරා, බී.සී. කැමිලස්

2 වෙද ඇසින් ලෝකය දැකීම/ සේනානායක, සුදර්ශන

3 ආයුර්වේද චිකිත්සාවලිය/ අමරසිංහ, ඊබට්

4 කායික හා මානසික සුවය සඳහා යෝග ව්‍යායාම/ පලිහවඩන, අමර

5 මවක වන වරම / සිරිවර්ධන, දයානි

**2012**

1 ඉසිවර දැක්ම / කරුණාරත්න, ඇම්.ඒ. මහින්ද

2 ජීවක රත රෝග සංග්‍රහය/ කවිරාජ්. බී.

3 ආයුර්වේද රූපලාවණ්‍ය/ අතුරුලිය, මහේෂ්

4 ජීවක රත රෝග චිකිත්සා සංග්‍රහය /කොළඹගේ, බී.

5 Some critical and analytical essays on ayurveda and traditional medicine/ Ranasinghe, Sarath G.

6 දේශීය ඇස් වෙදකම/ ගුණසේන, දේවිකා

7 කුරුලෑවට ආයුර්වේද පිළියම්/ දීප්තිකා ක්‍රිෂාණි

8 දේශීය ඖෂධ ශාක සහ දේශීය වෛද්‍ය/ ප්‍රතිකාර/ පීරිස්, රණසිංහ

9 ආයුර්වේදීය ආහාර ශික්ෂණය /පොත්තේවෙල බුද්ධරක්ඛිත හිමි

10 දිව සුරකින දිව ඔසු / ෆොන්සේකා, පාලිත

**2013**

ප්‍රකාශන නොමැත

**2014**

1 රත් හඳුන් /අරුණ කුමාර කේ.කේ.අයි.යූ.

2 Preventive measures for the recurrent attacks of skin diseases according to ayurvedic medicine/Jayasinghe, K.H.A.

3 වෙනස් වන ලෝකයට ආයුර්වේද/ අබේසේකර, චන්ද්‍රා

4 වෛද්‍ය දීපනී හෙවත් ගෘහස්ථ වෙදකම් /මාපලගම මෛත්තෙය්‍ය හිමි

5 සුව දිවි රැකුමට ආහාර විධි / ජයසිංහ, කේ.එච්.ඒ.එස්.

6 නිරෝගි දෙනෙත සහ ආයුර්වේදය / පීරිස්, ප්‍රියානි

7 දේශීය වෛද්‍ය ප්‍රතිකාර/ දේශප්‍රිය, ප්‍රසාද්

**2015**

1 කොතලහිඹුටු / අරුණකුමාර, කේ.කේ.අයි.යූ. සහ එස්. සුභසිංහ

2 ඔසු පැළ හඳුනා ගනිමු - 2 / උපාලි, ජේ. ඩයස්

3 පථ්‍යාපථ්‍යවිනිශ්චය සහ දේශීය දලු අනුපාන සංග්‍රහය / කොළඹගේ, කවිරාජ් බී.

4 පුස්කොළයේ ලියූ හෙළ වෙදකම / ධම්මරතන හිමි, ගලහිටියාගම

5 තුරු තොරතුරු - ඖෂධීය ශාක : මිනිසාට ප්‍රයෝජනවත් ශාක - පස්වන කාණ්ඩය / තෙන්නකෝන්, ධර්මරත්න

6 ඖෂධ භාවිතයට අත්වැලක් / වීරරත්න, චාමරි ලෝචනා

7 ඔසු පැල ගුණ වරුණ / දහනායක, ජයසේන

8 පැරණි ඖෂධ වට්ටෝරු / සිරිසේන, උක්වත්තගේ

9 කෂාය සංග්‍රහය/ සම්. පැලවත්තේ උපනන්ද හිමි

10 හිසට උපන් තුරුලතා / පියසිරි, අම්ලසිත්යාපා

11 රාජෞෂධනිධිය : හෙවත් ශරීරගත සියලු ලෙඩට අත්දුටු සාරෞෂධ යෝග රාශියකින් යුත් පුරාණ වෙදුන්ගේ අත්පොත

12 දේශීය ඖෂධ සංග්‍රහ /අමරසේන, අහංගම ඊබට්

13 සංක්ෂිප්ත ගෙඩි, වණ, චිකිත්සා සංග්‍රහයඃ ආයුර්වේද, දේශීය, නවීන, මාත්‍රා සහිතයි/ කොළඹගේ, කවිරාජ් බී.

14 සර්ප දෂ්ටනය සහ සර්ප විෂ වෙදකම්/ මාදුවගේ, සිරිපාල

15 හෙළ වෙද අත්පොත / සිරිසේන, මංජුල රුවන්

16 ශ්‍රී භෛසජ්‍යකල්පනා පරිභාෂා සංග්‍රහය / කොළඹගේ, කවිරාජ් බී.

17 පාරම්පරික කෂාය ප්‍රකාරණය / සම්. ඉනු දේවිකා ගුණසේන

මෙම තොරතුරු මූලාශ්‍රවලින් පුස්කොළ පොත්, වෙද අත්පොත්, පෞරාණික වෙද පොත්, සංරක්ෂණය කර රැක ගත යුතුය. පෞරාණික වෙද පොත් ඉතා සීමිත ප්‍රමාණයක් ඇති අතර ඒවා මුද්‍රණය නොවීමද ප්‍රකාශකයින් විසින් පළ නොකිරීමද ගැටලුවකි. එම ග්‍රන්ථ සංරක්ෂණයද ගැටලු සහගතය, පාරම්පරික වෛද්‍ය දැනුම අඩංගු තොරතුරු මූලාශ්‍ර දුලබ වීමද ආයුර්වේද වෛද්‍ය දැනුම පෝෂණයට බාධාවකි, එමෙන්ම පුස්කොළ පොත් සංස්කෘත, දෙමළ, සිංහල යන භාෂා වලින් ඇති නිසා භාෂාමය ගැටලු වලටද පරිශීලකයන් මුහුණ දෙයි, එමෙන්ම බොහෝ ආයුර්වේද ග්‍රන්ථ මුද්‍රණය වී ඇත්තේ සංස්කෘත භාෂාවෙන් බැවින් එම භාෂාව පිළිබඳ ගැටලුවට මුහුණ දීමට සිදු වේ. එමෙන්ම වර්තමානය වන විට පුස්කොළ පොත් සංරක්ෂණය නොවීම එනම් කළු මැදීම නොවන නිසා එවායෙහි පෙළ කියවීම අපහසුතාවයට පත්වී ඇත. ඒවායෙහි අඩංගු දැනුම කියවා අවබෝධ කර ගැනීමට තරම් විෂය විශේෂඥයන් නොමැති වීමද ගැටලුවකි. පුස්කොළ පොත්වල ඇති රහස් වට්ටෝරු, රහස් වචන අවබෝධ කර ගැනීමට ඒ පිළිබඳ පෘථුල අවබෝධයක් නොමැතිව සිදු කළ නොහැක. පුස්කොළ පොත්, වෙද අත්පොත් පරිශීලනය කිරීමට පාඨකයන් කැමැත්තක් නොදක්වයි, එමෙන්ම එවායෙහි අන්තර්ගත දැනුම පිළිබඳ අවබෝධයක් ද පාඨකයන්ට නොමැත. පුස්කොළ පොත් තැන්පත් කර ඇති පුස්තකාල හා ආයතන වලින් ඒවා පරිශීලනය කිරීමට අවසර ලබා නොදීම ද ගැටලුවකි.

මෙම ගැටලුවලට පිළියම් ලෙස පුස්කොළ පොත් හා වෙද අත්පොත්වල අන්තර්ගත දැනුම අවබෝධ කර ගැනීම සඳහා පාරම්පරික වෙද මහතුන්ගේ සහයෝගය ලබා ගෙන එම දැනුම මුද්‍රිත මාධ්‍යයට ගත හැක, එමෙන්ම එම දැනුම සංඛ්‍යාංකකරණය (Digitize) කිරීම, Micro Film කිරීම කළ හැක, පුස්කොළ පොත්, වෙද අත්පොත් හා පෞරාණික ආයුර්වේද වෛද්‍ය ග්‍රන්ථ සංරක්ෂණය කිරීම සඳහා සංරක්ෂණ

ක්‍රියාදාමයක් අනුගමනය කළ හැක. සංස්කෘත භාෂාව හා දෙමළ භාෂාවෙන් රචිත පුස්කොළ පොත් හා ග්‍රන්ථ පරිවර්තනය කර ගැනීම සඳහා විෂය විශේෂඥයන්ගේ සහයෝගය ලබා ගත යුතුය. ආයුර්වේද ග්‍රන්ථ ප්‍රකාශනය වර්ධනය කිරීම සඳහා පර්යේෂකයන් දිරි ගැන්වීම, ඔවුන්ට ආධාර අනුබල දීම, ආයුර්වේද විෂයට අදාළ සඟරා පළ කිරීමට පර්යේෂකයන් මෙන්ම පර්යේෂණ ආයතනවලට අනුග්‍රහ දායකත්වය ලබා දීම හා වර්තමාන සමාජයට ගැළපෙන ලෙස ආයුර්වේද බෙහෙත් නිෂ්පාදනයට ආයුර්වේද විෂය හදාරන්නන් යොමු කිරීමට පියවර ගත යුතුය.

බටහිර වෛද්‍ය ක්‍රමය අභිබවමින් මුළුමහත් ලෝක ප්‍රජාවගේම අවධානය ආයුර්වේද වෛද්‍ය ක්‍රමය කෙරෙහි නැඹුරු වී ඇත. විශේෂයෙන්ම බටහිර ප්‍රතිකාරවලින් ඇත් වන ඇමරිකානුවා නොයෙක් ආකාරයේ ස්වභාවික ප්‍රතිකාර ක්‍රම පිළිබඳව අත්හදා බැලීම් ද කරයි. එමෙන්ම එවායින් මහගු ප්‍රතිඵලද ලොවට පෙන්වා ඇත. උදාහරණ වශයෙන් රිදී ශක්තිය ලද ඇල්දිය ප්‍රතිකාරය (silver water therapy) මෙය මේ වන විට ඇමරිකාවේ ඉතා ජනප්‍රිය ප්‍රතිකාර ක්‍රමයකි. අපේ පැරන්නන් විසින් රිදීබඳුන් සහ රිදී හැන්දක් යුෂ වර්ග පානයට සහ කුඩා දරුවන්ට බෙහෙත් පෙවීමට උපයෝගී කර ගැනීම හා මෙම කරුණු සබැඳේ. කොළ, පොතු, ඇට, මුල් ආදී ඖෂධ වර්ග විකුණන චීන බෙහෙත් හල් ඕනෑම නගරයකින් සොයාගත හැකිය. වර්ජිනියාවේ ද සෑම ජනපදයකම නොයෙක් ප්‍රමාණයෙන් හා ඉතා දියුණු මට්ටමේ ආයුර්වේද රෝහල් ඇත.

"මේ රටේ මහපොළොවේ ඇති හැම ගසක්ම, හැම වැලක්ම, හැම තෘණ ජාතියක්ම, හැම පැළ වර්ගයක්ම, හැම කොළයක්ම ඖෂධයකි. මුළු ලංකාවම ඖෂධ උයනකි. සිංහල ලෙයට, සිංහල සිරුරට, සිංහලකමට ගැළපෙන ඖෂධ පැළෑටි ස්වභාවධර්මය විසින් අපට පරිත්‍යාගකොට ඇත. ඒවායේ වටිනාකම අප දන්නේ නැත. නියම ප්‍රයෝජන අප ගන්නේ ද නැත. (සරණංකර හිමි, 1985)

මෙවැනි තත්ත්වයන් හමුවේ අපිට උරුම වී ඇති දේශීය වෛද්‍ය ක්‍රමය ඉදිරි පරපුර සඳහා රැක ගැනීමට නම් ඒ සඳහා අප සතු තොරතුරු මූලාශ්‍ර රැක ගැනීම අපගේ පරම යුතුකමයි. ඒවා සංරක්ෂණය කර දැනුම ලබා ගැනීමට නවීන තොරතුරු මාධ්‍ය

වලට ගෙන බටහිර වෛද්‍ය ක්‍රමය අභිබවමින් ඉදිරියට ගෙන යෑමට ශ්‍රී ලාංකික සෑම පුරවැසියෙකුගේම වගකීම වේ.



**ආශ්‍රිත ග්‍රන්ථ**


1 පතිරත්න, හේමචන්ද්‍ර (1985) විශ්වවිද්‍යාලයීය ආයුර්වේද අධ්‍යාපනය කෙසේ සකස් විය යුතුද, ආයුර්වේද සමීක්ෂා, 1-2 කලඹ : පි. 123-125

2 ඥානවිමල[හිමි], කිරිඇල්ලේ(1970). දේශීය වෛද්‍ය ශබ්දකෝෂය. කොළඹ: එම්.ඩී.ගුණසේන

3 සෝමසිරි, ගුණදාස(1963) ස්වදේශීය භෛෂජ්‍ය විශ්වකෝෂය. කොළඹ: එම්. ඩී. ගුණසේන

4 සෝරත [තෙර]., (1963) ශ්‍රී සුමංගල ශබ්දකෝෂය පළමු කොටස

5 විජයතුංග, හරිස්චන්ද්‍ර (1982) ප්‍රායෝගික සිංහල ශබ්ද කෝෂය. පළවෙනි කාණ්ඩය. කොළඹ : සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

6 සිරිවර්ධන, සුනිල් (1998) ආයුර්වේදයට ඇමරිකාවේ ඇති නැඹුරුව. ආයුර්වේද සමීක්ෂා, වෙළුම 1 -නවවන කලඹ. පි. 63-64

7 ආරියදාස, කුමාරසිංහ (1982) ආයුර්වේද ඉතිහාසය. කොළඹ: ආයුර්වේද දෙපාර්තමේන්තුව

8 ආයුර්වේද පර්යේෂණ ආයතනය (1992) තල්පතේ පිළියම් වෙළුම කොළඹ: ආයුර්වේද දෙපාර්තමේන්තුව

9 සරණංකර හිමි, ගණේගම (1985) වෙදකමයි පන්සලයි. ආයුර්වේද සමීක්ෂා, 1-2 කලඹ පි.170

10 Charaka, (1960)Chakkradatha’Varanasi( Chowkhamba Sanskrit S

**Natioil Library and Documentation Services Board**
**No. 14, Independence Avenue,**
**Colombo 07**

ISBN 978-955-7544-22-9